
# ස්නේහී නුඹ



චතුරින්දි නිම්කලා

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විසකම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අපගේ ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රටතුළ යලි ගොඩනගන්න පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම ඉදිරි අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය
ශෂිකලා සේනාධීර
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

"ස්නේහී... ස්නේහී... නැගිටින්න දරුවෝ මොකක්ද ඔය තරම් නිදා ගැනිල්ල, දැන් 6.00ටත් කිට්ටුයි."
අම්මාගේ උදෑසන අඬහැරේ ඇසී මම බියට පත්වී අවදි වුණෙමි.

"අනේ තව චුට්ටක් නිදා ගන්න දෙන්නකෝ අම්මේ."
මම අම්මාට ඇවිටිලි කරත් ඇය ඉක්මනින් ජනේලය ඇර ඇඳ දෙසට ආවාය.

" මොනවද කියන්නේ තවත් නිදාගන්න දෙන්න කියලා. ඉස්කෝලෙ යන්න පරක්කු, මං ඊළඟ වතාවේ කාමරයට එන්න කලින් ලෑස්ති නැගිටලා ඉන්න ඕනේ හොඳ ද...?"

ඉන් පසුව මම අම්මාගේ බල කිරීමටත් පාසල සහ මිතුරන් සිහි වීමෙනුත් ඉක්මනට අවදි වුණෙමි.

****

අද සතියේ ආරම්භය නිසා මම හිතේ සතුටින් ලෑස්ති වුණෙමි.

"මම ඔයාගේ ලන්ච් බොක්ස් එකට කෑම ටික දැම්මා පුංචි බේබී... ඉතුරු කරන්නෙ නැතිව ඔක්කොම කන්න ඕනි."
කුසුමා නැන්දා මා හිස ආදරයෙන් පිරිමදිමින් කීවාය.

"හා කුසුමා නැන්දේ.. මං ඔක්කොම කන්නම්. ආ... ඒක නෙවෙයි අම්මේ, කෝ අයියා පේන්නවත් නැනේ."
මම පාසල් බෑගය සූදානම් කරමින් ඇසුවෙමි.

"ඇයි චූටි ඔයාට මතක නැද්ද...? අද අයියලාගේ කැම්පස් එකේ පාටි එකනේ." අම්මා සතුටින් කීවාය.

" අයියෝ මට අමතක වුණානේ,එයා ඉතින් උදෙන්ම නැගිටලා ඕන කරන දේවල් ගන්න යන්න ඇති. එහෙම නේද අම්මා...?"
අම්මා කියන්නට පෙරම මා එසේ කියද්දී ඇය විමතියට පත් වූවා ය.

" හරි චූටි ඔයාට පරක්කු වෙනවත්නේ.ඉන්න මං තාත්තිට කියන්නම් ඔයාව ඉස්කෝලෙට දාලා එන්න කියලා."
අම්මා කලබලයෙන් මෙන් කීවාය.

" ඔව් ඉතින්. මම කොහොමත් යන්නේ තාත්තිත් එක්කනෙ. තාත්තිට ඉක්මන්ට එන්න කියන්න." මම එසේ කියද්දී අම්මා සිනහසෙමින් කාමරය වෙතට ගියාය.

තාත්තා පැමිණ ඉක්මනින් මෝටර් රථය පණ ගන්වා මාහට කතා කළේය....

"චූටි ඉක්මනට එන්න බබෝ.ඔයා දැන් මැරෙන්න හැදුව නේද ..?"

"හරි තාත්ති මං එනවා."

මම තාත්තාගේ ආසනයට පසෙකින් වාඩි වී පොත් බෑගය පිටුපස ආසනයට දමා ගමන ආරම්භ කළෙමි....

ලා හිරු එළිය වැටී පරිසරයද අපූරු රටාවක් මවා තිබුණි. මල් විකසිත වී නැවුම් සුවඳක්ද එක්විය.

මම නමින් ස්නේහී උත්තරා විජේනායක. මම ජීවත් වන්නේ මහනුවර නගරයට ආසන්නයේ ය. මගේ පියා රුවන්ත විජේනායක .ඔහු මෝටර් රථ ව්‍යාපාරිකයෙක්. මගේ මව වන තාරිකා විජේනායක මහනුවර ශික්ෂණ රෝහලේ වෛද්‍යවරියකි. මා හට සිටින්නේ එක් සහෝදරයෙකු පමණයි. ඔහු සොහාන් කෞශල්‍ය විජේනායක. මම මහනුවර මධ්‍යම මහා විද්‍යාලයේ 13 ශ්‍රේණියේ කලා අංශය ඉගෙනුම ලබයි.මාගේ සහෝදරයා පාසල් අධ්‍යාපනය අවසන් කර උසස් අධ්‍යාපනය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුළත් වුණේය.

"තාත්ති, මාව ඔතනින් බස්සවන්න මං ඇතුලට යන්නම්."
මම පොත් බෑගය අතට ගෙන තාත්තිට කීවෙමි.

"හරි පැටියෝ පරිස්සමෙන්.ආ ඒක නෙවෙයි, මට අද හවස එන්න වෙන්නේ නෑ. ඔයා මොකක්ද කරන්නේ?"
කාර් එකේ දොර වහන ගමන් තාත්ති කීවේය.

" ආ හරි තාත්ති අවුලක් නෑ. මං යාළුවොත් එක්ක බස් එකේ යන්නම්. මට සල්ලි කීයක් හරි දෙන්න පුළුවන්ද...?"මම තාත්තිගෙන් ඇසුවෙමි.

"ආ මෙන්න මෙතන රුපියල් 500ක් තියෙනවා. එහෙනම් හවසට පරිස්සමෙන් යන්න. මං යනවා පැටියෝ බුදු සරණයි."
මම තාත්තිට සමු දී විදුහල වෙත ඇදුණෙමි.

"ගුඩ් මෝර්නින් ස්නේහී අක්කී..." මා වෙත පැමිණි නුවනි නංගී කීවාය.

"ගුඩ් මෝර්නින් නංගී ..අද උදෙන්ම වැඩ වගේ."
මම ඔච්චමට මෙන් ඇයට කීවෙමි.

"ඔව් අක්කි ඔයත් එන්න,අද ඩියුටි වැඩියි ."ඇය කීවාය.

"ආ...ඒ මොකද අද වෙනදට වඩා වැඩ වැඩි වෙලා මොකක් හරි විශේෂයක්ද ...?" මම විමතියෙන් මෙන් ඇසුවෙමි.

"ඇයි අක්කි ඔයාට මතක නැද්ද...? සඳුදාට ලෝක ගුරු දිනයනේ, ඇයි අනේ ඔයාට මෙච්චර ඉක්මනට ඒකත් අමතක වුණාද...? ඔයාට තමයි ලොකුම වගකීම තියන්නේ."
ඇය කීවාය.

"අනේ සොරි නංගී,මට අමතක වුණා. මං ඔයාලට සපෝට් එකක් දෙන්න එන්නම්."මම ලැජ්ජාවෙන් මෙන් කීවෙමි.

"මං යනවා නංගී... මං උදව්වට එන්නම්."

මම පාසලේ ශිෂ්‍ය නායිකාවක්ද වී මෙලෙස කිසිදු වගකීමකින් තොරව සිටීම ගැන මම පසුතැවිලි වුණෙමි.

"අනේ මං අද ඉඳන්වත් ඉස්කෝලෙට හරියට වැඩක් කරන්න ඕනේ."
මම සිතින් දැඩි ලෙස අධිෂ්ඨාන කළෙමි.

මා පන්තියට යන විට යහළුවෝ එකතු වී සිනහසෙමින් කතාබස් කරමින් සිටියෝය.

"ගුඩ් මෝර්නින් කෙල්ලේ..."
එකවරම මාගේ හොඳම මිතුරිය වූ එරන්දි කෑ ගැසුවාය.

"ගුඩ් මෝර්නින් කට්ටියටම.ඔයාලා එක්ක වැඩි වෙලාවක් ඉන්න වෙන්නෙ නෑ. මට යන්න වෙනවා අද ඩියුටි වැඩියි."

මම ඉක්මනින් බෑගය පුටුව මත තබමින් කීවෙමි.

එකවරම එරන්දි මාව බිත්තියේ කොනට ඇදගෙන ගියාය.

"මොකද බං මේ, මාව ඇදගෙන යන්නේ."
මම කලබලයෙන් මෙන් හඬ නැගුවෙමි.

" බයවෙන්න එපා. ඔයාට පොඩි දෙයක් කියන්න තියෙනවා."
ඇය රහසින් වෙන් කීවාය.

"මොකක්ද ඒ ගමන ඕකනම් වැඩි හොඳකට නෙවෙයි."
මගේ හිත කීවෙමි.

"මොනාද බං කියන්න තියෙන්නේ ..? කියන දෙයක් ඉක්මනට කියන්න මට පරක්කු වෙනවා."
මම ඇයට කීවෙමි.

"මේ අපේ ඉස්කෝලේ මැත්ස් සෙක්ෂන් එකේ කොල්ලෙක් උඹට කැමතියිලු."එරන්දි ඇඹරෙමින් කීවාය.

" මල විකාර, උඹට පිස්සුද බං ..? මං ඉස්කෝලෙ ශිෂ්‍ය නායිකාවක්. අනිත් එක එක්සෑම් එකත් ළඟ තියාගෙන මට පුළුවන්ද..?"
කොල්ලෙක් එක්ක විකාර කරන්න."
එයට මාහට තරහ ගියෙමි.

"හරි හරි ..., උබ දැන් පලයං.මං පස්සේ උඹට කතා කරන්නම්කෝ. හැබැයි වැඩේ නම් අතාරින්න එපා."
එරන්දි මට ඔච්චමටමෙන් කීවාය.

"අනේ මල විකාර උදේ පාන්දර වෙන කියන්න දේවල් නැත්තං හොඳයි ."
මම හිතින් මුමුණමින් පන්තියෙන් පිටතට ගියෙමි.

මම පන්තියෙන් පිටවෙත්ම කලා අංශය භාර සමන්මලී ගුරුතුමියව මුණගැසුණි.

"ආ ස්නේහි ...ගුඩ් මෝර්නින්.මං මේ ඔයාව හොයාගෙන පංතිය පැත්තට ආවේ. හොඳ වෙලාවට ඔයාවම හම්බුණා."
සමන්මලී ගුරුතුමිය එක හුස්මට කීවාය.

"ගුඩ් මෝර්නින් ටීචර්,මොකක් හරි හදිස්සියක් ද ...? " මම කලබලයෙන් මෙන් ඇසුවෙමි.

"අනේ හදිස්සියක් නෙවෙයි දරුවෝ, මට ප්‍රින්සිපල් සර් කිව්වා සඳුදා ගුරු දිනයට ළමයින්ට පොඩ්ඩක් සපෝට් එකක් දෙන්න . ඒකයි.ඔයා මාත් එක්ක පුස්තකාලයට පොඩ්ඩක් යමුද ...?"
ගුරුතුමිය කරුණාවෙන් මෙන් ඇසුවාය.

සමන්මලී ගුරුතුමිය සමඟින් මම පුස්තකාලයට ගියෙමි.

"ස්නෙහි, මං ඔයාලා දෙන්නට පවරන්න යන්නේ ටිකක් අමාරු වැඩක්."
සමන්මලී ගුරුතුමිය බැරෑරුම් හඬින් කීවා ය.

" ටීචර් කාටද ඔයාලා දෙන්නා කිව්වේ ,මං විතරනේ මෙතන ඉන්නේ."
මම විමතියකින් ගුරුතුමියගෙන් ඇසුවෙමි.

"අනේ මට සමාවෙන්න. ඔයාට විතරක් මේ වැඩේ තනියම කරන්න අමාරුයි. මං තව ළමයෙකුට එන්න කිව්වා ඔය දෙන්නා මේ වැඩේ කරන්න." සමන්මලී ගුරුතුමිය කීවාය.

"ආ ඔය කියනකොටම එන්නේ, එන්න අනුත්තර මෙතනින් වාඩි වෙන්න."

එකවරම මා ඔහු දෙස හැරී බැලුවෙමි. උසට සරිලන මහතකින් යුත් කඩවසම් පිරිමි ළමයෙක් පැමිණියේය.

පාසල් භූමිය තුළ මින් පෙර නොදුටු අයෙක් බව මට හැඟුණි, නමුත් මට ඔහුව යම් කිසි හුරු පුරුදු බවක් දැනුණි.

"ගුඩ් මෝර්නින් ටීචර්,මට සමාවෙන්න පොඩ්ඩක් එන්න පරක්කු වුණාට."ඔහු ගෞරවයෙන් යුතුව ගුරුතුමියට පැවසුවේය.

"ඉට්ස් ඕකේ අනුත්තර. අපිත් දැන් තමයි මෙතනට ආවේ. මේ ඉන්නේ ස්නේහී . ඔය දෙන්නට දැන් එකට වැඩ කරන්න වෙන්නේ."
සමන්මලී ගුරුතුමිය මා හඳුන්වා දෙද්දී ඔහු ලැජ්ජාවෙන් මෙන් මා දෙස බැලුවේ ය.

"මොකක්ද ටීචර් අපි දෙන්නට කරන්න තියෙන්නේ?"
මම එකවරම ගුරුතුමියගෙන් ඇසුවෙමි.

"ඔයාලා දන්නවනේ සඳුදාට ගුරු දිනේ එනවා කියලා. තව සතියක් වගේ පුංචි කාලයක් තියෙන්නේ. මේ වැඩේ හොඳම කොටස කරන්න තියෙන්නේ ඔය දෙන්නට, ඒ නිවේදනය කරන එක ... වැඩසටහන ලස්සන කරන වැඩේ ඔය දෙන්න අතේ තමයි තියෙන්නේ."
සමන්මලී ගුරුතුමිය පැවසුවාය.

"ටීචර් අපි ප්‍රෝග්‍රෑම් ටික දාලා කතාව හදාගන්න ඕනිද ?" මා අසන්නට පෙරම අනුත්තර ඇසුවේය.

" නැහැ අනුත්තර ,මං ඔයාලට හදල දෙන්නම්. ඔය දෙන්නට තියෙන්නේ හොඳට ප්‍රැක්ටිස් කරලා වැඩේ ලස්සනට කරන්න."ගුරුතුමිය හොඳින් පැහැදිලි කර කීවාය.

" ටීචර් ඔය වැඩේ අපි හොඳට කරන්නම්."මම සතුටු හිතෙන හඬකින් පැවසුවෙමි.

"තාම හරියට ප්‍රෝග්‍රෑම් ටික රෙඩි කරලා නෑ. මං දැනට ඔයාලගේ වොයිස් චෙක් කරන්න වෙන කතාවක් දෙන්නම්."
එසේ කියමින් ගුරුතුමිය ෆයිල් කවරයක් අතට ගත්තාය.

පළමුව කතාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණේ අනුත්තරටය.
ඔහු කතා කිරීමේදී පිරිමි ළමයකු සතු නියම පෞරුෂය හොඳින් කැපී පෙනුණි.
මම ඔහුගේ කතාව හොඳින් අසා සිටියෙමි.

අනතුරුව මම හැකි උපරිම අයුරින් ඒ ඉදිරිපත් කළෙමි.

"ටීචර් අපි යුනිෆෝම් එකම නේද අඳින්න ඕනේ එදාට..?"
පුහුණුවීම් අවසන් කර පිටව යද්දී මම සමන්මලී ගුරුතුමියගෙන් ඇසුවෙමි.

" හොඳ වෙලාවට මතක් කලේ. මට කියන්න බැරි වුණා. මේ පාර අපි ගුරු දිනය ටිකක් වෙනස් විදිහට කරන්න යන්නේ.ඔය දෙන්නට පුළුවන් වෙයිද යුරෝප් ටයිප් එකට ඇඳුම් හදාගන්න. ඒ කිව්වේ ස්නේහි ඔයා පාටි ෆ්‍රොක් එකක් හදාගන්න. අනුත්තර,ඔයා කළු කලිසමකුයි, සුදු ෂර්ට් එකයි ,බ්ලේසර් එකකුයි හදාගන්න. තේරුණා නේද ..?"
සමන්මලී ගුරුතුමිය කියාගෙන ගියාය.

මමත් අනුත්තරත් ඊට එකඟ විය.

" අද හවස් වෙනකොට වැඩසටහනේ න්‍යාය පත්‍රය හදාගන්න පුළුවන් වෙයි. ඔයාලා අද දවස ඔහොම ඉන්න. මං හෙට වැඩසටහන ම හදාගෙන එන්නම්. ඔයාලා දෙන්නට හෙට ටිකක් හවස් වෙනකම් ඉස්කෝලෙ ඉන්න පුළුවන්ද ...?"ගුරුතුමිය ඇසුවාය.

" මට පුළුවන් ටීචර්." මම පැවසුවෙමි.

"මටත් පුළුවන් ටීචර්" අනුත්තරත් එයට එකඟ වුණේ ය.

" හරි එහෙනම් හෙට හවස වැඩේ කරමු. ඔය දෙන්න ඇඳුම් හදා ගන්න.හෙට හවස 4.30 වෙනකම් ඉස්කෝලේ ඉන්න. දැන් දෙන්නම පන්ති වලට යන්න." සමන්මලී ගුරුතුමිය කීවාය.

" ආ ස්නේහී, එදාට කරන අනිත් වැඩසටහන් ගැනත් පොඩ්ඩක් හොයලා බලන්න ."
ගුරුතුමී අවධාරණයෙන් කීවාය.

" හරි ටීචර් මං හොයලා බලන්නම් ."

ඉන්පසු ගුරුතුමිය අපෙන් සමු දී ගුරු විවේකාගාරය දෙසට ගියාය.

" ස්නේහි , ඔයා කොයි ක්ලාස් එකේද ...?"
මා නොසිතූ ලෙස අනුත්තර ඇසුවේය.

" ආ මමද මං ඉන්නේ ආට් සෙක්ෂන් එකේ 13-A ක්ලාස් එකේ,එනකොට ඔයා ...?"
මම ඔහුගෙන් ඇසුවෙමි.

" මම මැත්ස් සෙක්ෂන් එකේ 13- B ක්ලාස් එකේ." ඔහු පැවසුවේය.

"හ්ම්ම්ම්...මං ඔයාව මීට කලින් දැකල නෑ, අලුතින්ද මේ ඉස්කෝලෙට ආවේ..?"
මම අනුත්තරගෙන් ඇසුවෙමි.

"ඔව් ස්නේහී, මං ළඟදි ආවේ. O/L රිසාල්ට් එකෙන්. නැත්නම් ඉතින් මෙහෙට එන්න අමාරුයිනේ." ඔහු පැවසුවේය.

" හරි අපි එහෙනම් හෙට හවස හම්බවෙමු. මම ක්ලාස් එකට යනවා, බායි අනුත්තර ..." මම ඔහුට අතවනමින් පන්තිය ඇතුළට පැමිණියෙමි.

*****

ඒත් සමඟම උදෑසන රැස්වීමද ආරම්භ වුණි.
උදෑසනම එරන්දී කියූ දෙයත් මගේ සිත තුළ සැරිසරමින් තිබුණි.

කඩවසම් පෙනුමක්,කළු පැහැති අපූරු කොණ්ඩයක් හා කොල්ලෙකුට කලාතුරකින් ලැබෙන අපූරු පෞරුෂයකුත් අනුත්තර සතුව පැවැතුණි ....
ඔහුගේ ගැඹුරු කටහඬ මගේ හිතේ ඇඳී තිබුණි.

පාසලේ දවස ඉක්මනින්ම ගෙවී ගියේය.

අද දින තාත්ති නොපෙනෙන නිසා මම පාසලේ වැඩ කටයුතු අවසන් කර යහළුවන් සමඟින් පාසලෙන් පැමිණියෙමි.

" මොනාද බන් අද උදේ ඉඳන් උඹ හරියට කතාවක්වත් නෑ. මොනාද ඔච්චරටම මනෝපාර දාන්නේ ආ...මං අර කියපු කොල්ලා ගැනවත්ද...?" එරන්දි මා දෙස හොරෙන් බලා ඇසුවාය.

" අනේ ඔය මොකෙන් ගැනවත් නෙවෙයි බං, සඳුදා නිවේදනය කරන්න පුළුවන් වෙයිද කියලයි කල්පනා කලේ."
මම කේන්තියෙන් මෙන් කීවෙමි.

"ඒක නෙවෙයි මට ඔයාට කියන්න බැරි වුණානේ අර කොල්ලා, 13-B එකේ හිරාන් අදත් උදේ උඹ සමන්මලී ටීචර් එක්ක ගිය වෙලාවෙ ආවා. මගෙන් ඇහුවා ඌ කැමතියි කියලා උඹට කිව්වද කියලා."
එරන්දි පුදුමයෙන් මෙන් කීවාය.

"උඹ මොකක්ද කිව්වේ?"
මම එරන්දිගෙන් ඇසුවෙමි.

" මං කිව්වා උඹ හරියට උත්තරයක් දුන්නේ නෑ කියලා .. ඊට පස්සේ ඌ මට රවගෙන පන්තියෙන් එලියට ගියා ."
එරන්දි පැවසුවාය.

" අනේ මන්දා බන් මට නම් ඔය අහක යන කුණු ගොඩවල් කර ගහන්න බෑ."
මම ඇය කියූ දේ ගණන් නොගෙන කීවෙමි.

"මේ අපි පොඩ්ඩක් බුක්ෂොප් එකට ගිහින් යමුද..? උදේ හංසි අක්කා ස්කොලෙන් එකතු වුණ සල්ලි දුන්නා ටීචර්ස්ලාගේ තෑගි ටික පොඩ්ඩක් බලන්න කියලා."
මම එරන්දීට පැවසුවෙමි.

"හරි ඒකත් කරගෙන යමුකෝ."
ඇය කීවාය.

අනතුරුව අපි දෙදෙනා ගුරුවරුන්ගේ තෑගි තෝරා ඒවාට මුදල් බැද පැමිණියෙමු.

"අපි ස්ටෑන්ඩ් එකට යමු නේද ...? මෙතන බස් එකක් එනකම් ගොඩක් වෙලා ඉන්න වෙයි."
එරන්දි එසේ කීවාය.

මමද එයට එකඟ වී අපි දෙදෙනා බස් නැවතුම්පොළට පැමිණියෙමු.

"අපි අර බස් එකට නගිමු ඒකෙ සීට් තියෙනවා."
මම එසේ කියමින් බස් රථය දෙසට ඇදුණෙමි.

එරන්දී මා පසු පසින් පැමිණියාය.

" මේ මට උඹට කියන්න බැරි
වුණානේ. උඹේ පස්සෙන් එන හිරාන් ඉන්නේ. ඌ හෙන කුකුළළු. දකින එක පස්සේ යනවලු, අපේ ඉස්කෝලෙටත් O/L වලින් ඇවිල්ලා තියන්නේ,ඉගෙන ගන්නත් බෑලු. සල්ලි වලට මේ ස්කෝලෙට ඇවිල්ලා තියන්නේ..."
එරන්දි කියාගෙන ගියාය.

"අනේ මේ ...මට උන්ගෙන් වැඩක් නෑ. අනික උබ කට ඇරියොත් කියන්නේ ඌ ගැන, මං ඔය කියන එක්කෙනාව දැකලාවත් නැහැ. අනික කොච්චර සල්ලි තිබ්බත් වැඩක් නෑ කෙල්ලෝ පස්සේ යනවනම් , ඉගෙන ගන්න බැරි නම් ..."
මම එරන්දී ට ඔරොප්පුවට මෙන් කීවෙමි.

"ඔයා කැමති දෙයක් කරන්න මට ඉතින් ඔයාගේ ජීවිතය තීරණ ගන්න බෑනේ."
එරන්දි ජනේලය දෙස හැරී කීවාය.

"මං ඔයාගෙන් අහන්න හිටියේ ඔයාලගේ අක්ක දැන් මොනවද කරන්නේ?"
මම එරන්දීරගෙන් ඇසුවෙමි.

" එයා BOC බැන්ක් එකේ වැඩ කරනවා, එයා තව මාස 2කින් බඳිනවා, දැන් ඉගෙනීම් කටයුතුත් ඉවරයිනේ."
එරන්දී සතුටු හිතෙන හඬින් කීවාය.

" අනේ ශෝක් නේද ..?"
මම සතුටින් කීවෙමි.

මම එරන්දී සමඟ කතාබහ කළෙමි.
බසය වේගයෙන් නිවස ආසන්නයේ පාරට පැමිණියේ ය.

" කතාවෙන් කතාව බහින තැනටත් ආවා. මම ඉස්සරහ බහිනවා , අපි හෙට හම්බවෙමුකෝ..."
මම එසේ කියමින් අසුනේ නැගිට්ටෙමි.

" බායි එරන්දි බුදු සරණයි, පරිස්සමෙන් යන්න.."
මම එරන්දීට සමුදෙමින් බසයෙන් බැස්සෙමි.

මා නිවසට යන විට අම්මා සහ කුසුමා නැන්දා කුස්සියේ සිටියහ.

"ආ චූටි,ඔයා ආවද අද තාත්තිට මීටින් එකක් කියලා එන්න වෙන්නේ නෑ කිව්වනේ. මගේ මැණික තනියමද ආවේ?"

" නෑ අම්මා එරන්දිත් මාත් එක්ක ආවා." මම පොත් බෑගය පුටුව මත තබමින් කීවෙමි.

" අම්මා අද වැඩ නැද්ද ..?" මම කුතුහලයෙන් මෙන් ඇසුවෙමි.

"නෑ අද මං කලින් ආවා. අද ස්ටුඩන් ට්‍රේනින් එකක් තිබුණේ. මං කලින් ආවේ ඒ නිසා ..." අම්මා කීවාය.

" ආ චූටි ඒක නෙවෙයි අද ඩිලාන් අංකල්ලා මෙහෙ එනවා."
අම්මා මා හට කීවාය.

"ඩිලාන් අංකල් කිව්වේ අම්මලාගේ හොස්පිටල් එකේ ඩොක්ටර් අංකල්ද...?"
මම විමතියෙන්නේ මෙන් මවගෙන් ඇසුවෙමි.

"ඔව් අනේ ඔයාට මතක නැද්ද තරංගි ඇන්ටි, ප්‍රවීන් ඒ දෙන්නත් එනවා."
අම්මා මා දෙස බලා කීවාය.

"ප්‍රවීන් කිව්වේ මාත් එක්ක ප්‍රී ස්කූල් ගියේ කෙනාද ...?" මම මින් පෙර දැක නැති අයෙකු ගැන අසනවාක් මෙන් ඇසුවෙමි.

" ඔව් ළමයෝ එයාලා අවුරුදු ගානකින් මෙහේ ආවේ නෑනේ. මං හිතන්නේ අන්තිමට දැක්කේ හය වසරෙදි ද කොහෙද ...?දැන් නම් එයා ගොඩක් ලොකු ඇති, මට අද රෑට එයාලට ඩිනර් රෙඩි කරනවා. මට ඔයාගෙන් හෙල්ප් එකක් ඕනි."

"හා හරි අම්මා මං හෙල්ප් කරන්නම්. මං මොකක්ද කරන්න ඕනේ අම්මා." මම ඇගෙන් ඇසුවෙමි.

" ඔයා වොෂ් එකක් දාගෙන මොනවා හරි කාලා ගේ පොඩ්ඩක් අස්කරලා දාන්න ලොකුවට කරන්න දෙයක් නෑ. කුසුමා අද උදෙත් අස් කළානේ.ඔයා දැනට ඒ වැඩේ කරන්න මං වෙන උදව්වක් ඕනි උනොත් කියන්නම්.

****

මම අම්මා පැවසූ පරිදි සන්ධ්‍යා කාලයේ මුළු නිවසම පිරිසිදු කළෙමි.

අනතුරුව මම නැවත පිරිසුදු වී කළු පැහැති ගවුමක් ඇද,ඉණ ළඟට වෙන තෙක් දිග දිගට තිබූ මාගේ කොණ්ඩයද පීරාගෙන ඇඳට වී පොතක් කියවමින් සිටියෙමි.

****

" චූටි දූ ඉක්මනට පහළට එන්න ඩිලාන් අංකල්ලා ඇවිල්ලා."
අම්මා සවස 4.00ට පමණ මා හට කතා කළාය.

දෙවන මහලේ සිට පඩිපෙළ බැස යද්දී මම විමතියට පත් දුටුවෙමි.

"මොනවා අනුත්තර ..." මට රහසින් මෙන් කියවුණි.

මම ඔවුන් අසලට ගොස් අංකල්ට සහ ඇන්ටීට දණ ගසා වැන්දෙමි.

"අම්මා මතකද මං ඔයාට කිව්වා මට තව පිරිමි ළමයෙක් එක්ක නිවේදනය කරන්න හම්බුණා කියලා. ඒ මෙයා තමයි," මම අම්මාට රහසින් මෙන් කීවෙමි.

අනේ තරංගී ,අද මේ දෙන්නා ඉස්කෝලෙදි මුණගැහිලා, මෙයා ප්‍රවීන්ව ගොඩ කාලෙකින් දැකල නෑනේ. ඒ නිසා අඳුරගන්න බැරිවෙලා."
අම්මා ඔවුන්ට කීවාය.

"ඇත්තද චූටි පුතා,"
තරංගි ඇන්ටි ප්‍රවීන්ගෙන් ඇසුවාය.

" ඔව් අම්මේ මං දන්නෑනෙ මේ සනු කියලා."

"අනේ එහෙමද අපි මෙයාට කතා කරන්නේ සනු කියලනේ. පුතාට ස්නේහී කිව්වහම අඳුරගන්න බැරි වෙන්න ඇති. අන්තිමට දැක්කෙත් හය වසරෙදි කොහෙද නේ?"
තරංගී ඇන්ටි කීවාය.

" බලන්නකෝ තරංගී, දැන් අපේ සනුගෙ ලස්සන ලෝභයේ බෑ. ඉස්සර කොච්චර පොඩියටද හිටියේ ..."
ඩිලාන් අංකල් මා දෙස බලමින් කීවේය.

අම්මාගේ සියලුම යහළුවන් මා හට පුංචි කාලයේ සිටම ඇමතුවේ සනු කියමිනි.
ඒ අතර ප්‍රවීන් මා දෙස බලා සිනාසුණේය.

" එන්න අපි මොනාහරි බීලම කතා කරමු."
එසේ කියමින් අම්මා ඔවුන්ව කෑම කාමරේ දෙසට රැගෙන ගියාය ..

"පුතා සනු එක්ක පොඩ්ඩක් කතා කරන්න."ඩිලාන් අංකල් ප්‍රවීන්ට කීවේය.

"හායි කොහොමද සනු ." ඔහු මා දෙසට අත වනමින් කීවේය.
ඔහු කෑම කාමරේට නොගොස් සාලේ පුටුවක වාඩි වුණේය.

" මං ඔයාට ප්‍රවීන් කියන්නද අනුත්තර කියන්නද ....?" මම ඔහුගෙන් ඇසුවෙමි.

"මගේ සම්පූර්ණ නම ප්‍රවීන් අනුත්තර සේනාධීර ... මට ඉස්කෝලේ හැමෝම කතා කරන්නේ අනුත්තර කියලා, හැබැයි මං කැමතියි ඔයා මට ප්‍රවීන් කියනවට මොකද ඒක පොඩි කාලේ ඉඳන් කියපු නමනේ ...
හැබැයි ඔන්න මං නං ඔයාට කතා කරන්නේ සනු කියලා ඔයාට ප්‍රශ්නයක් නෑ නේද ...?"
ඔහු මගෙන් ඇසුවේය.

"මට ප්‍රශ්නයක් නෑ ප්‍රවීන් ..."
මම ඔහුට කීවෙමි.

එයත් සමගම අම්මා පැමිණ බීම වීදුරුවක් සහ චොක්ලට් කේක් කෑල්ලක් ප්‍රවීන් අතට දුන්නේය.

"කතා කරන ගමන් බොන්න පුතේ ." එසේ කියමින් අම්මා නැවත කෑම කාමරයට ගියාය.

"බලන්නකෝ නේද නොහිතපු විදිහට අපි අද හම්බුන හැටි ."
මම ප්‍රවීන් දෙස බලා කීවෙමි.

"අනේ ඔව් සනු ඒකනම් ඇත්ත , මටත් තාම හිතාගන්න බෑ. අපි දෙන්නා සඳුදාට ඒ වැඩේ නියමටම කරමු." ප්‍රවීන් බීම බොන අතරේ කීවේය.

"ආ වුට්ටක් ඉන්න සනු ඔයාට පොඩි දෙයක් ගෙනාවා."
එසේ කියමින් ප්‍රවීන් ඇගේ මවගේ බෑගයේ විවෘත කර දිලිසෙන කවරයක් සහිත පෙට්ටියක් එළියට ගත්තේය.

" ආ මෙන්න මේක ඔයාට ."
ප්‍රවීන් අත දිගුකර ඒ පෙට්ටිය මා අත තැබුවේය.

" මොනාද අනේ මේ ...?ඔයාලා කරදර වෙලානේ ."
මම ඔහු දෙස බලා කීවෙමි.

"අනේ ඕක පොඩි දෙයක් ..." ප්‍රවීන් කිව්වේය.

" තැන්ක්යූ ප්‍රවීන් " මම සතුටින් කීවෙමි.

"ඔයාට මතකද සනු මොන්ටිසෝරි කාලේ මගේ මකනේ වෙන කෙල්ලෙක් ගත්තා කියලා ඔයා ඒ කෙල්ලව රතු වෙන්නම හැපුවා."
මුවට සිනහ නංවමින් ඔහු කීවේය .

ඉක්මනින්ම මගේ මුහුණ රතු වුණි.

"හ්ම්ම්...මට මතකයි ."මා හට ලැජ්ජ හිතුණු නිසා මම අහක බලමින් කීවෙමි.

"ඒක නෙවෙයි සඳුදාට ඔයා මොන පාට ඩ්‍රස් එකක්ද අඳින්නේ ...?"

"මං හිතන් ඉන්නේ රතු පාට ෆ්‍රොක් එකක් අඳින්න ."

"හ්ම්ම්...එහෙනම් මං ඒකට මැච් වෙන්න ඇඳුම් හදා ගන්නම්.සනු මොකුත් හිතන්නේ නැත්නම් මං ඔයාගෙන් දෙයක් අහන්නද...? "
එකවරම ප්‍රවීන් මාගෙන් ඇසුවේය.

" මොකක්ද ප්‍රවීන් ..?"
මම විමතියෙන් මෙන් ඔහුගෙන් ඇසුවෙමි.

"ඔයාට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවද ..." ඔහු සැකයෙන් මෙන් ඇසුවේය.

"අනේ නෑ ප්‍රවීන් මීට කලින් 11 වසරෙදි එක කොල්ලෙක් එක්ක මාස තුනක් විතර යාළුවෙලා හිටියා ...හැබැයි මං ඒක නැවැත්තුවා එයාව මට ගැලපෙන්නෙ නෑ. ඊට පස්සේ ආයි කිසිම සම්බන්ධයක් තිබ්බිලා නෑ. ඒක තමයි දැනට පළවෙනි සහ අවසන් එක ..."මම ඔහුට සත්‍ය පැවසුවෙමි.

"එහෙමද එහෙනම් කමක් නෑ ..." ප්‍රවීන් සතුටින් කීවේය.

"ඇයි ඔයා එහෙම ඇහුවේ ..?"

"නෑ මං නිකන් ඇහුවේ , ඔයා වගේ කෙල්ලෙක්ට බෝයි කෙනෙක් එක නෑ කියන්නෙත් පුදුමයි."

"ප්‍රවීන් ඔයා දන්නවද හිරාන්ව ..?"
මම ඔහු අසල පුටුවක වාඩි වෙමින් ඇසුවෙමි.

"ඔව් හිරාන්ව දන්නවා අපේ ක්ලාස් එකේනේ ඉන්නේ ඇයි මොකෝ කේස් එක ...?"
"නෑ ඌ මගේ පස්සෙන් එනවලු , මල කරදරයක් වෙලා ඉන්නේ ..."

"ඒකත් එහෙමද අපි බලාගමුකෝ ...?" ඔහු තමාටම මුමුණ ගත්තේය.

"ආයෙ මොකක් හරි කිව්වොත් මැක්ස් සෙක්ෂන් එකේ අජිත් සර්ට කියන්න ." ඔහු බැරෑරුම් ලෙස කීවේය.

" ඒක නෙමෙයි ඔයාට ගර්ල් කෙනෙක් ඉඳලා නැද්ද ...?"මම ඔච්චමට මෙන් ඔහුගෙන් ඇසුවෙමි.

"නෑ සනු මං කෙල්ලෙක්ට ට්‍රයි කරලා තියෙනවා. ඒත් කාත් එක්කවත් යාළු වෙලා ඉඳලා නෑ ,දැන් නම් ඕව අතෑරලා ඉන්නේ."
ඔහු මා දෙස බලා කීවේය.

"පුතා මේ තාරුකා ඇන්ටි ඩිනර් රෙඩි කරලා ඔයාලා දෙන්නාත් එන්න."
තරංගී ඇන්ටි එසේ කියමින් ප්‍රවීන්ට කතා කළාය.

"හා අම්මා.. අපි එන්නං"
ප්‍රවීන් එසේ කියමින් අසුනින් නැගිට්ටේය.

ඒත් සමගම තාත්තිත් පැමිණියේය.

"ආ ඩිලාන් කොහොමද ..?කොයිවෙලේද ආවෙ ?" තාත්ති ඩිලාන් අංකල්ගෙන් ඇසුවේය.

"අපි නම් දැන් ඇවිත් සෑහෙන වෙලා එන්න අපිත් එක්කම ඩිනර් ගමු ."
ඩිලාන් අංකල් කීවේය .

"මං වොෂ් එකක් දාගෙන එන්නම්. ඔයාලා එතකන් ඩිනර් ගන්න."
තාත්ති එසේ කියමින් උඩුමහලට ගියේය.

"තාරුකා ඔයාලට කියන්න දෙයක් තියෙනවා."තරංගී ඇන්ටි කීවාය.

"ඒ මොකක්ද තරංගී...?"
අම්මා ආහාර බෙදමින් ඇසුවාය.

"මේවා මෙහෙම කියන එක හරි නෑ ඔයාලට කියන්නම් කියලා හිටියේ. තව මාස දෙකකින් විතර අපේ ලොකු පුතා මැරිකරනවා."

"අනේ ඒක කොච්චර හොඳද අපෙන් මොනාහරි වෙන්න තියෙනවනම් කියන්න ."
අම්මා ඇන්ටිට කීවා ය.

"අපි දින තීන්දු කරගෙන ඔයාලට කියන්නම් ." ඇන්ටි කීවාය.

"ඔය දෙන්න දැන් සඳුදා නිවේදනය කරන එකට ලෑස්තිද ..?" ඩිලාන් අංකල් අපෙන් ඇසුවේය.

" තාම ස්පීච් එක රෙඩි නෑ අප්පච්චි ... අපි හෙට ඉඳලා ප්‍රැක්ටිස් කරනවා." ප්‍රවීන් කීවේය.

" අද ඉස්කෝලේ ඉන්න අතරේ සමන්මලීගෙන් කෝල් එකක් ආවා. එයා කිව්වා පුතාව මේ වැඩේට සිලෙක්ට් කර ගත්තා කියලා. මං දන්නෑනේ තෝරගත්ත අනිත් කෙල්ල සනු කියලා" තරංගී ඇන්ටි කීවාය.

තරංගි ඇන්ටි නගරයේ ප්‍රමුඛ පෙළේ පාසලක විදුහල්පතිනියකි. එම නිසා සමන්මලී ගුරුතුමිය ඇයට ඒ බව දැනුම් දී තිබුණි .

අපිත් සමග කෑම ගැනීමට තාත්තීත් පැමිණියේය.

" තාරුකා පුතා කෝල් කළාද...?"තාත්ති අම්මාගෙන් ඇසුවේය.

"ඔව් රුවන්ත , මං හවස ගත්තා එතකොට පාටි එක පටන් ගත්ත විතරයි."

" හා හා එහෙනම් කමක් නෑ."
තාත්ති කීවේය.

සියල්ලම කෑම කන අතරේ සුහද කතාබහක යෙදුණහ.නොදැනීම කාලය ගතවුණි .

"අපි එහෙනම් ගිහින් එන්නම් තාරුකා." තරංගි ඇන්ටි කීවාය.

"ආයේ දවසක එන්න හොඳේ..."තාත්ති ඔවුන්ට කීවේය.

මම ඔවුන්ට වැන්දෙමි.

ඔවුන් ගියපසු අම්මාත් තාත්තාත් සමග විස්තර කතා කර මම කාමරයට පැමිණියෙමි.

මම ඉන්පසු ප්‍රවීන් දුන් දිලිසෙන පෙට්ටිය විවෘත කර බැලූවෙමි.

කුඩා කල අප දෙදෙනා එකට හිඳගත් ඡායාරූපයක් මැදට දමා රෝස පැහැති දිලිසෙන බිත්ති ඔරලෝසුවක් සහ පාට පාට කොණ්ඩ කටු පෙට්ටියක් එහි විය.

මම ඔවුන් රැගෙන වී තිබූ තෑගි මවටත් පියාටත් පෙන්නා බිත්තියේ ඔරලෝසුව එල්ලුවෙමි.
පසුව අම්මාගෙන් ප්‍රවීන්ගේ දුරකථන අංකය ඉල්ලාගෙන ඔහුට ස්තූති කළෙමි.

****

පසුදින පාසලේ පළමු කාලපරිච්ඡේදය වූයේ තර්ක ශාස්ත්‍රයයි.
මා පන්තියේ වැඩකටයුතු කරන අතරේදී සමන්මලී ගුරුතුමිය පන්තියට ආවාය.

"එක්ස් කියුස් මී ලහිරු සර් .මං පොඩි වැඩකට ස්නේහිව එක්කගෙන යන්නද ... ?"
ගුරුතුමිය ලහිරු සර්ගෙන් ඇසුවාය.

"ඕකේ ටීචර් එක්කගෙන යන්න .මට ළමයි දෙන්නෙක් ඇවිත් කිව්වා. මං හිතුවෙ බොරු කියනවා කියලා .සොරි ටීචර් ." ඔහු පැවසුවේය.

මම සමන්මලී ගුරුතුමියත් සමග ප්‍රධාන ශාලාවට පැමිණියෙමි.

ඒ වන විට ප්‍රවීන්ද එතනට පැමිණ සිටියේය.

" අනුත්තරත් ඇවිල්ලා ඉන්නේ,දැන් දෙන්නා ප්‍රැක්ටිස් කරන්න පටන් ගන්න ."
සමන්මලී ගුරුතුමිය කීවාය.

"මොකද ඔයා එන්න පරක්කු වුණේ ..?" ප්‍රවීන් රහසින් මෙන් ඇසුවේය.

" සර් එන්න දුන්නේ නෑ අන්තිමට ටීචර්ම එන්න වුණා."
මම ප්‍රවීන්ට කීවෙමි.

අනතුරුව අපි බොහෝ වෙලාවක් පුහුණුවීම් කළෙමු.

" දැන් නම් ඔය දෙන්නා වැඩේ හොඳට කරනවා. මීටත් වඩා හොඳට වැඩේ එදාට කරන්න ඕනි. "
ගුරුතුමිය සතුටින් කීවා ය.

"දැන් දෙන්නගෙ ඇඳුම් ටිකත් හරි නේද මට ඊයේ අනුත්තරගේ අම්මත් කතා කළා.ඇඳුම් ටික ලෑස්ති කරලා තියෙන්නේ කිව්වා ..."
සමන්මලී ගුරුතුමිය අනුත්තර දෙස බලා කීවාය.

" හරි ඔය දෙන්නා තව ටිකක් ප්‍රැක්ටිස් කරන්නකෝ , දැන් ස්ටේජ් එකට ගිහින් එදාට කරනවා වගේම කරන්න පුළුවන්නම් ඕක ටිකක් කටපාඩම් කරගන්න . මං වුට්ටක් ඔෆිස් එකට ගිහින් එන්නම්. "එසේ කියමින් සමන්මලී ගුරුතුමිය පිටව ගියාය.

"සනු ඔයාට පොඩි දෙයක් පෙන්නන්න
තියෙනවා. ඇස් දෙක පියා ගන්නකො."ප්‍රවීන් මා දෙස බලමින් කීවේය.

මම ඔහුට අවනත වී දෙනෙත් පියා ගත්තෙමි.

එකවරම කාඩ්බෝඩ් බෑග් එකක් ඔහු මා අත තැබුවේය . මම ඇස් දෙක විවර කළෙමි.

" මොනවද ප්‍රවීන් මේ ..?"

" ඔයාම ඇරලා බලන්නකෝ ..."
ඔහු සතුටින් කීවේය.

මා එය විවර කර බලන විට අලංකාර රතු පැහැති දිලිසෙන දිග ගවුමක් ඒ තුළ තිබුණි.

" අනේ ඒක හරිම ලස්සනයි.තැන්ක් යූ ප්‍රවීන් ."
මම ඉහවහ ගිය සතුටින් යුතුව කීවෙමි.

"ඊයේ රෑ අපි ගෙදර යනකොට අම්මා කිව්වා ඔයාට ඕක ගමු කියලා. ඊට පස්සේ අපි කේ. සී .සී එකට ගිහින් ඔයාටයි මටයි සඳුදා වැඩේට ඕන කරන ඇඳුම් ගත්තා. "
ඔහු සතුටින් කීවේය.

" ඒක නෙවෙයි ඔයා කොහොමද අද මේක ඉස්කෝලෙට ගෙනාවේ ..?"
මම කුතුහලයෙන් මෙන් ඔහුගෙන් ඇසුවෙමි.

"ටිකක් අමාරු වුණා. මේ මොනවද කියල ගේට් එක ළඟදි ප්‍රිෆෙක්ට්ස්ලා ඇහුවා. මං ඇත්ත කිව්වට එයාලා පිළිගත්තේ නෑ. ඊට පස්සේ එතනට සමන්මලී ටීචර් ආවා. අම්මා ටීචර් කතා කරලා කියලා. ඒක නිසා අවුලක් උනේ නෑ."
ප්‍රවීන් කියා සිටියේය.

"අපි එහෙනම් ස්ටේජ් එකට ගිහින් පොඩ්ඩක් ප්‍රැක්ටිස් කරමු ." මම ඔහුට එසේ කියමින් වේදිකාව දෙසට ගියෙමි.

අපි ඒ වන විට හොඳින් පුහුණුවීම් කර සිටියෙමු.

" ස්නේහී ඔය දෙන්න ඔය වැඩේ ඉවර නම් මාත් එක්ක පොඩ්ඩක් එන්නකෝ , අනිත් වැඩසටහන් ගැනත් පොඩ්ඩක් බලන්න ."
සමන්මලී ගුරුතුමිය ආයාචනාත්මකව කීවාය.

අනෙකුත් වැඩසටහන්ද හොඳින් සංවිධානය කර තිබුණි.

ගුරු දිනය වෙනුවෙන් ගුරුවරියකගෙන් කියා සහාය ලැබුණේ සමන්මලී ගුරුතුමියගෙන් පමණයි.
එය එසේ විය යුතුයි මන්ද මේ කරන්නේ ගුරුවරුන් උදෙසා නිසා.
සවස් කාලයේ හිඳ අපි පුහුණුවීම් කළෙමු.

*****

සතිය හෙමින් හෙමින් ගෙවී ගියේය. තවත් සඳුදාවක් උදාවුණි. අද ලෝක ගුරු දිනය.

මම උදෑසනින්ම අවදි වී තාත්තා සමග පාසලට ගියෙමි.

ගුරු දිනයේ විවිධ අංග ඉදිරිපත් කරනා ළමුන්ව සැරසීම සඳහා එරන්දිගේ අක්කා පැමිණ සිටියාය.

මම පාසලට ගොස් සමන්මලී ගුරුතුමියව මුණගැසුණෙමි.

ඒත් සමගම ප්‍රවීන්ද එතැනට පැමිණියේය.

" ඔය දෙන්න දැන් චේන්ජ් කරගන්න එරන්දිගේ අක්කා ඇවිල්ල ඉන්නවා. එයාට කියලා ස්නේහි ඔයා පොඩි මේකප් එකක් දාගන්න කොණ්ඩෙත් හදාගන්න."
ගුරුතුමිය කීවාය.

"ඉන්පසු අපි වෙන වෙනම ගොස් සූදානම් වුණෙමු.

"අක්කී කොහොමද ඔයාට ...? මට ආරංචි වුණා ඔයා ආවා කියලා ,මට ඔයාගෙන් හෙල්ප් එකක් ඕනි." මම එරන්දිගේ අක්කාට කීවෙමි.

" ඕකේ නංගා මං ඔයාව ලස්සන කරලා ගන්නම්. ඔයා ඉතින් කොහොමත් ලස්සනයි නේ ."අක්කා කීවාය.

හිතුවාටත් වඩා ලස්සනට ඇය මාව සැරසුවාය. දිග කොණ්ඩය මෝස්තරයකට දමා,රතු දිග ගවුම ඇඳ මම අපූරුවට සිටියෙමි. ඒත් සමගම ප්‍රවීන්ද එතනට ආවේය.

"වාව් ලස්සනයි ඔය ඉන්නේ සුරංගනාවියක් වගේ. දැන් නම් හරිම ලස්සනයි සනු ." ඔහු කීවේය.

" තැන්ක් යූ ප්‍රවීන් ... ඔයත් ලස්සනයි. අපි එහෙනම් වැඩේ හොඳට කරමු ."

" අනේ දැන් ඔය ලස්සනට ඉන්නේ මගේ පැටව් දෙන්නා .. එහෙනම් හොඳට වැඩේ කරන්න."
සමන්මලී ගුරුතුමිය එතැනට පැමිණ කීවාය.

අපි දෙදෙනා හැකි උපරිමයෙන්ම නිවේදනය ඉදිරිපත් කළෙමු .
සියලු දෙනාම අපට සුභපැතුවෝය.

"ඔයාගේ වොයිස් එක නම් මාරම ලස්සනයි ප්‍රවීන් , ඒ කටහඬට වශී වෙනවා."
මම ප්‍රවීන් දෙස බලමින් කීවෙමි.

" ඔයා වශී වුණාද..?"
ඔහු ඔච්චමට මෙන් ඇසුවේය.

" සමහර විට " මම හොරැහින් බලා කීවෙමි.

" මං අද මගේ ෆෝන් එක ගෙනාවා අපි දෙන්නා ෆොටෝ එකක් ගහමුද ...?" ඔහු රහසින් මෙන් ඇසුවේය.

" හා මරු අදහස ගහමු එහෙනම් ..." මම කැමැත්තෙන් කීවෙමි.

අපි දෙදෙනා එකට වී ලස්සන ෆොටෝ එකක් ගැසුවෙමු.

"අර එරන්දිලත් මේ පැත්තට එනවා ." මම ප්‍රවීන්ට කීවෙමි.

"අනේ මල්ලි මං දැක්කා ඔයා ප්‍රෝග්‍රෑම් එක කරනවා. ලස්සනට වැඩේ කරා දෙන්නම . හුඟ දවසකින් ඔයාව දැක්කේ ."
එරන්දිගේ අක්කා ප්‍රවීන්ට කීවාය.

" අක්කි කොහොමද අපි ඔයාලාගේ ගෙදර එන්න හිටියේ ." ප්‍රවීන් ඇයට කීවේය.

"ආනේ අක්කි ඔයා ප්‍රවීන් අඳුරනවාද ...?"
මම විමතියෙන්නෝ අක්කාගෙන් ඇසුවෙමි.

"අනේ ඔයා දන්නැද්ද මං බඳින්නෙ මෙයාගේ අයියා දිනුත්තරව ."
එරන්දිගේ අක්කා සිනාසෙමින් කීවාය.

"ආනේ ඔව්ද ....? මට එරන්දිවත් ප්‍රවීන්වත් කිව්වෙ වත් නෑ. මං දැන් දන්නේ . ඒ කියන්නේ ඔයාලා නෑදෑයෝ වෙනවා." මම සතුටින් කීවෙමි.

"මං ඔයාට කිව්වේ අපේ අක්කා බඳින්නේ ඉන්නේ කියලා මං දන්නෑනෙ ඔයයි මගේ මස්සිනයි මෙච්චර හොඳ යාළුවෝ කියලා ."
එරන්දි මා දෙස බලමින් කීවා ය.

"ඒක නෙවෙයි නංගි ඔයයි අපේ නංගි තමයි මගේ දෙවෙනි මනමාලියෝ දෙන්නා ලෑස්ති වෙලා ඉන්න හොඳේ ...?"
එරන්දි ගේ අක්කා ප්‍රසාදි කීවාය.

" අනේ ශෝක් අක්කී ."මම සතුටින් කීවෙමි.

"නංගි අද අපේ අම්මා තාරුකා ඇන්ටිට කතා කරනවා කිව්වා.අද හවස ඔයාලා අපේ ගෙදර එන්න අද නැකැත් බලන්න යනවා. එහෙනම් අනිවාර්යයෙන් එන්න. දැන් අපි යනවා."
එසේ කියමින් එරන්දිත්, ප්‍රසාදි අක්කාත් පිටව ගියහ.

"සනූ මට නම් හිතා ගන්න බෑ. අයියා කිව්ව එයාගේ දෙවෙනි මනමාලයකුට මාව ගන්නවා කියලා. එතකොට අපි ඒක ගෑප් එකට සෙට් වෙනවා." ප්‍රවීන් සතුටින් කීවේය.

" අනේ මරු ."

" මං එහෙනම් යනවා චේන්ජ් කරගන්න.ඔයත් චේන්ජ් කරගන්න . දැන් තාත්තිත් එයිනේ ."
ප්‍රවීන් එසේ කියමින් මා හට සමුදුන්ණේය.

ඔහු දුරට ගොස් නැවත හැරී මෙසේ කීවේය.

"මැසේජ් එකක් දාන්න සනූ පරිස්සමෙන් යන්න බුදු සරණයි!"
මම ඔහුට අත වැනුවෙමි.

පසුව මම ඇඳුම් කාමරයට ගොස් ඇඳුම් මාරු කරගත්තෙමි.

" අනේ ඔයාලා හොඳට වැඩේ කළා හරිම ලස්සනයි පුතේ ,"
සමන්මලී ගුරුතුමිය සතුටින් කීවාය.

" තැන්ක්‍යූ ටීචර් ..."මම සතුටින් කීවෙමි.

මම ප්‍රධාන ශාලාව අස්කිරීමට උදව් කළෙමි.
වැඩ අවසන් වී මා යන විට තාත්ති ගේට්ටුව ළඟට ඇවිත් සිටියේය .

" තාත්තී ඔයා ඇවිල්ල ගොඩක් වෙලාද ..?"

" නෑ.. නෑ.. දැන් මං දැන් ආවා විතරයි. ඒක නෙවෙයි කොහොමද අද වැඩේ ..?"
තාත්ති ඇසුවේය.

" හොඳට කළා තාත්ති,හැමෝම හොඳ කිව්වා."

" එහෙනම් එච්චරයි මම කොහොමත් දන්නවනේ මගේ කෙල්ලගේ එනවුන්සින් ගැන , ඒක නෙවෙයි බබා අපි අම්මලාගේ හොස්පිටල් එක පැත්තට ගිහින් යමු . අම්මා එන්න කිව්වා."තාත්තා එසේ කියමින් වාහනය හැරෙව්වේය.

අපි අම්මලාගේ හොස්පිටල් එකට පැමිණියෙමු.

"ආ අර එන්නේ අම්මා"මම පැවසුවෙමි.

"ආ චූටි ඔයත් දැන් ද එන්නේ ,අපිට හැම සඳුදාම ස්ටුඩන්ට් ට්‍රේනින් නේ තියන්නේ , ඒ නිසා මේ ටයිම් එකට එන්න පුළුවන්."
අම්මා පැවසුවාය.

අම්මාව හා මාව නිවසින් බස්සවා තාත්තා නැවත ඔෆිස් එකට ගියේය
.
"චූටි මට අද උදේ එරන්දිලාගේ අම්මා කතා කළා. එයාලගේ අක්කගේ වෙඩින් එකලු,.බඳින්න ඉන්නේ ඩිලාන් අංකල්ගේ ලොකු පුතාවලු,ඔයාව දෙවනි මනමාලියෙකුට ගන්නවලු."

"ඔව් අම්මා මට ඉස්කෝලෙදි ප්‍රසාදි අක්කාව හම්බ වුණා එයා මට කිව්වා. ශෝක් නේද...?"

"තරංගි ඇන්ටියි, රූපිකා ඇන්ටියි අද නැකත් බලන්න යනවලු . ප්‍රසාදි අක්කි රෙදි බලන්න යනවලු මටත් එන්නලු සපෝට් එකක් දෙන්න එන්නලු."

" රූපිකා ඇන්ටි කිව්වේ එරන්දිලාගේ අම්මට නේද ...?"

" ඔව් අනේ එයා තමයි අපි හතර දෙනා ගිහින් එනකම් ඔයා එරන්දිලා ගෙදර ඉන්න සමහර විට ප්‍රවීනුත් එහෙට එයි"
අම්මා එසේ කියා කුස්සියට ගියාය.

මම කාමරයට ගොස් පිරිසිදු වී එරන්දිලාගේ ගෙදර යාමට සූදානම් වුණෙමි.

එකවරම මට ප්‍රවීන්ගෙන් කෙටි පණිවිඩයක් පැමිණියේය.

"ලස්සන බබෝ අද එරන්දිලගෙ ගෙදර එනවද..?"යනුවෙන් ප්‍රවීන් එවා තිබුණේය.

" මං නම් එනවා මොකක්ද ඒ බබෝ කොටස"
යනුවෙන් මම ඔහුට යැව්වෙමි .

"ඒක ඉතින් ආදරේටනේ කිව්වේ. අද ඉතින් සුරංගනාවියක් වගේ මාත් එක්ක ප්‍රෝග්‍රෑම් එක කරා නේ ..."ඔහු එවා තිබුණේය.

" එහෙමද...? එහෙනම් එරන්දිලාගේ ගෙදරදි හම්බවෙමු. බායි ප්‍රවීන් ..." එලෙස කෙටි පණිවිඩයක් යවා මං කුස්සියට ගියෙමි.

" මොනවද කුසුමා නැන්දේ ඔය හදන්නේ ..?"
මම ඇයගෙන් ඇසුවෙමි.

"ආ පුංචි බේබි .... මං මේ කිරිටොෆි ටිකක් හැදුවා. දැන් හදලා ඉවර වෙන්නත් ළඟයි. පුංචි බේබිගේ යාළුවාගේ ගෙදර ගෙනියන්න මයෙ හිතේ."

" එහෙමද කුසුම නැන්දා ,එහෙනම් ඔය වැඩේ කරන්න . අපේ අම්මව දැක්කද ...?"
මම කුතුහලයෙන් මෙන් ඇසුවෙමි.

" ලොකු නෝනා කාමරයේ ඇති මං හිතන්නේ ලෑස්ති වෙනවා ."
කුසුමා නැන්දා කිරිටොෆි එක බාන අතරේ කීවාය.

" හරි කුසුම නැන්දේ මං බලන්නම්." එසේ කියමින් මම අම්මලාගේ කාමරේට ගියෙමි.

"අම්මා ලෑස්ති වෙලා ඉවරද ..?" මම දොරට තට්ටු කරමින් ඇසුවෙමි.

"හරි චූටි මං ලෑස්ති ඔයත් රෙඩිනේ එහෙනම් අපි යමු ."
අම්මා කාමරයෙන් පිටතට පැමිණෙමින් කීවාය.

අම්මාගේ මෝටර් රථයෙන් අපි එරන්දිලාගේ ගෙදරට ගියෙමු. අප යන විටත් ප්‍රවීන් සහ තරංගි ඇන්ටී පැමිණ සිටියහ.

" අපි මේ ඔයාලා එනකම් මග බලාගෙන හිටියේ, අපි දැම්මම යමු නේද ඇවිල්ල තේ ටිකක් බොන්න පුලුවන්නෙ."රූපිකා ඇන්ටී කීවාය .

"හරි අපි යමු ... ආ මෙන්න රූපිකා අක්කේ ඔයාලට කිරි ටොෆී ගෙනවා."එසේ කියමින් අම්මා කිරිටොෆි පාර්සලය රූපිකා ඇන්ටිට දුන්නාය.

" අනේ ඕවා ගේනාවෙ ඇයි? කරදර වෙලානේ ඔයාලා ." රූපිකා ඇන්ටී කීවාය.

"ඔයාලා තුන්දෙනා පරිස්සමට ගෙට වෙලා ඉන්න.වැඩ ගොඩක් තියෙන නිසා අපි එන්න චුට්ටක් පරක්කු වෙයි. ප්‍රවීන් යාළුවෝ දෙන්නා බලාගන්න හොඳද ..?"තරංගී ඇන්ටි කීවාය.

ඉන් පසු අපේ අම්මාගේ මෝටර් රථයෙන් ඔවුහු පිටත් වුණහ.

"දැන් අපි මොනාද කරන්නේ අනේ ..." මම කම්මැලිකමෙන් ඇසුවෙමි.

"අපි තුන්දෙනා වැටි එකක් දාගෙන ඉමු. "
එරන්දී කීවාය.

" ඒකත් නරකම නෑ,"ප්‍රවීන් ඊට පිළිතුරු දුන්නේය.

"ඔයාලා දෙන්න කතා කර කර ඉන්න. අම්මා චොකලට් ශේක් හදලා තියලා ගියේ. මං අරන් එන්නම්. "
එසේ කියමින් එරන්දි කුස්සියට ගියාය.

" මං ඔයාට දෙයක් පෙන්වන්නද ...? එකවරම ප්‍රවීන් මගෙන් ඇසුවේය.
මා හිස වනා ඊට එකඟ වුණි.

ප්‍රවීන් ඔහුගේ ෆෝන් එක ගෙන තිරය ඔන් කළේය.

"අනේ ප්‍රවීන් ඔයා අපි දෙන්න  අද ගහපු ෆොටෝ එක වෝල්පේපර් දැම්මද අනේ වාව් එක හරිම ලස්සනයි ...."

" දැන් මට ෆෝන් එක ඔන් කරන වාරයක් ගානේ ඔයාගේ මුහුණ දකින්න පුළුවන්." ඔහු ඇසක් ඉඟි මරමින්  කීවේය.

" ළමයි මෙන්න ඔයාලට චොක්ලට් ශේක් ගෙනාව බොන්න .."
එසේ කියමින් එරන්දි උස චොක්ලට් ශේක් වීදුරු තුනක් මේසේ මත තැබුවා ය.

" අනේ තැන්කියූ එරන්දි ."මම ඇයට කීවෙමි.

"එහෙම තමයි කපල් එක වැටි කර කර ඉන්නකොට මොනවා හරි බොන්න දෙන එක මගේ යුතුකමනේ," එරන්දි සිනහසෙමින් කීවාය.

" මොකක්ද මොකක්ද ඒ කතාව කපල් එක ...? මේ හලෝ අපි දෙන්න යාළුවෝ විතරයි හොඳ ද?"
මම බොරු තරහක් මවමින් කීවෙමි.

" එහෙම වුණානම් හොඳයි  හැබැයි, ඔය දෙන්න මාර මැචින් ආ ... "එරන්දි අප දෙස බලමින් කීවා ය.

" අනාගතයේදී සලකා බලන්නම් නෑනේ " ප්‍රවීන් එරන්දිට කීවේය.

" මොකක් අනාගතයේදී සලකා බලන්නම් ඈ....?"මම විමතියෙන් මෙන් ප්‍රවීන්ගෙන් ඇසුවෙමි.

"ඔව් එහෙම වුණොත් මරු මගේ අක්කවයි නංගිවයි එකම ගෙදර අයියයි  මල්ලි මැරි කරද්දි ,"එරන්දී සිනහසෙමින් කීවාය .

"මං ඔයාව පස්සේ අල්ලගන්නම්කෝ අක්කේ…"මම එරන්දි ට විහිළුවට මෙන් කීවෙමි.

" සනූ,සොහාන් අයියා නිවාඩුවට ආවේ නැද්ද..?"ප්‍රවීන් මගෙන් ඇසුවේය.

"වීක් එන්ඩ් එකේ තමයි එන්නේ. මේ ළඟදි ඇවිල්ලා ගියේ . ගිය සතියේ කැම්පස් එකේ ෆන්ෂන් එකකුත් තිබ්බනෙ ." මම කීවෙමි.

"මේ දැන් අක්කාගේ වෙඩින් ඉන්න එකේ දෙවෙනි මනමාලයෙකුයි, මනමාලියකුයි  නම් හරි .ඔය දෙන්න එදාට එක කපල් එකක් මට තාම කෙනෙක් නෑනේ. "
එරන්දි දුක් මුසු මුහුණින් අප දෙස බලා කීවාය.

"අයියෝ බය වෙන්න එපා අපේ ලොකු අම්මගේ පුතා දෙවැනි මනමාලයාට ගන්නවා. ඔයාව එයා එයත් එක්ක දාන්නම් ."

" ආ එහෙමද හාකෝ. අපි එදාට බලමුකෝ ."

" මේ අපි තුන්දෙනා ෆොටෝ එකක් ගහමුද ..?" ප්‍රවීන් ඇසුවේය.

එයට එකඟ වී ඡායාරූපයක් ගත්තෙමු.

" ප්‍රවීන් ෆොටෝ ගහන්න ඔච්චර ආස ඇයි..?" එරන්දි ඔහුගෙන් ඇසුවාය.

"එහෙම විශේෂයක් කියලා නෑ.  ඒ වුණාට මේවා පස්සේ කාලෙක වටිනවා. එතකොට හොඳ මතක සටහන් . අනික මම ආසම සබ්ජෙක්ට් එක ෆොටෝ ග්‍රැෆි කියන්නේ.මං ෆොටෝ ෂූට් එහෙමත් කරනවා."

ප්‍රවීන් අපට පැවසුවේය.

" ඒකට නම් මාත් එකඟයි. පස්සේ දවසක ඕවා බලනකොට මාර විදියට වටිනවා."
මම එයට එකඟවෙමින් කීවෙමි.

" යාළුවනේ මට හොඳ අදහසක් ආවා මගේ ලැප් එකේ තියෙනවා අලුත් ආව හින්දි ෆිල්ම් එකක් අපි ඒක බලමු ."
එරන්දි සතුටින් කීවාය.

අපි චොකලට් ශේක් එක බොන ගමන් ෆිල්ම් එක බැලුවෙමු. ෆිල්ම් එක අවසාන කොටස යන විට අම්මලාද පැමිණියහ.

" ආ අම්මලා ආවද නැකත් හදාගත්තද කවදද දින දීලා තියෙන්නේ?"
එරන්දි රූපිකා ඇන්ටිගෙන් ඇසුවාය .

" මේ ඔක්තෝබර්නේ දෙසැම්බර් හොඳ දිනයක් නැල්ලු. ඒ නිසා නොවැම්බර් 2 දාට දින දා ගත්තා. තව මාසයක්වත් නැනෙ ,දැන් ඉතින් ලෑස්ති වෙන්න වෙයි. "
රූපිකා ඇන්ටි කීවාය.

"මේ තියෙන කාලෙ හොඳටම ඇති අක්කේ අපේ පවුල් තුනම එකතුවෙලා ඉක්මනින්ම වැඩ ටික කර ගමු. "අම්මා කීවාය.

"ඉන්න අම්මේ මං ඔයාලට තේ ටිකක් හදන්නම්."
එසේ කියමින් එරන්දි කුස්සියට ගියාය.

අපි එරන්දි පිටුපසින් කුස්සියට ගියෙමු.

"තව ටික දවසයි අපිට තියෙන්නේ මරු නේද.?
මම ඔවුන්ගෙන් ඇසුවෙමි.

"ඔව් මට නම් ඉවසිල්ලක් නෑ ." එරන්දී සතුටින් කීවාය.

එරන්දි අම්මලාට තේ හදා ගෙනවිත් දුන්නාය.
උත්සවයේ වැඩ කටයුතු සිදු කරන අන්දම ඔවුහු සාකච්ඡා කළහ.

අපි නිවසට යන විට සවස හත පමණ වුණි.

අප පැමිණ සුළු වෙලාවකට පසු තාත්තිත් පැමිණියේය.

" ප්‍රවීන් ඔයා මගේ ජීවිතයට අපූරු මතකයන් එකතු කරනවා. " ඔහු සමග කතාබස් කරන විට පෙර මතකයන් හිත තුළ ඇදෙයි.

ඔහු මගේ ජීවිතයට මෙතරම් ඉක්මනින් ළං වූයේ කෙසේ දැයි මට සිතාගත නොහැකි වුණි.
මම එසේ සිතමින් නින්දට ගියෙමි.

****

මම උදෑසනින්ම අවදි වී තාත්තිත් සමඟ පාසලට ගියෙමි.

පාසල ආරම්භ වී කාලපරිච්ඡේද හතරක්ම ගත වුණි ...

විවේක කාලයේ අපි කෑම ගැනීමට පාසලේ ආපනශාලාවට ගියෙමු.

"අර බලපන් මගේ පුංචි සුරංගනාවි එනවා. ඊයේ ස්ටේජ් එකේ හිටියේ බලපංකෝ ඒකිගේ ඇඟ ලස්සනයි නේ."

එකවරම ආපනශාලාව ඉදිරිපිට සිට හිරාන් හැමෝටම ඇහෙන්නට කෑ ගැසුවේය.

"මොකක්ද තමුසෙ කිව්වේ ,ආය මොනවා හරි කියල තිබ්බොත් බලා ගන්නම්. "
මම ඔරවමින් ඔහුට කීවෙමි.

හිරාන් කියූ දේ ඇසී ප්‍රවීන් හා ඔහුගේ යාළුවෝ ද එතැනට පැමිණියහ .

" හිරාන් පාඩුවේ ඉඳපන් ,කෙල්ලෙක්ට කතා කරන්නේ ඉගෙන ගනින් ඉස්සෙල්ලා ." ප්‍රවීන් සන්සුන්ව පැවසුවේය.

"ආ.. උබ මොනවද කියන්නේ පැත්තක ඉඳලා,ඊයේ මේකී එක්ක ස්ටේජ් එකේ හිටියා කියලා උඹ ලොකු නෑ හොඳේ ,මං උඹට කලින් මේකිගේ පස්සෙන් ගියේ. "හිරාන් කීවේය.

"මොකක් ද තෝ කිව්වේ ." යනුවෙන් කියමින් ප්‍රවීන් ඔහුගේ කනට වැරෙන් පහරක් එල්ල කළේය.

ඒ අතරේ මගේ ඇස් වලින් කඳුළු වැටුණි .මම දෙන්නාගේ රණ්ඩුව වැළැක්වීමට ගත් වෑයම අසාර්ථක විය.
ඔවුහු නොනවත්වාම රණ්ඩු කළහ.

ප්‍රවීන් ගැසූ පහරකට හිරාන්ට සිහිය නැති විය.

ප්‍රවීන් පහරදීම නතර කලද ගුරුවරුන් හා සිසුන් එහි වටවිය.

" මොනවද අනුත්තර මේ පොඩි ළමයි වගේ ගහගන්නේ , දැම්ම යමු ඔෆිස් එකට . අපි හිතුවේ නෑ ඔයා ඔහොම ළමයෙක් කියලා ." ගණිත අංශය බාර අජිත් සර් ප්‍රවීන්ව ඇදගෙන ගියේය.

ගුරුවරු එකතු වී හිරාන්ව රෝහල් ගත කළහ.

මම ප්‍රවීන්ව බැලීමට ඔෆිස් එක ළඟට ගියෙමි.

ගුරුවරු ඔහුව වට කරගෙන සිටියහ.

මට වාවාගත නොහැකි දුකක් දැනුණි.ඒ මා වෙනුවෙන් ඔහු හිරාන් සමග රණ්ඩු කළ හෙයිනි.

ප්‍රින්සිපල් සර් ප්‍රවීන්ගේ දෙමාපියන්ටද පැමිණෙන ලෙස පැවසුවේය.

ටික වේලාවකට පසු ඩිලාන් අංකල් සහ තරංගී ඇන්ටී පැමිණියහ.
තරංගි ඇන්ටි වෙනත් පාසලක විදුහල්පතිනියක් වීම නිසා ප්‍රින්සිපල් සර් සහ ගුරුවරුන් ප්‍රවීන්ට අවස්ථාවක් ලබා දුන්නේය.. මෙය ඔහු විසින් කළ පළමු වැරැද්ද නිසාත් හිරන්ගේ තත්ත්වය බරපතල නොවන නිසාත් ප්‍රවීන්ට සමාව ලැබුණි.

නමුත් මේ නිසා තරංගී ඇන්ටි කෝපයෙන් පසු වුණාය.

ඔවුහු පාසලෙන් නික්මුණහ.

"ඇයි අනේ ප්‍රවීන් ඔයා එයත් එක්ක රණ්ඩු කලේ ."
මම ඔහු දෙස බලමින් කීවේය.

"හරි සතු දැන් ඒ ප්‍රශ්නෙ ඉවරයි නේ , අනික ඔයාට කැත විදිහට බනිනකොට මට බලාගෙන ඉන්න පුළුවන්ද ? මං තව වෙලා හිටියනම් ඌව මරලා දානවා."
ප්‍රවීන් කේන්තියෙන් මෙන් කීවේය.

"අනේ ඔන්න ආයෙනම් ඔය වගේ රණ්ඩු බෑ. තේරුනානේ...?"
මම ඔහුගේ ඇඳුමේ ඇති දූවිලි පැල්ලමක් පිසදමින් කීවෙමි.

"මං ගෙදර ගිහින් කෝල් කරන්නම්. පරිස්සමෙන් ප්‍රවීන් ."
මම ඔහුට එසේ කියමින් පන්තියට ගියෙමි.

කාල පරිච්ඡේද හතරක් නොදැනීම ගත වුණි.
ප්‍රවීන් හිරාන් සමග ඇති කරගත් රණ්ඩුව පිළිබඳ නිතරම සිහි වුණි.
මම වෙනදා මෙන් තාත්තී සමඟ නිවසට පැමිණීමට පාසලෙන් පිටත් වුණෙමි.

" මොකද චූටි අද කතාවක්වත් නැත්තේ ...?"
මා මූණ එල්ලන් සිටීම නිසා තාත්ති ඇසුවේය.

හිරාන් මාහට කියූ දේ නොකියා මම සිදු වූ දේ තාත්තීට කීවේය.

"බලන්නකෝ මේ ළමයා කරගන්න වැඩ තරංගි කොහොමද ඕවට මුහුණ දෙන්නේ? අද නම් හොඳටම කේන්ති ගිහින් ඇත්තේ."

"ඔව් තාත්ති ඉස්කෝලෙනුත් ගියේ හරි කේන්තියෙන්. ප්‍රවීන්ට බනීද දන්නෑ."

" ඒකනේ ....හරි චූටි ඔයා එහෙනම් ගෙට වෙලා ඉන්න .අද නම් අම්මා එද්දි රෑ වෙයි. මං අම්මව එක්කගෙනම එන්නම් ." තාත්ති එසේ කියමින් පිටව ගියේය.

මම ගෙදරට ගොස් ඇඳුම් මාරු කිරීමට ප්‍රථම ප්‍රවීන්ට කෝල් කලෙමි.

"හෙලෝ ප්‍රවීන් ඔයාට ප්‍රශ්නයක් නෑ නේද ඔයාගේ අම්මට පොඩ්ඩක් දෙන්නකෝ..."

මම සිදුවුණු සියල්ල තරංගී ඇන්ටීට කීවෙමි.

හිරාන් පිළිබඳව අපගේ ගෙදර අයට නොකියන ලෙසත්, ප්‍රවීන්ට දඬුවම් නොකරන ලෙසත් ඉල්ලා සිටියෙමි.

මා කියූ දේ අසා තරංගි ඇන්ටි මදක් සන්සුන් වූවාය.

මම ප්‍රවීන් සමඟ ස්වල්ප වේලාවක් කතා කර ෆෝන් එක තැබුවෙමි.

මම නාන කාමරයට ගොස් හොඳින් නාගෙන පිරිසුදු වී ඇඳුමක් ඇඳ කුසුමා නැන්දා උයා තිබූ බත් කෑවෙමි.

ඒ අතර අම්මාගෙන් දුරකථන ඇමතුමක් පැමිණියාය .

"හෙලෝ බබා ඔයා ඉස්කෝලෙ ඇරලා ගෙදර ආවද ..?"

" ඔව් අම්මේ මං ඇවිල්ලා ටිකක් වෙලා"

" පුතේ අද ප්‍රවීන්ලගේ අයියා දිනුත්තරට ක්ලාස් නැලු නිවාඩුලු, ඒ නිසා අද ගෲප් එකේ ඔක්කොටම ඇඳුම් මහන්න දෙන්න යනවලු. වෑන් එකකලු යන්නේ, ඔයා ලෑස්ති වෙලා ඉන්න ගේ ගාවට එයාලා එයි."

" හා අම්මේ, මං ලෑස්ති වෙලා ඉන්නම්. මං තරංගී ඇන්ටිට  කතා කළා කිව්වෙ වත් නෑ."

 ටික වෙලාවකට පසු ප්‍රවීන්ලාගේ වෑන් එක අප නිවසේ ගේට්ටුව අසලට පැමිණියේය .....

ඒ වන විට මම ලෑස්ති වී සිටියෙමි.

"ආ නගින්න ඔයත් අපි යමු ඇඳුම් බලන්න." ප්‍රසාදි අක්කා කීවාය.

 වෑන්  රථයේ තවත් පුංචි නංගිලා දෙදෙනෙක් සහ මල්ලිලා දෙදෙනෙක් ද සිටියහ.

 එරන්දි, ප්‍රසාදි අක්කා ,දිනුත්තර අයියා, ප්‍රවීන් සහ ඔහුගේ ලොකු අම්මාගේ පුතා ද ඇවිත් සිටියහ.

" අද ඔන්න ගෲප් එකම ඉන්නවා." එරන්දී සතුටින් කීවාය.

"මොකෝ කතාවක්වත් නැත්තේ." ප්‍රවීන් මා දෙස බලමින් ඇසුවේය.

"නෑ නිකම් ඔයා කරපු වැඩේට කතා කරන්න නෙවෙයි වටින්නේ."

"අනේ සනූ ආය නම් ඕක ඇදලා ගන්න එපා ප්ලීස් .මට නම් එපා වෙනවා."

"හරි හරි සොරි ප්‍රවීන් මං ඇත්තනෙ කිව්වේ."

"එරන්දි මේ ඉන්නේ ක්‍රිශාන් අයියා අපට වඩා අවුරුද්දක් වැඩිමහල්."
ප්‍රවීන් එයාගේ ලොකු අම්මාගේ පුතාව එරන්දීට හඳුන්වා දෙමින් කීවේය.

ප්‍රවීන් ගැන මා හිතහිත තුළ පෙරදාක නොදැනුණු හැඟීම් ඉපදී තිබුණි.

ඒ මන්දැයි කියා මට සිතාගත නොහැකි වුණි.
අපි ඇඳුම් මසනා තැනට ගොස් මිනුම් ලබාදී එදිනට අවශ්‍ය කරන සපත්තු, කොණ්ඩෙට අවශ්‍ය කරන දේ මිලදී ගත්තෙමු.

අපි අවශ්‍ය කරන දේ රැගෙන නැවතත් වෑන් එකට පැමිණියෙමු.

"ප්‍රසාදි පව් අනේ මේ පොඩි හතර දෙනා ,මං ගිහින් කන්න මොනවාහරි අරගෙන එන්නම්."
 එසේ කියමින් දිනුත්තර අයියා අසල ඇති අවන්හලකට ගියේය.

 දිනුත්තර අයියා චිකන් රෝල්, ඩ්‍රම්ස්ටික් සහ ක්‍රීම් සෝඩා රැගෙන වී තිබුණි.

 අපි වෑන් එකේ සිට ආහාර ගත්තෙමු.

"අනතුරුව ඔවුහු මහනුවර වොන්ඩර් රිවර් හෝටලයට ගොස්  නොවැම්බර් 2දාට දින වෙන් කර ගත්තෝය.

" මට නම් හිතාගන්න බෑ. තව ටික දවසයි තියන්නේ වෙඩින් එකට."
එරන්දි සතුටින් කීවාය.

****

දවස් එකිනෙක ඉක්මනින් ගෙවිණි. සුපුරුදු පරිදි පාසලේ කටයුතු සිදුවිය.
අද නොවැම්බර් 1දා බ්‍රහස්පතින්දා, කාලය ඉක්මනින් ගතවුණු අන්දම කිසිවෙකුටත් සිතාගත නොහැකි විය.

"චූටි පුතේ අද අපි එරන්දිලා ගෙදර යනවා, හෙට ප්‍රසාදි අක්කිගේ වෙඩින් එකනේ. ඔයා මේ දවස් දෙකේ ඉස්කෝලෙ යන්න එපා. "

"ඔව් අම්මේ මාත් හිතන් හිටියේ අද ඉස්කෝලේ යන්නේ නෑ කියලා. "

"අපි දහයට විතර එහෙට යමු. එයාලට වැඩ ගොඩ ගැහිලා ඇති උදව් කරලා එමු."

"අම්මේ මට ප්‍රසාදි අක්කා කිව්වා අද රෑ එහෙ ඉන්න එන්න කියලා. මොකද පාන්දරම සැලොන් එකට යන්න එපැයි."

" එහෙනම් ඔයා තව ටිකකින් නාලා එහෙම ලෑස්ති වෙන්න.අපි එහෙට යමු."

"ආ ඒක නෙවෙයි අම්මේ,මං හෙට හවසට අඳින ඩ්‍රස් එකයි,අනිත් ඕන කරන දේවල් ටිකයි ලෑස්ති කරලා යන්නම්. ඔයාලා වෙඩින් එකට එනකොට ඒ ටිකත් අරගෙන එන්න."

" හා මං ගේන්නම් පුතේ. ඔයා ඇඳ උඩ තියලා යන්න."
අම්මා කාමරයෙන් එළියට යන අතරේ කීවාය.

හෙට නොවැම්බර් 2 ක හෙට ප්‍රසාදි අක්කිගේ වෙඩින් එක වගේම තවත් වැදගත් දෙයක් ඇත.එය නම් මගේ 19 වන උපන්දිනයයි.ඒත් තවම කිසිවෙකු එය මතක් කළේ නැත.

මම ඉක්මනින්ම නාගෙන ඇඳුමක් ඇඳගත්තෙමි. මා පහළට යනවිට පවුලේ සියලු දෙනා ආහාර ගැනීමට සූදානම්ව සිටියහ.

" අද තාත්තිට නිවාඩු ද ...?"
මම කෑම මේසේ පුටුවක වාඩි වෙමින් ඇසුවෙමි.

"අපි දෙන්නා දවස් හතරක්ම නිවාඩු දැම්මා. ප්‍රසාදි දුවගේ වෙඩින් එකනේ." තාත්ති කීවේය.

අපි හතර දෙනාම උදේ ආහාරය ගත්තෙමු.

" අයියා ඔයත් එනවද එරන්දිලාගේ ගෙදර...?"

" නෑ මමයි තාත්ති දිනුත්තර අයියලාගේ ගෙදර යනවා. ඩිලාන් අංකල් අපිට එහෙ එන්න කිව්වා
ඔයයි අම්මයි එරන්දිලා ගෙදර යන්න."

පැය භාගයකට පමණ පසු අපි සියලු දෙනාම නිවසින් පිටත් වුණෙමු.

අම්මාව හා මාව එරන්දිලා ගේ නිවසින් බස්සවා ඔවුහු ප්‍රවීන්ලාගේ ගෙදරට ගියහ.

" ආ...ඔයාලා ආවද ? ආව එක හොඳයි අපිට මේ වැඩ ගොඩගැහිලා ඉන්නේ." එරන්දි සිනාසෙමින් කීවාය.

"යමු යමු අපි උදව් කරන්නම්. ඔයා මොනවා කරන ගමන්ද හිටියේ?"

"දැන් තමයි වෙඩින් කේක් හදලා ඉවර වුණේ ඒවා පෙට්ටි වලට දාන ගමන් තමයි හිටියේ. උදව්වට නම් තව හතර පස් දෙනෙක් ඉන්නවා.
අපි දෙන්නා ඒ වැඩේ කරමු නේද..?"

" මට නම් ඕන දෙයක්."
මම එසේ කියමින් එරන්දී සමග කේක් හැසිරීමට ගියෙමි.

"මේ දැන් ඔයාට සප්‍රයිස් ඩාන්ස් එක හොඳටම පුළුවන් නේද..?"
එරන්දි මාගෙන් ඇසුවාය.

"ඔව් පුළුවන් අපේ ගෙදර ඉඳන් හොඳට ප්‍රැක්ටිස් කළානේ."

මම, ප්‍රවීන්, එරන්දී සහ ක්‍රිශාන් අයියා මංගල උත්සවයට හින්දි නර්තනයක් පුරුදු විය.

අද එරදිලාගේ ගෙදර නෑදෑයන්ගෙන් පිරී තිබුණි ...

අම්මලා එකතු වී කැවිලි සැකසුවහ.
ප්‍රසාදි අක්කිගේ මුහුණ සතුටින් පිරී තිබුණි.

"නංගිලා දෙන්නා පොඩ්ඩක් එන්න බඩුවක් පෙන්වන්න."
ප්‍රසාදි අක්කී අප දෙදෙනාට කතා කළාය.

"ඇයි අක්කී මොකද...?"
එරන්දි අක්කාගෙන් ඇසුවාය.

" මේ බලන්නකො අපේ ප්‍රී ෂූට් එකේ ෆොටෝස් ඇවිල්ලා."
එසේ කියමින් අක්කා ලැප් එකෙන් අපට ෆොටෝස් පෙන්නුවාය.

" වාව් අක්කී හරිම ලස්සනයි."මම අක්කීට කීවෙමි.

"අක්කි ඔයාලා දෙන්නගෙ ෆොටෝස් ගැහුවේ දිනුත්තර අයියාගේ යාළුවා නේද..?"
එරන්දි ඇසුවාය.

" ඔව් කසුන් මාලියද්ද කියන්නේ එයා තමයි. හොඳටම ෆොටෝස් ගහලා, හෙට වෙඩින් එකෙත් ෆොටෝස් ගන්නේ එයා තමයි."
ප්‍රසාදි අක්කී සතුටින් කීවාය.

" අද මං සැලොන් එකට යනවා අන්තිම ෆේෂල් එක කරන්න.ඔයාලත් එනවනම් එන්න."
ප්‍රසාදි අක්කී අපෙන් ඇසුවාය.

" අද බෑ අක්කී, පෙරේදා ගිහින් අපි දෙන්නගේ ෆේෂල් එක ඉවර කරානේ. ඔයා යන්න."

එරන්දි කීවාය.

" ස්නේහි මොකද කියන්නේ? යන්න එනවද..."
ප්‍රසාදි අක්කී ඇසුවාය.

"මං එහෙනම් ඔයාගේ තනියට එන්නම්."
මම ප්‍රසාදි අක්කිට බෑ කීමට නොහැකි නිසා කීවෙමි.

පසුව අපි සැලොන් එකට ගොස් පැයකට පමණ පසු ගෙදරට පැමිණියෙමු.

සවස හතට පමණ අපේ අම්මා හා තාත්ති ගෙදර ගියහ.

අයියා ප්‍රවීන්ලාගේ ගෙදර නැවතුණු බව තාත්ති කීවේය.

" ඔයාලා තුන්දෙනත් කලින් කාලා නිදාගන්න. පාන්දර දෙකට විතර සැලොන් එකට යන්න වෙනවනේ." නිහාල් අංකල් කීවේය.

" හරි තාත්ති,අපි කලින් නිදාගන්නම්."
ප්‍රසාදි අක්කී ඔහුට කීවාය.

නිහාල් අංකල් පැවසූ පරිදිම අපි කලින් රාත්‍රී ආහාර ගත්තෙමු.

ප්‍රසාදි අක්කී වීඩියෝ කෝල් එකක් ගෙන දිනුත්තර අයියාට කතා කළාය.

එරන්දි සින්දුවක් අසමින් නිදා ගත්තාය. මම දුරකථනය ගෙන ප්‍රවීන්ට කෙටි පණිවිඩයක් ඇමුවෙමි.

"ප්‍රවීන් ඔයා නිදිද..?"
මම ඔහුගෙන් ඇසුවෙමි.

"නෑ සනූ හෙට දවස එනකම් ඉවසිල්ලක් නෑ." ඔහු එසේ ඊට පිළිතුරු දුන්නේය.

ටික වේලාවක් මැසේජ් කර මම නිදා ගත්තෙමි.

****

"ළමයි නැගිටින්න පුතේ, දැන් වෙලාව පාන්දර එකයි."
රූපිකා ඇන්ටි ඇවිත් අපිව අවදි කළාය.

" කීයටද අම්මේ නැකත තියෙන්නේ..?"
ප්‍රසාදි අක්කී ඇසුවාය.

"පාන්දර 1.40 ට නැකත තියෙන්නේ. සැලොන් එකට 2.00 විතර වෙනකොට එන්න කිව්වනේ.දැන් තුන්දෙනා ලෑස්ති වෙන්න."
එසේ කියමින් ඇන්ටි කාමරයෙන් පිටව ගියාය.

මේ දවස එනකම් නොඉවසිල්ලෙන් බලාගෙන සිටි නිසා අපි තුන්දෙනාම ඉක්මනින්ම ලෑස්ති වුණෙමු.

රූපිකා ඇන්ටි තුන්දෙනාටම කිරිබත් කැව්වාය.
ප්‍රසාදි අක්කී බුදුන් වැද අනතුරුව සියල්ලන්ටම වැන්දාය.

අපි නැකතට ගෙදරින් පිටත් වුණෙමු.
නිහාල් අංකල් අපව රැගෙන යාමට මෝටර් රථය මිදුලට ගෙන ආවේය.

අපි සැලොන් එකට පැමිණියෙමු.

" ප්‍රසාදි මනමාලියක් වෙන්න ලෑස්තියි නේද..?" සැලොන් එකේ අක්කා විහිළුවට මෙන්න ඇසුවාය.

ප්‍රසාදි අක්කා ලැජ්ජාවෙන් මෙන් සිනාසුණේය.

අපිට ඇඳීමට තිබුණේ රෝස පාට ඔසරියක්ය.

සැලුන් එකේ තවත් අක්කලා දෙන්නෙක් මටත්, එරන්දීටත් අන්දවා අනතුරුව මේකප් කර, ආභරණ දමා,කොණ්ඩ මෝස්තරයක්ද ඇමුවෝය.

පාන්දර හතරට පමණ එරන්දිලාගේ ඥාති වූ අනිත් මල් කුමාරියන් දෙදෙනාද පැමිණියහ. අක්කා කෙනෙක් ඔවුන්ටද අන්දවා මේකප් කළාය.

ප්‍රසාදි අක්කීට සම්පූර්ණයෙන්ම මේකප් කර අවසන් වුණි.රූපිකා ඇන්ටි පැමිණ නැකතට තැල්ල තැබුවාය.

"වාව් දැන් නම් අක්කි මාරම ලස්සනයි." මම ප්‍රසාදි අක්කීට කීවෙමි.

පාන්දර 5.30 වන විට සියලු දෙනාම ඇඳගෙන අවසන් වුණි.

අපි පස්දෙනාගේම වෙනදා නැති අපූරු ලස්සනක් තිබුණි.
ඡායාරූප ගන්නා අයියා සැලුන් එකට පැමිණ අපි පස්දෙනාගේම ඡායාරූප ගත්තේය.

උදෑසන 6.00 ට පමණ මෝටර් රථයකින් අපව පේරාදෙණිය මල් වත්තට රැගෙන ගියහ.

තවත් මෝටර් රථයකින් දිනුත්තර අයියලාද පැමිණියහ.

රජ ඇඳුම ඇඳ ඔවුහු හැඩවී සිටියහ.

දිනුත්තර අයියා ප්‍රසාදි අක්කිව දැක සතුටින් සිනාසී ඇයව ආදරයෙන් වැළඳ ගත්තේය.
ඇය අද ලස්සනට සැරසී සිටියාය.

"අද නම් වෙනදට වඩා ලස්සනයි."
ප්‍රවීන් මා දෙස ඇසක් ඉඟි මරමින් කීවේය.

" මං විතරද ඔයත් ලස්සනයි."

නමුත් අද මාගේ උපන්දිනේ බව සියලුම දෙනාට අමතක වී තිබුණි.

අපි මල් වත්තේ සිට ඡායාරූප ගත්තෙමු. එක් අවස්ථාවක ඡායාරූප ගත් අයියා යුගල වශයෙන් ඡායාරූප ගනිද්දී මා හා ප්‍රවීන් මුහුණින් මුහුණ බලා ඡායාරූපයක් ද ගත්තේය.

අපි එකට වී ඡායාරූප කීපයක්ම ගත්තෙමු.

පසුව අප මෝටර් රථයෙන් හෝටලයට පැමිණියෙමු.

චාරිත්‍රවලට අනුව හෝටලයට ඇතුළු වී නැකැත් වෙලාවේදී පෝරුවේ චාරිත්‍ර සිදු කළහ.

අනතුරුව අපි උදෑසන ආහාර ගත්තෙමු.

මම මේ සෑම අවස්ථාවකදීම ප්‍රවීන් හා එකට සිටියෙමි.අප නිවසේ අයත් අද ලස්සනට පැමිණ සිටියහ.

" අනේ මගේ කෙල්ල අද හරිම ලස්සනයි."අම්මා සතුටින් කීවා ය.

" ඇත්තමයි සනු පැටියෝ,ඔයා අද ගොඩක් ලස්සනයි."
තරංගී ඇන්ටි මගේ මූණ අතගාමින් කීවාය.

" අම්මේ මගේ ඇඳුම් ටික ගෙනාව නේද .."මම අම්මාගෙන් ඇසුවෙමි.

" ඔව් ලේඩිස් රූම් එකේ තියෙනවා. පස්සේ ඇඳගන්න."අම්මා කීවාය.

ගෲප් එකක් වශයෙන් සිට කළයුතු චාරිත්‍ර අවසන් වුණි.

අප හතරදෙනා මේසයක වාඩි වී කතාබස් කරමින් සිටියහ.

"මෙච්චර හොඳ දවසෙත් ඇයි මූණ එල්ලගෙන ඉන්නේ."
එරන්දි ඔච්චමට මෙන් මාගෙන් ඇසුවාය.

" නෑ මොකුත් නෑ, කවුද මූණ එල්ලගෙන ඉන්නේ."

" ප්‍රවීන් අපි ගහපු ෆොටෝස් ටික අයියගේ යාළුවාගෙන් ඉල්ලා දෙන්න හොඳේ?"
ක්‍රිශාන් අයියා කීවේය.

" හා අයියේ,මං ඉල්ලලා දෙන්නම්."

" එරන්දි ඔන්න ඔයා නහයෙන් අඬ අඬා හිටියනේ හොඳ පාට්නර් කෙනෙක් නෑ කියලා, මේ ඉන්නේ දැන් හරිද ..?"
ප්‍රවීන් එරන්දිගෙන් ඇසුවේය.

" ආ දැන් හරි අපි දැන් හොඳ යාළුවෝ." එරන්දි සිනාසෙමින් කීවාය.

" වැඩේ අපි හිතුවටත් වඩා හොඳට වුණා නේද..?"මම ඔවුන්ගෙන් ඇසුවෙමි.

"තාම හරියටම ඉවර වුණේ නෑ,ඇයි අපේ ඩාන්ස් එක..?" ප්‍රවීන් සතුටින් කීවේය.

අපි දහවල් වන තෙක්ම කතාබහක යෙදී සිටියෙමු.
ප්‍රවීන් ඔහුගේ නෑදෑයන්ද අපට හඳුන්වා දුන්නේය.

"බබා දැන් දවල් කෑම කන වෙලාව කිට්ටුයි. ඔයාලා අක්කිත් එක්කම ඉන්න."
රූපිකා ඇන්ටී එරන්දීට කීවාය.

අපි ඔක්කොම එකතුවී කෑම මේසයේ එකට දහවල් ආහාර ගත්තෙමු.

පසුව අපි ඇඳුම් මාරු කර ගත්තෙමු. මම කහ පැහැති හින්දි ඇඳුමක් (මෙහෙන්ජා ඇඳුමක් )ඇඳ කොණ්ඩේ කඩා, ආභරණ පැළඳුවෙමි.

මා ඇන්ද ඇඳුමේම නිල් පැහති ඇඳුම එරන්දි ඇන්දාය.

" ආනේ ඔයාලා දෙන්නත් හින්දි විදිහටම කහයි, නිලුයි වලින් ඇන්දද..?" එරන්දී පුදුමයෙන් මෙන් ප්‍රවීන්ලාගෙන් ඇසුවාය.

"ඔව්,අපි දෙන්නා ඔයාලා මොන වගේ ඇඳුම් ද අදින්නේ කියලා ප්‍රසාදි අක්කිගෙන් ඇහුවා. එයා තමයි කිව්වේ."

අනතුරුව ප්‍රසාදි අක්කිලාද ඇඳුම් මාරු කළහ.
අප ඇන්ද ඇඳුම් වලට වඩා ටිකක් වෙනස් විදිහ ලස්සන හින්දි ඇඳුමක් ඇය ඇන්දාය.

ඉන් පසුව අපි හින්දි නර්තනයද ඉදිරිපත් කළෙමු.සියලු දෙනාම එය ලස්සනයි කියා පැවසුවෝය.පසුව අපි සියල්ලම නටමින් ගයමින් විනෝද වුණෝය.

එකවරම එරන්දි මා හට හෝටලයේ උද්‍යානයට කතා කළාය.

" ස්නේහි පොඩ්ඩක් එන්නකෝ"
ඇය එසේ කියමින් මාව එක්කගෙන ගොස් මාගේ ඇස් දෙක ගැට ගැසුවාය.

" මොකක්ද හලෝ මේ කරන්න
හදන්නේ..?"මම කුතුහලයෙන් මෙන් ඇසුවෙමි.

මට කිසිවක් සිතාගත නොහැකි විය.

"යමුකෝ" කියමින් ඇය මාව එක්කගෙන ගියාය.

අනතුරුව ඇස් බැඳ තිබූ පටිය ගැලෙව්වාය.

"හැපි බර්ත් ඩේ ස්නේහී ...හැමෝම එකවර කෑ ගැසුවෝය.
හෝටලයේ උද්‍යානයේ කෙළවර කහ පැහැති බැලූන් ආව් එකක් එල්ලා, මැද "හැපි බර්ත් ඩේ" යනුවෙන් ගසා, කහ පැහැයෙන් වටේම සරසා තිබුණි. මැද මේසයක දිලිසෙන කහ පැහැති රෙදි කැබැල්ලක් දමා ඒ මත විශාල කේක් එකක් තබා තිබුණි.

මුළු උද්‍යානයේම කහ පාටින් සරසා තිබුණි...

එහි වටේ අම්මා,තාත්තා,අයියා, ප්‍රවීන්, එරන්දි, ක්‍රිශාන් අයියා, තරංගී ඇන්ටී සහ ඩිලාන් අංකල් සිටියහ.
එරන්දී දිලිසෙන ස්නෝ ස්ප්‍රේ එකක් ගෙන මගේ ඇඟට ස්ප්‍රේ කළාය.

හැපි බර්ත් ඩේ මියුසික් එකක්ද දමා තිබුණි.

" අනේ ඔයාලා හැමෝටම තැන්ක් යූ" මාව පුදුම කලාට මම සතුටින් කීවෙමි.

" මේ අදහස ප්‍රවීන්ගේ එයාට තැන්ක්ස් කරන්න."අම්මා මා හට කීවාය.

"තැන්කියු ප්‍රවීන්." මම ඔහුට සතුට සිතින් යුතුව කීවෙමි.

ඔවුන් හැපි බර්ත් ඩේ සින්දුව කියන විට මම ඉටිපන්දම් නිවුවෙමි.

පසුව මම කේක් කපා හැමෝටම කැව්වෙමි.

පසුව ප්‍රවීන් හැර අනෙක් හැමෝම තෑගි දුන්නහ.තෑගි දී අනතුරුව වැඩිහිටියෝ එතනින් පිටව ගියෝය.

එතන ඉතුරු වූයේ මම, ප්‍රවීන්, එරන්දි හා ක්‍රිශාන් අයියා පමණයි.

එකවරම ප්‍රවීන් මා හට කහ පැහැති රෝස මලක් දුන්නේය.

"අයි ලව් යූ සනු මැණික"
මා නොසිතූ දෙයක් ඔහු කීවේය.

මා හට මෙය හීනයක් දැයි සිතාගත නොහැකි විය.

"ඔයා ඔය ඇත්තටමද ප්‍රවීන් කියන්නේ ..?"
මම සතුටින් ඔහුගෙන් ඇසුවෙමි.

" ඔව් මැණික ඇත්තටම මං ඔයාට කැමති, මං පොඩි කාලේ ඉදන් ආස ඔයා වගේ කෙල්ලෙක්ට."ප්‍රවීන් සතුටින් කීවේය.

"මාත් ඔයාට කැමතියි ප්‍රවීන්.." මම ඔහුව වැළඳ ගනිමින් කීවෙමි.

මා එසේ එකවරම ඔහුට කැමති වූයේ ඇයිදැයි මටම පුදුම සිතුණි.

" මං දැනං හිටියා ඔයා මට කැමති වෙනවා කියලා. ඉන්න මං ඔයාට තෑග්ගක් ගෙනාවා."
එසේ කියමින් ඔහු කුඩා දිලිසෙන පෙට්ටියක් අතට ගෙන මා අතට මා හට දුන්නේය.

මම එය විවර කර බැලුවෙමි.

" ප්‍රවීන් හරිම ලස්සන මාලයක්."
එය අපූරු රත්තරන් චේන් එකකි.

එහි පෙන්ඩන්ට් එකේ 'S'අකුර සහ 'P'අකුර හාට් එකක් මත කොටා තිබුණි.

ඔහු මාගේ බෙල්ලට ඒ මාලය දැම්මේය.

"ආ මේකත් ඔයාට,මේක ගෙදර ගිහින් බලන්න." ඔහු තවත් කහ පැහැති දිලිසෙන කොළයක ඔතා තිබූ ලොකු පෙට්ටියක් දුන්නේය.

"අනේ තැන්ක් යූ ප්‍රවීන් මේ හැමදේටම. මගේ හොඳම උපන්දිනේ මේක තමයි." මම සතුටින් කීවෙමි.

" ඔයා දැන් මගේනේ,මං ඔයාව හැමදාම සතුටින් තියන්නම්. කිසිම දුකක් නොදී ."
ඔහු ආදරයෙන් කීවේය.

" අන්තිමට මම කිව්ව දේ වුණා. මගේ අක්කවයි නංගිවයි එකම ගෙදර අයියයි මල්ලි පැහැර ගත්තා."
එරන්දි සතුටින් කීවාය.

මම සිනාසෙමින් ඇයවත් වැළඳ ගත්තෙමි.

" තැන්ක් යූ ඔයාලා මේ කරපු හැමදේටම."

"ඔයාලා දෙන්නගෙ ලස්සන ෆොටෝස් ගොඩක් මං ගත්තා."
ප්‍රවීන්ගේ කැමරාව අතැතිව ක්‍රිශාන් අයියා කීවේය.

" අනේ තැන්ක්යූ අයියා."ප්‍රවීන් සතුටින් කීවේය.

"අපි යමු නේද  හොටෙල් එක ඇතුළට" එරන්දි කීවාය.

අනතුරුව අපි හෝටලේට ගියෙමු.

වෙඩින් එකේ අවසානයට ළඟා වුණි. ප්‍රසාදි අක්කාත්, දිනුත්තර අයියාත් පිටව යාමට සූදානම් විය.ඔවුන් යන විට සියලූ දෙනාම හැඬුවෝය.

" වෙඩින් එකේ වැඩ ටික හොඳටම කෙරුණා නේද අක්කේ..?"
අපේ අම්මා රූපිකා ඇන්ටීට කීවාය..

"අනේ ඔව් නංගී." රූපිකා ඇන්ටී සතුටින් කීවාය.

"දැන් ඉතින් ආයේ තියෙන්නේ දෙවෙනි දවසේ වැඩ ටිකනේ ඒකත් ඔහොම්මම කරගමු." තරංගි ඇන්ටීද ඊට හවුල් වෙමින් කීවාය.

" මට නම් හිතා ගන්නවත් බෑ මං ඔයාට එකපාරම කැමති වුණා කියලා."

" මටත් තාම මේක හීනයක් වගේ."

අපි පැයකට පමණ පසු හෝටලයෙන් පිටව ඒමට සූදානම් වුණෙමු.
මම මට හමුවුණු සියලුම තෑගි කාර් එකට දාගත්තෙමි.

අනතුරුව ප්‍රවීන්ට හා එරන්දීට සමු දෙමින් අපි නිවසට පැමිණියෙමු.

මම ගෙදර ආ විගස තෑගි ටික කාමරයට රැගෙන ආවෙමි.පසුව මම නාන කාමයට ගොස්  ඇදුමක් ඇඳ ගත්තෙමි.මම සියල්ලන්ම දුන් තෑගි විවෘත කළෙමි.

ප්‍රවීන් මාලයක් චොක්ලට් පෙට්ටියක්, ටෙඩි බෙයා කෙනෙක් සහ අද උදෑසන අපි දෙදෙනා එකට හිඳගත් ඡායාරූපයක් ලොකු කරදී තිබුණි.

උපන්දින පාටියේ තෑගි ද මා නොසිතූ ලෙස ලැබුණි. මම ෆෝන් එක ගෙන ප්‍රවීන්ට කෙටි පණිවිඩයක් ඇමුවෙමි.

" බබා ඔයා ගෙදර ගියාද...?"

"ඔව් මැණික දැන් ඇවිත් ටිකක් වෙලා."

"ඔයා මොනවද කරන්නේ?"

"මං මේ තෑගි ටික බැලුවා තැන්ක් යූ සෝ මච් ප්‍රවීන්, ඔයා මං වෙනුවෙන් කරපු හැමදේටම."

" ඕක මොකක්ද ?මේ හෙට සෙනසුරාදනේ අපි පන්සල් යමුද ..?"

"මට නම් අවුලක් නෑ. එහෙනම් ගිහින් එමු."

"එහෙනම් හෙට හම්බවෙමු මැණික. මං උදේට කෝල් කරන්නම්. අපි හෙට හවස යමු."

" චූටි කෑම කන්න එන්න."
අම්මා පහළ සිට කතා කළාය.

" ආ ඉන්න අම්මා මං එනවා."
එසේ කියමින් මම පහළට ගියෙමි.

"තාත්ති අද මට තෑගි ගොඩක් හම්බවුණා."එසේ කියා මම හැමෝම දුන්න තෑගි ගැන ඔවුන්ට පැවසුවෙමි.

රාත්‍රී ආහාර ගෙන මම කලින්ම නින්දට ගියෙමි.

****

ලා හිරු එළිය ජනේලයෙන් පැමිණෙත්ම මම ඉක්මනින්ම අවදි වුණෙමි.
වෙලාව උදෑසන 6.40 යි.

මම අවදි වී පහළ මහලට ගියෙමි.

" අම්මේ ඔයා වැඩට යන්න ලෑස්තිද..?"

" මං දැන් යන්න යන්නේ. මං අනිත් නිවාඩුව හෙට ගන්නවා."

"තාත්ති වැඩට ගියාද ..?"

"නෑ තාත්ති අද නිවාඩු.අද තාත්ති ඔෆිස් එකේ යාළුවෙකුගේ ගෙදර යනවා. තව ටිකකින් තාත්තිත් යයි.."

" ආ එහෙමද අම්මා...?"

" මං එහෙනම් යනවා බබා. කුසුමා තේ හදලා ඇති බොන්න."

" ආ අම්මේ... මං අද හවසට ප්‍රවීන් එක්ක පන්සල් යනවා." මම කලබලයෙන් මෙන් අම්මාට කීවෙමි.

"ඇයි හදිසියේම හා හා කමක් නෑ.... ගිහින් එන්න හැබැයි පරිස්සමෙන්."

මම අම්මා වාහනයට නැගීමට පෙර ඇයට වැන්දෙමි.

අම්මා මෝටර් රථයෙන් පිටව ගියා ය.

ස්වල්ප වේලාවකට පසු තාත්තීද පිටව ගියේය.

"කුසුමා නැන්දේ ,තේ හදලද තියෙන්නේ." මම කුසුමා නැන්දාගෙන් ඇසුවෙමි.

"නෑ පුංචි බේබි.තේ නිවෙන නිසා මං හැදුවේ නෑ. ඉන්න මම හදලා දෙන්නම්."
ඇය තේ හදමින් කීවාය.

කුසුම නැන්දා තේ හැදූ පසු මම තේ සහ කේක් රැගෙන කාමරයට ගියෙමි.

"ප්‍රවීන්ට මැසේජ් එකක් දාලා බලන්න ඕනේ." මම එසේ සිතමින් ෆෝන් එක අතට ගත්තෙමි.

"ගුඩ් මොර්නින් මැණික." යනුවෙන් ඔහු කෙටි පණිවිඩයක් එවා තිබුණේය.

මම එයට පිළිතුරු නොදී ඔහුට දුරකථන ඇමතුමක් ලබාගෙන ඔහු සමග කතා කළෙමි.

මම පැය භාගයක් පමණ ඔහු සමග කතාකර අනතුරුව නාන කාමරයට ගියෙමි.

" ප්‍රවීන්ට මොනවා හරි දෙන්න ඕනි. එයා මට හැමදාම එක එක දේවල් දෙනවා. මං තාම එයාට මොකුත්ම දුන්නේ නෑ."
එසේ සිතමින් මම නගරයට යාමට සූදානම් වුණෙමි.

"කුසුමා නැන්දේ,මන් ටවුන් එකට ගිහින් එන්නම්."
මම නගරයට යාමට සූදානම් වී කුසුමා නැන්දාට කීවෙමි.

" හොඳයි පුංචි බේබි පරිස්සමෙන් ගිහින් එන්න. තුණුරුවන් සරණයි!" කුසුමා නැන්දා ආදරයෙන් මා හිස පිරිමදිමින් කීවාය.

අප නිවස නගරයට ආසන්නයෙන් පිහිටි නිසා පයින් වුවත් නගරයට යා හැකිය... බොහෝ කලකින් මහජන පුස්තකාලයට යාමට නොහැකි වූ නිසා මම පුස්තකාලයට ගොස් පොත් දෙකක් ලබාගෙන අනතුරුව බැංකුවට ගොස් රු. 25000ක් ලබා ගත්තෙමි.

පසුව නගරයේ වෙළඳසැලකින් ඔහුට තෑග්ගක් මිලදී ගත්තෙමි.එය ලස්සන දිලිසෙන පෙට්ටියක පාර්සල් කරගෙන එය රැගෙන මම නැවත නිවසට ගියෙමි......

උදෑසන කාලයේ ඉර හොඳින් පායා තිබුණි. මා යන විට කුසුමා නැන්දා මල් පැළ සුද්ද කරමින් සිටියාය.
" ආ පුංචි බේබි ගිහින් ආවද..? මං කෑම ලෑස්ති කරලා තියෙන්නේ කන්න." කුසුමා නැන්දා කීවාය.

"ඔව් කුසුමා නැන්දේ,ඒක නෙවෙයි අද දවල්ට මං කෑම හදන්නද..?"
මම කුසුමා නැන්දාගෙන් ඇසුවෙමි.

" අනේ ඒ මොකද පුංචි බේබී... මං හදන්නම්."
ඇයි කුතුහලයෙන් මෙන් කීවාය.

"නෑ නෑ එහෙම විශේෂයකට නෙමෙයි. මගෙ යාළුවෙකුට කෑම එකක් ගෙනියන්න ඕනි ඒකයි. අපි දෙන්නා විතරනේ, මං හදන්නම්.ඒක නෙවෙයි මෙන්න මං කුසුමා නැන්දට ඇඳුමක් ගෙනාවා. හොඳද බලන්නකෝ ඔය වැඩේ ඉවර කරලා.." මම ආදරයෙන් කීවෙමි.

"අනේ පුංචි බේබි ඕවා මොකටයි. ස්තුතියි පුංචි බේබිට." කුසුම නැන්දා සතුටින් කීවාය.

"ඒකට කමක් නෑ නැන්දේ,මං මේක මේසේ උඩ තියන්නම් .පස්සේ බලන්න." මම එසේ කියමින් නිවස තුළට පැමිණියෙමි.

මම ඇඳුම් මාරු කර ප්‍රවීන්ට රැගෙන යාම සඳහා ආහාර සැකසුවෙමි.

චිකන් කරි, ෆ්‍රයිඩ් රයිස් සහ තැම්බූ බිත්තර සමඟ කෑම පාර්සලයක් සෑදුවෙමි.
පසුව කප් කේක් ද සකසා කෑම පෙට්ටියක අසුරා ගත්තෙමි.

මම කෑම සකසන ආකාරය දෙස කුසුමා නැන්දා බලා සිටියාය.

"කුසුමා නැන්දේ, ඔයා වෙනදට මට කෑම හදල බෙදලා දෙනවනේ ..ඔන්න මං අද හැදුවා කාල බලන්න." මම පිඟානකට කෑම බෙදා කුසුමා නැන්දාට දෙමින් කීවෙමි.

"අනේ පුංචි බේබි මෙහෙම හොඳද මන්දා...?"
කුසුම නැන්දා ආයාචනාත්මකව කීවාය.

කුසුමා නැන්දාට කෑම බෙදා දී මම කෑම කෑවෙමි ....

සවස 3.00 ට පමණ මම පන්සලට රැගෙන යාම සඳහා සුදු පිච්චමල් වට්ටියක් කැඩුවෙමි.

තෙල් ,තිර,හඳුන් කූරු හා ගිලන්පස ද සූදානම් කර ගත්තෙමි.

සවස 4.00ට පමණ මම සුදු අත් දිග ගවුමක් ඇඳ ප්‍රවීන් දුන් මාලයද දමාගෙන කණ්නාඩියෙන් කිහිප වරක් ම හැඩ බැලුවෙමි.

ප්‍රවීන්ට සූදානම් කරගත් කෑම පාර්සලයද, පන්සලට රැගෙන යන පූජා ද්‍රව්‍ය හා ප්‍රවීන්ට ගත් රැගෙන මම පහළ තට්ටුවට පෙර කිසිදාක නොවූ සතුටින් පැමිණියෙමි.

"පුංචි බේබි පන්සල් යන්නද..?"

"ඔව් නැන්දේ මං ගිහින් එන්නම්."
මම එසේ කියමින් නිවසෙන් පිටව ගියෙමි.

අනතුරුව මම ප්‍රවීන්ට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

ඔහු ඒ වන විටත් පන්සලට පැමිණ ඇති බව පැවසුවේය.මම පයින්ම පන්සල වෙත ගියෙමි.

" ආ සනූ එන්න. කොහොමද ඉතින් මගේ මැණිකට ..?"ප්‍රවීන් මා දෙසට එමින් කීවේය.

" මං හොඳින් ඉන්නවා,අපි ඇතුලට යමුකෝ මට ඔයාට දෙන්න දේවල් ගොඩක් තියෙනවා."
මම සතුටින් කීවෙමි.

අපි රටාවකට මළුව ඇමද මල් පූජා කළෙමු.
ප්‍රාර්ථනා බොහොමයක් හිත තුළ රඳවා ගෙන පහන් පත්තු කළෙමු.
පසුව ගාථා කියා බුදුන් වැන්දෙමු.ප්‍රවීන් සමග මෙලෙස කාලය ගත කිරීම මගේ සිතට සතුටක් කැදවිය.

පසුව අපි පන්සලේ වැලි මළුවේ කොනක වාඩි වුණෙමු.

"ආ මෙන්න ඔයා හැමදාම මට තෑගි දෙනවනේ, අද මං ඔයාට තෑග්ගක් ගත්තා."
මම ගෙනාපු තෑගි ප්‍රවීන්ට දෙන අතරේ කීවෙමි.

"මේ මොනවද සුවදේ බෑ..."
ඔහු කෑම පාර්සලය අතට ගනිමින් ඇසුවේය.

"ඔය බත් එකක් ...මං හැදුවේ ,කප් කේකුත් තියනවා."

"බොරු කියන්න එපා කුසුමා නැන්දා වෙන්නැති උයන්න ඇත්තේ..."

"නෑ... නෑ... මං කුසුම නැන්දට උයන්න එපා කියලා මමමයි හැදුවේ. ගෙදර ගිහින් කාලා බලන්න."

" හා මං කන්නම් තැන්ක් යූ බබා.. මේ ඒක නෙවෙයි මට හිතෙනවා අපේ අම්මට කියන්න අපේ එෆෙයා එක ගැන."

"දැම්ම එපා නේද ..?අපි එෆෙයා එක පටන් ගත්තේ ඊයෙනේ, තව ටික කාලයක් ඉඳලා කියමු."

" හැබැයි අම්මලා අකමැති වෙන එකක් නෑ, ඔයා දන්නවද අපි ඔයාලගේ ගෙදර ඩිනර් වලට ආපු දවසේ අපේ අම්මා විහිළුවට වගේ කියනවා ඔයාවගේ ලේලි කෙනෙක් ලැබුණ නම් කොච්චර හොඳද කියලා.."

" අනේ බොරු කියන්න එපා."

" නෑ නෑ ඇත්තටම කිව්වා. පන්සලේ ඉඳන් බොරු කියන්නෙ මොකටද..?"

" එහෙමද ඒ වුණාට කමක් නෑ ...දැම්ම කියන්න එපා."

" මේ අයියගෙ වෙඩින් එකේ ෆොටෝස් ඇවිල්ලා. මම ඔයයි මමයි ඉන්න ඒවා තෝරගෙන ෆෝන් එකට ගත්තා. මම ඔයාට එවන්නම්."

"අනේ මරු මට පස්සේ එවන්න. මගේ බර්ත් ඩේ පාටි එකේ ඒවත් එවන්න.මේ ඒක නෙවෙයි මං ඔයාට කියන්න හිටියේ A/L එක්සෑම් එක තව ටික කාලයයිනේ, අපි එක්සෑම් එක ඉවර වෙනකම් වැඩිය හම්බවෙන්නේ නැතුව කෝල් මැසේජ් විතරක් කරමු."

" අනේ ඉතින් ඇයි ඒ..?"

" මං දන්නවා අපේ එෆෙයා එක පටන් ගත්ත විතරයි කියලා ,ඒත් එක්සෑම් එක ගොඩ දාන්න ඕනි ප්‍රවීන්, තව මාස හයක් විතරනේ තියෙන්නේ."

"හරි මැණික මට ඔයා කියන දේ තේරෙනවා. අපි එක්සෑම් ඉවර වුණාම හම්බවෙමු. හැබැයි මට කෝල් කරන්න ඕන හොඳේ..?"

අපි දෙදෙනා බොහෝ වෙලාවක් කතා කරමින් සිටියෙමු.

"දැන් හවස් වුණානේ මං ඔයාව ගිහින් දාන්නම්."

" ඔයා මොකේද ආවේ?"

" මං ආවේ මගේ බයික් එකේ.මං මේ බව දන්න නිසා තව හෙල්මට් එකක් ගෙනාවා යමු .."

ඔහුගේ බයික් එකේ පිටුපස යාම ඉතා විනෝදජනක වුණි.

ඔහු මාව නිවසේ ගේට්ටුව අසලින් බැස්සුවේය.

" පරිස්සමින් යන්න බුදු සරණයි මැණික." ඔහු මා හිස ආදරයෙන් බලමින් කීවේය.

"ඔයත් පරිස්සමෙන් යන්න ... බුදු සරණයි! හෙට ඔයාලගේ ගෙදර අපි එනවා."

මම එසේ කියමින් ඔහුට සමුදී නිවසට පැමිණියෙමි.

මා යන විටත් අම්මා හා තාත්තා නිවසට පැමිණ සිටියේ නැහැ.
මම ඇඳුම් මාරු කර ටිකක් නිදාගත්තෙමි.

*****

"චූටි බබා මොකද සනීප නැද්ද..?"
අම්මා කාමරයේ විදුලි බල්බය ඔන් කරමින් ඇසුවාය.

" නෑ අම්මේ එහෙම අසනීපයක් නෑ. මට ටිකක් නින්ද ගියා."
මම අම්මාට තුරුල් වෙමින් කීවෙමි.

"මම බය වුණා උණක්වත් හැදිලද කියලා."

"අම්මා දැන්ද ආවේ..?"

" මායි තාත්ති දැන් ඇවිල්ලා ටිකක් වෙලා. මං වොෂ් එකක් දාගෙන උඩට ආවේ ඔයා මොනවද කරන්නේ බලන්න. ඒක නෙවෙයි අද ප්‍රවීන් එක්ක පන්සල් ගියාද ..?"

"ඔව් ගියා අම්මේ,එයා එක්කම ගෙදරට ආවා."

"ආ එහෙමද..? ඔය දෙන්න තනියමද හිටියෙ? තරංගී ඇන්ටිලා ආවේ නැද්ද ?"

" නෑ අම්මේ  එයා තනියම ආවේ. මං එයාට බත් එකක් අරගෙන ගියා.."

"හා ඒක හොඳයි.මේ හෙට එයාලගේ ගෙදර යන්න ඇඳුම් ටික ලෑස්ති කර ගන්න. උදෙන්ම යන්න ඕනෙනේ.හෙට දෙවැනි දවසනේ."
අම්මා කාමරයෙන් පිටවෙමින් කීවාය.

මම පසුදා උදෑසන ඇඳගෙන යන කළු පැහැති පාටි ගවුම සූදානම් කරගෙන රාත්‍රී ආහාර ගෙන කලින්ම  නිදා ගත්තෙමි.
****
පසුදා උදෑසන අපි සියලු දෙනාම ප්‍රවීන්ලාගේ නිවසට ගියෙමු.

වෙඩින් එකේ දෙවැනි දවසේ කටයුතු හොඳින් සිදුවිණි. මම ප්‍රවීන් හා එරන්දි සමඟ දවසම කටයුතු කළෙමි.

"බබා දැන්  තව ටිකක් වැඩිපුරම එක්සෑම් එකට මහන්සි වෙන්න. මේ ටිකේම එක එක වැඩ.හෙට ඉඳලා පොඩ්ඩක් කලින් කරගෙන ආවා වගේ වැඩ කරන්න." තාත්ති කීවේය.

"ඔව් තාත්ති මං එරන්දිලාටත්  කිව්වේ නට නටා ඉන්න එක පොඩ්ඩක් නවත්තලා වැඩ කරමු කියලා."

" දැන් මේ දවස් දෙක තුනේ ක්ලාස්වත් ගියේ නෑනේ,ඒවා හරියට  කර ගන්න වුටි." කෑම කන අතරේ අම්මා කීවාය.

මම රාත්‍රී ආහාර ගෙන පසුදා පාසල් යාමට ඇඳුම් සූදානම් කර ගත්තෙමි. පසුව මම බ්‍රහස්පතින්දා සහ සිකුරාදා අතපසු වූ පාඩම් යාළුවෙකුට කියා ගෙන්වාගෙන සම්පූර්ණ කළ ගත්තෙමි.
*****
මම පසුදා පාන්දර 3.00 ට අවදි වී උදෑසන 6.00 වන තෙක් පාඩම් කටයුතු කළෙමි.

මම පාසලේ වැඩ කටයුතුවලට වැඩි අවධානයක් යොමු කළෙමි.පාසලේ සුපුරුදු පරිදි අධ්‍යාපන කටයුතු සිදු කළෙමි.

දවසේ පැය භාගයක් ප්‍රවීන් වෙනුවෙන් වෙන් කළෙමි.
*****
සැඩ මාරුතයක් සේ කාලය ගතවුණු අන්දම කිසිවෙකුට සිතාගත නොහැකි විය.
මාස හයක් ගෙවී අවසන්ය.
තරඟකාරී අධ්‍යාපන රටාවේ විශිෂ්ට කඩයිම වන A/L  විභාගය සඳහා තව ඇත්තේ සති තුනක් පමණි.

" පුතේ, අද ඉස්කෝලේ යන්න නැද්ද..?"  අම්මා කාමරයට පැමිණ ඇසුවාය.

" නෑ අම්මේ විෂයන් 3ම උගන්නලා ඉවරයි. දැන් මේ ටිකේ ඉස්කෝලේ ගියා කියලා තේරුමක් නෑ. අද අපේ ලොජික් ක්ලාස් එකේ සෙමිනා එකක් තියෙනවා ඒකට යනවා."

"කීයටද ඒක පටන් ගන්නේ."

" ක්ලාස් එක 10.00  වෙනකොට පටන් ගන්නවා. I.C.T  ක්ලාස් එකයි මීඩියා ක්ලාස් එකයි අනිද්දට තියෙන්නේ. අන්තිම සතිය වෙනකන් දිගටම ඒ ක්ලාස් තමයි."

"හා හා ඔයා වෝෂ් එකක් දාගෙන පහළට එන්න. මාත් තව  ටිකෙන් වැඩට යනවා."

උදෑසන 6.30 වන විට මා පිරිසුදු වී ආහාර ගත්තෙමි. උදේ 7.00 සිට 9.00 දක්වා නැවත පාඩම් කටයුතු සිදු කර පන්ති යාමට සූදානම් විය.මා පන්තියට යාම සඳහා නිවසින් එළියට බසිත්ම මෝටර් බයිසිකලයක් ගේට්ටු අසල නතර කර තිබුණි.

" ප්‍රවීන් ඇයි ඔයා නොකියා ම ආවේ..?" මම කුතුහලයෙන් මෙන් ඇසුවෙමි.

"මං ඉතින් ආවා ඔයාට අද ක්ලාස් නේ, ක්ලාස් එකට ගිහින් දාන්න ."

"අනේ මන්ද ඔයා නම් මට යන්න පුළුවන්. ඔයා දැන් මාව ගිහින් දානවා  ක්ලාස් එකේ ළමයි දැක්කොත්  එක එක ඒවා කියයි."

"අනේ කියන එකේ කියන දෙයක් කියපු දෙන් ඔයා නගින්නකෝ බයික් එකට."

පසුව ඔහු මාව පන්තිය අසලටම ගෙනවිත් බැසුවේය.

" ඔයාට අද ක්ලාස් නැද්ද..?" මම බයිසිකලයෙන් බැස හෙල්මට් එක ගලවන අතරේ ඇසුවෙමි.

" මට ක්ලාස් තියෙන්නෙ 11.00ට මං ක්ලාස් එකට යන්නම ලෑස්ති වෙලා ආවේ."

"හරි එහෙනම් මම යනවා. බුදු සරණයි!" මම ප්‍රවීන්ට අත වනමින් කීවෙමි.

*****

දවසින් දවස අපගේ විභාගයට දින ලං වුණි.මම වෙනදාටත් වඩා හොඳින් පාඩම් කටයුතු අවසන් කළෙමි.

හෙට උදෑසන විභාගයට මුහුණ දීමට සිදුවීම නිසා මා හට පුංචි බියකුත් තිබුණි.

"බබා දැන් ඔයා පාඩම් වැඩ ටික කරලා ඉවරයි නේ කලින් කාලා නිදාගන්න."
හවස 7.00 ට පමණ අම්මා මාගේ පොත් මේසය අසලට පැමිණ කීවාය.

"මං රෙදි ටික ලෑස්ති කරගන්න ඕනි."

" ආ මං රෙදි ටික හදලා දෙන්නම්. එන්න දැන් කන්න. කාලා නිදාගන්න."
මම කලින්ම රාත්‍රී ආහාර ගෙන ඇඳට පැමිණ දුරකථනය ගෙන ප්‍රවීන්ට ඇමතුමක් ලබා ගත්තෙමි. ඔහුට පසු දින හොඳින් විභාග ලියන ලෙස පවසා දුරකථනය තබා නිදා ගත්තෙමි.

*****

උදෑසන 4.00 ට පමණ අවදි වී නැවත වාරයක් පාඩම් කළෙමි.

A/L විභාගයට පළමුවර ඉදිරිපත් වන නිසා පුංචි බියක්ද සිත තුළ විය.
අපි උදෑසන 6.46 ට පමණ පන්සලෙන් සකසා දුන් නැකතට අනුව නිවසින් පිටත් වුණෙමු.

තාත්තී හා අම්මා සමග මම පන්සලට ගොස් පාසල වෙතට ගියෙමි.

"විභාගය හොඳින් ලියන්න මැණික. බුදු සරණයි!"
අම්මා මාගේ හිස සිඹ කීවාය.

මම අම්මාට හා තාත්තාට වැඳ පාසලට ඇතුල් වුණෙමි.

උදෑසන 8.30 ට පමණ ශාලාධිපතිතුමා අපට ප්‍රශ්න පත්‍ර බෙදුවේය.
පාඩම් කළ දේවල් පැමිණ තිබූ නිසා තර්ක ශාස්ත්‍රය පේපරය සතුටින් ලිව්වෙමි.

පසුව ශාලාධිපති පැමිණ පේපර් එකතු කළේය.

" කොහොමද ලේසිද පේපරේ ..?
විභාග ශාලාවෙන් එළියට එන අතරේ එරන්දි ඇසුවාය.

"අවුලක් නෑ බං ගොඩක් තිබුණේ දන්නේ ඒවා. ඔයාට කොහොමද පේපරේ?"

" ඇත්තම කිව්වත් මට අමාරුයි"

"වැඩිය හිතන්න එපා."

****

මම නිවසට පැමිණ ප්‍රවීන්ට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

"ඔයාට කොහොමද එක්සෑම්..?"

" ප්‍රශ්නයක් නෑ ටිකක් ලේසී. ඔයාට කොහොමද..?"

" මටත් අවුලක් නෑ ගොඩදාගත්තා."

විභාගය ඉතිරි විෂයන් දෙක සහ පොදු පරීක්ෂණයටද මම හොඳින් මුහුණ දුන්නෙමි.

විභාගයේ අවසාන දිනයේ යහළුවන් එකතු වී කුඩා උත්සවයක් සංවිධානය කර තිබුණි.
මම විභාගය අවසන් වී සතුටින් නිවසට පැමිණියෙමි.අම්මා අද නිවාඩු දා තිබුණාය.

" මූණෙ තියෙන සතුට විභාග ඉවර වුණාම."

" ඔව් අම්මේ හිතේ තිබුණු ලොකු බරක් නිදහස් වුණා."

මම කාමරයට ගොස් දිය නා ඇඳුම් මාරු කර ෆෝන් එක ගෙන ප්‍රවීන්ට කතා කළෙමි.

" මගේ කෙල්ලේ දැන්නම් ඔන්න එක්සෑම් ඉවරයි. දැන් නම් අපි දෙන්නට එකට ඉන්න පුළුවන්."

" ඔව් ඔව් ඒක ඇත්ත දැන්මම ඔයා ළඟට එන්න හිතෙනවා."

" ඉතින් අපේ ගෙදර එන්න අම්මා එක්ක. අපේ අම්මත් ඉන්නවනේ."

" හා මං අම්මට අදහස දාලා බලන්නම්.අන්න අම්මා කතා කරනවා මං තියෙනව එහෙනම්."

මම ඔහුට එසේ කියා දුරකථනය තබා පහළට ගියෙමි.

"එන්න කෑම කන්න මං ඒකට කතා කළේ."

" ඒක නෙමෙයි අම්මා අපි තරංගි ඇන්ටිලාගේ ගෙවල් පැත්තෙ ගිහින්ද එමුද ?අම්මටත් අද නිවාඩු නේ?"

" අදහස නරකම නෑ. හැබැයි තරංගි ඇන්ටි ගෙදර ඉන්නවද දන්නේ නෑ."

" ගෙදර ඇති අම්මේ මේ පාර ප්‍රවීන් නිසා ඇන්ටිට එක්සෑම් ඩියුටි නෑ නේ."

" ඉන්න මං එහෙනම් කෝල් කරලා අහල බලන්නම්."
එසේ කියමින් අම්මා කාමරේට ගියාය.

" බබා ඔයා කාලා ලෑස්ති වෙන්න එහෙනම් තරංගි ඇන්ටි එන්න කිව්වා."

මම සතුටින් කාමරේට ගොස් තරංගි ඇන්ටි උපන්දිනේට දුන් ගවුම ඇඳ, ප්‍රවීන් දුන් මාලය දමා, කොණ්ඩේ උඩට කර පීරා සූදානම් වුණෙමි.

" ෂා... ඔය තරංගී ඇන්ටි දුන්න ගවුම නේද..?"

" ඔව් අම්මා ඒක තමයි."

"ලස්සනයි ඒක ඔයාට හරි හැඩයි." අම්මා සූදානම් වී පාවහන් පළඳමින් කීවාය.

"යමු නේද එහෙනම්." අම්මා එසේ කියමින් මෝටර් රථයට නැග එය පණ ගැන්වූවාය.
අපි ප්‍රවීන්ලාගේ නිවසට ගියෙමු.

" අනේ මගේ කෙල්ල මං දුන්න ගවුම ඇඳලා ලස්සනේ බෑ."අපි ගිය ගමන්ම මා බදාගෙන තරංගී ඇන්ටී සතුටින් කීවාය.

අම්මා තරංගී ඇන්ටිලාට රැගෙනා කේක් පාර්සලය මේසය මත තැබුවාය.

" කෝ පුතාලා නැද්ද තරංගි...?"

" අනේ අද තමයි ලොකු පුතයි,ප්‍රසාදි දුවයි ගම්පොළ ගෙදර පදිංචියට ගියේ. චූටි පුතා නම් ඉන්නවා. ඉන්න මං කතා කරන්නම්."

තරංගී ඇන්ටී කතා කිරීමට පෙරම ප්‍රවීන් කාමරයෙන් පිටතට පැමිණියේය.

ඔහු අපේ අම්මාට වැන්දේය.

" සනූ කිව්වෙවත් නෑ එනවා කියලා." ඔහු අසුනකට බර වෙමින් පැවසුවේය.

" අපිට හිතුණා. දෙගොල්ලොන්ටම නිවාඩු නිසා ඇවිත් යන්න." අම්මා කීවාය.

"මම ඔයාලට බොන්න මොනවා හරි රෙඩි කරන්නම්. තාරු ,එන්න මාත් එක්ක කිචන් එකට යං. මේ දෙන්නා කතා කර කර ඉදී ."

අනතුරුව ඔවුහු කුස්සියට ගියහ.

"කොහොම හරි මාව බලන්න ආවා එහෙනම්."

" ඔව් ඉතින් ඔයාගෙනෙ අයිඩියා එක."

"මගේ සුදූ මැණික ලස්සනේ බෑ දැන් තවත් ලස්සන වෙලා.."

" ආ එහෙමද කොල්ලෝ,බොරු නොකියා ඉන්න. දැන් එක්සෑම් එකක් ඉවරනේ, මොකක් හරි හොබි එකක් හොයාගන්න ඕනේ."

" ඔයා පොත් කියවන්න ආසද..?"

" ඔව් අනේ මං නවල් කියවන්න මාරම ආසයි."

"එන්නකො එහෙනම්. මේ බලන්න අපේ අම්මා ගාව පොඩි පුස්තකාලයක් තියෙනවා."
ඔහු නිවසේ තිබූ පොත් කාමරේ පෙන්වමින් කීවේය.

"රාක්ක පිරෙන්නම පොත් තියෙනවා." මම පොත් රාක්ක වලින් පිරුණු කාමරය දෙස බලමින් කීවෙමි.

" ඔයා ඔතනින් ඕන තරම් පොත් අරන් ගිහින් කියවලා ගෙනත් දෙන්න."
මම එතැනින් නවකතා පොත් හතරක් තෝරා ගත්තෙමි.

"ඔයා මොනවද දැන් කරන්න හිතන්
ඉන්නේ.?"
මම පොත් කාමරයෙන් පිටවෙද්දී ප්‍රවීන්ගෙන් ඇසුවෙමි.

"මං මේ දවස්වල සින්දුවක් ලියනවා. මං හිතන් ඉන්නේ මියුසික් වීඩියෝ එකක් කරන්න."

" අනේ ශෝක් නේ ඔයාට සින්දු කියන්නත් පුළුවන්ද ..?"

"ඔව් මට පුළුවන්. එච්චර හොඳට බෑ ඉතින්.මං වෙලාවක ඔයාට සිංදුවක් කියන්නම්කෝ."

" ආ ළමයි මෙන්න ගන්න." තරංගී ඇන්ටි ෆලූඩා ජූස් කෝප්ප දෙකක් අල්ලන අතරේ කීවාය.

"බබා අපි මේ කතා වුණේ ඔයාලගේ එක්සෑම් එක ඉවර නිසා කොහේ හරි ට්‍රිප් එකක් එක්කන් යන්න."තරංගී ඇන්ටි කීවාය.

"අනේ මරුනේ අම්මා යමුකෝ. කොච්චර ශෝක්ද..?" ප්‍රවීන් කීවේය.

"අපි එරන්දිලා ගෙදර කට්ටියත් එක්කගෙන යමු."අම්මා කීවාය.

" මට ඩිලානුත් කිව්වා අපි අනුරාධපුරේ ගිහින් එමු කියලා. ඩිලාන්ගේ නංගි ඉන්නේ එහෙනේ."තරංගි ඇන්ටි කීවාය.

" ඉතින් හොඳයි නේ අනුරාධපුරේ ,මේ මාසෙ අන්තිම සතියනේ ,අපි ඊළඟ මාසෙ මුල ගිහින් එමු." අම්මා කීවාය.

"හා එහෙනම් මං ලොකු පුතාටයි දුවටයි  කියන්නම්."

"අනේ මරු නේද ප්‍රවීන්."මම හෙමිහිට ප්‍රවීන්ට කීවෙමි.

"ඔව් බබා මරු."ඔහු සතුටින් එය අනුමත කළේය.

රාත්‍රී ආහාර ගැනීම සඳහා එහි නතර වනලෙස තරංගි ඇන්ටි ඉල්ලා සිටියාය.

ඉන්පසු අම්මා තාත්තීට කතා කර එහෙට පැමිණෙන ලෙස පැවසුවාය.

හවස 7.00 ට  පමණ ඩිලාන් අංකල් ද නිවසට පැමිණියේය.

"ආ මගේ කෙල්ල ඇවිත් ,කෝ රුවන්ත ආවේ නැද්ද ..?"
ඩිලාන් අංකල් ඇසුවේය.

"තව ටිකකින් එයා එයි ඩිලාන්" ඩිලාන් අංකල් ඇසූ ප්‍රශ්නයට අම්මා පිළිතුරු දුන්නාය.

"ලතා කෑම රෙඩි කරනවා. අපි කතා කර කර ඉමු ...ඩිලාන් ඔයත් වොෂ් එකක් දාගෙන එන්න. කතා කරන්න දෙයක් තියෙනවා."තරංගී ඇන්ටි කීවාය.

"ආ මේ මං ඔයාගෙන් අහන්න හිටියේ ඔයාට රඟපාන්න පුළුවන්ද ..?"

"ඇයි එහෙම අහන්නේ...? ඉස්කෝලේ නාට්‍ය දෙකක නම් රඟපාලා තියෙනවා. ඒ ඇරෙන්න විශේෂයෙන් රඟපාලා නැහැ."

" මගේ මියුසික් වීඩියෝ එකේ විෂුවල් එකට කෙල්ලෙක් ඕනි ඒකයි ."

"මට බැරි කමක් නෑ බලමුකෝ... ඔයා වෙන කෙනෙක් එක්ක මියුසික් වීඩියෝ එක කරනකොට මට ඉරිස්සියයි."

" ඒක මං දන්න නිසාමනේ ඔයාව ගන්න හදන්නේ."

ඒත් සමගම අපේ තාත්තිත් පැමිණියේය.

"මචන් රුවන්ත, මොකෝ මෙච්චර පරක්කු වුණේ..?"
ඩිලාන් අංකල් තාත්තිගෙන් ඇසුවේය.

"අද පොඩි බිස්නස් මීටින් එකක් තිබුණා ඒකයි. මේ ඒක නෙමෙයි අද ඔන්න අපිට සෙට් වෙන්නත් පුළුවන්." තාත්ති ඩිලාන් අංකල්ගේ පිටට ගසා කීවේය.

" ඒ පාර මොකක්ද දෙන්න කරන්න හදන්නේ. අදත් බොන්නද හදන්නේ?" අම්මා සැරින් මෙන් තාත්තාට කීවේය.

" අනේ කමක් නෑ තාරු,හැමදාම නෑනේ, දෙන්නා එකතු වුණහම විතරනේ. මං ඔයාලට මොනවා හරි කරලා දෙන්නම්."
තරංගී ඇන්ටි කීවාය.

අපි රාත්‍රී ආහාර ගත්තෙමු. තාත්තලා දෙන්නා නම් අපත් සමඟ ආහාර ගත්තේ නැහැ.

පසුව ඔවුහු ආහාර ගෙන සාලයට පැමිණ අපත් සමඟ වාඩි වුණෝය.

"ආපු ගමන් දෙන්න කාමයට රිංග ගත්තනේ, අපි මේ අනුරාධපුරේ යන ගමන ගැන කතා කරන්න හිටියේ." තරංගී ඇන්ටි කීවාය.

" ඔයාලා දිනයක් දාගන්නකෝ, නංගිට නම් අපි දැන් ගියත් ප්‍රශ්නයක් නෑ." ඩිලාන් අංකල් කීවේය.

"අද 28 වෙනිදානේ,එහෙනම් අපි 4 වෙනිදා වගේ යමුද තරංගී ..?"අම්මා ඇසුවාය.

"හා එහෙම හොඳයි අපි හැමෝම එහෙනම් දවස් තුන හතරක් නිවාඩු දාමු. ගිය පිටටම ආයෙ එන්න බෑනේ." තරංගී ඇන්ටි කීවාය.

" මොකේද අප්පච්චී අපි යන්නේ..?" ප්‍රවීන් ඩිලාන් අංකල්ගෙන් ඇසුවේය.

"අපේ වෑන් එක තියෙනවා නේ,ඒකේ යමු." ඩිලාන් අංකල් කීවේය.

"හැබැයි 12 දෙනෙක් වගේ ඉන්නවා පවුල් තුනේම." තාත්ති කීවේය.

" එහෙනම් අපේ ඉස්කෝලේ ගමකින් ළමයි ටිකක් අරන් එන පොඩි බස් එකක් තියෙනවා. ඒකට මං කතා කරලා කියන්නද එදාට එන්න කියලා..?" තරංගී ඇන්ටි ඇසුවාය.

"ඒක ගොඩක් ලොකු නැත්නම් ප්‍රශ්නයක් නෑ.සමහර විට වෑන් එකේ යන්නත් පුළුවන් වෙයි." අම්මා කීවාය.

" නැහැ තාරු,තරංගී කියපු පොඩි බස් එකේ යමු." තාත්ති කීවේය.

"ඉන්න මං නිහාල්ටත් කතා කරලා කියන්නම්.4 වෙනිදාට ලෑස්ති වෙන්න කියලා."ඩිලාන් අංකල් කීවේය.

ගමනේ අනෙක් කටයුතු වැඩිහිටියෝ කතා කර ගත්හ.
අපි නිවසට යන විට රෑ බෝවී තිබුණි.

****

හිමිදිරියේ කුරුල්ලන්ගේ කිචි බිචි නාදයෙන් මම අවදි වුණෙමි. අද ජූලි 3වෙනි සඳුදා...
මම දත් මැද ,මූණ සෝදා පහළ මහලට ගියෙමි.

"ගුඩ් මෝනින් බබා.එන්න තේ බොන්න."

" ගුඩ් මෝනින් අම්මා තාම වැඩට ගියේ නැද්ද...?"

" මං දැන් යන්න හදන්නේ තාත්තිත් එක්කම යනවා."

"ඔයාලා හෙට ඉඳන් දවස් 4ක් නිවාඩු දැම්මා නේද ..?"

"ඔව් නිවාඩු 5 ක්ම දැම්මා හෙට උදේ 4.30ට පිටත් වෙනවනේ. මං ඔක්කොම රෙදි ටික ඊයේ පැක් කළා."

" ඒක හොඳයි අම්මා. අද සඳුදා නිසා අම්මා කලින් එනවා නේද..?"

" ඔව් මං කලින් එනවා. අද රෑට ප්‍රවීන්ලයි එරන්දිලයි මෙහෙ එනවා නවතින්න පාන්දර ඔක්කොමලා එකටනේ යන්නේ."

" මං එහෙනම් උඩ තට්ටුවේ අනිත් රූම් තුනත් රෙඩි කරලා තියන්නම්."

" ඔව් මං කුසුමාටත් කිව්වා. අන්න තාත්තිත් එනවා. මට පරක්කුයි මං යනවා බබා."

"කරන්න දේකුත් නෑනේ තරංගී ඇන්ටිගේ නවල් එකේ ඉතුරු ටික කියවන්න ඕනේ."මම එසේ සිතමින් කාමරයට ගියෙමි.

කතාව ටිකක් කියවාගෙන යන විට මට ප්‍රවීන්ව මතක් වුණි. මම දුරකථනය ගෙන ඔහුට ඇමතුමක් ලබා ගත්තෙමි.

"සුදු බෝලේ ගුඩ් මෝනින්."ප්‍රවීන් කීවේය.

"ගුඩ් මෝනින් බබා,ඔයා මොනවද කරන්නේ?

" මං එක ගෙනියන්න බඩු පැක් කරනවා."

" අද අපේ ගෙදර එනවා නේද...?"

"ඔව් මැණික නැවිත් කොහොමද...?"

" හරි එහෙනම් හවසට එන්න. මේ ඒක නෙවෙයි,මං ඔයාට කියන්න ගියේ ක්‍රිශාන් අයියටත් එන්න කියන්න කියලා."

" ඔහු බබා අපේ අප්පච්චි කිව්වා. ක්‍රිශාන් අයියා විතරක් නෙමෙයි එයාගේ නංගිත් එනවා."

"අනේ නංගි කී වසරෙද?"

"නංගි 10 වසරේ. එයාලත් අද ඔයාලගෙ ගෙදර එනවා."

" හා එහෙනම් ඔයාලා ඔක්කොම එන්න.ඔයා වැඩේ කරන්න මං තියන්නම්. බුදු සරණයි."

" හරි මැණික බුදු සරණයි."

" කුසුමා නැන්දා කාමරේ අස් කරනවා. මාත් පොඩි උදව්වක් දෙන්න යන්න ඕනේ."
එසේ සිතමින් මම කාමරයෙන් පිටතට පැමිණියෙමි.

ඒ වන විටත් කුසුමා නැන්දා කාමර තුනක් අස් කර තිබුණාය.

ඒ නිසා මම කුස්සියට ගොස් අද දින සියලු දෙනාටම කප් කේක් සාදා ඒවා අයිසින් වලින් සැරසුවෙමි.

පසුව කුසුමා නැන්දා පැමිණ රාත්‍රී ආහාර සැකසීමට අවශ්‍ය දෑ සූදානම් කරන්නට වූවාය.

එකවරම මාගේ දෑස් කවරෙක් හෝ පිටුපසින් ඇවිත් වැසුවේය.
මම කලබලයෙන් මෙන් පිටුපස හැරී බැලුවෙමි.

"අනේ අයියා ඔයා..? නිවාඩු නෑ කියලනේ කිව්වේ."
මම ඔහුට තුරුල් වෙමින් ඇසුවෙමි.

" ඔයාලා හිතුවද මාව දාලා තනියම ට්‍රිප් යන්න."

" අනේ ලොකු බේබි ඇවිත්, ඉන්න මං කෑම ලෑස්ති කරන්නම්."කුසුමා නැන්දා කීවා ය.

"ඔහු කුසුමා නැන්දේ ,හරි බඩගිනියි." අයියා බඩ අල්ලමින් කීවේය.

" අයියා වොෂ් එකක් දාගෙන එන්න."
මා ඔහුට එසේ කියද්දී ඔහු මා අතර දිග චොක්ලට් එකක් දුන්නේය.

"අනේ තැංකුයි ඔයාට .."මම විහිළුවට මෙන් කීවෙමි.

පසුව මම කාමරයට ගොස් පසුදා රැගෙන යන රෙදි සියල්ල රැගෙන දැයි බලා  අයියා සමග කතා කිරීමට ඔහුගේ කාමරය දෙසට ගියෙමි.

"ඔව් බබා මං දැන් ආවේ.ඔයත් පරිස්සමෙන් යන්න.බුදු සරණයි!"
අයියා කාටදෝ කියනවා මට ඇසුණි.

එකවරම මම කාමරේ වෙතට ගියෙමි.

"ආ නංගී ඔයා දැන් කාමරය ළඟට ඇවිල්ලා ගොඩක් වෙලාද..?"

"නෑ බයවෙන්න එපා. මං දැන් ආවේ
කවුද කතා කළේ?"

"ඔයා අම්මලාට කියන්නේ නැත්නම් කියන්නම්."

"නෑ අනේ පිස්සුද මං කියන්නේ නෑ."

" දැන් කතා කළේ හිරන්දි මිනුක්ෂා රණසිංහ.අපි දෙන්නා ආදරය කරනවා. එෆෙයා එක පටන් අරං දැන් අවුරුදු තුනක් වෙනවා."

"මට හිතුණා, අක්කිගේ ගෙවල් කොහෙද අයියේ..? ඔයාලගේ කැම්පස් එකේමද?"

" එයාලගේ ගෙවල් බණ්ඩාරවෙල. අපේ කැම්පස් එකේ ඉංජිනියරින් ෆැකල්ටි එකේ."

"හරි ඉතින් ඇයි අම්මලාට නොකියන්නේ?"

" හිරූ කියනවා දැම්මම ගෙදරට කියන්න එපාලු. එයා කියනවා අපේ ගෙදරින් අකමැති වෙයිලු. එයාලගේ අම්මා ටීචර් කෙනෙක්, තාත්තා ලෝයර් කෙනෙක්."

" අවුලක් නැනේ,අපෙයි එයාලගෙයි එහෙම නොගැළපීමක් නෑ. අම්මලා අකමැති වෙන එකක් නෑ.මං ඕනි නම් අම්මට කියලා බලන්නම්."

" එපා නංගී දැම්ම හදිස්සි වෙන්න එපා. මං ඕනි උනත් ඔයාට කියන්නම්."

" ඒක නෙමෙයි අයියේ මටත් ඔයාට කියන්න දෙයක් තියෙනවා."

"ඇයි මොකෝ ප්‍රශ්නේ?"

" ඔයා දන්නව නේද ප්‍රවීන්ව..?"

"මොකද මං නොදන්නේ ඩිලාන් අංකල්ගේ පොඩි පුතානේ.හරි ඔව් ඉතින් ඒ මොකද..?"

" මේ අපි දෙන්නා අතර එෆෙයා එකක් තියෙනවා. අනේ අම්මලාට නම් කියන්න එපා."

"මොකක් නංගි ඔයා ..?මං හිතුවේ නැහැ ඔයා ඔහොම වෙයි කියලා, දැන් කොච්චර කල්ද පටන් අරගෙන..?"

" එච්චර කල් නෑ අයියේ ගිය අවුරුද්දේ ප්‍රසාදි අක්කලාගේ වෙඩින් එක දවසේ තමයි යාළු වුණේ."

" එහෙමද ප්‍රවීන් ගැන මං දන්නවනේ ඌ හිත හොඳ එකෙක් අපේ පවුලේ දෙකත් එකතුයිනේ,ප්‍රවීන් නිසා සමාව දෙනවා. වෙන මොකෙක් හරි රස්තියාදුකාරයෙක් වුණානම් තමයි බලා ගන්නේ. හැබැයි ඔන්න ප්‍රවීන් එක්ක වුණත් ඕනවට වඩා බෑ හොඳද..?"

"හරි හරි මං අනවශ්‍ය ප්‍රශ්න දාගන්න නෑ අයියේ."

"එක අතකට ඔය දෙන්න වාසනාවන්තයි. දැන් ගෙදරට කිව්වත් කැමති වෙයි. ඒකට අපි .."

"අනේ මේ හිරන්දි අක්කිගේ ෆොටෝ එකක් නැද්ද මට බලන්න ආසයි."

" එකක් නෙවෙයි සීයක් විතර ඇති ඉන්න මං පෙන්වන්නම්."

"මේ ඉන්නේ.." ඔහු ඡායාරූපයක් පෙන්වමින් කීවේය.

"ෂා ලස්සනයි අනේ."

කෙට්ටු, උස, සුදු, ඇයට දිග කොණ්ඩයක් තිබුණාය.
රෝස පැහැති ගවුමක් ඇඳ සිටි එම ඡායාරූපයේ ඇය රෝස මලක් මෙන් හැඩය.

"එයා හරියට රෝස මලක් වගේ."මම කීවෙමි.

"එහෙම තමයි අපි හොඳට හොයලා බලලා රෝසමල් හොයා ගන්නේ."

"මම නම් අක්කිට උඩින්ම කැමති."

පැය දෙකකට පමණ පසු නිවසට කවුරුන් හෝ ඇතුළු වෙනවා ඇසුණි.

" අම්මා වෙන්න ඇති මං ආවා කියලා කියන්න එපා පුදුම කරවමු."

"අම්මා ඔයා ආවද මහන්සිද..?" මම අම්මා වෙතට යමින් ඇසුවෙමි.

"ඔව් චූටි හරි මහන්සි"
පුටුවක වාඩි වෙමින් අම්මා කීවාය.

" මෙන්න නෝනා බීම එකක් බොන්න."
කුසුමා නැන්දා බීම වීදුරුවක් ගෙනෙවිත් අම්මාට දුන්නාය.

අයියා පිටු පසින් ඇවිත් අම්මාව බදා ගත්තේය.

"අනේ මගේ වස්තුව ඔයා ආවද කොයිවෙලේද ආවෙ නිවාඩු නෑ කිව්වනේ."
අම්මා සතුටින් අයියව වැළඳ ගනිමින් ඇසුවාය.

"මං අද උදේ ආවේ, නොකියාම ආවා ඔයාලාව පුදුම කරන්න. මමත් එනවා හෙට ට්‍රිප් එක යන්න."
අයියා අම්මා දෙස ආදරයෙන් බලමින් කීවේය.

"ආ දැන් ඉතින් අම්මල පුතාලා එකතු වුණානේ.දැන් ඉතින් මාව අමතක වෙයි." මම අම්මාට ඔච්චමට මෙන් කීවෙමි.

"නෑ ඉතින් මගේ සුදු මැණිකට හැමදාම ආදරේ කරනවනේ,ලොකු එන්නේ මාසයකට සැරයක්නේ.
දැන් අර කට්ටියත් එයි අපි ඉක්මනට වැඩ ටික කරමු."

පස්වරු 5.00 ට පමණ ප්‍රවීන්ලා ඔවුන්ගේ වෑන් රථයෙන් පැමිණියහ. ක්‍රිශාන් අයියාද ඇගේ නැගණියද පැමිණ සිටියහ.

"එන්න ඇතුළට, කෝ දිනුත්තර පුතාලා ආවේ නැද්ද..?" අම්මා ඇසුවාය.

"පුතාලා දැන් ගම්පොළින් එනවලු අද ගම්පොළ සුදු නංගිලාගේ ගෙදර ගිහින් ඒ දෙන්නා."

තරංගි ඇන්ටි කීවාය.

"ක්‍රිශාන් මල්ලිත් ඇවිත් නේද ..?"අයියා කීවේය.

"අපි මොනවා හරි බොමු නේද ..?"අම්මා කීවාය.

"එපා තාරු,රූපිකා කෝල් කළා.එයාලත් එන ගමන්ලු. ඒ ආවහම මොනවහරි බොමු."
තරංගී ඇන්ටි කීවා ය.

"ලොකු පුතා අද ද ආවේ..?"ඩිලාන් අංකල් අයියාගෙන් ඇසුවේය.

"ඔව් අංකල්, අද උදේ ආවෙ."

"අන්න කියනකොට ම එරන්දිලත් එනවා."අම්මා කීවාය.
එරන්දි ඇගේ මව හා පියා සමගින් පැමිණියාය.

"එන්න රූපිකා අක්කේ, ඇයි මෙච්චර පරක්කු වුණේ..?" අම්මා ඇසුවාය.

"බඩු ටික පැක් කරගන්න ටිකක් වෙලා ගියා නංගී." රූපිකා ඇන්ටි කීවාය.

"අනුරාධපුරයට අරගෙන යන්න බඩු වගයක් ගත්තා පොල් ගෝණියක් එහෙමත් තියෙනවා. කාර් එකේ ගිහින් අරන් එමුද රුවන්ත මල්ලි ..?"නිහාල් අංකල් ඇසුවේය.

" හරි යමු අයියා" එසේ කියමින් තාත්තී හා නිහාල් අංකල් පිටව ගියහ.

"අපි තේ ටිකක් බොමු එහෙනම්, උදේ ස්නේහි හදපු කප් කේක් තියෙනවා." අම්මා කීවාය.

" ෂා රසයි ස්නේහි ,දුව ඔයාට රසට කෑම හදන්න පුළුවන්.ඒකට අපේ එකී. ඔහේ ඉන්නවා." කේක් කන අතරේ රූපිකා ඇන්ටි මගේ කෑම වල ගුණ කියා එරන්දීට දොස් කීවාය.

" අනේ ඔයා නේද ක්‍රිශාන් අයියගේ නංගි ඔයාගේ නම මොකක්ද ..?"

"ඔව් අක්කී, මම අනුදි මිහංසා. ඔයා නේද ස්නේහී උත්තරා කියන්නේ..? එතකොට මේ අක්කි කවුද..?"
අනුදි ඇසුවාය.

" මං ස්නේහිගේ යාළුවා. එරන්දි නිමේෂිකා පෙරේරා. ඔයා ගැන අයියා කියලා තියෙනවා."
එරන්දි කීවාය.

අම්මා, රූපිකා ඇන්ටී සහ තරංගී ඇන්ටී සමග කතාබහක යෙදුණාය.

"ප්‍රවීන් ක්‍රිශාන්වත් එක්ක ගෙන පොඩ්ඩකට මෙහෙට එන්නකෝ.." අයියා ඔවුන්ට කතා කළේය.

ක්‍රිශාන් අයියා හා ප්‍රවීන් ,අයියාගේ අසලට ගියහ.
මගේ හිතට පුංචි බියක් දැනුණි.

" ප්‍රවීන් මට ඔයාගෙන් අහන්න දෙයක් තියෙනවා. මං හිතනවා ක්‍රිශානුත් ඒක දන්නවා ඇති කියලා"

" මොකක්ද අයියේ දැනගන්න තියෙන්නේ..?" ප්‍රවීන් බියෙන් මෙන් ඔහුගෙන් ඇසුවේය.

"අපේ නංගිගෙයි ඔයාගෙයි අතර තියෙන එෆෙයා එක ගැන මං දන්නවා. අද උදේ මට නංගි කිව්වා." අයියා ඔහු දෙස බලමින් කීවේය.

"අනේ අයියේ සනූ එක කිව්වද..? මට සමාවෙන්න. මං වැරැද්ද කරන්නේ නෑ. මං සනුට ආදරෙයි අයියේ."ප්‍රවීන් මා දෙස බලමින් කීවේය.

"නෑ නෑ මල්ලි සමාව ගන්න ඕන නෑ. මං උඹ ගැන දන්නවා මගේ නංගිව ඇහැක් වගේ පරිස්සමෙන් ආදරෙන් බලා ගන්න. කිසිම දුකක් දෙන්න එපා. ඒ වගේම අනවශ්‍ය දේවල් කරන්නත් එපා. තේරුණාද...?"
අයියා ප්‍රවීන්ගෙන් ඇසුවේය.

" ඔව් අයියේ අනිවාර්යෙන්ම." ප්‍රවීන් දැඩි ලෙස කීවේය.

ඔවුහු අප සිටින කෑම මේසේ වටා වාඩි වුණි.

" දැන් ගමන යන ලෑස්ති නේද කට්ටියම ..?"අයියා අපෙන් ඇසුවේය.

"මොකෝ නැත්තේ අපි ලෑස්තියි." එරන්දි සතුටින් කීවාය.

" මොකෝ දැන් දෙන්නා එකතුයිද අයියා එරන්දිගෙන් ක්‍රිශාන් අයියා සමඟ එකතු දැයි ඇසුවේය.
එරන්දි සිනාසුණාය

"අයියේ මට කෙල්ලෙක් ඉන්නවා. අනේ එරන්දි තරහා වෙන්න එපා." එරන්දිගෙන් අසන්නේ ඔහු ගැන බව දැන ක්‍රිශාන් අයියා කීවේය.

"අනේ ඇත්තටම ඔයාට කෙල්ලෙක් ඉන්නවද ..?"
මම පුදුමයෙන් මෙන් ඇසුවෙමි.

"අඩෝ මං වත් දැනම් හිටියේ නෑ. බලු වැඩ ක්‍රිශාන් අයියේ ඕවා නම්." ප්‍රවීන් ඔහුට කීවේය.

"නම මොකක්ද..? කොහෙ කෙල්ලෙක්ද..?" එරන්දි ඇසුවාය.

"වරින්දි දිනුක්ෂා රණසිංහ.ගෙවල් බණ්ඩාරවෙල." ක්‍රිශාන් අයියා කීවේය.

"මොනව වරින්දි..? එයාට අක්කා කෙනෙක් ඉන්නවද..?" අයියා විමතියෙන් මෙන් ඇසුවේය.

"ඔව් ඉන්නවා, මල්ලි කෙනෙකුත් ඉන්නවා." ක්‍රිශාන් අයියා සැහැල්ලුවෙන් කීවේය.

"අඩේ ක්‍රිශාන්, වරින්දිගේ අක්කා හිරන්දි මිනුක්ෂා රණසිංහ.එයා මගේ කෙල්ල. එතකොට උඹ මගේ වෙන්න මස්සිනා." අයියා සතුටින් කීවේය.

"පොඩ්ඩක් ඉන්න හිරු අක්කිගේ කොල්ලා ඔයාද ..?"ක්‍රිශාන් අයියා පුදුමයෙන් මෙන් අයියාගෙන් ඇසුවේය.

"ඔව් මං තමයි බං." අයියා කීවේය.

"අම්මෝ, කොහොමද ඒක.දැන් එහෙනම් අපිත් නෑදෑයො වෙනවා." මම පුදුමයෙන් මෙන් කීවෙමි.

" මට නම් මේක තාම හිතා ගන්න බෑ." අයියා කීවේය.

" ළමයි ඔයාලා වොෂ් දාගෙන එන්න. ප්‍රසාදි අක්කිලත් ආවා. අනුදීයි, එරන්දීයි ස්නේහි එක්ක ගිහින් චේන්ජ් කරගන්න."අම්මා අපට කීවාය.

" ලොකු බබා ප්‍රවීන්ටයි ක්‍රිශාන්ටයි ඔයාගේ රූම් එක රෙඩි කරලා තියෙන්නේ.එයාලට සපෝට් එකක් දෙන්න."අම්මා අයියාට කීවාය.

ප්‍රසාදි අක්කී සහ දිනුත්තර අයියා ද තේ පානය කර ඔවුන් දෙදෙනාට වෙන්කර තිබූ කාමරයට ගොස් පිරිසිදු වුණි.අම්මා ප්‍රවීන්ගේ දෙමාපියන්ට සහ එරන්දීගේ දෙමාපියන්ටද වෙනම කාමර දෙකක් ලබා දුන්නාය.

සියල්ලෝම රාත්‍රී ආහාර ගත්හ. කහ බතට චිකන් රෝස් කර, පරිප්පු මැල්ලුම්, බටු මෝජු, පපඩම් හා කට්ලට් සාදා තිබුණි.
අතුරුපසට වටලපන්ද කුසුමා නැන්දා සකසා තිබුණාය.

රාත්‍රී ආහාර ගෙන අපි කතාබස් කරමින් සිටියෙමු. පසුව මම එරන්දී හා අනුදී සමඟින් මගේ කාමරයට ගියෙමි. අනෙක් අයත් සූදානම් කර තිබූ කාමරවල නිදා ගත්තෝය. අද නිවසේ කුසුමා නැන්දාත් සමග 15 දෙනෙක් සිටි.

★★★

පාන්දර 3.40 පමණ අප සියලු දෙනා අවදි වී සූදානම් වුණි. අම්මා බුදු පහන තබා බුදුන් වැන්දාය.කුසුමා නැන්දාත් ඇගේ නිවසට යාමට සූදානම් වූවාය. පාන්දර 4.20ට පමණ අපව රැගෙන යාමට කුඩා පාසල් රිය පැමිණියේය.
අපි 4.30 ට නිවසින් පිටත් වුණෙමු. ඇඳුම්, ආහාර ,ජලය, බීම ,තේ හා අනුරාධපුරයට රැගෙන යාමට ගත් ආහාර ද්‍රව්‍යද වාහනයට දා ගත්හ.

අන්ධකාරයාත් සමඟ අපි ගමන ආරම්භ කළෙමු.

"බුදු සරණින් ඕං එහෙනම් අපි ගමන පටන් ගමු."රියදුර අසුනට පසෙකින් වාඩි වූ නිහාල් අංකල් කීවේය.

" අනේ මරු නේද අද නම් අපි හොඳට විනෝද වෙමු."මම සතුටින් කීවෙමි.

"ඔන්න අපිට අද ඕන තරම් වෙලා තියෙනවා කතා කරන්න."
රූපිකා ඇන්ටි කීවාය.

අනතුරුව ඔවුහු කතාබහක යෙදුණහ.

"මගේ මැණික ඔන්න එහෙනම් අපි දෙන්න යන පළවෙනි ට්‍රිප් එක."

"ඔව් ප්‍රවීන් මට නම් ඉවසිල්ලක් නෑ අනුරාධපුරයට යනකම්. ඒක නෙවෙයි රුවන්වැලි මහා සෑයට ගිහින් අපි දෙන්න භාරයක් වෙමුද?"

"මොකක් කියලද..?"

"ආයෙත් දවසක රුවන්වැලි මහා සෑයේ අපි දෙන්නට හම්බවෙන්න පුළුවන් වෙන්න කියලා."

"හා හාර වෙමු. අපි සුදු නෙළුම් මල් වට්ටියක් පූජා කරමු."

"හා ප්‍රවීන්,ඔයා හැමදාම,හැම ආත්මෙම මං ළඟට වෙලා මෙහෙම ආදරෙන් ඉන්නවා නේද ..?"

"ඔව් මැණික.මුළු සංසාරෙම හැම ආත්මෙකම ,මැරෙනකම් ඔයාට පණ වගේ ආදරේ කරනවා "
ප්‍රවීන් මගේ අත සිඹිමින් කීවේය.

ඒ ඔහුගේ ප්‍රථම සිප ගැනීමයි.

මම ඔහුගේ උරහිසට හේත්තු වුණෙමි.

"මේ ක්‍රිශාන්, ඔයාට කොහොමද වරීව හම්බවුණේ..?"
අයියා ක්‍රිශාන් අයියාගෙන් ඇසුවේය.

"මං බණ්ඩාරවල ටෙක්නිකල් කොලේජ් එකේ කෝස් එකකට ටික කාලයක් ගියානේ. එතකොට එයාව හම්බවුණේ."

" මට හිරු කිව්වා නංගි කොල්ලෙක් එක්ක යාළුවෙලා පොඩ්ඩක් හොයලා බලන්න කියලා, මං දැන් නෑනේ උඹ කියලා. මං හිරුට ඔයා ගැන කියන්නම්."

"අපි වෙලාවක බණ්ඩාරවෙල ගිහින් එමුද..?"

"හා යමු ක්‍රිශාන්, අපි ගියොත් ඔයාටත් කතා කරන්නම්." අයියා ඊට එකඟ විය.

" අනේ මෙහෙම ට්‍රිප් යන එක බෝරින්. අපි සින්දුවක්වත් කියමුකෝ."
එරන්දි බසටම ඇසෙන්නට කෑ ගැසුවාය.

අනතුරුව අපි සියලු දෙනාම සිංදු කියමින් දඹුල්ලට පැමිණියෙමු.

ඒ වන විට උදෑසන ලා හිරු පායා තිබුණි.
අතුරු පාරක පැමිණි විට පොඩි විලක් තිබුණි.
අපි ඒ අසල නැවතී කාපට් එකක් එලා උදේ ආහාර ගත්තෙමු.

අම්මලා කෑම ජාති ගොඩක් හදා තිබුණි.

" මේ ප්ලේස් එක නම් මාර ලස්සනයි නේද..?"තාත්ති කීවේය.

" අනේ ඔව් අංකල්,මං කැමරා එක ගෙනාවා අපි ෆොටෝ ටිකක් ගමු." ප්‍රවීන් කීවේය.

පසුව අපි එකතු වී ඡායාරූප ගත්තෙමු. මම ප්‍රවීන් සමඟද ඡායාරූප ගත්තෙමි.

" මං අපි දෙන්නගේ ෆොටෝ දාලා ඇල්බම් එකක් හදනවා." ප්‍රවීන් මට රහසින් මෙන් කීවේය.

" ශෝක් නේ ප්‍රවීන්,හොඳ වැඩක් ඒක." මම ඔහුට කීවෙමි.

"ප්‍රවීන් පුතා සිංදුවක් කියන්නකෝ ගිටාර් එක ප්ලේ කරන ගමන්."
අම්මා ප්‍රවීන්ගෙන් ඉල්ලා සිටියාය.

ප්‍රවීන් මුලදී අකමැති වුවද පසුව සියල්ලන්ගේ කැමැත්ත මත ගිටාර් එක ගෙන ලස්සනට සිංදුවක් කීවේය.

"පුතා ඔයා නම් පුදුම දක්ෂ දරුවෙක්, මැත්ස් වලින් ඉගෙනීම් කටයුතු හොඳටම කරනවා. හොඳ සිගර් කෙනෙක් ,රයිටර් කෙනෙක්,ෆොටෝ ග්‍රැෆර් කෙනෙක්,ඒ වගේම ඩාන්සර් කෙනෙක් ඔයා හැම පැත්තෙන්ම ඉස්සරහට ගිය දරුවෙක්."අම්මා කීවාය.

"ඒකනම් ඇත්ත නංගි."රූපිකා ඇන්ටීද එය අනුමත කළාය.

ඔහු තවත් සිංදු දෙකක් කීවේය.

"අනේ ප්‍රවීන්,ඔයාගේ වොයිස් එක නම් මාරම ලස්සනයි. ඒක හරියට භාවනාවක් වගේ."මම සතුටින් කිවෙමි.

"අනේ ඔව් පුතා, ඔයාට මාර ටැලන්ට් එකක් තියෙන්නේ. පුදුම වෙන්න දේකුත් නෑ ඉතින් ඒ කාලේ අම්මා ඉතින් ගායිකාවනේ." තාත්ති කීවේය.

"අනේ අම්මා ඔයත් සිංදුවක් කියන්නකෝ අහන්න ආසයි."
ප්‍රසාදි අක්කී තරංගී ඇන්ටිට කීවාය.

"දැන් බෑ දූ ගොඩ කාලෙකින් කිව්වේ නෑ."තරංගී ඇන්ටි ලැජ්ජාවෙන් මෙන් කීවා ය.

" ඔය බොරු අනේ ගෙදරදි හොදට සින්ග් කරනවා.අනේ අම්මා කියන්නකෝ,මල්ලි ගිටාර් එක ප්ලේ කරයි."
දිනුත්තර අයියා කීවේය.

තරංගී ඇන්ටීද සින්දුවක් කීවාය.

"මාරම ලස්සන කටහඬක් ඇන්ටිට තියන්නේ." එරන්දී කීවාය.

හැමෝම එය අනුමත කළහ.

අනතුරුව අප බස් රථයට නැග සුපුරුදු පරිදි ගමන ඇරඹුවෙමු. හැමෝම පරණ අලුත් දෙවර්ගයේම සිංදු කීවෝය.

"දැන් කොහෙද අපි ඉන්නේ." ඩිලාන් අංකල් රියදුරාගෙන් ඇසුවේය.

"සර් දැන් ඉන්නේ කැකිරාවේ."

"දැන් නම් අනුරාධපුරයට කිට්ටු කරලා." ඩිලාන් අංකල් කීවේය.

"ඔව් නේද ඩිලාන් උදේ 9.30 වෙනකොට අපට යාගන්න පුළුවන්." තාත්ති කීවේය.

"අපි හිමීටනේ ආවේ වේගයෙන් ආවනම් මෙලහකටත් අනුරාධපුරේ." නිහාල් අංකල් කීවේය.

" නංගිලාගේ ගෙවල් වලට තව අනුරාධපුරෙන් ඇතුළට යන්න ඕනෙද ඩිලාන්..?"
අම්මා ඇසුවාය.

"නෑ තාරුකා.එච්චර දුර නෑ,නංගිලා ටවුන් එක ළඟ ඉන්නේ.හැබැයි ඒක ගමක්." ඩිලාන් අංකල් කීවේය.

" දැන් වෙලාව කීයද ප්‍රවීන්..?"
මම ඔහුගේ උරහිසට හේතුවී සිටියදී තද නින්දකට වැටී සිට එකවරම අවදි වී ඔහුගෙන් වෙලාව ඇසුවෙමි.

"දැන් වෙලාව අටයි 8.45 ඔයා සුපිරි නින්දක් දැම්ම නේද මට දුකේ බෑ."

"ඔව් අනේ නින්ද ගියා දැනුනේ නෑ.තව ගොඩක් දුර යන්න තියෙනවද..?"

" නෑ තාව පැය භාගයක් විතර දුර."

අපි 9.15 පමණ වනවිට අනුරාධපුර නගරයට පැමිණ 9.30 වන විට ප්‍රවීන්ගේ නැන්දලාගේ ගෙදරට පැමිණියෙමු.

"අම්මේ,කට්ටිය ආවද එන්න ඇතුළට." ප්‍රවීන්ගේ නැන්දා තුෂාරි අපව සාදරයෙන් පිළිගත්තාය.

"අනේ මගේ අනූ පැටියා දැන් ලොකු වෙලා රැවුලත් වැවිලා." තුෂාරි ඇන්ටි ප්‍රවීන්ගේ මූණ ඉඹ කීවාය.

"මේ ප්‍රසාදි දුවගේ පවුලේ අය නේද..? තුෂාරි ඇන්ටි දිනුත්තර අයියාගෙන් ඇසුවාය.

" ඔව් චූටි නැන්දි මේ එයාලා තමයි." දිනුත්තර අයියා කීවේය.

" මට පොඩි මතකයක් තිබුණා. වෙඩින් එකේදි දැක්කනේ."තුෂාරි ඇන්ටි කීවා ය.

"කොහොමද තුෂාරි නංගී හොඳින් ඉන්නවද...?" අපේ අම්මා ඇසුවාය.

" අනේ ඔව් තාරු අක්කී, කෝ ඔයාගේ දුව මට මූණ මතක නෑ." ඇය කීවාය.

" මේ ඉන්නේ මෙයා."අම්මා මාව පෙන්නමින් කීවා ය.

"නංගි මේ බඩු ටික ගන්න."
බඩු පිරවූ මල්ලක් හා පොල් ගෝණියක් තුෂාරි ඇන්ටීට දෙන අතරේ තරංගි ඇන්ටි කීවාය.

"අනේ මේ හැටියට දේවල් මොකට ද..? ඔයාලා හුඟක් මහන්සි වෙලා තුෂාරි ඇන්ටි කීවාය.

" දරුවෝ තුන්දෙනා නැද්ද නංගී ..?" ඩිලාන් අංකල් ඔහුගේ නැගණියගෙන් ඇසුවේය.

"දුවලා දෙන්නා නම් කඩේට ගිහින් එන්න ගියා. පුතා නම් ඉන්නවා.ඉන්න මං කතා කරන්නම්."
තුෂාරි ඇන්ටි කීවාය.

"චමත්... චමත්... පුතේ පහළට එන්න. චූටි මාමලා ඇවිත්."
තුෂාරි ඇන්ටි කීවාය.

"උස,මහත, තළෙලු පිරිමි ළමයෙක් පැමිණ වැඩිහිටියන් සියල්ලටම වැන්දේය.

" දැන් ලොකු ඉලන්දාරියෙක් නේද..? කී වසරෙද වමත් පුතා ඉන්නේ."ඩිලාන් අංකල් ඇසුවේය.

"මං 12 වසරේ ඉන්නෙ මාමේ, මේ පාර A/L ලියනවා." ඔහු කීවේය.

ඒත් සමගම කෙට්ටු, කොණ්ඩේ උරහිසට වන තෙක් කපා තිබූ නිවුන් සහෝදරියන් දෙදෙනෙක් බඩු මල්ලක් ඔසවාගෙන පැමිණියාය.

" අනේ චූටි මාමා ඇවිත්."
එක ගෑණු ළමයෙක් ඩිලාන් අංකල්ව බදා ගනිමින් කීවාය.

"දැන් නම් දෙන්නාව අඳුරගන්නත් බෑ." තරංගි ඇන්ටි කීවාය.

"නැන්දේ,මගේ මේ මූණේ මේ තියෙන ලපය නිෂිනිගෙ නෑ.එතකොට අඳුරගන්න ලේසියි. ලපේ තියෙන කෙනා සචිනි,අනිත් කෙනා නිෂිනි."
සචිනි කීවාය.

"කී වසරද පුතේ ඔය දෙන්න දැන් ඉන්නේ..?"
අම්මා ඔවුන්ගෙන් ඇසුවාය.

" අපි දෙන්න 10 වසරේ ඉන්නේ ඇන්ටී." නිෂිනි කීවාය.

"ආ මෙන්න ගන්න ඔයාලා ඇවිත් ටිකක් වෙලා නේ, තිබහත් ඇති.."තුෂාරි ඇන්ටි අපි හැමෝටම අයිස් කෝපි දෙන අතරේ කිවාය.

" පුදුම රස්නයක්නෙ තියෙන්නේ.මට ආසයි තිසා වැවේ නාන්න."
තාත්ති කීවේය.

" එහෙනම් තව ටිකක් වෙලා ඉදලා ඔක්කොමත් එක්ක තිසා වැවේ නාලා එන්න. මම කෑම ලෑස්ති කරලා තියන්නම්."තුෂාරි ඇන්ටි කිවාය
.
" අම්මේ මගේ ඇඟට ටිකක් අමාරුයි." ප්‍රසාදි අක්කී දුර්වල වූ හඬකින් රූපිකා ඇන්ටිට කීවාය.

"ගමන් මහන්සියට වෙන්න ඇති පුතේ." තරංගී ඇන්ටී කීවාය.

එකවරම ප්‍රසාදි අක්කී අයිස් කෝපි වීදුරුව මේසේ මත තබා එළියට ගොස් කණුවට වමනය කළාය.

" මෙහෙට හැරිලා දකුණු අත දෙන්න දුවේ. නාඩි වලින් ලෙඩේ අඳුරගන්න පුළුවන්."
අම්මා රෝහලින් ලද අත්දැකීම් මතක් වී කීවාය.

සිදු වී ඇති දේ තේරුම්ගත් තරංගී ඇන්ටි සහ තුෂාරි ඇන්ටි කුස්සියට ගියහ.

තරංගි ඇන්ටි උණු උණු කිරි වීදුරුවක් ගෙන ආදරයෙන් ප්‍රසාදි අක්කීට පෙව්වාය.

" බය වෙන්න දෙයක් නෑ මැණික. ඔයා අම්මා කෙනෙක් වෙන්නයි යන්නේ. මගේ උණුසුම් සුබපැතුම්.."
තරංගී ඇන්ටි සතුටින් කීවාය.

දිනුත්තර අයියා ප්‍රසාදි අක්කීව වැළඳ ගෙන නළල සිප ගත්තේය.

හැමෝම අක්කීට සුබ පැතුවෝය.

"ප්‍රවීන් ඔයා බාප්පා කෙනෙක් වෙන්නයි යන්නේ."මම රහසින් මෙන් ප්‍රවීන්ට කීවෙමි.

"මං විතරද ඇයි ඔයා පුංචි අම්මා කෙනෙක් වෙන්නේ නැද්ද..?" මාගේ දෙකොපුල් මිරිකමින් ප්‍රවීන් කීවේය.

පසුව ප්‍රසාදි අක්කී හා තුෂාරි ඇන්ටි හැර අපි සියලුම දෙනා තිසා වැවේ දිය නෑවෙමු.

"මේ ලබන අත්දැකීම් කවදාවත් අමතක කරන්න බැරිවෙයි." එරන්දි සතුටින් කීවාය.
"ඒක නම් ඇත්ත එරන්දී." මම ඇයගේ කතාව අනුමත කළෙමි.

වෙනදාට නාන කාමරයෙන් නිදහසේ නාන මා හට වීත්තයක් ඇඳගෙන ප්‍රවීන් ඇතුළු පිරිස ඉදිරිපිට නෑම මුලදී ටිකක් අපහසු වුණි. මම ටික වෙලාවකින් එයට හුරු වී අනෙක් අය මෙන් සතුටින් දිය නෑවෙමි..

අප නිවසට යන විට තුෂාරි ඇන්ටි ආහාර පිස කෑම මේසයට දමා තිබුණාය.
පසුව අපි ආහාර ගත්තෙමු.
කිරිකොස් ව්‍යංජනය, මඤ්ඤොක්කා කොළ මැල්ලුම,වැව් මාළු බැදුම
හා පොල් සම්බෝල ද අතුරුපසට පළතුරු සැලඩ් සහ අයිස් ක්‍රීම් ද තිබුණි.

අපි සියලු දෙනාම ඒ ආහාර වේලේ ගුණ කීවෙමු.

" හුඟ කාලෙකින් ගමේ රහට කෑමක් කෑවා." තාත්ති කීවේය.

" ඒකනම් ඇත්ත මල්ලී." රූපිකා ඇන්ටි කීවා ය.

බත් කා අනතුරුව පුරුද්දට මෙන් නිහාල් අංකල් බුලත් විට සැපුවේය.

"නංගී අද රෑට කෑම මුකුත් ලෑස්ති කරන්න එපා." ඩිලාන් අංකල් කල්තියාම තුෂාරි ඇන්ටීට කීවේය.

" ඒ මොකද අයියේ ?ඔයාලා අද යන්නේ නෑනේ." තුෂාරි ඇන්ටී සැකයෙන් මෙන් ඇසුවාය.

"යන්නේ නම් නෑ, මෙහේ රෑට ඔක්කොටම නිදාගන්න ඉඩ මදිනේ. ඔයාට ආය කරදර කරන්න බෑ. ඔයා දන්නවනේ අපේ පන්තියේ හිටපු ප්‍රියන්ත. එයා මෙහි ආලකමන්දා කියලා ගෙස්ට් හවුස් එකක් කරනවා. ගෙස්ට් හවුස් එකක් කිව්වට ඒක හෝටෙල් එකක්. අද රෑට එහෙ එන්නම් කියලා මම ප්‍රියන්තට පොරොන්දු වුණා . ඒකයි, නංගි ඔයා අහිතක් හිතන්න එපා."
ඩිලාන් අංකල් කීවේය.

" අනේ මන්දා කමක් නෑ එහෙනම්. රෑ නැවතිලා ඉඳලා පාන්දර එන්න. උදෙන්ම අටමස්ථානෙ වඳින්න යමු."තුෂාරි ඇන්ටි කීවාය.

සැන්දෑවන තෙක්ම ප්‍රවීන්ලාගේ නැන්දාගේ ගෙදර සිට රාත්‍රී 8.00 ට පමණ හෝටලයෙන් රාත්‍රී ආහාර ගෙන පෙර නිවසේ නිදාගත් ආකාරයට අපි කාමර හයක් ගෙන නිදා ගත්තෙමු.

*****

පාන්දර 5.00 ට පමණ සියලු දෙනා අවදි වී සුදු පැහැති වස්ත්‍රයෙන් සැරසුණි.
මම අත් කොට සුදු පාට දිග ගවුමක් ඇන්දෙමි.

අපි සියලු දෙනාම බඩු බාහිර ආදිය රැගෙන හෝටලයෙන් පිටත් වී තුෂාරි ඇන්ටිලාගේ නිවසට පැමිණ ඔවුන්වත් දමාගෙන අලුයම හයේ පූජාවට රුවන්වැලි මහා සෑය වෙත පැමිණියෙමු.

මම ප්‍රවීන් සමග එකතු වී සුදු නෙළුම් මල් වට්ටියක් පූජා කර **'අප නැවත වරක් මේ පින්බිමේදී මුණ ගැසේවා'** කියා ප්‍රාර්ථනා කළෙමි.

පසුව අපි පූජා ද්‍රව්‍ය පූජා කර ගාථා කියා බුදුන් වැන්දෙමු...
කෙමෙන් හිරු උදාවුණි.
අපි අටමස්ථානය බැති සිතින් වන්දනා කළෙමු.

"හිතට මාරම නිදහසක් සුවදායිබවක් දැනෙනවා නේද තාරු." තාත්තා අම්මාට කීවේය.

"ඔව් ඒයි නැවතිලා ඉන්න හිතෙනවා. අපි ආය දවසක ඒමු."අම්මා කීවාය.

වැඩිහිටියෝ අපට ඉදිරියෙන් ගමන් කළහ.

"අනේ අනු අයියා අපි දෙන්නා සෙල්ෆි එකක් ගමුද..?" නිෂිනී පැමිණ ප්‍රවීන්ගෙන් ඇසුවාය.

"ඕකේ නිෂී ගමු. මොකෙන්ද ගන්නේ..?" ප්‍රවීන් ඇසුවේය.

" ඔයාගේ ෆෝන් එකෙන් ගමු,මට වට්සැප් වලින් ෆොටෝ ටික ශෙයා කරන්න." නිෂී කීවාය.

ඇය ප්‍රවීන්ගේ ඇගේ එල්ලේ ඡායාරූප ගත්තාය.

එය දැක මට කේන්ති ගොස් හිතට දැන් නිදහස එහෙම පිටින්ම නැති වුණි.

" මොකද මැණික මූණ එල්ලගෙන..? මෙච්චර හොඳ ගමනක් ඇවිල්ලත්." ප්‍රවීන් මාගේ අත අල්ලමින් කීවේය.

"ඔයාගේ මහ ලොකු නිෂී නංගිව හුරතල් කර කර ඉන්න. ඒකී කොයි වෙලේ බැලුවත් අනූ අයිය අනු අයියා කිය කියා ඔයාගේ ඇඟේ එල්ලෙනවා. ඇයි එයාට බැරි ප්‍රවීන් අයියා කියන්න. ඔයත් ඒ මූසලීට නිෂිනි කියන්න නිෂී නිෂී ගාන්නෙ නැතුව,දැන් වට්ස් ඇප් වලින් හායි හූයි ගගා මැසේජ් දායි."
මම ඔහුගේ අත ගසමින් කීවෙමි.

"අනේ මැණික එහෙම කියන්න එපා. පොඩි කාලේ ඉඳලම අපි කතාබහ කරන්නේ එහෙමනේ.දැන් ඉතින් පුළුවන්ද ඒක වෙනස් කරන්න."
ප්‍රවීන් කනස්සල්ලෙන් මෙන් කීවේය.

" කරන්න දෙයක් නෑ ඔයා මට ඇත්තටම ආදරේ නම් එහෙම කරන්න."

" හරි හරි දැන්වත් හිනා වෙලා ඉන්න කොහෙවත් ඉන්නේ එකියක් නිසා අපේ සතුට නැති කරගන්න හොඳ නෑ මැණික. හරි හරි මං එහෙම කරන්නම්කො."

" එහෙනම් කමක් නෑ මේ ඒක නෙවෙයි ප්‍රගීත් D. සේනාධීර කියන්නේ කවුද? ඔයාලගේ නෑදෑ කවුරු හරිද..? මට ෆේස්බුක් රික්වෙස්ට් එකක් දාලා තිබුණා."

"ඒ අපේ අයියා එයාගේ සම්පූර්ණ නම ප්‍රගීත් දිනුත්තර සේනාධීර. එයා ප්‍රගීත් කියන කොටස වැඩිය යූස් කරන්නේ නෑ .හැමෝම එයාව දන්නේ දිනුත්තර කිව්වාම."

" අයියගේ ඔයාගේ නම් එක වගේ නේද ..?අයියා ප්‍රගීත් දිනුත්තර සේනාධීර.මල්ලි ප්‍රවීන් අනුත්තර සේනාධීර."
මම බසයට නගිමින් කීවෙමි.

පසුව අපි තුෂාරි ඇන්ටිලාගේ නිවසට පැමිණ දිවා ආහාරයට පෙර ඔවුන්ගේ කුඹුරේ ගියෙමු. අසල වූ ගඟකින් දිය නා නිවසට පැමිණ දිවා ආහාර ගත්තෙමු.

මහනුවර ශික්ෂණ රෝහලේ හදිසියේ වූ වැඩ වර්ජනයක් හේතුවෙන් අම්මාට සහ ඩිලාන් අංකල්ට හැකි ඉක්මනින් සේවයට වාර්තා කරන ලෙස ඉහළින් නියෝගයක් පැමිණියේය.
එම නිසා අප නැවතත් අනුරාධපුරයෙන් සමු දී මහනුවරට පැමිණීමට බසයට ගොඩ වැදුණි.

"ජීවිතයේ අමතක නොවන චාරිකාව මේක." මම ප්‍රවීන් අසලින් වාඩි වෙමින් ඔහුට කීවෙමි.

" ඒකනම් ඇත්ත බබා මං හිතුවේ නෑ අපේ පළවෙනි ට්‍රිප් එක මෙච්චර හොඳ වෙයි කියලා."

මම ප්‍රවීන් සමග බොහෝ වේලාවක් කතාබහ කරමින් හිඳ ඔහුගේ උරහිසට හේත්තුවී නිදා ගත්තෙමි.

මම හැරෙන විට මහනුවර නගරයට පැමිණ තිබුණි.

"බබා අපි තව ටිකකින් ගෙදර යනවා. ඒ නිසා ආයේ නිදාගන්න එපා." අම්මා කීවාය.

නිවසට පැමිණෙන විට ප.ව 7.00 පමණ වී තිබුණි. අප පැමිණ සුළු මොහොතකට පසු කුසුම නැන්දා පැමිණියාය.

අම්මා නයිට් ඩියුටි සඳහා සූදානම් වී නිවසින් පිට වුණාය.
මම කලින්ම රාත්‍රී ආහාර ගෙන නිදා ගත්තෙමි
.
උදෑසනම අවදිවන විට වෙලාව පෙරවරු 7.00 පමණ වුණි. මම නැගිට දත් මැද මූණ සෝදා, බතික් ගවුමක් ඇද කොණ්ඩේ පීරාගෙන පහළට යන විට අම්මා පැමිණ සිටියාය.
" අම්මා කොයිවෙලේද ආවේ..?"

"මං එනකොට පාන්දර 5.00 යි. හරි මහන්සි වුටි,ඊට පස්සේ ලොකු ඩොක්ටර් කිව්වා අද නිවාඩු ගන්න කියලා."අම්මා කීවාය.

" එහෙනම් හොඳයි අයියත් අද යනවනේ." මම තේ බොන අතරේ අම්මාට කීවෙමි.

" කොල්ල ඉඳලා ඉඳලා යනවා කිව්වහම හරි දුකයි."

තාත්තී පැමිණ කෑම මේසේ වාඩි වුණේය.
ඒ අතර මම මගේ කාමරේට ගියෙමි.

"අම්මයි තාත්තයි දෙන්නම ඉන්න එක හොඳයි.මට වැදගත් දෙයක් කතා කරන්න තියෙනවා."
අයියා බියෙන් කීවේය.

"එන්න පුතේ වාඩිවෙන්නකෝ ඇයි මොකක්ද එයාට තියෙන ප්‍රශ්නේ..?" තාත්ති ඇසුවේය.

"තාත්තේ මේ මම අපේ කැම්පස් එකේ ඉංජිනියරින් ෆැකල්ටි එකේ කෙල්ලෙක්ට ආදරේ කරනවා . "
අයියා බියෙන් තාත්තා දෙස බලා කීවේය.

"නම මොකක්ද පුතේ ඒ කෙල්ලගේ..?" අම්මා කාරුණිකව ඇසුවාය.

"හිරන්දි මිනුක්ෂා රණසිංහ"

" එතකොට ගෙවල් කොහෙද පවුලේ විස්තර එහෙම..?" අම්මා නැවත වරක් ඇසුවාය.

" ගෙවල් බණ්ඩාරවෙල.අම්මා බණ්ඩාරවෙල සෙන්ට්‍රල් කොලේජ් එකේ මැත්ස් ටීචර් කෙනෙක් තාත්තා ලෝයර් කෙනෙක්. නංගි මල්ලි ඉන්නේ එයාලත් ලොකුයි. මල්ලි අපේ නංගීගෙ වයස. ඊට වඩා අවුරුද්දක් වැඩිමහල් එයාගේ නංගි." අයියා කීවේය.

"දැන් සම්බන්ධ පටන් අරන් කොච්චර කල්ද..?" තාත්තා ඇසුවේය.

" දැනට අවුරුදු තුනක් වෙනවා තාත්තේ.."

"ඒ දෙමාපියෝ දන්නවද මේක ගැන."තාත්තා බැරෑරුම් ලෙස ඇසුවේය.

"ඔව් තාත්තේ. හිරන්දි කියලා, එයාලා කැමතියි මේ සම්බන්ධයට."

"මගේ විරුද්ධතාවයක් නෑ. ඔයා මෙච්චර ඉගෙනගෙන හෙට අනිද්දා ඩොක්ටර් කෙනෙක් වෙන්න ඉන්නකොට මට බෑ කියන්න බෑ. දැන් ඔයාගේ වයසත් හරි නේ. ඒ ළමයගේ පවුල් පසුබිම ප්‍රශ්නයක් නෑ. ඒ වුණාට කමක් නෑ මට ඒ දුවගෙ හරි දෙමාපියන්ගේ හරි ෆෝන් නම්බර් එකක් දෙන්න. මං කතා කරලා බලන්නම්."
තාත්තා ස්වල්ප වේලාවක් කල්පනා කර කීවේය.

" අපි දිනයක් දාගෙන බණ්ඩාරවෙල ගිහින් එමු නේද රුවන්ත."අම්මා තාත්තාට කීවාය.

ඒ අතර අම්මාට තරංගි ඇන්ටිගෙන් දුරකථන ඇමතුමක් පැමිණියාය.

" ගුඩ් මෝර්නින් තාරු."

" ගුඩ් මෝනින් මොකද අද උදෙන්ම මා මතක් වෙලා..?"

"එහෙම දේකට නෙවෙයි. මං මේ කතා කලේ ඒ ලෙවල් රිසාල්ට් අවුට් වෙනවා කියලා කියන්න."

" අනේ එහෙමද , නිවුස් වලට කිව්වද..?"

" ඔහු අද උදේ තමයි නිව්ස් වලට කිවුවේ. මටත් ආරංචි වුණා."

" හිතට පොඩි බයකුත් දැනෙනවා නේද තරංගී."

" මටත් එහෙමයි. ඔයා එහෙනම් වැඩක් කරගන්න. මං කියන්නම් තාරු බුදු සරණයි!"

" හා හරි තරංගි බුදු සරණයි!."

"චූටි…චූටි… පොඩ්ඩක් පහළට එන්නකෝ."

"ඇයි අම්මා මොකද..?"

"අද ඒ ලෙවල් රිසාල්ට් අවුට් වෙනවලු."

"මොනවා ඔය ඇත්තමද අම්මා කවුද කිව්වේ?"

"තරංගී ඇන්ටි කිව්වේ."

"දැන් නම් මට බයයි වගේ."

***

මම රාත්‍රී ආහාර ගෙන ප.ව 9.00ට පමණ ඇඳට ගියෙමි. හිතේ තිබෙන බය පහව යන්නටත් රාත්‍රී දොළහ වන තෙක් ඇහැරගෙන සිටීමටත් අවශ්‍ය නිසාත් මම ලැප් එකේ පිල්ම් එකක් දාගෙන බැලුවෙමි.

නමුත් 11.00ට පමණ මා හට නින්ද ගියේය.

මධ්‍යම 12.10 ට ප්‍රතිඵල නිකුත් කර තිබුණි.

ඒ විගසම අම්මා කාමරයට පැමිණ මාව අවදි කළාය.

" චූටි මැණික නැගිටින්න. result out වෙලා."

" ඉන්න අම්මේ මම බලන්නම්." එසේ කියමින් මම ලැප් එක ගෙන විභාග අංකය ගැසුවෙමි.

" 3542190 මගේ ජීවිතය වෙනස් කරන අංකය මම එලෙස සිතුවෙමි.

"ස්නෙහි උත්තරා විජේනායක.
තර්ක ශාස්ත්‍රය A මීඩියා A ICT B."
මම මාගේ ප්‍රතිඵලය කියෙව්වෙමි.

" ටිකක් දුකයි. අවුලක්ම නෑ ඉතින්.අම්මේ මට A 2යි. B 1යි තියෙන්නේ. ප්‍රවීන්ටයි එරන්දිටයි කතා කරලා බලමු."
මම අම්මාට කීවෙමි.
"මගේ කෙල්ලට බුදු සරණයි. ඔය හොඳටම ඇති." අම්මා සතුටින් මා බදා ගනිමින් කීවාය.

" මෙන්න කියනකොටම තරංගි ඇන්ටිගෙන් කෝල් එකක් එනවා."අම්මා දුරකථනය අතට ගනිමින් කීවාය.

"හෙලෝ තාරු, result out වුණා නේද කොහොමද සනුගේ රිසාල්ට්…?" තරංගි ඇන්ටි ඇසුවාය.
"ඔව් තරංගි දුවට A 2යි, B 1යි තියෙන්නේ.එයාට නම් රිසාල්ට් එක ටිකක් මදි වගේ."
අම්මා කීවාය.

" අනේ ඔය හොඳටම ඇති තාරු. මං සනුට විෂ් කරා කියන්නම්."

" ඒක නෙවෙයි තරංගි පුතාගේ රිසාල්ට් කොහොමද…? අම්මා ඇසුවාය.

" පුතාට A 3යි. දිස්ත්‍රික් ෆස්ට්. අයිලන්ඩ් රෑන් එක පහ." තරංගී ඇන්ටි සතුටින් කීවාය.

" අනේ කොච්චර ලොකු සතුටක්ද..? තුණුරුවන් සරණයි කොල්ලට.අනිවාර්යයෙන්ම උඩින්ම කැම්පස් සිලෙක්ට් වෙනවා. ඇත්තටම පුදුම සතුටක් දැනෙන්නේ තරංගී. මං විෂ්කරා කියන්න." අම්මා කීවාය.

" ඔව් තාරු, මටත් පුදුම සතුටක් දැනෙන්නේ. අද හවස අපේ ගෙදර පාටි එකක් ඇරේන්ජ් කරනවා.ඔයාලා අනිවාර්යෙන්ම එන්න ඕනි." තරංගි ඇන්ටි කීවාය.
"අපේ ලොකු පුතා නම් කැම්පස් එකට ගියා. අපි තුන්දෙනා අනිවාර්යයෙන්ම එන්නම්." අම්මා කීවාය.

" මං එහෙනම් තියන්නම් තාරු. බුදු සරණයි!"එසේ කියමින් තරංගි ඇන්ටි දුරකථනය තැබුවාය.

"ශෝක් නේද අම්මා ප්‍රවීන්..?"

" ඔව් පුතේ. ඒ කොල්ල මාර දක්ෂයි. මැත්ස් කරලා ඔහොම පාස් වුණා කියන්නේ අනිත් ඒවා අහන්නත් දෙයක්ද …?"

" අම්මේ මං එරන්දිටත් කෝල් කරලා බැලුවා ෆෝන් එක ඔෆ්. උදේට එයාට ආයෙ අරගෙන බලමු." මම ඇඳට නැග ශීට් එක පොරවා ගනිමින් කීවෙමි.

" හා හා එහෙම කරමු. දැන් නිදාගන්න." අම්මා එසේ කියමින් කාමරයෙන් පිටව ගියාය.

උදෑසන මා එරන්දිට දුරකථන ඇමතුමක් ගත්තද ඇය දුරකථනය විසන්ධි කර තිබුණි.

අම්මා වෙනදා මෙන් තාත්ති සමග වැඩ ගියේ කලින් පැමිණෙන බව කියාය. මම සවස ප්‍රවීන්ලාගේ ගෙදර රැගෙන යාම සඳහා තෑග්ගක් ගැනීමට නගරයට ගියෙමි.

මම නගරයේ වෙළඳසැලකින් ඔහුට අවශ්‍ය දේ තෝරා ගෙන පාර්සල් කරගෙන මුදල් ගෙවා වෙළඳසැලෙන් පිටවුණි.

ඒත් සමගම මට උදේ ආහාර නොගත් නිසා කුසගින්නක් ඇති වුණි.

මම ආහාර ගැනීමට අවන්හලකට ඇතුළු වුණෙමි.

එකවරම මම අකුණක් වැදුනාක් මෙන් අවන්හලේ දොර අසල නතර වුණෙමි.

"මොනවා එරන්දි හිරාන් එක්ක." මාහට කියවුණි.

ඔවුන් දෙදෙනා අත් අල්ලාගෙන කතාබහ කරමින් සිටි නිසා මා දුටුවේ නැහැ.මම ඉක්මනින් අවන්හලෙන් පිටතට පැමිණියෙමි.
මට එය සිතාගත නොහැකි වුණි.

මම ඉක්මනින්ම නිවසට පැමිණියෙමි.
සවස 6.00 ට පමණ අම්මා හා තාත්ති නිවසට පැමිණියහ.

මම දිග ලා නිල් පැහැති කැශ්මියර් ගවුම ඇඳ, චේන් එක දමා,අතට නිල් පැහැති ගල් ඇල්லූ අත් පළඳනාව,ඔරලෝසුව හා මුද්ද දමා, ස්ට්‍රේට් කොණ්ඩය ක්‍රේල් කර, ලාවට මෙන් මේකප් එකක් දමා තෑග්ග ද බෑග් එකට දමා පහළට ගියෙමි.

අම්මා කළු පැහැති සිල්ක් සාරියක් ඇඳ සිටියාය.
තාත්තා කළු පැහැති අත් දිග ෂර්ට් එකක් සහ සුදු කලිසමක් ඇඳ සිටියේය .
ඔවුහු ප්‍රවීන්ට තෑග්ගක් ගත්තෝය.

"මොනාද අම්මේ ඔයාලා ප්‍රවීන්ට දෙන්න ගත්තේ…?" මම ඔවුන්ගෙන් ඇසුවෙමි.

"තාත්ති ජුවලරි ෂොප් එකෙන් බොයිස් බ්‍රේස්ලට් එකක් අරගෙන. මම ඩෙක්ෂූස් 2ක් ගත්තා. යන ගමන් ෆුඩ්සිටි එකෙන් චොක්ලට් කේක් එකක් ගන්නවා."

"ආ ඒ තෑග්ග හොඳයි.අපි එහෙනම් යමු නේද අම්මා?"

අපි ප්‍රවීන්ගේ නිවසට යන විට සවස හත පමණ වී තිබුණි. අපි හිතුවාටත් වඩා හොඳට උත්සවය සංවිධානය කර තිබුණි. ප්‍රවීන් තද නිල් පැහැති අත් දිග ෂර්ට් එකක් ඇඳ, ලා දුඹුරු පැහැති කලිසමක් ඇඳ කොණ්ඩය උඩට කර පීරා,තරමක් රැවුල වවා, ඔරලෝසුව හා චේන් එකක් පැළඳ සිටියේය.
ඔහුගේ ඒ වැදගත් කඩවසම් පෙනුමට දුටු ඕනෑම අයෙකු වශී වනවා සත්තයි.

මුළු නිවසම සුදු බල්බ් වැල් දමා සරසා තිබුණි. නිල් පාට හා සුදුපාට බැලූම් වලින්ද, ඒ පාටම ටේප් පටි වලින්ද නිවස හා මිදුල සරසා තිබුණි. ප්‍රවීන්ගේ නෑදැයන්ගෙන් හා යහළුවන්ගෙන් මුළු නිවසම පිරී තිබුණි.

" ප්‍රවීන් පුතා ඔයාට අපෙන් උණුසුම් සුබපැතුම්."තාත්ති ප්‍රවීන් දෙස බලා කීවේය.

අප සිටින දෙසට තරංගි ඇන්ටි සහ ඩිලාන් අංකල්ද පැමිණියහ.

"ආ එන්න තාරු… මගේ කෙල්ලත් හොඳට විභාගෙ පාස් වෙලානේ, අපිට ආඩම්බරයි ඉතින්." තරංගි ඇන්ටි මාව තුරුලු කර ගනිමින් කීවාය.

ඇය අද නිල් පැහැති සාරියක් ඇඳ සිටියාය . අංකල් ප්‍රවීන් ඇඳ සිටින කමිසයම ඇඳගෙන සිටියේ ය.

"මෙන්න පුතා ඔයාට පුංචි ගිෆ්ට් එකක්." අම්මා ප්‍රවීන්ට තෑගි දෙන අතරේ කීවාය.

"අද හැමෝටම වඩා ලස්සන අපේ සනු කෙල්ල." ඩිලාන් අංකල් මා දෙස බලමින් කීවේය.

අම්මා හා තාත්තා ප්‍රවීන්ගේ දෙමාපියන් සමග නිවස ඇතුළට ගියහ.
ප්‍රවීන්ලාගේ නිවසේ උද්‍යානය අලංකාරවත් ලෙස සරසා තිබුණි.

"අනේ මගේ ප්‍රවීන්,මයි කන්ග්‍රැජුලේශන්ස්, මට ඔයාට රිසාල්ට් ඇහුවහම පුදුම සතුටක් වගේම ආඩම්බරයක් දැනුනා.අද මෙහේ එන නිසා කෝල් කරේ නැත්තේ. ඒවගේම ඔයා අද මාරම හැන්සම්. මෙන්න ඔයාට පොඩි ගිෆ්ට් එකක්."
මම ප්‍රවීන්ට සතුටින් කීවෙමි.

"තැන්ක්යූ මැණික. ඔයා සුරංගනාවියක් වගේ අද මෙහෙට ඇවිල්ල ඉන්න එකම මදිද, වෙන මොන තෑගි ද ..?ඔයාගේ රිසාල්ට් එක ගොඩක් හොදයි."

" මටනම් මගේ රිසාල්ට් එක ගැන දුකයි. නෑ නෑ ඒක හොඳයි. වැඩිය හිතන්න එපා. මට ඔයාගෙන් තව තෑග්ගක් ඕනි."

" මොකක්ද..?"

"ඔයා මෙච්චර කල් මට ආදරේ කිව්වේ නෑනේ. කැමතියි කියලා විතරනේ කිව්වේ, ඒ වගේම මට කිස් එකක් ඕනි මැණික."

"ආ… ඒක තමයි මේ.හ්ම්ම්ම්…හා හා ඉන්නකෝ මං කියන්නම්. I love you so much ප්‍රවීන්." මම ඔහුගේ නළල සිප ගනිමින් කීවෙමි

"මීටූ … මාත් ඔයාට ගොඩක් ගොඩක් ගොඩක් ආදරෙයි මැණික."
ඔහු මාව තුරුලු කර ගනිමින් කීවේය.

" ප්‍රවීන් මේ ඔයාට කියන්න දෙයක් තියෙනවා. මොකක්ද බබා..?"

" මේ මං අද ටවුන් එකට ටවුන් එකේ කොෆි ෂොප් එකට ගියා යනකොට මං දැක්කා table එකක එරන්දි හිරානුයි අත් අල්ලගෙන කතා කර කර ඉන්නවා."

" මොනවා එරන්දි, එයා ඒ ජාතියේ කෙනෙක්ද..?"

" අද ඔයාලගේ ගෙදර ආවේ නැද්ද..?"

" රූපිකා ඇන්ටි නිහාල් අංකල් එක්ක ඇවිත් හිටියා. අපේ අම්ම ඇහුව ඇයි එරන්දී ආවෙ නැත්තේ කියලා. එයාට හොඳට උණ කිව්වා. එයාගේ රිසාල්ට් එකත් හොඳටම අඩුයි."

"ඇයි කොහොමද එයාගේ රිසාල්ට්..?"

" එයාට S 1යිලු, අනිත් දෙකම ෆේල්ලු. හිරාන්ට C3යිලු."

"අනේ මන්ද ප්‍රවීන්, මුං මොනවා කරන්න හිතන් ඉන්නවද කියලා …?"

"හරි හරි අපි දැන් ඕවා අමතක කරමු. එන්න අපි දෙන්න මගේ කැමරා එකෙන් ෆොටෝ එකක් ගහමු."

අනතුරුව ප්‍රවීන් ගෙදර උද්‍යානයේ සිටම කේක් කැපුවේය.සියලු දෙනා බීම බී විනෝද වුණෝය. අපි ප්‍රවීන්ට තෑගි ෆොටෝ ගැසුවෙමු. රාත්‍රී 9.00ට පමණ රාත්‍රී ආහාර ගත්තෙමු.

"බබා මේ හෙට මගේ මියුසික් වීඩියෝ එක කරනවා. මම හැමදේම රෙඩි කරල තියෙන්නේ. හෙට හැමෝම උදේට ඉස්කෝලේ යනවා කිව්වා. ගිහින් එන ගමන් එන්න වීඩියෝ එක කරන්න."ප්‍රවීන් කීවේය.

"ඔව් මාත් හෙට ඉස්කෝලෙ යනවා. හැබැයි පොඩි ප්‍රශ්නයක් තියෙනවා. අපේ අම්මලා කැමති වෙයිද දන්නෑ." මම කණගාටුවෙන් මෙන් කීවෙමි.

" මං රුවන්ත අංකල් ගෙන් අහන්නද? ඉන්නකො මං අහලා එන්නම්. පොඩ්ඩක් ඉන්න." එසේ කියමින් ප්‍රවීන් කලබලයෙන් මෙන් තාත්ති හමුවීමට ගියේය.

තාත්තී ප්‍ර මදක් කල්පනා කර ප්‍රවීන්ට කැමැත්ත ලබා දුන්නේය.

අපි නිවසට යන විට රාත්‍රී 11.00 පමණ වුණි. පසුදින පාසල් යාම නිසාත් ප්‍රවීන් සමග මියුසික් වීඩියෝ එක කිරීම නිසාත් මා සතුටින් පසුවුණි.

" ප්‍රවීන් ගුඩ් නයිට්, මට ඔයාව ගොඩක් මතක් වෙනවා. අපි හෙට හම්බවෙමු."
මම ප්‍රවීන්ට එලෙස පණිවිඩයක් යවා නිදා ගත්තෙමි .

***

පසු දින උදෑසන අවදි වී පාසල් යාමට සූදානම් වුණෙමි.

"තාත්ති, මාව ඉස්කෝලෙට ගිහින් දාන්න පුළුවන්ද…?"මම පහළට ගොස් තාත්තිගෙන් ඇසුවෙමි.

" හා යමු පැටියෝ. අම්මත් අපිත් එක්කම වැඩට යයි." තාත්ති කීවේය.

" ඉන්න එහෙනම් මං ඉක්මනට කෑම කන්නම්."එසේ කියමින් මම කෑම මේසේ වාඩි වුණෙමි.

"චූටී… අද නේද ප්‍රවීන් පුතාගේ මියුසික් වීඩියෝ එක කරන්නේ…?" තාත්ති මගෙන් ඇසුවේය.

"ඔව් තාත්තී ප්‍රවීන් කිව්වා ඉස්කෝලේ ගිහින් ඇවිත් කරමු කියලා. ප්‍රසාදි අක්කිත් අපිත් එක්ක එනවා."මම බත් කන අතරේ තාත්තිට කීවෙමි.

අනතුරුව මම අම්මා හා තාත්තා සමඟ පාසලට ගියෙමි. අම්මා පාසලේ සියලුම ගුරු මණ්ඩලයට බෙදා දීමට කේක් 6kgක්ද, කෙසෙල් ගෙඩි හා බීම බෝතල් ලීටර් 10 ක්ද සැලකින් අරගෙන දුන්නාය.

මම පාසලට ගොස් සියලුම ගුරුවරුන්ට බුලත් දී වැන්දෙමි.

අනෙක් යහළුවෝ ටීචර්ස් ස්ටාෆ් එකට ලබාදීමට කැවිලි පෙවිලි ගෙනවිත් තිබුණෝය.
අපි ඒවායින් කුඩා උත්සවයක් ලෙස සංවිධානය කර ගුරු මණ්ඩයට සංග්‍රහ කළෙමු.

පාසලේදී ප්‍රවීන්ව මුණගැසුණි.
අපට පාසලේ සියලුම ගුරුවරුන් ප්‍රශංසා කළහ.

" ඔයා මාත් එක්ක යන්න එනව නේද? මා දුටු මොහොතේ ඔහු මගෙන් ඇසුවේය.

" ඔව් යන්න එනවා. අපි දෙන්නා ඔයාලගේ ගෙදරට බස් එකේ යමු නේද…?"

"ඔව් එහෙම කරමු. ගෙදරට ගිහින් ඔයා ගෙනාපු ඇඳුම් චේන්ජ් කරගන්න. මං ඔයාට ඕනි කරන දේවල් ගත්තා. ප්‍රසාදි අක්කී තමයි ගෙනත් දුන්නේ."

"එයත් එනවා නේද…?"

"ඔව් අක්කි එනවා. එහෙනම් ඔයා ඉස්කෝලෙන් යද්දි මට කතා කරන්න."

පසුව අප දෙදෙනා බස් රථයෙන් ඔවුන්ගේ නිවසට පැමිණියෙමු.

අප යනවිට ප්‍රසාදි අක්කී පැමිණ සිටියාය. මම ඇඟ සෝදා ඇඳුම් මාරු කර ගත්තෙමි. ප්‍රසාදි අක්කී ඇය තෝරාගත් ඇඳුම් පෙන්නුවාය.

" නංගි මේ මං සිලෙක්ට් කරපු ඇඳුම්. බලන්න හොඳද කියලා..?" ප්‍රසාදි අක්කී ඇඳුම් පෙන්නමින් කීවාය.

විවිධ වර්ගයේ අලංකාර ඇඳුම් කිහිපයක් සහ අවශ්‍ය සියලුම දේ ප්‍රසාදි අක්කී රැගෙන විත් තිබුණාය.

"සනු මුලින්ම අපි යන්නේ ගැටඹේ පන්සලට, පේරාදෙණිය ළඟයිනේ. අපි මුලින්ම ඒක කරමු. ඔයා වයිට් කලර් ෆ්‍රොක් එක ඇඳගන්න." ප්‍රවීන් මා හට කීවේය.

මා ඇඳුම් ඇඳ ගත් පසු ප්‍රසාදි අක්කී මාගේ කොණ්ඩය උඩ ඉඳන් ගොතා සුදු පිච්චමල් වැනි කොණ්ඩකටු පෙළක් ගැසුවාය. පොඩියට මේකප් එකක්ද දැමුවාය.

අනතුරුව මම ප්‍රවීන් සමග තරංගී ඇන්ටිගේ මෝටර් රථයෙන් ගැටඹේ පන්සලට ගියෙමු.කැමරාව හා අවශ්‍ය උපකරණ රැගෙන දිනුත්තර අයියාගේ යහළුවන් තිදෙනා පැමිණියහ.

සුදු නෙළුම් මල් මිටක් මිලදීගෙන පළමුව ගැටඹේ පන්සලේ මියුසික් වීඩියෝ එකේ කොටසක් කර පසුව නැවත පැමිණ අනෙක් ඇඳුම් ද ඇඳ සැන්ඩ්සයිඩ් නම් හෝටලේ ඉතුරු කොටස කළෙමු.

සම්පූර්ණ වීඩියෝ එකම කළ පසු ප්‍රවීන් මාව නිවසට ගෙනත් බස්සවව්වේය.

ප්‍රවීන් 'රෝයල් ප්ලේ' ස්ටුඩියෝ එකට ගොස් සිංදුව කීවේය. එම ස්ටුඩියෝ එක අයිති වූයේ දිනුත්තර අයියාගේ යහළුවෙකු වන කසුන් මාලියද්ද අයියාටයි.

පසුදින ප්‍රවීන් මියුසික් ඕඩියෝ එකක් මා හට ඒවා තිබුණේය.

*"සඳට හාදු දෙමින් සඳ ළඟින් ගැවසෙමින් නිතරම*
*රහස් කොඳුරමින් ආලයෙන් මා හදේ ලැගුම් ගෙන*
*ස්නේහවන්තී නුඹයි මාහට ජීවේ ගෙන දෙන*
*මල් වහනට වඩින් සඳ දෙව්දූ හද පුද*

*සංසාරේම මා නිවනා අංගනාව නුඹ*
*මියුරු වදන් තෙපලන්න මා හට*
*හදේ ඉපදී නුඹ මාගේ ප්‍රාර්ථනා ලෙස මගේ නේද නුඹ කියන් සුරඟන*
*නුවර අඳුරේ වෙලී මා ළඟ සැතපෙන්න දෙව්ලිය*
*මාගේ ආලයෙන් මුසපත් වීදෝ දෙකොපුල*

*සඳට හාදු දෙමින් සඳ ළඟින්…*

*හිටිහැටියෙම නුඹේ ඇස් දෙක කතා කරනකොට*
*හිරි වැටුණා මගේ හදවත නැවතුන තැන අමතක කොට*
*මගේ දිවියම ප්‍රාණ කොට ගෙන හිනහෙන්නකෝ ආදරෙන් කුමරි මාගේම*

*සඳට හා දෙමින් සඳ ළඟින්…"*

ඔහුගේ කටහඬට මම වශී වුණෙමි.
ඔහු පද රචනයත් අපූරුවට සිදුකර තිබුණේය.

දින දෙකකට පමණ පසු මියුසික් වීඩියෝ එක මට එවා තිබුණි. ඔහු P&S Music King නම් ඔහුගේ යූටියුබ් නාලිකාවටද වීඩියෝ එක දමා තිබුණේය.

වීඩියෝ එකේ සිටින්නේ මන්දැයි කියා සිතාගත නොහැකි වුණේය.

"වීඩියෝ එක මාරම ලස්සනයි ප්‍රවීන්." මම සතුටු සිතින් යුතුව ප්‍රවීන්ට ඇමතුමක් ගැන සුබ පැතුවෙමි.

"චූටී, අද අයියා එනවා. අපි හෙට බණ්ඩාරවෙල යනවා."උදෑසනම අම්මා කීවාය.

" අනේ කොච්චර හොඳද අම්මේ. අක්කිලාගේ ගෙදරින් දන්නවද අපි එනවා කියලා."

"ඔව් දන්නවා ඒවා කලින්ම කතා කරගත්තා. හෙට එහේ යන්න ඇඳුම් එහෙම ලෑස්ති කරගන්න."

"අම්මාද නිවාඩු ද අද."

"ඔව් පුතේ මං දවස් තුනක් නිවාඩු දැම්මා."

ස්වල්ප වේලාවකට පසු අයියාද නිවසට පැමිණියේය. නිවසේ සියලුම දෙනා පසුදින බණ්ඩාරවල යාමට සූදානම් වුණි.

"නංගී අපි දෙන්න ටවුන් එකට ගිහින් යමුද…?"අයියා ආහාර ගෙන අනතුරුව මගෙන් ඇසුවේය.

" ඇයි අයියා හදිසියක්ද..?"

" නෑ නංගී හෙට හිරුට ගෙනියන්න මොනවා හරි ගිෆ්ට් එකක් ගන්න ඕනි. මට සිලෙක්ට් කර ගන්න තේරෙන්නේ නෑ. පොඩි සපෝට් එකක් ඕන ඒකයි."

"ආ යමු යමු ඉන්න මං ලෑස්ති වෙලා එන්නම්." එසේ කියමින් මම කාමරයට පැමිණියෙමි.

මම අයියා සමග ඔහුගේ මෝටර් රථයෙන් කැන්ඩි සිටි සෙන්ටර් එකට ගියෙමි.

"අයියේ අක්කි ආසම පාට මොකක්ද?"
මම ඇඳුම් ගැනීමට ගොස් ඔහුගෙන් ඇසුවෙමි.

"එයා ආසම පාට… රෝස පාට."ඔහු ටිකක් කල්පනා කර කීවේය.

අපි අක්කිට රෝස පාට ගවුමක්, කළුපාට ටී ෂර්ට් එකක්, හයිවෙස්ට් ඩෙනිමක්, අත් ඔරලෝසුවක්, මුදල් පසුම්බියක් හා සුවඳ විලවුන් බෝතලයක් මිලදී ගත්තෙමු.
අයියා ෆෝන් කඩයකට ගොස් ඇයට iphone එකක්ද ගත්තේය.

"හිරුගේ ෆෝන් එක පරණ එකක් ඒකයි මං අලුත් ෆෝන් එකක් ගත්තේ." අයියා ෆෝන් කඩයෙන් එළියට එන අතරේ කීවේය.

"ඒක හොඳයි අයියේ.මට අක්කිව දකිනකන් ඉවසිල්ලක් නෑ."

"ඔයාට කියන්න ගුඩ් නිවුස් එකක් තියනවා."

"අනේ ඒ මොකක්ද අයියේ..?"

"ක්‍රිශාන් යාළුවෙලා ඉන්නේ වරින්දි එක්කනේ. මං ඒ නිසා එයාටත් අපිත් එක්ක යන්න එන්න කිව්වා.ක්‍රිශාන් මගෙන් ඇහුවා ප්‍රවීන්වත් එක්කගෙන යමුද කියලා. මම මගේ නංගි බබා ගැන හිතලා හා කිව්වා. ඒ දෙන්නත් අපිත් එක්ක යන්න එනවා."

"අනේ ඇත්තමද මට විශ්වාස කරන්න බෑ. ඔයා නම් හරි හොඳයි. තැන්කියූ සෝ මච්."මම අයියාගේ අත අල්ලමින් සතුටින් කීවෙමි.

අපි නිවසට පැමිණෙන විට දහවල් 1.00 පමණ විය.
අයියා මට අයිස් ක්‍රීම් ද අරගෙන දුන්නේය. අපි නිවසට යන විට අම්මා ගමනක් යාමට සූදානම් වී සිටියාය.

"කොහෙද අම්මේ යන්න හදන්නේ…?" මම නිවසට ඇතුල් වෙද්දීම අම්මාගෙන් ඇසුවෙමි.

" පුතේ ප්‍රසාදි අක්කී තරංගී ඇන්ටිලා ගෙදර මේ ටිකේ ඉන්නේ. මම මේ අක්කිට කෑම එකක් ගිහින් දෙන්න කියලා. දැන් ඉතින් අම්මා කෙනෙක් වෙන්න ඉන්න එකනේ." අම්මා මේසය මත තබා ඇති කෙසෙල් කොලේ එතූ ලොකු බත් පාර්සලේ පෙන්නමින් කීවාය.

"අම්මේ මමත් එන්නද ඔයත් එක්ක යන්න."

" ඔයාට මහන්සි නැත්තං යමු."

මම අම්මා සමග තරංගී ඇන්ටිලාගේ ගෙදරට ගියෙමි.
අප යනවිට තරංගී ඇන්ටි වූල් වලින් පොඩි ජර්සියක් ගොතමින් සිටියාය.

ප්‍රසාදි අක්කිත් ඒ අසලම වාඩිවී සිටියාය.

"ආ තාරු, එන්න ඇතුළට." තරංගී ඇන්ටි සාදරයෙන් අපව පිළිගත්තාය.

"මෙන්න දූ ඔයාට කෑම එකක් ගෙනාවා." අම්මා කෑම පාර්සලය හා පළතුරු කූඩය ප්‍රසාදි අක්කී අතට දෙමින් කීවාය.

" අනේ ඇන්ටි කරදර වෙලා. කෑම එකේ සුවඳ කන්න ආස හිතෙනවා. මම තව ටිකක් දවල් වෙලා කන්නම්.ඇන්ටිට පින් සිද්ධ වෙනවා." ප්‍රසාදි අක්කී නිර්ලෝභීව කීවාය.

"කෝ පුතාලා නැද්ද තරංගී..?" අම්මා පුටුවක ඉඳගනිමින් ඇසුවාය.

අද ලොකුට නිවාඩු නිසා චූටි පුතාව එක්කගෙන එයාගේ යාළුවෙක්ගේ ගෙදර ගියා. මියුසික් වීඩියෝ එක කරන්න උදව් කරපු කසුන් පුතාලගේ ගෙදර."තරංගී ඇන්ටි කීවාය.

එසේ කියද්දී මගේ බලාපොරොත්තු සුන් වී ගියේය.

"ආ ඇන්ටි මං එදා ගෙනියපු පොත් හතර ගෙනාවා. මං අද තව අලුත් පොත් ටිකක් ගන්නද, සොරි ඇන්ටි පොත් ටික ගේන්න පරක්කු වුණාට."මම පොත් ටික බෑග් එකෙන් එළියට ගනිමින් කීවෙමි.

"ඊට්ස් ඕකේ සනු.ඔයා කැමති පොත් ටිකත් තෝරගෙන එන්න. ගේන්න පරක්කු වුණාට නං කමක් නෑ." තරංගී ඇන්ටි කීවාය.

"මම පොත් කාමරේට ගොස් පොත් හයක් තෝරාගෙන ආවෙමි. අම්මලා කුස්සියට ගොස් කතා කරමින් සිටියහ. මම ප්‍රසාදී අක්කී සමග කතාබහ කරමින් සිටියෙමි.

"අක්කි ඔයාලා ගම්පොළ ගෙදර යන්නේ නැද්ද ආය..?"

"අම්මගෙන් කරදරේ මෙහේ ඉන්න කියලා. මේ ටිකේ මෙහේ ඉන්නවා. ගම්පොළ ගෙදර ගියොත් අපි දෙන්නා විතරනේ. බබා හම්බවෙනකම් නුවර ඉන්නවා."

"ඒක හොඳයි අක්කි,ඒක නෙවෙයි ඔයා කොහෙද දැන් වැඩ කරන්නේ?"

මම BOC බැන්ක් එකේ ඇසිස්ටන් මැනේජර් ,කැන්ඩි බ්‍රාන්ච් එකේ."අක්කී කීවාය.

"ෂා ශෝක්නේ අක්කී. එතකොට දිනුත්තර අයියා නුවර ධර්මරාජේ ටීචින් නේද කරන්නේ?"

"ඔව් නංගී. අපි ගම්පොළ ගෙදර ගියත් ආයෙම නුවරට ජොබ් එකට එන්න ඕනි. උදේට එපා වෙනවා."

" ඔයාලා දිගටම මෙහි නවතින්න තියෙන්නේ."

" බෑ නංගි බබා හම්බුනාම යනවා. අම්මලාට කරදරේනේ. අනික මේ ගෙදර ප්‍රවීන් මල්ලිටනේ අයිති."

" අයියෝ අක්කී ප්‍රවීන්ට එහෙම තණ්හාවක් නෑ. ඔන්න ඔහේ ඔයාලා ඉන්න. අනික ඔය දේවල් එයාට ඕනි වෙන්නේ පස්සෙනෙ."

"ඒක නෙමේ නංගී අද අපි දළදා මාලිගාව යනවා.හවස පූජාවට භාරයක් වෙන්න. ඕනේ. මායි අයියයි මල්ලි යන්නේ. ඔයත් එනවා නම් එන්න. අනික මං දන්නවා ඔයයි මල්ලියි අතර එෆෙයා එකක් තියෙනවා කියලා."

"ඔව් අක්කී.අනේ කොච්චර හොඳද.මාත් එන්නම් එහෙනම්. ඒක නෙමෙයි කොහොමද අක්කී අපේ එෆෙයා එක ගැන දැන ගත්තේ..?" මම විමතියෙන් මෙන් ඇසුවෙමි.

"මට එරන්දි කිව්වේ.මාත් එක්ක කතා කර කර ඉන්නකොට එරන්දිට කියවුණා. අයියත් දන්නවා." ප්‍රසාදි අක්කී කීවාය.

එරන්දි හිතාමතාම අක්කාට එය කියා ඇති බව මට සිතුණි. එරන්දී සමග පුංචි කේන්තියකුත් හිතේ හටගත්තෙමි.

පසුව අම්මා සමග මම නිවසට පැමිණියෙමි.

"අම්මේ මට ටිකක් මහන්සි.මං වොශ් එකක් දාගෙන නිදාගන්නවා. මට 5.00ට විතර කතා කරන්න.ප්‍රසාදී අක්කිලත් එක්ක දළදා මාලිගාවේ යන්න ලෑස්ති වෙන්න ඕනී."

"ඔව් අක්කී මට කිව්වා ඔයාවත් එක්කගෙන යනවා කියලා. එහෙනම් පොඩ්ඩක් හාන්සි වෙන්න."

මම කාමරයට පැමිණ ඇඟ සෝදා සැහැල්ලු ඇඳුමක් ඇඳගෙන එරන්දීට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

නමුත් ඇය නම්බරේ බිසී දමා තිබුණි. මට එරන්දි ගැන දැඩි කලකිරීමක් ඇති වුණි.

මම ප්‍රවීන්ට පණිවිඩයක් යැව්වෙමි.

"බබා අපි එදා ගැටමේ ඇඳපු සුදු ඇඳුම් දෙක අද දළදා මාලිගාවේ යන්න අඳිමු නේද..? මම එසේ පණිවිඩයක් යොමු කර නිදා ගත්තෙමි.

***

"චූටි... චූටි...පුතේ නැගිටින්න. දැන් වෙලාව 5.00යි." අම්මා කාමරයට ඇවිත් මාගේ ඔලුව අතගා කතා කළාය.

මම අවදිවී එදා මියුසික් වීඩියෝ එකට ගත් සුදු දිග බතික් ගවුම ඇඳ කොණ්ඩය මෝස්තරයකට දමා සූදානම් වුණි.

"අයියේ මාව තරංගී ඇන්ටිලාගේ ගෙදරට ගිහින් දාන්නකෝ.මම පහළට ගොස් අයියාට කියා සිටියෙමි.

පසුව මම අයියාත් සමග ප්‍රවීන්ලාගේ ගෙදරට ගියෙමි.

අප යන විටත් ඔවුහු සූදානම් වී සිටියහ. අයියා ටික වේලාවක් එහි රැඳී යළි නිවසට ගියේය.

"මං දවල් ආවා ඔයා හිටියේ නෑනේ."

"ඔව් මැණික අම්මා කිව්වා මට හිතුණා අපරාදේ කසුන් අයියලා ගෙදර ගියේ කියල. කමක් නෑ දැන් මාලිගාවේ යනවනේ."

අපි හතර දෙනා දිනුත්තර අයියාගේ කැබ් එකෙන් දළදා මාලිගාවට ගොස් දළදා වහන්සේ වන්දනා කළෙමු.

මල් පූජා කර දිනුත්තර අයියා සහ ප්‍රසාදි අක්කී දරුවාට භාර වුණි.අපි බොහෝ වෙලාවක් මාලිගාවේ රැඳී ඡායාරූප ගෙන පසුව නිවසට පැමිණියෙමු.
අපි සිත් සේ දළදා වහන්සේ වන්දනා කර ගත්තෙමු.

"අනේ හිතට මාරම සැනසීමක් දැනෙනවා.වාඩිවෙලා එතනම ඉන්න හිතෙනවා." ප්‍රසාදි අක්කී කීවාය.

" ඔව් සුදු ඒකනම් ඇත්තක්.අපි ආය දවසක ගිහින් එමු."දිනුත්තර අයියා කීවේය.

"සනු අද මෙහේ ඉඳලා හෙට උදේට යන්න."මා නිවසෙන් පිටවීමට සූදානම් වෙද්දී තරංගි ඇන්ටී  කීවාය.

"බෑ ඇන්ටි. අපි හෙට බණ්ඩාරවල යනවනේ. ඒක නෙමෙයි ඇන්ටි ප්‍රවීන්වත් එක්කගෙන යමු කියලා අයියා කිව්වා. උදේට ක්‍රිශාන් අයියත් එනවා."

"ඔව් පුතේ ඔයාලගේ අම්මා මට හවස කෝල් කරලා කිව්වා. මම ලොකු පුතාට කියන්නම් තව ටිකකින් ඔය දෙන්නව ඔයාලගේ ගෙදරට ගිහින් දාන්න කියලා."

"එපා අම්මේ අයියා  එන්න ඕනි නෑ.මගේ බයික් එකේ අපි දෙන්නට යන්න පුළුවන්. එතකොට ආයෙ අනිද්ද එනකොට මටයි ක්‍රිශාන් අයියටයි බයික් එකේ එන්න පුළුවන්. අංකල්ලාට කරදර කරන්න ඕනෙත් නෑ."ප්‍රවීන් කීවේය.

"ඒකත් ඇත්ත තමයි. අනේ ඒ වුණාට මට බයයි ඔය දෙන්නව තනියම යවන්න. දෙන්නට තනියම යන්න පුළුවන්ද..?දැන් කළුවරත් වෙලා." තරංගි ඇන්ටි බියෙන් ඇසුවාය.

"පුළුවන් ඇන්ටී. අපි පරිස්සමෙන් යන්නම්."

"එහෙනම් දෙන්නා බත් ටිකක් කාලා පරිස්සමෙන් යන්න. චූටි පුතා ඔයාට ඕන කරන දේවල් එතකන් මං ලෑස්ති කරලා දෙන්නම්." තරංගී ඇන්ටි කීවාය.

අනතුරුව  බත් කා,අපි දෙදෙනා නිවසට පැමිණීමට පිටත් වුණෙමු.

"සනූ මැණික මාව හයියෙන් අල්ල ගන්න." ප්‍රවීන් මෝටර් රථයේ පණ ගන්වා කීවේය.

මම ඔහුව තුරුලු කර ගත්තෙමි.
මේ සිහිනයේ සදාකල්ම වෙලී ඉන්නට ඇත්නම් ගියා මට සිතුණි.
අප නිවසට පැමිණෙන විට වේලාව රාත්‍රී 8.00 පමණ විය.

"ආ දරුවෝ දෙන්න ආවද මොකද මෙච්චර පරක්කු වුණේ. තාත්ති දැන් ලෑස්ති වුණේ එක්කගෙන එන්න යන්න." අම්මා අප ලෙස බලා කීවාය.

"එන්න ප්‍රවීන් පුතේ ගෙට,ඔයා ඕන කරන ඇඳුම් එහෙම අරන්ද ආවේ …?"තාත්ති ප්‍රවීන්ගෙන් ඇසුවේය.

"ඔව් අංකල්.මං ඕන කරන දේවල් ගෙනාවා."

"එහෙනම් පුතේ බෑග් එක දෙන්න. සොහාන් අයියගේ කාමරයෙන් තියන්නම්. පුතා අද රෑට අයියත් එක්ක නිදාගන්න." ප්‍රවීන්ගේ අතෙහි වූ බෑග් එක ගෙන අම්මා කීවාය.

"ඔයාලා දෙන්න එහෙනම් වොෂ් එකක් දාගෙන එන්න. ඇවිත් කෑම කමු."

"අම්මේ අපි ප්‍රවීන්ලගේ ගෙදරින් කෑම කාලා ආවේ. තරංගී ඇන්ටි කෑම බෙදලා දුන්නා."

"හා පුතේ එහෙනම් තව ටිකක් රෑ වෙලා තේ එකක් හදලා දෙන්නම්."

අපි කාමර වලට ගොස් පිරිසිදු වී ඇඳුම් මාරු කර ගත්තෙමු.

පසුව මම සාලයට වී ප්‍රවීන් හා අයියා සමඟින් කතා බස් කරමින් සිටියෙමි.

"අනේ ප්‍රවීන් සින්දුවක් කියන්නකෝ." මම ප්‍රවීන්ගෙන් ඉල්ලා සිටියෙමි.

"මගේ ගිටාර් එක නැතුව බෑ අනේ."

"ඉතින් මගේ ගිටාර් එක තියෙනවා.ඒක  ගෙනත් දෙන්න නංගි ප්‍රවීන්ට." අයියා කීවේය.

මම ඉක්මනින්ම අයියාගේ කාමරයට ගොස් ඔහුගේ ගිටාර් එක ගෙනවිත් ප්‍රවීන්ට දුන්නෙමි.

ඔහු කවිකාර ආදරේ සිංදුව කීවේය.මම ඔහු සිංදුව කියන ආකාරය දෙස ඇසිපිය නොහෙලා බලා සිටියෙමි. ඔහුගේ කටහඬ නම් දෙවියන් උපතින්ම දායාද කළ තිළිණයක් යැයි මට සිතුණි.

පසුව අප කතා කරමින් හිඳ පසුදා උදෑසන බණ්ඩාරවෙල යාමට අවශ්‍ය සියලු දේ සූදානම් කළෙමු.

අම්මා සකසා දුන් තේ පානය කළ රාත්‍රී 10.00ට පමණ නිදා ගත්තෙමු.

***

පාන්දර හතරට පමණ එහා ගෙදර ටොමීගේ උඩුබිමේ ශබ්දය ඇසී මම ගැසී ඇහැරුණෙමි. මා අවදි වී පහළට යන විට අම්මා අවදි වී කුසුමා නැන්දා සමගින් කුස්සියේ සිටියහ.

"ආ චූටි මැණික ගුඩ් මෝනින් ඔයා කලින්ම ඇහැරුණාද ?අපි මේ ගෙනියන්න හදපු කැවිලි ටික පාර්සල් කරනවා." අම්මා කීවාය.

"අම්මා මාත් උදව්වක් දෙන්න එන්නද?"

" ඔයාට පුළුවන් නම් චොක්ලට් කප් ටිකක් හදනවද?මං හදන්න හිටියේ ඔයා ඉතින් රසට කේක් හදන්න දන්නවනේ."

" මං චොක්ලට් කප් එකේ 25ක් පමණ හැදුවෙමි. අම්මා කුසුමා නැන්දා සමග එකතුවී පොල්ටොෆි හා මුන් කැවුම් ද සෑදුවාය.

පාන්දර 4.45 වන විට තාත්ති,අයියා සහ ප්‍රවීන් අවදි වුණි. අපි අක්කිලා ගෙදර යාමට සූදානම් වුණෙමු. අපි සියලු දෙනාම ආහාර ගත්තෙමු. අම්මා අයියා සමග එකතු වී පහන පත්තු කර බුදුන් වැන්දාය.
තාත්ති රාත්‍රියේ ගොස් දිනුත්තර
අයියාගේ කැබ් එක ඉල්ලාගෙන ගෙනවිත් තිබුණි. අප බණ්ඩාරවෙල ගොස් පැමිණෙන තෙක් තාත්තාගේ මෝටර් රථය දිනුත්තර අයියාට ලබාදී තිබුණි.

අපි පාන්දර 5.45ට තිබූ නැකතට නිවසින් පිටත් වුණෙමු.

"ලොකු පුතේ අර එනවා කියපු අනිත් පුතා කෝ…?" තාත්ති අයියාගෙන් ඇසුවේය.

"ආ මං එයාට කෝල් කරා දැන් ටවුන්  එකට ඇවිල්ලලු ඉන්නේ."අයියා කීවේය.

අයියා කීවාක් මෙන් ක්‍රිශාන් අයියා නගරයට පැමිණ සිටියේය.

ඔහු අපත් සමග ගමනට එකතු විය.

"ආ ක්‍රිෂාන් මලයා,මොකෝ මෙච්චර ලොකු බෑග් එකක් ගත්තේ.උඹ වරින්දිලාගේ ගෙදර නවතින්නද යන්නේ." අයියා ඔච්චමට මෙන් අයියාගෙන් ඇසුවේය.

"නෑ අයියේ වරින්දි HRM  ඩිග්‍රි එක කරනවා. ප්‍රයිවට් කැම්පස් එකක. මං එයාට ඕන කරන නෝට්ස් වගේකුයි එයාට කියවන්න පොත් වගේකුයි ගත්තා. ඒක තමයි ඔය බෑග් එකේ තියෙන්නේ. එයා නවල් කියවන්න මාරම ආසයි."

"අනේ අපේ අම්මගේ ලයිබ්‍රි එකෙන් පොත් ටිකක් ඉල්ලගන්න තිබුණේ." ප්‍රවීන් කීවේය.

"මට ගානක් වුණේ නෑ මල්ලි. අපරාදෙ නේද..?මම සල්ලි වලටත් පොත් ගත්තා." ක්‍රිශාන් අයියා පසුතැවිලි වෙමින් කීවේය.

"ප්‍රවීන්ට දැන් ගියහම තව යාළුවෙක් හම්බවෙනවා." සොහාන් අයියා කීවේය.

"ඒ කවුද අයියේ…?"

"ඇයි අනේ හිරුගේ මල්ලී. භාතිය දිනුක්ෂ."

" එයා අපේ වයස ද…?"

"ඔව් ඔයාලගේ වයස. මේ පාර ඒ ලෙවල් කරේ."

බොහෝ වෙලාවක් අපි සියලු දෙනා කතාබස් කරමින් පැමිණියෙමු.

"දැන් කොහෙද තාත්ති අපි ඉන්නේ…?" මම රියදුරු අසුනේ සිටි පියාගෙන් ඇසුවේය.

"දැන් පුස්සැල්ලාවේ ඉන්නේ." චූටී තාත්ති කීවේය.

"තාත්ති ඔයා ෆාස්ට් ට්‍රයිඩර් කෙනෙක්නේ." අයියා ඔච්චමට මෙන් කීවේය.
එයට සියල්ලෝම සිනහසුණහ.

අපි කතාබහ කරමින් පැමිණියෙමු.
"තාත්ති නුවර එළියට පැමිණ අවන්හලකට ගොස් හොට් චොක්ලට් සහ චයිනීස් රෝල්ස්  මිලදී ගත්තේය.
වේලාව උදෑසන 9.30 පමණ විය.

"අම්මෝ සීතල දැන්නම් ඉන්න බෑ" මම සීතල ඉවසන්න බැරි නිසා කීවෙමි.

"ඔව් නේද චූටී, බෑග් එකේ බ්ලැන්කට් එකක් ඇති පොරව ගන්න." අම්මා කීවාය.

"ක්‍රිශාන් ඔයා වරින්දියට මොනවා හරි ගිෆ්ට් එකක් ගත්තද…?" අයියා ක්‍රිශාන් අයියාගෙන් ඇසුවේය.

"ඔව් අයියේ මං ගත්තා. මං තුන්දෙනාටම එක වගේ ට ටීෂර්ට් තුනකුත් ගත්තා. මල්ලිට වොච් ගත්තා. මේ පාර ඒ ලෙවල් කරල පාස්නේ." ක්‍රිශාන් අයියා කීවේය.

"කොහොමද අයියේ එයාගේ රිසාල්ට්."මම ක්‍රිශාන් අයියාගෙන් ඇසුවෙමි.

"ඌට A1යි,B2යි තියෙන්නේ." ක්‍රිශාන් අයියා කීවේය.

අපි වැලිමඩ නගරයට පැමිණියෙමු.

"ලොකු පුතේ වැලිමඩ පාරේ කිව්ව නේද? කෝල් එකක් අරගන්න දුවට."
තාත්ති කීවේය.

අයියා හිරන්දි අක්කීට කතා කළේය.

ඔවුන්ගේ ගෙදර වැලිමඩ පාරේ දිගේ ඉදිරියට බණ්ඩාරවෙල දෙසට එන විට නාවෙල නම් ගමේ බව ඇය කියා සිටියාය.

අප නාවෙලට යන විට වරින්දි අක්කා සමග ඇගේ මල්ලි පාරට පැමිණ සිටියෙමු.

"ඔහොමම කැබ් එකෙන් මේ පාර දිගේ එන්න අංකල්. අර තියෙන්නේ අපේ ගෙදර මිදුලටම කැබ් එක ගන්න පුළුවන්." වරින්දි අක්කා කීවාය.

අපි හිරන්දි අක්කලාගේ නිවසට පැමිණියෙමු. මුළු මිදුලම තණකොළ වවා තිබුණි. විවිධ වර්ගයේ මල්වලින් මිදුල හැඩවී තිබුණි.
විශාල පැරණි වලව්වක ස්වරූපයකට නිවස තිබුණි.

අපි නිවසට ඇතුල්වන විට උදෑසන11.40 පමණ විය. අපි අනුරාධා ඇන්ටිට සහ කැලුම් අංකල්ට වැන්දෙමු.

"ඇයි අනේ මේ ඔයාලා මෙච්චර කරදර වුණේ. අපි මේ දේවල් බලාපොරොත්තු වුණේ නැහැ." අනුරාධා ඇන්ටි කීවාය.

"ඔයාලා එහෙන් කීයට ද ආවේ..?"කැලුම් අංකල් ඇසුවේය.

"අපි පාන්දර 5.45ට එහෙන් පිටත් වුණේ." තාත්ති කීවේය.

"දුව අපිට විස්තර කිව්වා. මේ දෙන්නා යාලුවෙලා අවුරුදු 3ක් වෙනවනේ.මට දුව මුලින්ම පුතා ගැන කිව්වා. මම අකමැති වුණේ නෑ."
අනුරාධා ඇන්ටි කීවාය.

අපිත් පුතා කියනකොටම හිතුවා හොඳ වැදගත් පවුලක් කියලා. හිතුවා වගේ ඒක ඇත්ත නේද රුවන්ත." අම්මා කීවාය.

"අනූ දුවව එක්කගෙන එන්න." කැලුම් අංකල් අනුරාධා ඇන්ටීට කීවේය.

ලා රෝස පාට බටර් සිල් සාරියක් ඇඳ උස, කෙට්ටු සුදු ගැහැණු ළමයෙක් බුලත් හෙප්පුවක් අතේ තියාගෙන පැමිණියාය. දිග කොණ්ඩය මෝස්තරයකට දමා දිග මාලයක් දමා සිටි යැයි සැබවින්ම සුන්දරය.

ඇය අයියා අසලට පැමිණ බුලත් හෙප්පුවදී වැන්දාය.
පසුව අම්මාට හා තාත්තාටත් වැන්දාය.

"අනේ හරිම ලස්සන, සිරියාවන්ත ගෑණු ළමයෙක්.බෝනික්කෙක් වගේ ලස්සනයි." අම්මා හිරන්දි අක්කී දෙස බලමින් කීවාය.

"දුව කැම්පස් එකේ මොන ෆැකල්ටි එකේද..?" තාත්තී අක්කිගෙන් ඇසුවේය.

"මම ඉංජිනියරින් ෆැකල්ටි එකේ තාත්තේ."හිරන්දි අක්කී කටපුරා තාත්තේ කියා ඇමතුවාය. ඒ නිසා එයට අම්මලා බොහොම සතුටු වුණෝය.

ඇගේ දක්ෂකම, ලස්සන,පොහොසත්කම සහ වැදගත්කම නිසා අම්මලා එක පයිම විවාහයට කැමති වුණි.

අයියා ගෙනාපු තෑග්ග හිරු අක්කීට දුන්නේය.

වැඩිහිටියෝ විස්තර කතා කරමින් තේ බිව්වෝය. හිරන්දි අක්කී සහ අයියාද කතාබහ කළහ.

"ක්‍රිශාන් අයියා වරින්දි අක්කීට ගෙනාපු පොත් සහ තෑගි දුන්නෝය.

" මල්ලි කොහොම හරි එක්සෑම් එක ගොඩ දාගත්තා නේද…?" අයියා හාතියට කීවේය.

"ඔව් අයියේ ඒ වුණාට මං කැම්පස් යන්නේ නෑ." හාතිය කීවේය.

"ඒ මොකෝ මල්ලී,ඔයා වෙන මොකක් හරි බලල තියෙන්නේ..?" අයියා ඇසුවේය.

"ඔව් අයියේ මං ආමි එකට යනවා.S.T.F එකට.මගේ තියෙන කොලිෆිකේෂන් එක ඉහළ තනතුරකට එකපාරම යන්න පුළුවන්."හාතිය කීවේය.

"ඒකත් හොඳයි මල්ලී. කැම්පස් එකේ අවුරුදු 4ක් විතර ගෙවනවාට වඩා ඒක හොඳයි." අයියා කීවේය.

"අයියේ මං ක්‍රිශාන් අයියාවනම් දන්නවා. චූටි අක්කී කියලා තියෙනවා. එතකොට මේ අනිත් දෙන්න ඔයාගේ නංගී මල්ලිද..?" හාතිය මාවත් ප්‍රවීන්වත් පෙන්නමින් ඇසුවේය.

"මේ මගේ නංගි ස්නේහී… අනිත් මල්ලි ක්‍රිශාන්ගේ පුංචිගේ පුතා.අපේ නංගිගේ හොඳම යාළුවා,ඒ වගේම නංගිගෙ බෝයි ෆ්‍රෙන්ඩ්." අයියා කීවේය.

"ආ එහෙමද? ඒ දෙන්නා හොඳට මැච් වෙනවා." හාතිය කීවේය.

පසුව අප අසල ඔය එක දිය නා දහවල් ආහාර ගත්තෙමු.

"අම්මා අපි රිගල් එකේ ෆිල්ම් එකක් බලන්න යමුකෝ." වරින්දි ඇගේ මවට ඇවිටිලි කළාය.

" ඔය හත්දෙනා ගිහින් එන්න අපි ගෙදර ඉන්නම් පුතේ." අනුරාධා ඇන්ටි කීවාය.

පසුව අපි බණ්ඩාරවල රිගල් සිනමා ශාලාවට ගියෙමු.

"ෆිල්ම් එක පටන් ගන්නේ 2.30ට. ආයෙ පෙන්නන්නේ 6.30ට දැන් වෙලාව 1.35යි. අපි එතකම් පීසා හබ් එකටවත් යමු."අයියා කීවේය.

"පීසා හබ් එකේ පීසා කොල්ටි නෑ සොහාන්. අපි KFC එකට යමු."
හිරු අක්කී කීවාය.

පසුව අපි KFC එකෙන් කෑම ඇනවුම් කළෙමු.

2.30ට සිනමා ශාලාවට ගොස් ටිකට් ගෙන අලුතෙන්ම ආපු විසල් ආදරේ ෆිල්ම් එක බැලුවෙමු.

"අනේ ෆිල්ම් එක මාර ලස්සනයි." සම්පූර්ණ ෆිල්ම් එකම බලා අවසානයේ මම එළියට එන අතරේ කීවෙමි.

"කපල් 3ට නම් ඉතින් ෆිල්ම් බලන එක මරු. මටත් හිටියනම් කෙල්ලෙක්." හාතිය කීවේය.

"අනේ යනවා යන්න මැට්ටා, අපි දන්නවා තමුසෙගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් ගැන." වරින්දි කීවාය.

"හරි හරි ඉතින්."හාතිය ලැජ්ජාවෙන් මෙන් කීවේය.

"ස්නේහි නංගිට තියෙන්නේ විසල් ආදරේ මූවි එකේ තාදිගේ පෙනුම. ඔය දෙන්න අක්කයි නංගි වගේ." හිරන්දි අක්කී කීවාය.

"අනේ අක්කී විහිළු කරන්න එපා. මං කොහෙද රශ්ප්‍රභා සංදීපනී අක්කී වගේ වෙන්නේ.එයා කොච්චර ලස්සනයිද…?"

"ඔයා ලස්සනයි නේ ස්නේහි." කිසිවෙකුට නොපෙනෙන්නට ඇසක් ඉගි මරමින් හාතිය කීවේය.

"අපි ඉක්මනට ගෙදර යමු නේද…? නුවර යන්නත් ඕනිනේ." අයියා කලබලයෙන් මෙන් කීවේය.

අපි එයට එකඟ වී කැබ් රථයෙන් හිරන්දි අක්කිලාගේ නිවසට පැමිණියෙමු.

"ආ කොහොමද කට්ටිය මූවි එක හොඳයිද..?"කැලුම් අංකල් ඇසුවේය.

"අනේ පව් සොහාන් පුතා ගෙදරත් හොඳට කාලා kfc එකෙනුත් ඒ ළමයට කියලා කෑවද අනුරාධා ඇන්ටි කීවාය.

"ඒක නෙවෙයි කැලුම් අයියේ, අපේ දුව ලොජික් කලේ ලොජික් වලටයි,මීඩියා වලටයි විතරයි A තියෙන්නේ. I.C.T වලට B තියෙන්නේ. මං කල්පනා කළේ මෙයාව ගවමන්ට් කැම්පස් එකට දාන්නේ නැතුව private ප්‍රයිවට් ලෝ කොලේජ් එකට හරි ප්‍රයිවර් කැම්පස් එකකට හරි දාන්න. මෙයාගේ රිසාල්ට් එකේ ඉසෙඩ්ස්-කෝ එක මදි ගවර්මන්ට් කැම්පස් එකට යන්න. එහෙම කමක් නැද්ද.?"අම්මා කැලුම් අංකල්ගෙන් ඇසුවාය.

"මෙහෙමයි නංගී,සමහර ප්‍රයිවට් ලෝ කෝලේජ් වල පිළිගැනීමක් නෑ. ඩිග්‍රි එක ගත්තට ජොබ් නෑ. ඔයාලට වියදම් කරන්න පුළුවන් නම් මං කියන තැනට දාන්න මං උදව් කරන්නම්. අපිත් එක්ක වැඩ කරන සමහර ලෝයස්ලා එතනින් තමයි ඉහළට ආවේ."කැලුම් අංකල් කීවේය.

"වියදම් කරන එක නම් ප්‍රශ්නයක් නෑ මවන් ඉගෙන ගත්තට පස්සේ ජොබ් එක ෂුවර් නම්. තාත්තා ඊට හවුල් වෙමින් කීවාය.

"ඔයාලා කතා කරන අතර මේ ලයිම් ජූස් බොන්න." අනුරාධා ඇන්ටි බීම වීදුරු 10ක් මේසය මත තබමින් කීවාය.

පසුව බීම බී අපි නිවසට පැමිණීමට පිටත් වුණෙමු.

"අනේ අද ඉඳලා යන්නකො ඉතින්." අනුරාදා ඇන්ටි කීවාය.

"අනේ බෑ නංගී, අපි වෙන දවසක එන්නම්" අම්මා එසේ කීවාය.

"අනේ ස්නේහි, අද අපි ඔයාගේ ෆෝන් එකෙන් ගහපු ෆොටෝ ටික එවන්නකෝ."භාතිය මා දෙසට පැමිණෙමින් කීවේය.

"මං මොකටද එවන්නේ…?" මං පුදුමයෙන් මෙන් ඇසුවෙමි.

ඔහු මගේ වට්සැප් දුරකථන අංකය ඉල්ලා ගත්තේය.

අපි නුවර යෑමට කැබ් එකට නැග්ගෙමු.

"මොකක්ද තමුසෙ අර කරපු වැඩේ." ප්‍රවීන් කෝපයෙන් මෙන් ඇසුවේය.

"මොකක්ද ප්‍රවීන්…?" මම බියෙන් මෙන් ඇසුවෙමි.

"මං බලාගෙන හිටියේ.උදේ ඉඳන් භාතියත් එක්ක හුරතල් වුණ හැටි. මං දැක්කා ෆිල්ම් හෝල් එකෙන් එළියට ඇවිත් ඔයා ලස්සනයි කියලා ඌ ඇහැක් ගහපු හැටි.අන්තිමට එයත් එක්ක ෆොටෝ ගහලා ෆෝන් නම්බර් එකත් උඩ පැනගෙන දුන්නා." ප්‍රවීන් කෝපයෙන් මුහුණ රතු කරගෙන අන් අයට නොඇසෙන්නට මට හොඳටම බැන්නේය.

"අනේ සොරි ප්‍රවීන්,මං හිතලා කරපු දේවල් නෙවෙයි.ඔයා මට කවදාවත් තමුසෙ කියලා කතා කරල නෑ. ඌ මට ඇහැක් ගැහුවා කියලා මං උගේ ඇහැ ගලවන්නද කියන්නේ? ඔයා දැක්කනෙ එයා බලෙන්මනේ නම්බර් එක ඉල්ලගත්තේ. ඔයා ඉන්නකොට මට වෙන උන් එක්ක හුරතල් වෙන්න ඕනි නෑ."

ඔව් මාත් හිතා ගත්තා ඌ ආයෙ පාරක් ඇහැක් ගැහුවොත් උගේ ඇහැ ගලවනවා කියලා. දැන් අර මිනිහා මැසේජ් දායිනේ. දෙනවා තමුසෙගේ ෆෝන් එක.දැන් සොරි කිව්වට වැඩක් නෑ."ඔහු මගේ අතේ තිබුණු ෆෝන් එක උදුරමින් කීවේය.

"අනේ ප්‍රවීන්…."

නුවරට පැමිණෙන තුරම ප්‍රවීන් මා හා වචනයක්වත් කතා කළේ නැහැ.

මේ ගමනේ අවසානයේ මෙතරම් දුක්බර වේ යැයි මම සිතුවේ නැහැ.
භාතිය ඉදිරියේ මා පමණ ඉක්මවා නොහැසිරුණු බව මා දනී.
ඔහු ඇසක් ගසා ලස්සනයි කීම පිළිබඳව ප්‍රවීන් දැඩි කෝපයෙන් පසු වුණේය.

"කොල්ලෙක් ඇහැක් ගහන එක ඒ තරම් බලපතල දෙයක්ද..?"මා එසේ සිතුවත් ඊට පිළිතුර මම නොදැන සිටියෙමි.

ප්‍රවීන් අප නිවසට පැමිණි කිසිම වචනයක් මාත් සමඟ කතා නොකරමින් අම්මා හා තාත්තාට වැඳ ක්‍රිශාන් අයියා සමඟ කළුවරේම මෝටර් බයිසිකලයෙන් ගමන් කළේය.

මම කාමරයට ගොස් ඇඳුම් මාරු කර අඬමින් නින්දට ගියෙමි……

***

අහසේ හිරු මලානිකව පායා තිබුණි.
සතියක් ගත වුවද ප්‍රවීන් ගැන කිසිම තොරතුරක් ලැබුණේ නැහැ.
මගේ ජංගම දුරකථනයද ප්‍රවීන් අත වූ නිසා මට කවරෙකුටවත් කතා කර නොහැකි වුණි.
ගෙදර ලැන්ඩ් ෆොන් එකෙන් ඔහුගේ අංකයට ඇමතුමක් ලබා ගත්තත් දුරකථනයේ විසන්ධි කර තිබුණි.

මම ඒ සතිය ඇතුළත කැලුම් අංකල් පැවසූ ආයතනයේ ශාස්තු ගෙවා උපාධි පාඨමාලාවට ලියාපදිංචි වුණෙමි.

සතියේ දින හතරක් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉගැන්වීම සිදුකෙරුණ නමුත් එම ක්‍රමයට මම බෙහෙවින් අකමැති වුණි.

මා හට ප්‍රවීන්ගේ මුහුණ දැකීමට දැඩි ආශාවක් ඇති වුණි. අද සෙනසුරාදාවක් නිසා තරංගි ඇන්ටීද නිවසේ සිටින බව මට මතක් වුණෙමි.
මම අම්මාට ගෙදර ලැන්ඩ් ෆෝන් එකෙන් දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

"හලෝ අම්මා මං චූටි කතා කරන්නේ."

"කියන්න චූටි, මොකක් හරි හදිස්සියක්ද..?" අම්මා ඇසුවාය.

"නෑ අම්මේ,මං තරංගි ඇන්ටිගෙන් ගෙනාපු පොත් කියවලා ඉවරයි. මං අලුත් පොත් ටිකක් අරන් ඉන්නද…?"

"හා එහෙනම් ගිහින් එන්න.හැබැයි පරිස්සමෙන්. මට ගිහින් තරංගි ඇන්ටිගේ ෆෝන් එකෙන් කෝල් එකක් ගන්න."
මම එයට එකඟ වී සතුටින් දුරකථනයේ තබා ප්‍රවීන්ලාගේ නිවසට යාමට සූදානම් වුණෙමි.

පොත් ටිකත් රැගෙන මම බස් රථයෙන් ඔවුන්ගේ නිවසට ගියෙමි.

"ආ සනූ පුතේ, එන්න ඇතුළට.හදිසියේම මොකෝ මේ…? හොඳ වෙලාවට දැම්මම ආවේ. මං පැයකින් විතර ගමනක් යන්න ලෑස්ති වෙලා හිටියේ." තරංගි ඇන්ටි සතුටින් කීවාය.

"කියන්න විදිහක් තිබුනේ නෑ.හොඳ වෙලාවට මං දැම්මම ආවෙ.මං මේ ආවේ පොත් ටික මාරු කරගන්න." මම කලබලයෙන් මෙන් කීවාය.

"ආ..මාරු කර ගන්න පුතේ."

"ඇන්ටි ප්‍රවීන් අද ගෙදර නැද්ද…?"

"අනේ නෑ පුතේ,ගම්පල සුදු නංගිලාගේ ගෙදර ගිහින් ලොකු පුතයි දුවත් ගියා.පෙරේදා ගියේ."

මම ඇන්ටීට කියා අම්මාට දුරකතන ඇමතුමක්ද ලබා ගත්තාය.

මගේ බලාපොරොත්තු සුන් වී සැඩ මාරුතයක ගසාගෙන ගියහ.

"මට ඇන්ට එක්ක පොඩ්ඩක් කතා කරන්න ඕනි." මම බියෙන් මෙන් කීවෙමි.

"එන්න මෙතනින් වාඩිවෙලා කියන්න. මොකක් හරි ප්‍රශ්නෙක ඉන්න කියලා මුහුණෙන් පේනවා." තරංගි ඇන්ටි කීවාය.

"ඇන්ටි මේ… මේ…මගෙයි ප්‍රවීන්ගෙයි අතර එෆෙයා එකක් තියෙනවා."මම බැරෑරුම් හඬින් කීවෙමි.

"මොකක් ඔය ඇත්තමද සනූ කියන්නේ…?" ඇන්ටි විමතියෙන්නේ ඇසුවාය.

"අනේ ඔව් අම්මේ, මට සමාවෙන්න." මම පොඩි දරුවෙකු මෙන් ඇන්ටි ඉදිරියේ දණ ගසා හඬමින් කීවාය.

පසුව මම ප්‍රවීන් සමඟ යාළු වුණ දා සිට අද දක්වා සියලුම දේ ඇන්ටීට කීවෙමි.

"අඬන්න එපා පුතේ. මං බය වුනේ ඔය දෙන්න අතින් මොකක් හරි ලොකු වැරද්දක් වෙලාද කියලා." ඇන්ටි කීවාය.

"අනේ නෑ අම්මේ,එහෙම මොකුත් වුණේ නෑ."මම ස්ථිර හඬකින් කීවෙමි.

නිරායාසයෙන්ම මට අම්මා කියා කියැවුණි.

"මං ඔයාට අකමැති වෙන්නේ නෑ දුවේ. මං ආසයි ඔයා වගේ ලේලි කෙනෙකුට, ඔයාගේ මොන අඩුපාඩුවක්ද..? ඒත් මං කලින් හිතුවා වගේ අනවශ්‍යා දේවල් කරන්න එපා. අපේ කැමැත්ත ලැබුණට කාලයට ඉඩ දෙන්න. එතකොට ජීවිතේ ලස්සන වෙනවා. මං ප්‍රවීන් ගැන හොඳට දන්නවා. එයා එහෙම නරක කෙනෙක් නෙවෙයි." තරංගී ඇන්ටි කීවාය.

මම ආදරයෙන් ඇන්ටීව වැළඳ ගත්තෙමි.

"අම්මේ ප්‍රවීන් මාත් එක්ක තරහා වෙලා."

"ඔයා අම්මේ කියනකොට මගේ හදවත කිරි ගැහෙනවා. මට දුවෙක් නැති නිසා ඒක හුඟක්ම දැනෙනවා. මං ඔයාට වැඩක් කියන්නද ? ඔයා අද රෑට මෙහේ ඉන්න. හෙට උදේට පුතාලා එනවා ඔයා එයාව හම්බවෙලාම කතා කරන්න."

"අනේ ඒක කරන්න බැරිවෙයි අම්මේ, අපේ අම්මට කියලත් නෑනේ."

"නෑ නෑ… ඉන්න මං තාරුට කතා කරලා අහන්නම් අද මම තනියම ඉන්නෙ දුවව තියාගන්නද කියලා."
ඒ ආකාරයට තරංගි ඇන්ටි අම්මාට කතා කළාය.

අම්මා මා මෙහේ නවතිනවාට මුලින් අකමැති වුව ද පසුව කැමති වූවාය.

"අම්මා යන්න හිටියේ ගමන යනවා නේද..?"

"මං යන්න හිටියේ අපේ ඉස්කෝලේ ටීචර් කෙනෙක්ගෙ ගෙදර. දැන් යන්න ඕනි එකක් නෑ. අනික මං ගියොත් ඔයා තනියමනේ."

"අනේ මං ඇවිත් අම්ම යන්න හිටපු ගමනක් නැති කරලා දැම්මා නේද…?"
මම කණගාටුවෙන් මෙන් කීවෙමි.

"අයියෝ නෑ පැටියෝ, ඔයා වොෂ් එකක් දාගන්න. ප්‍රසාදි අක්කිගේ ඇඳුම් දෙකක් මං දෙන්නම්. ඒක ඇඳගන්න"

පසුව මම ඇඟ සෝදා ප්‍රසාදි අක්කිගේ නිල් ඩෙනිම් සායක් හා රෝස පාට අත් ටී ෂර්ට් එක ඇඳ ගත්තෙමි.

තරංගී ඇන්ටී රාත්‍රියේ නිදා ගැනීමට ප්‍රවීන්ගේ කාමරයට අසලින් වූ අමුත්තන්ගේ කාමරය සකසා දුන්නා ය.

ඇන්ටිත් මමත් කාමරයට වී රාත්‍රියේ කතාබහ කරමින් සිටියෙමු.
ප්‍රවීන්ගේ පුංචි කාලය කළ දඟ වැඩ ඇය සිනහසෙමින් කීවාය.
රාත්‍රී 9.00ට පමණ ඩිලාන් අංකල් පැමිණියේය.

ඔහු මාව දැක ආදරයෙන් වැළඳ ගත්තේය. තරංගී ඇන්ටි රාත්‍රී ආහාරයෙන් පසු අපගේ සම්බන්ධය ගැන ඩිලාන් අංකල්ට කීවාය.

"ඇත්තටම ඔයා අපේ පුතාට ආදරේ කරනවද පුතේ…?" ඩිලාන් අංකල් ඇසුවේය.

"ඔව් අංකල්, මං පොරොන්දු වෙනවා කිසිම වැරැද්දක් නොකර ප්‍රවීන් එක්ක ඉන්නවා කියලා." මම අවංක චේතනාවෙන් කීවෙමි.

"අපේ අකැමැත්තක් නෑ පුතේ, අපේ එකා වෙන නරක කෙල්ලෙක් එක යාළු වෙලා නොමග යයි කියන බය හිතේ තිබුණා. දැන් ඒකත් නෑ. ඔයා හරිම ගුණ යහපත් දරුවෙක්. ඒක මං හොඳට දන්නවා. හැබැයි ඔයාලට තාම ලොකු වයසක් නැති නිසා අනවශ්‍යා දේවල් බෑ.."ඩිලාන් අංකල් කීවේය.

ප්‍රවීන්ලාගේ ගෙදරින් කැමැත්ත හිමිවීම හීනයක්දැයි මට සිතාගත නොහැකි වුණි.

"ආ පුතේ, මං ඔයාට කියන්න හිටියේ අමතක වුණානේ අපේ චූටි පුතාව මොරටුව කැම්පස් එකේ ඉංජිනියරින් ෆැකල්ටි එකට සිලෙක් වුණා." තරංගී ඇන්ටි සතුටින් කිවාය.

"අනේ කොච්චර හොඳද..?" මම සතුටින් කීවෙමි.

පසුදින උදෑසන 6.30ට මම අවදි වුණෙමි… මම අවදි වී ඇද සකස් කර කොණ්ඩේ පීරාගෙන කුස්සියට ගියෙමි.

"ආ පැටියෝ ගුඩ් මොර්නින්. ඔයා ඉන්න මම ලතාට කියන්නම් තේ හදලා දෙන්න කියලා."

"ගුඩ් මෝනින් ඇන්ටී, මට ටූත් බ්‍රෂ් එකක් දෙන්න පුළුවන්ද..?"

"අනේ මට අමතක වුණා.ඉන්න මම දෙන්නම්." තරංගි ඇන්ටි එසේ කියමින් කබඩ් එක ඇර අලුත් ටූත් බ්‍රෂ් එකක් දුන්නාය.

මම දත් මැද මුහුණ සෝදා ගත්තෙමි. නිදාගැනීමට ඇඳ ගත් රාත්‍රී ඇඳුම ගලවා ඩෙනිම් සාය සහ රෝස පාට ටී ෂර්ට් එක ඇඳගත්තෙමි.

පසුව ලතා ඇන්ටි සකසා දුන් කිරිතේ කෝප්පය පානය කළෙමි.
මම සාලයේ දොරෙන් එළියට ගියෙමි.
හෝටලයක උද්‍යානයක් මෙන් මිදුල ලස්සනයි. නොයෙකුත් වර්ගයේ පාට පාට මල් වවා, තණකොළ වැවූ බිම සහ මාළුන් පිරි විශාල පොකුණක්ද මිදුලේ විය.

මා එළියට යන විට තරංගී ඇන්ටි මල් පැළ වලට වතුර දමමින් සිටියාය.

"ඇන්ටි පැල වලට වතුර දානවද…?"

"ඔව් දුවේ, ඊයේ දවසෙම අම්මා කියපු එක්කෙනා අද ආයමත් ඇන්ටි කියනවා.! ඇය අමනාපයෙන් මෙන් කීවාය.

"එහෙම එකක් නෑ. එක පාරම මං ඇන්ටිට අම්මා කියන්නේ ඇයි කියලා හැමෝම බලයි ඒකයි."

"ඔව් දුවේ, ඒකත් ඇත්ත. අපි කාලයට ඉඩ දෙමු."

මම මිදුලේ සුදු පැහැති සිමෙන්ති බංකුවේ වාඩි වී තරංගී ඇන්ටි සමග කතාබහ කළෙමි.

ඇන්ටිට දුරකථන ඇමතුමක් පැමිණියාය.

"දුවේ දැන් පුතාලා එන ගමන්ලු. පේරාදෙණියලු ඉන්නේ. දැන් එයි." ඇන්ටි දුරකථන ඇමතුම අවසන් කර කිවාය.

මම රාත්‍රියේ නිදාගත් කාමරයට ගියෙමි.
පැය 1කට පමණ පසු ප්‍රවීන්, අයියා සහ අක්කා සමඟ පැමිණියේය.

"ආ මගෙ දරුවා තුන්දෙනා ආවද…? චූටි පුතා එනකම් මග බලාගෙන හිටියේ" තරංගී ඇන්ටී කීවාය.

"ඒ මොකද අම්මේ…?" ප්‍රවීන් ගෙට ඇතුල්වී මහන්සිය යැවීමට පුටුවක බර වෙමින් ඇසුවේය.

ඒත් සමගම මම කාමරයෙන් පිටතට පැමිණියෙමි.

"ඇයි මේ අඳුරන්නේ නැති අය ගේ අස්සේ දාගෙන." ප්‍රවීන් සිත් පිත් නැති අයෙක් මෙන් කීවේය.
ඔහු එලෙස කීවේ විහිළුවට මෙන්ය.

ඒ වචන මගේ හදවත පසාරු කළේය. මම වැලපෙමින් ඔහුව බදාගත්තෙමි.

"අනේ ප්‍රවීන්, මං මොන වැරැද්දක් කළාටද ඔයා මෙහෙම පළිගන්නේ..?" මම අඬමින් ඇසුවෙමි.

"ඔය ජේන්නේ නෑ. ආපු ගමන් කෙල්ලව ඇඬෙව්වා" තරංගි ඇන්ටි කීවාය.

තරංගී ඇන්ටි මාව තුරුල් කර ගත්තාය.

" මං ගෙදර යන්න ලෑස්ති වෙන්නං අම්මේ."මම තරංගි ඇන්ටිට කීවෙමි.

"එපා පුතේ ඔයා ඉන්නෙ මගේ ගෙදරනේ. තරංගී ඇන්ටි මගේ කඳුළු පිසදමමින් කීවාය.

ප්‍රවීන්ට මේ කිසි දෙයක් සිතා ගත නොහැකි වුණේය. ඔහු බෑගය විවෘත කර මාගේ ජංගම දුරකථනය ලබා දුන්නේය. ඔහුට කතා කිරීමට හෝ තිබෙන්නේ එය පමණක් නිසා මම ෆෝන් එක අතට ගත්තෙමි.

"පුතේ, මං දන්නව ඔය දෙන්නා ආදරය කරනවා කියලා. අපි ඔයාලගේ එෆෙයා එකට අකමැති නෑ. ඇයි ඔයා මේ දරුවාගෙන් මෙහෙම පළිගන්නේ." තරංගි ඇන්ටි ප්‍රවීන්ගෙන් ඇසුවාය

තරංගි ඇන්ටි සියල්ල ප්‍රවීන්ට පැහැදිලි කර දුන්නාය.

"අයැම් වෙරි සොරි සනූ, මං විහිළුවට වගේ ඒක කිව්වේ." ප්‍රවීන් මාව බදාගනිමින් කීවේය.

"ඔයා දන්නවද මේ සතියේ ජීවත් වෙලා හිටියට මට දැනුනේ මං බාගෙට මැරිලා වගේ." මම කඳුළු අතරින් කීවෙමි.

"මට දුක හිතුණා හාතියට ඔයාගේ නම්බර් එක දෙනකොට, මම හාතියත් එක්ක මැසේජ් කළා. එයත් මං හිතුවා වගේ නරක කෙනෙක් නෙමෙයි. සොරි මම ඔයාව මග ඇරියට, අනික එදා අනුරාධපුරේදී නිෂී හැසිරුණා වගේම නේ, හාතියත් හැසිරුණේ. අම්මේ අප්පච්චි දන්නවද අපේ එෆෙයා එක ගැන." ප්‍රවීන් අම්මාගෙන් ඇසුවේය.

"ඔව් චූටි පුතේ, අප්පච්චි කැමතියි සනූට." තරංගී ඇන්ටි කීවාය.

"දැන් ඉතින් අම්මගේ අලුත් ලේලි පුතයි ආවට පස්සේ අපිව අමතකයි නේද…?"දිනුත්තර අයියා සිනහසෙමින් කීවේය.

"අනේ නෑ පුතේ ඔයාලට එහෙම අමතක වෙනවද..? මාව මුලින්ම අම්මා කෙනෙක් කලේ පුතා, නැන්දම්මා කෙනෙක් කළේ ප්‍රසාදි දුව, මුලින්ම ආච්චි කෙනෙක් කරන්නේ ඔය දෙන්නගේ දරුවා. මට ඔයාලා ඔක්කොම එකයි." තරංගී ඇන්ටි කීවාය.

පසුව මම දහවල් වන තෙක්ම ප්‍රවීන්ගේ නිවසේ සිටියෙමි.
අපේ සම්බන්ධයට ප්‍රවීන්ගේ දෙමාපියන් කැමති වීම නිසා මමත් ඔහුත් සතුටින් පසුවුණි.

***

සඳුදා සිට වුවත් කොලේජ් එකට ගෙන්වන්නේ නැතුව මාර්ග ගත ක්‍රමයට ඉගැන්වීම මට මහා හිසරදයක් වුණි.

පසුව මම ඔවුන් සමග කතා කරගෙන ඉගෙන ගත් දිනයටයන්ට පමණක් ගෙවා ආපසු මුදල් ලබාගෙන මහනුවර සිනේට් ප්‍රයිවට් කැම්පස් එකේ ලියාපදිංචි වුණෙමි.

ප්‍රවීන් හෙට සිට මොරටුවේ බෝඩිමක නතර වෙන බැවින් උදෑසනම අප නිවසට පැමිණියේය.

"ආ ඇන්ටි, අද නිවාඩු ද..?" ප්‍රවීන් අප නිවසේ දොර ළඟ සිට ඇසුවේය.

"අනේ නෑ පුතා, තව ටිකකින් යනවා. එන්න ගෙට." අම්මා ප්‍රවීන්ට කීවාය.

එහෙමද ඇන්ටී, මං මේ හදිසියේම ආවේ හෙට ඉඳන් මං කැම්පස් යනවා කියන්න. මාව මොරටුවේ කැම්පස් එකට සිලෙක්ට් වුණා. යන්න කලින් කතා කරලා යන්න ආවේ." ප්‍රවීන් ඔහුගේ අතේ වූ බෑග් එකක් හා බුලත් හුරුල්ලක් අම්මාට දී වඳිමින් කීවේය.

"මගේ පුතාට තුණුරුවන් සරණයි! ඔයාට වරදින්නේ නෑ පුතේ…"අම්මා ඔහුගේ හිස සිඹ කීවේය.

මම ඔහුගේ කටහඬ ඇසී පහළට පැමිණියෙමි.

"ආ ප්‍රවීන්, ඔයා ආවද? කිව්වෙවත් නැහැ එනවා කියලා." මම ඔච්චමට මෙන් කීවෙමි.

"සනූ, මං හෙට ඉඳලා මොරටුවේ බෝඩ් වෙන්න යනවා කියන්න ආවේ."ප්‍රවීන් සමග කතාබහ කරමින් හිඳ අම්මා කුස්සියට ගියාය.

"අනේ ඔයා හෙට යනවද..?" මම දුකෙන් මෙන් ප්‍රවීන්ගෙන් ඇසුවෙමි.

"ඔව් මැණික, මම මාසෙකට සැරයක් එනවා. මේක මාව මතක් වෙන්න තියාගන්න." ඔහු කීවේය.

"මට ඔයා මතක් වෙන්න තෑගි ඕනේ නෑ. මං මැරෙනකම් ඔයා මගේ හදවතේ ඉන්නවා."
මම හැඬුම්බරව ඔහු තෑගි ගනිමින් කීවෙමි.

ඔහු ස්වල්ප වේලාවක් කතා කරමින් හිඳ තේ පානය කර නිවසට යාමට සූදානම් වුණේය.

"පරිස්සමෙන් වැඩ ටික ගන්න පුතේ. බුදු සරණයි!" අම්මා කීවාය.

මම අමාරුවෙන් හෝ ඔහුට සමු දුන්නෙමි.

පසුව ඔහු දුන් තෑග්ග විවර කළෙමි.

කළු පාට ඇල්බම් බොක්ස් එකක දිග ඇල්බම් එකක් තිබුණේය.එහි ඡායාරූප 50ක් පමණ තිබුණි.

මුලින්ම අප නිවේදනය කළ දිනයේ ගත් ඡායාරූප, ප්‍රසාදි අක්කීගේ වෙඩින් එකේ ගත් ඡායාරූප, මාගේ උපන්දින පාටියේ ගත් ඡායාරූප, එරන්දිලාගේ ගෙදරේදී ගත් ඡායාරූප, අනුරාධපුර චාරිකාවේ ගොස් ඡායාරූප, විභාගය සමත් වීම නිසා ප්‍රවීන්ලාගේ ගෙදර තිබූ පාටියේ දී ගත් ඡායාරූප, දළදා මාලිගාවේදී ගත් ඡායාරූප සහ මියුසික් වීඩියෝ එකෙහි ගත් ඡායාරූප ද එහි ඇතුළත් විය.

මම ප්‍රවීන්ට දුරකථන ඇමතුමක් ලබාගෙන සතුට පළ කළෙමි.
මම පහළට ගොස් අම්මාටද ඇල්බම් එක පෙන්නුවෙමි.

" අනේ හරිම ලස්සනයි නේද පුතේ ෆොටෝ ඇල්බම් එක." අම්මා කීවාය.

"ඔව් අම්මේ මේක මාර ලස්සනයි. එක වටිනවා."

"චූටි, මට තරංගි ඇන්ටි හැමදේම කිව්වා. ඔයා ඇයි මට කිව්වෙ නැත්තේ? ඔය දෙන්නගේ එෆෙයා එක ගැන මම දන්නවා. ප්‍රවීන් වගේ දක්ෂ ලස්සන කොල්ලෙක්ට අපි අකමැති වෙනවද..? මට දුක ඔයා මට ඒක හංගපු එක. මං දැනගත්තා ඔය දෙන්නගේ එෆෙයා එක ගැන අපි ට්‍රිප් එක ගිය දවසෙම." අම්මා එසේ කියද්දී මගේ හදවත ගැහෙන්නට විය.

"මට සමාවෙන්න අම්මේ, මං හිතුවා දැම්මම අම්මලාට ඒක කියන්න ඕන නෑ කියලා. ඒකයි කිව්වේ නැත්තේ.අම්මා තාත්තාට කිව්වද..?"

"ඔව් මං ඊයෙ රෑ තරංගී ඇන්ටි ඔය කතාව කිව්වහම රෑම මම තාත්තාට කිව්වා. එයාත් අකමැත්තක් නෑ. අද රෑට තාත්තා ඔයාට කතා කරයි. ඔයා වෙන කොල්ලෙක්ට කැමති වෙලා හිටියනම් අපි කීයකටවත් කැමති වෙන්නේ නෑ. ඒත් ප්‍රවීන් පුතා ගැන දන්නවා. එයා හොඳ ගතිගුණ තියෙන වැදගත් කොල්ලෙක්. ඒකයි අපි එයාට කැමති."

අම්මා සහ  තාත්ති කැමති වීම පිළිබඳව මම බෙහෙවින් සතුටු වුණෙමි.
මම ප්‍රවීන්ට ඒ ගැන කියූ විට ඔහුත් සතුටින් වුණේය.

පැය 2.00කට පමණ පසු මම එරන්දිට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

"හලෝ එරන්දි කොහොමද හොඳින් ඉන්නවද..?"

"ආ ස්නේහි ඔව් හලෝ හොඳින් ඉන්නවා."

"මං දැක්කා ළඟ දවසක හිරාන් එක ඔයා කොෆි ශොප් එක්ක ඉන්නවා."

"අපි දෙන්න දැන් ආදරේ කරනවා. එයා මගේ boyfriend. මං එයා එක්ක කෝපි බොන්නැතුව ප්‍රවීන් එක්ක කොෆි බොන්නද..?"

"මොනව හිරාන්... ඔයාගේ boyfriend ..?" මම සැකයෙන් මෙන් ඇසුවෙමි.

"ඔව් ඇයි අපිට යාළුවෙන්න මිසිස් සේනාධීරගෙන් අවසර ගන්න ඕනිද...?"
ඇය උපහාසයෙන් මෙන් ඇසුවාය.

"නෑ නෑ ඔය එක එක වටේ යන කුකුළ්ලොත් එක්ක යාළුවෙන්න මගෙන් අවසර ගන්න ඕනෑ. ටික කාලයක් මගේ පස්සෙන් එනවා කියලා මට සෙට් කරන්න හැදුවා. අන්තිමට එයාගේ හැටි දැනගෙන එයාම යාලුවෙලා." මම සිනහසෙමින් කීවෙමි.

"අනේ මේ ස්නේහි, ඔයා හරියට කතා කරන්නේ මහ ලොකු සුද්දවන්ති වගේනේ. අපි දන්නවා ප්‍රවීන් එක්ක නටන  නාඩගම්." ඇය මට වචනයෙන් ප්‍රහාර එල්ල කළාය.

"නෑ මටනම් තමුසේ වගේ මිනිහලා එක්ක නටන්න ඕන නෑ. මං ළඟ හිටියනම් උඹේ හොම්බ තලනවා." මම එසේ කියමින් දුරකථන ඇමතුම විසන්ධි කළෙමි.

"විභාගේ ෆේල් වුණාට පස්සේ කටත් වැඩිවෙලා." මම එසේ සිතුවෙමි.

ඒත් සමගම මම ප්‍රවීන්ට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

"බබා ඔයා කොහෙද ඉන්නේ..?" මම ප්‍රවීන්ගෙන් ඇසුවෙමි.

"මැණික මං දැන් තමයි නුවරින් පිටත් වුණේ. අප්පච්චි එක්ක මොරටුවේ බෝඩිමට යනවා."

මම එරන්දි සමඟ ඇතිවුණු කතාබහ අකුරක් නෑරම ඔහුට කීවෙමි.

"අනේ මැණික, ඒකී කියන ඒවා ගණන් ගන්න එපා. ආය පාරේ දැක්කොත් කතා කරන්න එපා. ඔයාට ඔය වගේ යාළුවො ඕනි නෑ. මට දුක එකිගේ අක්කා මගේ නෑනා වුණ එක."

"ඔව් ඔයා කියන කතාව හරි, ඒ වුණාට ඔයා ප්‍රසාදි අක්කී ගැන අහිතක් හිතන්න එපා. එයා හරි හොඳයි. එරන්දි වගේ නෙවෙයි."
ප්‍රවීන් සමග කතා කිරීමෙන් මගේ හිත නිවුණි.

ඔහු දැන් වෙනත් පළාතකට යාම නිසා හිත දුකින් මිරිකී ගියේය.
***
පසුදා සිට සිනේට් කැම්පස් එකට මම තාත්ති සමග ගියෙමි.

නීති ප්‍රවේශය විභාගය මාගේ එකම අරමුණ කරගෙන නීතිඥවරයෙකු වීමේ සිහිනයේ දිවා රෑ දුටුවෙමි.

විශ්ව විද්‍යාලය තුළ ගත කරන අලුත් ජීවිතයට මම ඉක්මනින් හුරු වුණෙමි.

"චූටි කැම්පස් එකේ හොඳට උගන්වනව නේද..?" දිනක් රාත්‍රී කෑම ගන්න අතරේ අම්මා ඇසුවාය.

"ඔව් අම්මා ශෝක් එකට උගන්වනවා. ආස හිතෙනවා. හොඳට තේරෙනවා, පන්ති කාමර එහෙමත් මාර ලස්සනයි"

"යාලුවෝ එහෙම ඉන්නවද පුතේ..?"

"යාළුවො කතාබහ කරනවා. තාම හොඳ යාළුවෙක් කියලා නෑ. තව ටික දවසක් යනකොට හම්බවෙයි."

"පුතේ මං අවුරුදු දෙකකට ක්ලාස් ෆීස් ගෙව්වා." තාත්ති කීවේය.

"අනේ තැන්ක්යූ තාත්ති."

රාත්‍රී ආහාරයෙන් පසු මම ඇඳට ගියෙමි.

"ප්‍රවීන්ට කතා කරන්න ඕනි. කැම්පස් එකේ විස්තර අහගන්න." මම එසේ සිතමින් ඔහුට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

"බබා ඔයා මොනාද කරන්නේ?"

"දැන් තමයි වොශ් එකක් දාගෙන ඇඳට ආවේ."

"කැම්පස් එක හොඳයිද..?"

"මරු අනේ. කැම්පස් ජීවිතේ මෙච්චර සුන්දරයි කියලා දැන් තමයි තේරෙන්නේ."

"අනේ ඔයා එහෙම කියද්දි බය හිතෙනවා. මගේ ලස්සන කොල්ලව සක්කර වට්ටමක් රවට්ට ගනීද කියලා." මම බොරු බයක් පෙන්නමින් කීවෙමි.

"නෑ මැණික, ඔයා වගේ රෝස මලක් අත්හරින්න මං මෝඩ නෑ."

"හැබැයි බලාගෙන රෝස ගහේ කටු තියනවා." මම ඔච්චමට මෙන් කීවෙමි.

"ඒ කටු මුවහත් කරන්න මම දන්නවා. ඒක නෙවෙයි ඔයාට කොහොමද කැම්පස් එක..?"

"මටත් වරදක් නෑ, ආසාවේ බෑ පුදුම සතුටකින් කැම්පස් යන්නේ."

"හොඳට වැඩ ටික කරගන්න මගේ මැට්ටී, පොඩ්ඩක් කැතට යන්න කැම්පස් යනකොට. නැත්නම් කොල්ලෝ බැල්මදායි මගේ මැණිකට."

"ලස්සනට යන්න ඕනේ කැම්පස් එකම වශී වෙන විදිහට."

"බබා බෝඩිමේ ඇන්ටි කෑම කන්න කතා කරනවා. මං එහෙනම් තියෙනවා.බුදු සරණයි මැණික."

"හරි පැටියෝ එහෙනම් බුදු සරණයි" එසේ කියමින් මම දුරකථනය තැබුවෙමි.

මම ලැප් එක ගෙන 'සඳ දෙව්දූ' නම් වූ ප්‍රවීන්ගේ සින්දුව අසා ෆොටෝ ඇල්බම් එකද බැලුවෙමි.

දැන් ගෙදරින් දන්න නිසා ප්‍රවීන් මට ලොකු කර දුන් අපි දෙදෙනා ප්‍රසාදි අක්කීගේ වෙඩින් එක දවසේ ගත් ඡායාරූපය අල්මාරියෙන් ගෙන මාගේ කණ්ණාඩි මේසේ මත තැබුවෙමි.

පසුව මම නින්දට ගියෙමි…

***

වෙනදා මෙන් පාන්දර 5.00ට එලාම් එක වැදුණි.
අද සිකුරාදාවක් නිසා මම සතුටින් අවදි වුණෙමි.

"ආ බබා ගුඩ් මෝනින්, ඔයා නැගිට්ටද ?මං මේ ඔයාව ඇහැරවන්න ආවේ." අම්මා තේ කෝප්පයක් අතැතිව කාමරයට පැමිණියාය.

"ගුඩ් මොර්නින් අම්මා. මං දැන් නැගිට්ටේ."

"ආ පොඩ්ඩක් ඉන්න. මීට කලින් කණ්නාඩි මේසය උඩ අර ෆොටෝ එක තිබුණෙ නෑනේ." අම්මා පුදුමයෙන් මෙන් කීවාය.

"නෑ අම්මා අල්මාරිය ඇතුලෙ තිබුණේ. මම ඊයෙ රෑ ඕක ඔතනින් තිබ්බේ." මම අම්මාට කීවෙමි.

"ආ ඒක තමයි, ඒවා අපිට පෙන්නන්නෙ නැති වෙන්න හංගලානේ තිබිලා තියෙන්නේ. මොනා උනත් ඒක ලස්සනයි. ඒකෙ දෙන්නම මූණින් මූණ බලාගෙන හරිම ලස්සනට ඉන්නවා."

පසුව මම දත් මැද මුහුණ සෝදා කොණ්ඩේ පීරා ඇඳුම් ඇඳගෙන පොත් ටික බෑගයට දමාගෙන පහළට ගියෙමි.

"පුතේ කෑම කන්න." අම්මා කෑම බෙදමින් කීවාය.

මම කෑම කා තාත්තී සමග කැම්පස් එකට පැමිණියෙමි.

"පරිස්සමෙන් යන්න චූටි, එද්දි එන්න බස් එකට සල්ලි තියෙනවද..?"

"ඔව් තාත්ති තියෙනවා. මං එහෙනම් යනවා. බුදු සරණයි තාත්ති." මම එසේ කියමින් කැම්පස් එකට ඇතුළු වුණෙමි.

එම පන්තියට යන විට අතරමග පුරුදු රුවක් දුටුවෙමි.

ඔහු නමින් අශේන් තේජන. පාසලේ 11 ශ්‍රේණියේදී මා හට ආදරය කළ මාගේ ප්‍රථම ප්‍රේමය.
නමුත් දැන් මාහට ඔහු කෙරෙහි ආදරයක් නොමැත.

"ස්නේහි ඔයා මේ කැම්පස් එකේද යන්නේ?" ඔහු මා දෙස බලා ඇසුවේය.

"ඔව් අශේන්, මට පරක්කු වෙනවා මං යනවා." මම එසේ කියමින් පන්තිය දෙසට ගියෙමි.

"ඔයා නේද ස්නේහි කියන්නේ..?" මා දෙසට පැමිණ මා අසලින් වාඩි වෙමින් අපේ පංතියේ ගැහැණු ළමයෙක් ඇසුවාය.

"ඔව් හලෝ, එතකොට ඔයා..?"

"ආ මම ද...? මම මිහින්දි ආකර්ෂා. මොකක් හරි අවුලකින්ද ඉන්නේ..?" ඇය නැවත වරක් ඇසුවාය.

මම උදැසන අශේන් හමුවූ බව කියා ප්‍රවීන් පිළිබඳවද ඇයට කීවෙමි.

ඇය සමඟ කතාබස් කරමින් සිටියදී ඇය මිතුරු වුණාය. ඇගේ ගෙවල් ගම්පොල වන අතර නුවර ඇගේ ලොකු අම්මාගේ ගෙදර සිටින බවත් පැවසුවාය.

දවසේ ඉගැන්වීම් කටයුතු නිසි පරිදි සිදු කෙරුණි.

හවස පන්තියෙන් පිටව යන විට නැවත වරක් අශේන්ව මුණගැසුණි.

"ස්නේහි ඔහොම පොඩ්ඩක් නවතින්නකෝ.." ඔහු ඇවටිලි කළේය.

"ඇයි අශේන් අපිට තවත් කතා කරන්න දෙයක් නෑනේ, ඇයි මොකද..?" මම ඔහුගෙන් ඔරොප්පුවට මෙන් ඇසුවෙමි.

"ස්නේහි, එකොළහ වසරෙදි මගේ ලොකුම තරහාකාරයා ඔයා. මට ඔයා ගැන ලොකු දුකක් වගේම කේන්තියක් තිබුණා. ඒත් කාලයත් එක්ක ඒ තරහ නැති වුණා."

"අශේන් ඇත්තටම මං ඔයත් එක්ක යාළුවෙලා හිටපු මාස තුනේ සතුටින් හිටියා. ඔයා ඉස්කෝලේ චණ්ඩියෙක් වගේ හිටියේ. ඒ වගේම ඔයා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා හිටියේ. මං දන්නවා ඔයා මට පණටත් වඩා ආදරේ කරා කියලා. එක දවසක් මං හෝල් එකේදි ඔයාට කුඩුකාරයා කියලා බැනපු එකට ඔයත් තරහෙන් ඉන්නේ. ඔයා එක්ක යාලු වෙලා ඉද්දි පන්තියේ ජනේලය ළඟ අපි කතා කර කර ඉන්නකොට හැමෝම කතා වුණා අපි ගැලපෙන කපල් එකක් කියලා. මට ඔයා ගැන නරක ආරංචි ගොඩක් ආවා. ඔයා මත්ද්‍රව්‍ය පාවිච්චි කරනවා කියලා. අන්තිමට මං යාළුවෝ කියපු දේ අහලා ඔයාව අතෑරියේ. මං ඊට පස්සේ අවුරුදු ගානක් යනකම් කිසිම සම්බන්ධයක් පටන් ගත්තේ නෑ. අන්තිමට ඔයා මං නිසා තවත් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වුණා."
මම වසර ගණනාවක් සිත තුළ තදකරන් සිටි කතාව ඔහු තුළ දිග හැරියෙමි.

"මං දන්නවා ස්නේහි, ඒ කාලේ ඇත්තටම සුන්දරයි. මං තාමත් ඒ මතකයන් එක්ක ජීවත් වෙනවා. මට පුදුම දුකක් දැනෙනවා ඔයා යාලුවන් නිසා මගෙන් ඈත් වුණ එකට." ඔහු කණගාටුවෙන් මෙන් කීවේය.

"මගෙන් වැරැද්දක් වුණා නම් සමාවෙන්න අශේන්. මං ඔයාට කතා කළාට ආයෙමත් සම්බන්ධයක් පටන් ගන්න ඕනි නෑ. මට දැන් කොල්ලෙක් ඉන්නවා. ඒ නිසා ඔයා හොඳට ඉගෙන ගන්න. ඔයා මෙහෙ මොකක්ද කරන ඩිග්‍රි එක..?" මම ඔහුගෙන් ඇසුවෙමි.

"මම ඒ ලෙවල් වලට කොමස් කලේ. දැන් HRM ඩිග්‍රි එක කරනවා."

"අශේන් මම ඔයාගේ ජීවිතේ විනාශ කරානම් මට සමාවෙන්න. ඒත් අපි ආයෙ 11 වසරට කවදාවත්ම යන්නේ නෑ. අපේ පන්තියෙ එක එක ගෑණු තමයි ඔයාගේ ඔළුවට විෂබීජ දැම්මේ. මටත් ඔයා ගැන කේලම් කියලා එපා කෙරුවේ."

"අදටත් අපේ නංගි ඔයා ගැන කියනවා."

මාත් ඔයාලගේ නංගිට සැලකුවේ මගේම නංගිට වගේ. දැන් ඉස්සර වගේ නෙවෙයි හැමදේම වෙනස්. අපි වෙන් වෙන්න හේතු වුනේ එක එක එවුන්ගේ කේලම්. මට හොඳටම පරක්කුයි අශේන්. ඔයා හැමදාම හිනා වෙලා සතුටින් ඉන්න. ආයෙ අතීතයට ගිහින් හිත පාර ගන්න එපා. හොඳට ඉගෙනගෙන ඔයාගේ හීන වලට යන්න. අම්මව හොඳට බලා ගන්න කිසිම දුකක් නොදී. මං යනවා." මම එසේ කියමින් එතනින් පිටව ආවෙමි.

මා පැමිණියත් ඔහු මා දෙස බලා සිටියේය.
"සොරි අශේන් මට පණටත් වඩා ආදරේ කරන මගේ ප්‍රවීන්ව මට වටිනවා. මට එයාව නැති කරගන්න බෑ." මම සිතෙන් සිතුවෙමි.

අද දින අශේන් තේජන බණ්ඩාරව මුණගැසුණු බව කිසිවෙකුටත් නොකීමට මම බල වග බලා ගත්තෙමි.

මා යන විට අත්තම්මා සහ සීයා පැමිණ සිටියෝය.

"මගේ චූටි කෙල්ල එනවා." අත්තම්මා සතුටින් කීවාය.

"අනේ අත්තම්මලා දැන්ද ආවේ..?"
මම ඔවුන්ට වැඳ සතුටින් ඇසුවෙමි.

"ඔව් මැණිකේ. අපි දැන් ටිකක් වෙලා ඇවිත්." අත්තම්මා මා තුරුලු කර ගනිමින් කීවාය.

"බලන්නකෝ චාන්දනී, චූටි මැණිකෙගේ ලස්සන. උස ගිහින් මහත්වෙලා බෝනික්කෙක් වගේ." සීයා කීවේය.

"ආ අම්මේ මෙන්න තේ ටිකක් බොන්න." අම්මා තේ කෝප්ප දෙකක් කේක් සහ බිස්කට් සමග ගෙනැවිත් ඇගේ මවට හා පියාට දුන්නාය.

අද ජූලි 25 වන සිකුරාදා, ප්‍රවීන් පැවසූ පරිදි ඔහු අද දින නිවාඩුවට නුවර පැමිණිය යුතුයි.

"බබා ඔයා දැන් කොහෙද ඉන්නේ?" මම ප්‍රවීන්ට දුරකථන ඇමතුමක් ගෙන ඇසුවෙමි.

"මැණික මං ඉන්නේ මාවනැල්ලේ. ඔයා කැම්පස් ගිහින් ආවද..?"

"ඔව් දැන් ටිකක් වෙලා ඇවිත්. ඔයා එහෙනම් පරිස්සමෙන් එන්න බුදු සරණයි." මම ඔහුට එසේ කියමින් දුරකථනය තැබුවෙමි.

පසුව මම ඇඳුම් මාරු කරගෙන පහළට ගියෙමි.

"අත්තම්මලා දිගටම මෙහේ ඉන්නව නේද..?" මම සතුටින් අත්තම්මාගෙන් ඇසුවෙමි.

"අම්මා කතා කරලා කිව්වා ලොකු පුතාගේ විවාහ මංගල්‍ය කටයුතු කතා කරගන්න ඒ දරුවෝ සදුදාට මෙහෙ එනවා කියලා. අපි අඟහරුවාද දිහාවට යනවා දුවේ." අත්තම්මා කීවාය.

"අනේ සීයේ ඔයයි, අත්තම්මයි දිගටම මෙහේ ඉන්නකෝ." මම සීයාට ඇවටිලි කළෙමි.

"පුතේ ලොකු අම්ම අපට ගෙදරින් හෙලවෙන්න දෙන්නෑ. අපිට කිව්වා පුළුවන් තරම් ඉක්මනට ආයෙ එන්න කියලා. ඒ දරුවා අපි නැති කාලෙක කොහොම ඉඳීද දන්නෑ." සීයා කීවේය.

"හා හා කමක් නෑ. ඔයාලා එහෙනම් එහෙම ඉන්නකො." මම සීයාට බොරු කේන්තියක් මවා කීවෙමි.

"අනේ දුවේ එහෙම කියන්න එපා." අත්තම්මා දුකෙන් මෙන් කීවාය.

"චූටි දුවේ, කියවන්න පොත් පත්තර මොකුත් එහෙම නැද්ද..?" සීයා මගෙන් ඇසුවේය.

"ඉන්න සීයේ, මං ගෙනත් දෙන්නම්." මම එසේ කියමින් මාගේ කාමරයට පියමැන්නෙමි.

මම සීයාට තරංගී ඇන්ටිගෙන් ඉල්ලාගත් පොත් හයක් සහ පුවත්පත් මිටියක් ගෙනවිත් දුන්නෙමි.
ඔහු සතුටින් එය ගත්තේය.

ඔහු විශ්‍රාමික ගුවන් හමුදා මේජර් ජෙනරාල් වරයෙකි.
කුඩා කල පටන් පොත් කියවීම පුරුද්දක් කර ගත් බව ඔහු කියා සිටියේය.
අත්තම්මා තැපැල් කන්තෝරුවේ වැඩකර ඇති බවත්, තැපැල් නෝනා යැයි කියූ විට ඇය නොදන්නා අයකු නැති බවත් පෙර දිනක අම්මා කියා සිටියාය.

පසුව මම රාත්‍රී වනතුරු අත්තම්මා හා සීයා සමගින් කතාබස් කළෙමි.

අතීතයේ අත්තම්මා හා සීයා හමුවුණු හැටි පවා ඇය කීවාය.
මම සිනහාසෙමින් ඔවුන් සමග සතුට බෙදා ගත්තෙමි.
රාත්‍රී ආහාරයෙන් පසු සීයාගේ කොන්දේ අමාරුවට මම බෙහෙත් තෙල් ගෑවෙමි.

"මගේ රත්තරං කෙල්ලට තුණුරුවන් සරණයි!." මා ඔවුන්ට වැද නිදාගැනීම සඳහා කාමරයට එන විට සීයා කීවේය.

***

පසුදින ජූලි 26 වන සෙනසුරාදා කැම්පස් එකේ නිවාඩු දිනයක් බැවින් මම පාන්දරම අවදි වුණේ නැහැ.
ලා හිරු කිරණ ජනේලයෙන් මා සිරුර වෙලා ගනිද්දී මා හට දුරකථන ඇමතුමක් පැමිණියේය.
ඇමතුම ගෙන තිබුණේ ප්‍රවීන්ය.

මම ඇඳේ ඉඳගනිමින් ඔහුට කතා කළෙමි.

"ගුඩ් මෝර්නින් බබා." මම ඔහුට කීවෙමි.

"ගුඩ් මෝර්නින් මැණික. ඊයේ රෑ මං ගෙදර ආවා. අපි අද කොහේ හරි යමුද..?"

"අදහස නම් නරකම නෑ. ඒත් කොහෙද යන්නේ?" මම කුතුහලයෙන් මෙන් ඇසුවෙමි.

"යන්න නම් තැනක් තියෙනවා.අපි ගම්පොළ අම්බුලුවාවේ යං." ඔහු සතුටින් කීවේය.

"හා හොඳයි හැබැයි ගෙදරින් අවසර ගන්න ඕනි, යන්න දෙයිද කියලා ෂුවර් නෑ." මම දුකෙන් මෙන් කීවෙමි.

"ප්‍රශ්නයක් නෑ, දැන් ගෙදරින් අපි ගැන දන්නවනේ." ඔහු ඊට විරුද්ධ වෙමින් කීවේය.

"අපි ගැන දන්න එක තමයි ලොකුම ප්‍රශ්නේ. ඉස්සර නම් යාළුවෝ නේ කියලා හිතලා යන්න දෙනවා. ඒත් දැන් අපි අතරේ යාළුකමට එහා ගිය දෙයක් තියෙනවා කියලා එයාලා දන්නවා. ඒ නිසා බයටම යන්න දෙන්නේ නෑ. කමක් නෑ මං අහලා බලන්නම්කෝ."

"ඔව් ඔයා කියන දේ ඇත්ත, අම්මගෙන් අහලා බලලා කෝල් එකක් ගන්න එහෙනම්." ඔහු එසේ කියමින් දුරකථන ඇමතුම විසන්ධි කළේය.

මම දත් මැද මුහුණ සෝදා ඇඳ පිළිවෙලකට සකසා පහළට ගියෙමි.

"ගුඩ් මෝර්නින් චූටි." අම්මා කෑම කන අතරේ කීවාය.

"ගුඩ් මෝර්නින් අම්මා, ඔයාට අද නිවාඩු ද..?" මම අම්මාගෙන් ඇසුවෙමි.

"නෑ පුතේ මං වැඩ. කාලා ලෑස්ති වෙනවා.
අම්මේ ඔයාගෙන් අහන්න දෙයක් තියෙනවා. ප්‍රවීන් අහනවා අම්බුලුවාවේ ගිහින් එමුද කියලා." මම බියෙන් මෙන් අම්මාගෙන් ඇසුවෙමි.

"අම්බුලුවාව කිව්වේ ගම්පොළ නේද…?"

අම්මා කුතුහලයෙන් මෙන් ඇසුවාය.

"ඔව් අම්මේ."

"අපි ඔයාලාට ගෙදරින් කැමැත්ත දුන්නට ඒකෙන් අයුතු ප්‍රයෝජන එහෙම ගන්නවා නෙවෙයි." අම්මා සැරින් මෙන් කීවාය.

"ඉන්න මං තරංගීගෙනුයි තාත්තගෙනුයි අහලා ඔයාට යන්නද එපා ද කියලා කියන්නම්."
අම්මා එසේ කියමින් දුරකථන ඇමතුම ගෙන තරංගී ඇන්ටිට සහ තාත්තාට කතා කළාය.

පසුව මා දෙසට පැමිණියාය.

"හරි චූටි ප්‍රශ්නයක් නෑ. ඔය දෙන්නා ගිහින් එන්න. හැබැයි මං කිව්වා වගේ අනවශ්‍ය දේවල් බෑ." අම්මා දැඩිව කීවාය.

"අනේ තැන්ක්යූ සෝ මච් අම්මා." මම අම්මාව සතුටින් බදා ගනිමින් කීවෙමි.

අනතුරුව මම සතුටින් කාමරයට පැමිණ ප්‍රවීන්ට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

"මැණික අම්මා මොකක්ද කිව්වේ..?"

"අම්මා යන්න කිව්වා. අපි කීයටද යන්නේ..?"

"ඒකනේ මං කිව්වේ. යන්න දෙයි කියල. අපි දහයට විතර ගෙදරින් යමු."

"හා ප්‍රවීන්, අපි මොකේද යන්නෙ..?" මම කුතුහලයෙන් මෙන් ඇසුවෙමි.

"මගේ දඩු මොණරෙන්." ඔහු විහිළුවට මෙන් කීවේ ඔහුගේ මෝටර් බයිසිකලේ ගැන බව මම දැනගත්තෙමි.

"මරු මරු, මට පුළුවන්නේ රාවණා රජතුමාත් එක්ක ආව මන්දෝදරී දේවිය වගේ යන්න."
මම විහිළුවට මෙන් කීවෙමි.

"මේ බබා මං ඔයාට ගෙනා දුන්න කපල් ටී ෂර්ට් එක දෙන්නම අඳිමු නේද..?" මම ඔහුගෙන් ඇසුවෙමි.

"හා මැණික, ඒක කොහාටවත් අඳින්න බැරි වුණා. එතකොට අපි එක වගේ ඉඳී." ඔහු සතුටින් කීවේය.

මම ඔහු සමග කතා කරමින් හිඳ පහළට ගියෙමි. මා පහළට යන විට අත්තම්මා හා සීයා උදෑසන ආහාර ගනිමින් සිටියහ.

මමත් ඔවුන් සමග ආහාර ගත්තෙමි. මම අද යන ගමන ගැන අත්තම්මාට හා සීයාටද කීවෙමි. ඔවුන්ට ප්‍රවීන් ගැනත් පැවසුවෙමි.
ඔවුහු මාහට ආදරයෙන් අවවාද දුන්නෝය.

මම උදේ 9.20ට පමණ කාමරයට පැමිණ ගම්පොළ යාමට සූදානම් වුණෙමි.

කපල් ටී ෂර්ට් එකට ලා නිල් පැහැදි ඩෙනිම් කලිසම ඇද සුදු සපත්තු දෙක දමා කොණ්ඩේ උඩට කර බැඳ, ඔරලෝසුව, මාලය හා මුද්ද දමාගෙන කුඩා බෑගයට වතුර බෝතලයක් හා මුදල් පසුම්බිය දමා ගත්තෙමි.

උදෑසන 10.00 වන විට ප්‍රවීන් ඔහුගේ දඩුමොණරෙන් ඉඟිලි අප නිවස අසලට පැමිණියේය.

"ප්‍රවීන් අපේ අත්තම්මයි, සීයයි ඇවිත් ඉන්නවා. මං ඔයා ගැන කිව්වා. පොඩ්ඩක් ඇවිත් කතා කරලා යන්නකෝ." මම ප්‍රවීන්ට කීවෙමි.

ප්‍රවීන් මා කිවූ නිසාම නිවසට පැමිණ ඔවුන් සමග කතාබස් කළේය.

"අනේ පුතාලා පරිස්සමෙන් යන්න තුණුරුවන් සරණයි." අප ඔවුන්ට වැඳ නිවසෙන් පිටවෙද්දී ආත්තම්මා කීවාය.

"අන්තිමට කොහොම හරි හැමෝගෙම  හිත් දිනා ගත්තා නේද ඔයා..?" මම බයිසිකලේට නැග හෙල්මට් එක දා ගනිමින් කීවෙමි.

"එහෙම තමයි මං වගේ කොල්ලෙක්ට ඕන කෙනෙක් කැමති වෙනවා." බොරු ආඩම්බරයක් මවා ප්‍රවීන් කීවේය.

"මම කවදාවත් හිතුවේ නෑ පොඩි කාලේ මාත් එක්ක ප්‍රී ස්කූල් ගිය පොඩි කොල්ලා මගේ ජීවිතේ මෙච්චර වෙනස් කරයි කියලා." මම ප්‍රවීන්ගේ බඩ වටා අත් දෙක යවා ඔහුට තුරුල් වෙමින් කීවෙමි.

"මට නම් පොඩි කාලෙ ම හිතුණා."

"මොකක්ද..?"

"කවද හරි බඳින්නේ ඔයා වගේ කෙල්ලෙක් කියලා"

ප්‍රවීන් තරමක් වේගයෙන් පැමිණි නිසා අපට ඉක්මනින්ම ගම්පොළ නගරයට පැමිණීමට හැකිවුණි.

ඔහු ගම්පොළ පාලම අසල මෝටර් බයිසිකලේ නැවැත්වූයේය.

"ඔයා මොන හරි කනවද …?" ඔහු ඇසුවේය.

"දැන් එපා බඩගිනි නෑ. මට ආසයි මහවැලි ගඟ අනුවෙන විදිහට පාලම උඩ ඉඳලා ෆොටෝ එකක් ගන්න."

පසුව ඔහු මාගේ ඡායාරූපයක් ගත්තේය.

ඔහු කැමරාවද ගෙනවිත් තිබුණේය

"තව ගොඩක් දුර යන්න ඕනෙද ප්‍රවීන්…?"මා එසේ අසද්දී ඔහු දුර ඈත කන්දක ඇති අම්බලුවාව මට පෙන්නුවේය.

බොහෝ දුරක් ගෙවා ගෙන අපි අම්බලුවාවට පැමිණියෙමු.

"මං හිතන්නේ මැණික ඔයාට මේ කුළුණේ උඩටම නගින්න බැරි වෙයි. ඔයා පොඩි දේකටත් බයයි නේ." ප්‍රවීන් විහිළුවට මෙන් කීවේය.

"හරි හරි අපි බලමුකෝ. මං ඔයාට නැගලාම පෙන්වන්නම්." මම ඔහුට අභියෝග කර කීවෙමි.

පසුව අපි කුළුණ උඩටම ගොස් ඡායාරූප ගත්තෙමු.

මම කෙසේ හෝ ඒ අභියෝගය ජයගත්තෙමි.

"අද සෙනසුරාදා දිනයක් වුවද,එතරම් සෙනඟ නොසිටීම ගැන අපි බෙහෙවින් සතුටු වුණි.

අපි පරිසරයේ සුන්දරත්වය විඳිමින් එහි බොහෝ වෙලාවක් රැඳී සිටියෙමු.

අනතුරුව නැවත ගම්පොළ නගරයට පැමිණියෝය.

"බබා, දැන් නම් හොඳටම බඩගිනී." ප්‍රවීන් කීවේය.

"අපරාදෙ අපිට කෑම එකක් අරගෙන එන්න තිබුණා."

"කමක් නෑ, අපේ සුදු පුංචි වැඩ කරන්නේ ගම්පොළ පීසා හට් එකේ. එයා එතන මැනේජර්. අපි යමු පීසා හට් එකට."

"අප දෙදෙනා නුවරඑළිය පාරේ ගම්පොළ පීසා හට් එකට පැමිණියෙමු. අපි දෙදෙනා පැමිණ ඇති බව දැන සුදු පුංචි පැමිණ අපත් සමග කතා කළාය.

"අනූ පුතේ, ගොඩ දවසකින් දැක්කේ. මේ ඔයා කියපු ගෑනු ළමයද..?" සුදු පුංචි ඇසුවාය.

"ඔව් සුදු පුංචි, මෙයා ගැන තමයි මං කිව්වේ." ප්‍රවීන් කිවේය.

නිල් පැහැති ෂර්ට් එකක් හා කළු කලිසමක් ඇද, කොණ්ඩය පොල් ගෙඩියක් තරමේ ගුලියක් ගසා මේකප් එකක් දමා සිටි ඇය රූමත්ය.

අනතුරුව මම ඇය සමග කතා කළෙමි. දුටු ඕනෑම අයෙකුට ඇය තරංගි ඇන්ටිගේ නංගි බව පැවසිය හැක. ඒ ඔවුන් දෙදෙනාටම තිබෙන්නේ එකම මුහුණුවරක් නිසා.
අපි පීසා කෑවෙමු. සුදු පුංචි අපිට බීමද ගෙනවිත් දුන්නාය.

අනතුරුව අපි බිල ගෙවා සුදු පුංචිට ස්තුති කළෙමු.
"අපි එහෙනම් ගිහින් එන්නම් පුංචි." ප්‍රවීන් ඇයට වඳිමින් කීවේය.
මමද පුංචිට වැන්දෙමි.

"බුදු සරණයි මගේ පැටව් දෙන්නට, ආයේ දවසක මේ පැත්තෙ ඇවිල්ලා යන්න එන්න." සුදු පුංචි කීවාය.

ඇය අපට ගෙදර රැගෙන යාමට පීසා දෙකක් දමා දුන්නාය. අපි දෙදෙනා නැවත නුවර ඒමට පිටත් වුණෙමු.

"ඔයාලගේ පුංචි හරි හොඳයි. ඒ වගේම මාර ලස්සනයි. තාම බැඳලා නැද්ද..?" මම ප්‍රවීන්ගෙන් යන අතරේ ඇසුවෙමි.

"ඔව් හොඳයි වගේම ලස්සනයි. හැබැයි බැඳලා ලොකු ළමයි තුන්දෙනෙක් ඉන්නවා." ප්‍රවීන් සිනහසෙමින් කීවේය.

"මොනවා ඔය ඇත්තමද, ඔයා බොරු නේද කියන්නේ.. ඉතින් පුංචිට තියෙන්නේ පොඩි පෙනුමක්නේ."

"නෑ ඇත්තමයි බබා අපේ වයස පුතෙකුයි අපිට වඩා අවුරුද්දක් බාලා දුවෙකුයි තව දහය වසරේ පුතෙකු ඉන්නවා." ඔහු කීවේය.

"අම්මෝ මට නම් විශ්වාස කරන්නත් අමාරුයි වගේ."

"වෙලාවක අපි පුංචිලා ගෙදර ගිහින් එමු." ප්‍රවීන් කීවේය.

අප දෙදෙනා නුවරට පැමිණෙන තේක්ම කතාබහ කරමින් පැමිණියෙමු.

වේලාව සවස 5.30ට ආසන්න වුණි. ප්‍රවීන් මාව නිවසේ අසලටම ගෙනැවිත් බැස්සුවේය.

"පරිස්සමෙන් යන්න ප්‍රවීන්. බුදු සරණයි. මම ඔහුට එසේ කියා අත වනමින් නිවසට පැමිණියෙමි.

"අත්තම්මේ මං ආවා." මම අත්තම්මාගේ අසලට යමින් කීවෙමි.

"ආ චූටි දුව ආවද? අපි ඒත් බය වුණා. දැන් වෙලාව 6.00ටත් කිට්ටුයිනේ." අත්තම්මා කීවාය.

"මෙන්න ඔය දෙන්නට පීසා එකක් ගෙනාවා." මම එසේ කියමින් අත්තම්මා අතට පීසා බෑග් එක දුන්නෙමි.

අම්මලා නිවසට පැමිණෙන විට රාත්‍රී 9.00 වී තිබුණි. කුසුම නැන්දා ආහාර පිස කෑම මේසයට දමා තිබුණි.
අම්මා හා තාත්තිත් පිරිසුදු වී රාත්‍රී ආහාර ගැනීමට පැමිණියහ. එකවරම තාත්තිට දුරකථන ඇමතුමක් පැමිණියේය.

නැවත තාත්ති කෑම මේසයට පැමිණෙන විට දහඩිය දමා මුණ රතු වී හැඩුම්බරව සිටියේය.

"මොකද රුවන්ත කවුද කතා කළේ..?" අම්මා සැකයෙන් මෙන් ඇසුවාය.

"මට කතා කළේ බදුල්ල හොස්පිටල් එකේ ඉඳලා රමේෂ් පුතා." තාත්ති කීවේය.

"අර වරුණ ප්‍රනාන්දු සර්ගේ පුතා නේද රමේශ් කියන්නේ? ඉතින් මොකද කියන්නේ..?" අම්මා සැකයෙන් මෙන් ඇසුවාය.

"ඔව් ඔව්, එයා තමයි අද උදේ රශිකා ප්‍රනාන්දු මැඩම් නැතිවෙලා තාරුකා. හෙට මළ ගෙදර යන්න ඕනි අනිවාර්යෙන්ම."

"මොනව රශිකා මැඩම් නැති වෙලා. අනේ පව්." තාත්ති කියූ දේ අසා අම්මාට කෑම පිට උගුරේද ගියාය.

අම්මා හා තාත්තා පවසන කිසිවෙකු පිළිබඳ මා මීට පෙර අසා නැත.

අම්මා මා දෙස බොහෝ වේලාවක් බලා සිටියාය.

"පුතේ අපි හෙට ඒ මැඩම්ගේ මළගෙදර ගිහින් එමු." අම්මා මා හට කීවාය.

"කවුද අම්මේ රශිකා මැඩම් කියන්නේ." මම අම්මාගෙන් ඇසුවෙමි.

"ඔයා කිව්වට දන්නෑ පුතේ, එයා මිහිපිට උත්තමාවියක්. අපි අද සතුටින් මෙහෙම ඉන්නේ ඒ මැඩම් නිසා." අම්මා කියූ කිසිවක් මට නොතේරුණද මම අසා සිටියෙමි.

"රුවන්ත මළ ගෙදර කොහෙද තියෙන්නේ?" අම්මා තාත්තිගෙන් ඇසුවාය.

"බදුල්ලේ ඉඳන් නුවරට මරණය ගෙනල්ලලු. අපි හෙට උදෙන්ම ගිහින් එමු. අනිද්දට හිරන්දි දුවලත් එනවනේ." තාත්ති ශෝකයෙන් මෙන් කීවේය.

අම්මා සහ තාත්ති මේ තරම් දුක්වන්නේ ඇයි දැයි සිතමින් මම නින්දට ගියෙමි. ප්‍රවීන්ටද දුරකථන ඇමතුමක් ගෙන සිදුවූ දේ පැවසුවෙමි.

***

"චූටි දුව… නැගිටින්න පුතේ වෙලාව 5.00යි." පසුදා උදෑසන අම්මා මා හට කතා කළාය.

අද ජූලි 27 වන ඉරිදා…..

"අම්මේ ගුඩ් මෝනින් දැම්ම මොකටද නැගිට්ටන්නේ." මම ඇඟ මැලි කඩමින් ඇසුවෙමි.

"දුවේ ඊයේ කියපු මැඩම්ලගෙ මළ ගෙදර අද යන්න ඕනි. උදෙන්ම යමු. හෙට අක්කිලා එන එකට ලෑස්ති වෙන්නත් ඕනෙනේ." අම්මා කීවාය.

පසුව මා සුදු පැහැති ටී ෂර්ට් එකක් සහ කළු පැහැති ඩෙනිම් කලිසමක් ඇඳ උදේ ආහාරයවත් නොගෙන අම්මා හා තාත්තා සමගින් මෝටර් රථයෙන් සුවිසල් මන්දිරයක් වැනි නිවසකට පැමිණියහ.

පාර හරහා සුදු කොඩියක් දමා තිබුණි. ගේ උයනේ තැබූ ඇලුමිනියම් පුටුවල සුදු ඇඳගත් අය කතාබස් කරමින් සිටියහ.
සිහිනෙන් ඇවිදින කලෙක මෙන් මම දෙමාපියන් සමඟ ගේ උයන හරහා ගොස් ගෙට ඇතුල් වුනෙමි.

සාලයේ මැද මිනී පෙට්ටියක ඇය සිටි. සුදු
සාරියකින් සැරසී සිටින ඇගේ මුහුණ මලානිකය. මුවගේ මන්දස්මිතයකි.

අම්මා ඇයව දැක ඉකි ගසා ඇඩුවාය. තාත්තා දොම්නස පිරී ඇති මුහුණෙකින් යුක්ත විය.

ස්වල්ප වේලාවකින් රශිකා මැඩම් දෙස බලා සිටියදී මගේ නෙතගටද කඳුළු ආවෙමි.
ඇගේ වත මාහට හුරු බවක් දැනුණි.

තාත්ති අසලට තරුණ ගැහැණු ළමයෙකු සහ පිරිමි ළමයෙකු පැමිණ කතා කළහ.

තාත්ති මොනවද ඔවුන්ට පවසා මා දෙසට ඇඟිල්ල දිගුකොට දුව යයි පැවසුවේය.

"මෙයාද අංකල්ගේ දුව." එම තරුණ ගැහැණු ළමයා මා දෙසට පැමිණ ඇසුවාය.

ඇය දිග කොණ්ඩයක් සහිත කෙසඟ තරුණියකි. නමුත් ඇයගේ අමුතු සිරියාවක් තිබුණි.

"පුතේ මේ ඉන්නේ නැතිවුණ රශිකා ප්‍රනාන්දු මැඩම්ගේ දුව, මිනෝෂි සේනාරයි, පුතා රමේශ් ඉසුරංගයි." තාත්ති මාහට ඔවුන්ව හඳුන්වා දෙමින් කීවේය.

ඔවුහු මා හා ස්වල්ප වේලාවක් කතා කර නික්ම ගියහ.
ඇය යාමට පෙර කොළ කැබැල්ලක ඇගේ දුරකථන අංකය ලියා අවශ්‍ය වුවහොත් කතා කරන්නැයි පවසා ගියාය.

අවමංගල්‍ය ශාලාවේ සැර මල් සුවඳකින් මාගේ නාස්පුඩු සිරවුණි.
පසුව පැය භාගයක් පමණ හිඳ රශිකා මහත්මියගේ දේහයට අවසන් ගෞරව දක්වා අපි නිවසට පැමිණියෙමු.

"ඒ දරුවො දෙන්න නම් පවු නේද රුවන්ත." අම්මා ගෙට ගොඩ වෙමින් කීවාය.

තාත්ති ද ඊට එකඟ වුණේය.

නිවසට පැමිණි විගසම මා ඇඳුම් උනා හොඳින් ස්නානය කළෙමි.
කාමරයට පැමිණ මිනේහි අක්කී දුන් දුරකථන අංකය දුරකථනයේ සටහන් කර ගත්තෙමි.

ඒත් සමගම ප්‍රවීන්ගෙන් දුරකථන ඇමතුමක් පැමිණියේය.

"බබා ගුඩ් මෝනින්…" මම ඔහුට කීවෙමි.

"මළ ගෙදර ගිහින් ආවද..?"

"ඔව් ප්‍රවීන්, දැන් ඇවිත් ටිකක් වෙලා.
මං ඔයාට කෝල් කලේ මං අද යනවා කියන්න. ඔයාට පුළුවන් නම් අපේ ගෙදර ඇවිල්ල යන්න
එන්න." ඔහු කීවේය.

"අද නම් බෑ  සුදූ හෙට හිරන්දි අක්කිලා අපේ ගෙදර එනවා. අම්මට පොඩ්ඩක් හෙල්ප් එකක් දෙන්න ඕනි." මම කියා සිටියෙමි.

"ඔයා කීයටද යන්නේ..?" මම නැවත වරක් ඇසුවෙමි.

"මම දවල් 1.30ට විතර යන්නේ." ඔහු කීවේය.

පසුව මම ඔහු සමග කතා බස් කරමින් හිඳ දුරකථනය තබා අම්මාට උදව් කිරීමට පැමිණියෙමි.

දවල් 12.00 පමණ වන විට අයියා බඩු මළු රැසක් රැගෙන නිවසට පැමිණියේය.

"ලොකු ආවද පුතේ මොකටද මේ බඩු උස්සගෙන ආවේ..?" අම්මා ඇසුවාය.

"මට ගේන්න හිතුණා. ඒක නෙවෙයි අම්මා අද නිවාඩුද..?" අයියා පුටුවකට බර වෙමින් ඇසුවේය.

"ඔව් පුතේ නිවාඩු දැම්මා.හෙට දුවලා එන එක නිසයි, අද අපි මළ ගෙදරක ගියා ඒ නිසයි." අම්මා කීවාය.

"ආ මේ අම්මට ගුඩ් නිවුස් එකක් තියෙනවා කියන්න." අයියා සතුටින් කීවේය.

"මොකක්ද පුතේ..?" අම්මා අයියා අසලින් වාඩි වෙමින් ඇසුවාය.

"අපේ කැම්පස් එකේ ගැජුවේෂන් සෙරමණි එක අගෝස්තු 15 වෙනිදා." අයියා සතුටින් කීවේය.

"අනේ කොච්චර හොඳද තව මාසයක් වත් නෑ." අම්මා අයියාගේ හිස සිඹිමින් කිව්වාය.

අපි තිදෙනාම එකතු වී නිවස පිරිසිදු කළෙමු.

දිනපතාම කුසුම නැන්දා ගෙදර සහ ගේ උයන පිරිසුදු කරන නිසා අපහට කිරීමට මහා වැඩ කන්දරාවක් තිබුණේ නැහැ.

පසුදා උදෑසන 10.00ට පමණ හිරන්දි අක්කලා අප නිවසට පැමිණියහ. ඔවුන් මෝටර් රථය මිදුලෙහි නවත්වා නිවසට ඇතුල් වුණි.
ඔවුහු බඩු මලු කිහිපයක් පුටුව මතින් තැබුවෝය.

" එන්න වාඩිවෙන්න නංගි ." අම්මා අනුරාධා  ඇන්ටිට කීවාය.

 මම තාත්ති හා අයියා සමගින් උඩ තට්ටුවේ සිට පහළට පැමිණියෙමි.

අපි අනුරාදා ඇන්ටිට සහ කැලුම් අංකල්ට වැන්දෙමු.
හිරන්දි අක්කීත් සමග වරින්දි අක්කී හා භාතියත් පැමිණ සිටියහ.

ප්‍රවීන් සමග ඇතිවූ ගැටුමෙන් පසු මම භාතියගේ මුහුණ දෙසවත් නොබැලුවෙමි.

හිරන්දි අක්කී දිගු කළු පැහැති මල් මල් ගවුමක් ඇඳ කොන්ඩේ උඩ ඉඳන් ගොතා සිටියාය.

"ඔයාල කීයටද ගෙදරින් ආවෙ..?" තාත්ති ඔවුන්ගෙන් ඇසුවේය.

"අපි ඊයෙ උදේ ආවේ අයියා. කැළුම්ගේ යාළුවගේ ගෙදරක හිටියේ. එහේ ඉඳන් මේ ආවේ." අනුරාධා ඇන්ටි කීවාය.

අම්මා ඔවුන්ට ෆලුඩා ජූස් සංග්‍රහ කළාය.

ඔවුහු කැම මේසය වටා වාඩිවී බීම පානය කරමින් කැවිලි කෑවෝය.

"ඔයාලා ඉතින් ඊයේම මෙහෙට එන්න තිබුණනේ." අම්මා පැවසුවාය.

"එහෙම බඳින්න කලින් ඊ කොල්ලගේ ගෙදර නවතින්න එන එක හරි නෑනේ." අනුරාදා ඇන්ටි කීවාය.

"එහෙනම් මම ප්‍රවීන්ලගේ ගෙදර කී පාරක් නම් ඉඳලා තියෙනවද..?" මම සිතින් සිතුවෙමි.

"මෙයාලගේ ගැජුවේෂන් සෙරමණි එක අගෝස්තු 15 වැනිදා නේද..?" අම්මා කීවාය.

"ඔව් මටත් දුව කිව්වා.අපි එහෙනම් සැප්තැම්බර් මුල වගේ වෙඩින් එක ගමු නේද? ඒ වෙනකොට කැම්පස් එකේ වැඩක් ඉවර වෙලා ජොබ් එකත් හම්බවෙනවනේ." අනුරාධා ඇන්ටි කීවාය.

වැඩිහිටියෝ කතාකර සැප්තැම්බර් 6 වෙනිදාට විවාහය තීන්දු කර ගත්හ. ඒ අතරේ අපි වෙනම සාලයට වී කතාබස් කළෙමු. ඔවුහු දහවල් ආහාරය ගත්තෝය.

අම්මා කුසුම නැන්දා සමග එකතු වී කහ බත්, චිකන් කරිය, මාළු ඇඹුල්තියල්, පරිප්පු, පපඩම්, මැල්ලුම්, බටුමෝජු හා කට්ලට් සකසා තිබුණි.

"බොහෝ වේලාවක් අප නිවසේ රැඳී සවස 4.00ට පමණ ඔවුහු නිවසට යාමට සූදානම් වුණෝය.

"දැන් ගෙදරටද යන්නේ යාළුවාගේ ගෙදරටද යන්නේ..?" තාත්ති කැලුම් අංකල්ගෙන් ඇසුවේය.

"අපි මේ ගමන්ම බණ්ඩාරවෙලට යනවා."කැලුම් අංකල් කීවේය.

"හරි එහෙනම් බුදු සරණයි කට්ටියටම. පරිස්සමින් යන්න." අම්මා ඔවුන්ට අත වනමින් කීවාය.

පසුව මම කාමරයට පැමිණ ප්‍රවීන්ට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

ඒ වනවිට ඔහු කැම්පස් ගොස් පැමිණ සිටියේය.

"බබා ඔයාව ගොඩක් මතක් වෙනවා." මම ඔහුට කීවෙමි.

"මටත් එහෙමයි ඔයා මොනවද කරන්නේ?"

"දැන් තමයි හිරන්දි අක්කිලා ගියේ අයියලාගේ ග්‍රැජුවේෂන් සෙරමණි එක අගෝස්තු 15 වෙනිදා. වෙඩින් එක සැප්තැම්බර් 6 වෙනිදට දාගත්තා." මම කීවෙමි.

"ආ එහෙමද එහෙනම් හොඳයි නේද..? ආ අද අර මූසලයත් එන්න ඇති නේද…?" ප්‍රවීන් කීවේය.

"ඇයි අනේ ඕවා ආයෙ ඇදලා ගන්නේ. මං අද ඌත් එක්ක වචනයක්වත් කතා කළේ නෑ." මම කේන්තියෙන් මෙන් කීවෙමි.

"හරි හරි ඉතින්. ඒක නෙවෙයි අපේ කැම්පස් එකේ 'ත්‍රිමාණ' කියලා ප්‍රෝග්‍රෑම් එකක් තියෙනවා. එක එක අයට අයිටම් බෙදලා තියෙනවා. සමහරුන්ට කපල ඩාන්ස් එහෙමත් හම්බවුණා. මට තියෙන්නේ කෙල්ලෝ ගොඩක් ඩාන්ස් කරනකොට මැද ඉඳගෙන සිංදු කියන්න." ඔහු සතුටින් කීවේය.

"අනේ ෂෝක් නේ.. මට ඉරිස්සියයි වගේ, මාත් හිටියනම් ඔයාගේ කැම්පස් එකේම." මම දුකෙන් මෙන් කීවෙමි.

ප්‍රවීන් සමග කතාකර පසුව මම මිහින්දීට කතා කර අතපසු වු වැඩ කොටස ඉල්ලාගෙන සම්පූර්ණ කර ගත්තෙමි.

***

පසුදා මම සුපුරුදු පරිදි තාත්ති සමග කැම්පස් එකට ගියෙමි.
මා පන්තියට යන විට හිරන්දි මාගේ අසුනට එහා පැත්තෙන් වාඩි වී සිටියාය.

"ගුඩ් මොර්නින්…! ඇය සිනාසෙමින් කීවාය.

"ගුඩ් මොර්නින් මිහී." මම ඇයට කීවෙමි.

"මේ ඒක නෙමෙයි. ඊයේ  ඔයාව හොයාගෙන බෝයි කෙනෙක් ආවා.මේ නම මොකක්ද මේ අශේන්  කියල කිව්වා." මිහින්දි කීවාය.

"ඔයා කිව්වද මං ආවේ නෑ කියලා." මම පුදුමයෙන් මෙන් ඇසුවෙමි.

"ඔව් යාළුවෝ වගේ ඉන්න කැමතිනම් අද යන්න කලින් කතා කරලා යන්න කිව්වා." ඇය මා දෙස බලමින් කීවාය.

"අනේ මට වැඩේමයි. ආයෙ මොකුත් කිව්වට ගණන් ගන්න එපා මිහී." මම තරහෙන් මෙන් කීවෙමි.

සුපුරුදු පරිදි කැම්පස් එකේ කටයුතු සිදුවුණි. මම හිතාමතාම අශේන්ව මඟ ඇරියෙමි.
ඒ ඔහු සමග යහළුවෙකු ලෙසින්වත් සිටීමට අවැසි නොවන නිසා.

***

නිකිණි පුර හඳ රාත්‍රී අහසේ බැබලෙමින් සිටියේය. දින සති ගතවන අන්දම මා හට සිතාගත නොහැකි වුණි. කාලයේ වටිනාකම විශ්ව විද්‍යාලයට ඇතුල් වූ පසු බෙහෙවින් දැනෙන්නට වුණි.

අයියාගේ උපාධි ප්‍රධානෝත්සවයට දින සති එළඹුණි. අම්මා ඇයට තද කොළ පැහැති සුදු පබළු වලින් වැඩ දමා තිබෙන සාරියක්ද, මා හට තද කොළ පැහැති කොට සාටි ගවුමක්ද, තාත්තිට කළු පැහැති ෂර්ට් එකක්ද මිලදී ගත්තාය.

අගෝස්තු 15 වනදා අපි පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ගියෙමු. අයියාගේ උපාධි උත්සවය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උත්කර්ෂවත් අන්දමින් පැවතුණි. හිරන්දි අක්කිලාගේ පවුලේ අයද ඊට පැමිණ සිටියහ.

"අද නම් පුදුම සතුටක් දැනෙන්නේ, ලොකු බරකින් නිදහස් වුණා." අම්මා සැහැල්ලුවෙන් මෙන් කීවාය.

"ඒකනම් ඇත්ත අක්කේ මටත් එහෙම්මමයි." අනුරාධා ඇන්ටීද ඊට එකඟ වූවාය.

අපි පවුල් දෙකේම අය එකතු වී ඡායාරූප ගත්තෙමු. අයියා හා අක්කී ද තනි ඡායාරූපයක් ගත්තහ.

අපි සන්ධ්‍යාව වන විට නිවසට පැමිණියෙමු. අයියාගේ උපාධි උත්සවය අවසන් වුවද මාගේ සිත තුළ ලොකු බරක් තිබුණ. ඒ අගෝස්තු 20 වනදට ප්‍රවීන්ගේ ජන්ම දිනය යෙදෙන හෙයිනි.

මට කාමරයට ගොස් ජනේලයෙන් පිටත බලා සිටීමට ආශාවක් ඇතිවුණි. ගමේම සිටින කුඩා ළමුන් එකතු වී නිවස අසල ඇති පිට්ටනියක සෙල්ලම් කරමින් සිටියහ.එය දුටු විට මාගේ ළමා කාලය වෙත මතකය සැරිසරුවේය.
එකවරම මට හොඳ අදහසක් පැමිණියෙමි.

මම දුරකථනය ගෙන තරංගි ඇන්ටිට ඇමතුමක් ලබා ගත්තෙමි.

"හලෝ ඇන්ටි කතා කරන්න පුළුවන්ද මම ස්නෙහි..?"

"පුළුවන් පුතේ කියන්න."

"ඇන්ටි 20 වෙනිදට, ප්‍රවීන්ගේ 20වැනි බර්ත් ඩේ එකනේ. මං කල්පනා කළේ ප්‍රශ්නයක් නැත්නම් ගම්පොළ සුදු පුංචිලාගේ ගෙදර birthday එක ඇරේන්ජ් කරලා, අපි ඔක්කොම එහෙට කියන්නේ නැතුව ගිහින් ප්‍රවීන්ට හදිසියකට වගේ එහෙට එන්න කියමුද කියලා"

"හොඳ අදහසක් පුතේ, එහෙනම් ඉන්නකො මං සුදු නංගිටින්න කතා කරල බලන්නම් කොහොමත් එයා අකමැති වෙන්නේ නෑ. මං නංගිට කෝල් කරල ඔයාට කෝල් එකක් ගන්නම්." තරංගි ඇන්ටි එසේ කියමින් දුරකථනයේ තැබුවාය.

පසුව තරංගි ඇන්ටී කතා කළාය. සුදු පුංචි එයට කැමති වූ බව ඇය පැවසුවාය.

මම 20 වැනිදාට ප්‍රවීන්ගේ උපන් දින උත්සවය ගම්පොළ පවත්වන බව අම්මාට හා තාත්තාටද කීවෙමි.

ඔවුහු ඊට කැමැත්ත පළ කළහ. මම ක්‍රිශාන් අයියාට හා අපේ අයියාටද මේ බව කීවෙමි. එමෙන්ම මම ප්‍රවීන්ගේ කැම්පස් එකේ අලුත් යහළුවන් දෙදෙනෙකු වූ ප්‍රබෝධ හා තීක්ෂණට ද දුරකථන අංක සොයා කතා කළෙමි.
ප්‍රවීන්ට මේ බව නොකියන ලෙසද පැවසුවෙමි. ප්‍රසාදි අක්කීට සහ දිනුත්තර අයියාටද තරංගි ඇන්ටී මේ බව දන්වා සිටියාය.

ඩිලාන් අංකල් අනුරාධපුරයේ තුෂාරි ඇන්ටීටද කතාකර තිබුණේය. ඔවුන්ට පැමිණීමට නොහැකි බව දන්වා වමත්, නිෂිනි සහ සචිනි ගම්පොළට එවන බව ඇය පවසා තිබුණාය.

***

අගෝස්තු 19 වන සිකුරාදා රාත්‍රියේ ප්‍රවීන් ඩිලාන් අංකල් සමග ගෙදරට පැමිණ තිබුණේය. මම ඔහුට එදින දුරකථන ඇමතුම් ලබා ගත්තේ නැහැ.

ඔහු නිවසට පැමිණි බව පණිවිඩයක් එවන විට මම උදෑසන නගරයෙන් මිලදීගත් නවීන පන්නයේ ගිටාරය සහ අනෙකුත් දේවල් සූදානම් කරමින් සිටියෙමි.

***

පසුදා උදෑසන අපි තරංගි ඇන්ටිගෙන් පාර අසා ගම්පොළ සුදු පුංචිගේ නිවසට ගියෙමු.

අප යන විට දිනුත්තර අයියා හා ප්‍රසාදි අක්කී පැමිණ සිටියහ. එමෙන්ම ක්‍රිශාන් අයියා, අනුදි නංගී, අනුරාධපුරයේ සිට වමත් මල්ලී සහ ඇගේ නිවුන් සහෝදරියන් දෙදෙනා ද පැමිණ සිටියහ.

සුදු පුංචිලාගේ නිවස තෙමහල් නිවසක් වූ නිසා සියලු දෙනාම අපහසුවකින් තොරව සිටියෝය. අපි උපන්දිනයට අවශ්‍ය දේවල් තෑගි සහ ඔවුන්ගේ ගෙදරට අවශ්‍ය බඩු ද මිලදී ගත්තෙමු.

"එන්න ඇතුළට, මේ දුවගෙ පවුල අයද..?"අපි නිවසට යන විට සුදු පුංචි ඇසුවාය.

"ඔව් පුංචි…" මම ඇයට කීවෙමි.

"අක්කි ඔයා නේද ස්නේහි කියන්නේ..?" මා වෙතට උරහිසට තෙක් දිග කොණ්ඩයක් සහිත තරමක් මහත, ලස්සන ගැහැණු ළමයෙක් පැමිණ ඇසුවාය.

"ඔව් නංගී, එතකොට ඔයා..?"

"මම තිසුමි ඉශාරා. අනු අයියා ඔයා ගැන විස්තර කියලා තියෙනවා."

තිසුමි යනු සුදු පුංචිගේ දුවයි. තවත් පුතාලා දෙන්නෙක් ඇයට සිටියාය. එක් අයෙක් අපේම වයස ගිහාන් මදුශංක. අනෙත් පුතා දිනාල් අනුරාධ. ඔහු දහය ශ්‍රේණියේ ඉගෙනුම ලබයි.

අනුදි, නිෂිනි සහ සචිනි ඔහුගේම වයසේය.

අද උදෑසන ප්‍රවීන්ගේ උපන්දිනය අමතක මෙන් අපි ඔහුට කතා නොකර සිටියෙමු.
එකවරම මා හට දුරකථන ඇමතුමක් පැමිණියේය.

"හෙලෝ ස්නේහි…මම ප්‍රබෝධ කතා කරන්නේ ප්‍රවීන්ගේ කැම්පස් එකේ, මායි තීක්ෂණයි දැන් ඉන්නේ ගම්පොළ ටවුන් එකේ අපි කොහාටද එන්න ඕනි..?"

"ආ ප්‍රබෝධ, ඔයාලා ඔතනම ඉන්න. මං දැන් අපේ අයියව එවන්නම්. එයත් එක්ක එන්න."

අයියා නගරයට ගොස් ඔවුන්ව සුදු පුංචිලා ගෙදරට එක්කගෙන ආවේය.

අනතුරුව සුදු පුංචි අප සියලුම දෙනාට තේ හදලා දුන්නාය.

අපි තේ බී සවස උපන්දින පාටියට නිවස සැරසුවෙමු. දිනුත්තර අයියා ප්‍රවීන්ගේ ඡායාරූපයක් ලොකු කර ගෙනවිත් තිබුණි. එය තබා, බැලුම්බෝල එල්ලා happy birthday ස්ටිකර් එකක් ගසා, ටේප් වලින් සරසා බල්බ් වැල් දමා ඔවුන්ගේ දෙවන මහල ඇතුළ සැරසුවෙමු.

සවස හතරට පමණ තරංගි ඇන්ටි බොරුවට ප්‍රවීන්ට කියා තිබුණා සුදු පුංචියට අසනීප වී ඇති බව, එසේ කියා ඔවුහු ගම්පොලට පැමිණීමට පිටත්වී තිබුණෝය.

වෙනදා මේ සියලු දේට සිටිනා එරන්දී අද නොමැති වූවාය. මම රූපිකා ඇන්ටිට කතා කර පැමිණෙන්නයි කියන විට ඔවුන්ට පැමිණීමට නොහැකි බව පැවසුවාය.

සවස තිසුම්ගේ අප්පච්චීද පැමිණියේය.

ඔහුද සුදු පුංචි මෙන් ඉතා කරුණාවන්ත අයෙක් වුණේය.

අප සියලු දෙනාම දෙවන මහලට වී සිටියහ.

දෙවන මහලේ විදුලි බුබුළුද නිවා තිබුණි.
ප්‍රවීන් ඔහුගේ දෙමාපියන් සමග පැමිණියේය.

"එන්න ඇතුළට." සුදු පුංචිගේ සැමියා වූ වානක බාප්පා කීවේය.

"මල්ලි දැන්ද ආවේ..?" ඩිලාන් අංකල් ඔහුගෙන් ඇසුවේය.

"දැන් ටිකක් වෙලා අයියා, අද සොනාලිට උණ හැදිලා ටිකක් අමාරු වුණා. බෙහෙත් අරගෙන ආවේ දැන් ටිකකට කලින්." වානක බාප්පා ප්‍රවීන්ට ඇසෙන්නට බොරුවට කීවේය.

"බාප්පා කෝ සුදු පුංචි…?" ප්‍රවීන් පුංචිට වැඩි සෙනෙහසක් දක්වන හෙයින් ඇය අසනීප වූ පසු ඇයව බැලීමට අවශ්‍ය නිසා ඇසුවේය.

"දෙවැනි තට්ටුවේ ඉන්නවා පුතේ, බලලා එන්න." බාප්පා ප්‍රවීන්ට කීවේය.

ප්‍රවීන් අසුනින් නැගිට පඩිපෙළ නැඟ එද්දී ඊට පිටුපසින් තරංගි ඇන්ටිලාද පැමිණියහ.

අන්ධකාරේම ප්‍රවීන් අවසන් පඩිය දක්වාම පැමිණියේය. එකවරම ප්‍රවීන් විදුලි පහන දැල්වූවේය.. ක්ෂණිකවම සියලු දෙනා 'Happy birthday ප්‍රවීන්' යනුවෙන් කෑ ගැසුවෝය.

බල්බ් වැල් දමා මැද කේක් එකක් තබා වටේම යහළුවන් නෑදෑයන් පිරී ඇති විට ප්‍රවීන්ට මෙය අදහා ගත නොහැකි වුණේය.

ඔහු මුහුණ වසාගෙන ස්වල්ප වේලාවක් සිටියේය.

ඔහුගේ ඇස්වලින් සතුටු කඳුළු රූටා වැටුණේය.

"අනේ දෙවියනේ මට අදාගන්න බෑ, හැමෝම ඇවිල්ලා තැන්ක්යූ ඔයාලා හැමෝටම.." ඔහු සතුටින් කීවේය.

"ඔයාගේ සනුගේ අදහස් තමයි මේවා." තරංගි ඇන්ටි කීවාය.

ඔහු මා දෙස ආදරයෙන් බලා සිටියේය. ඔහු මට ස්තුති කළේය.

පසුව අපි කේක් කැපුවෙමු. ප්‍රවීන් හැමෝටම කේක් කැව්වේය.

"අඩේ උඹලා දෙන්නා කොහොමද බං ආවේ..?" ප්‍රවීන් ප්‍රබෝධ හා තීක්ෂණව වැලඳ ගනිමින් ඇසුවේය.

"ඒව වැඩක් නෑ, අපි කොහොම හරි ආවනේ." තීක්ෂණ ඔච්චමට මෙන් කීවේය.

අපි හැමෝම ප්‍රවීන්ට තෑගි දුන්නෙමු.
මා ඔහුට අලුත් ගිටාර එකක් දෙන විට ඔහු මාව වැලඳ ගෙන නළල සිප ගත්තේය.

"තැන්ක්යූ මැණික මේ හැමදේටම ඔයා නිසා තමයි මං අද සතුටින් ඉන්නේ." ඔහු කොඳුරා කීවේය.

පසුව අපි සියලු දෙනාම විනෝද වුණෙමු. රාත්‍රී 9.00 පමණ වන තෙක් අපි සුදු පුංචිලාගේ ගෙදර සිටියෙමු. රාත්‍රී ආහාර ගෙන අපි නිවසට පැමිණෙන්නට සූදානම් වුණෙමු.

අප නිවසට පැමිණෙන ලෙස මම අනුදීට, නිෂිණිට සහ සචිනිට කතා කළෙමි.

ඔවුහු අපත් සමග පැමිණියහ.

ප්‍රවීන් සමඟ ප්‍රබෝධ, තීක්ෂණ, චමත් හා ක්‍රිශාන් අයියා ගියහ.

අප නිවසට යන විට රාත්‍රී 9.00 පමණ වුණෙමු.

ප්‍රවීන් සිහිනෙකින්වත් නොසිතූ පරිදි ඔහුගේ විසිවෙනි උපන්දිනය සැමරුවෝය.

"ඔයාලා තුන්දෙනත් මගේ කාමරේම ඉන්නවද නැත්නම් වෙන කාමරයක් රෙඩි කරලා දෙන්නද..?" මම නැගණියන්ගෙන් ඇසුවෙමි.

"අපිත් ඔයත් එක්කම ඉන්නම් අක්කී." සචිනි කීවාය.

පසුව ඔවුහු මාත් සමගම මාගේ ඇඳේම සිටියහ.
ඇඳ තරමක් විශාල වූ නිසා අපි අපහසුවකින් තොරව සිටියෙමු.

රාත්‍රියේ ප්‍රවීන් මට දුරකථන ඇමතුමක් ලබා ගත්තේය.

"ඔයා නම් මාරයි මැණික. කොහොමද මේ විදිහට බර්ත් ඩේ එක ඕගනයිස් කරේ"

"ඔයා වෙනුවෙන් ඕනම දෙයක් කරනව ප්‍රවීන්."

"හෙට අපේ ගෙදර එන්න ඔය තුන්දෙනාවත් එක්කගෙන."

මම ඊට පිළිතුරු දී ඔහු සමග ස්වල්ප වේලාවක් කතා කර දුරකථනයේ තබා නිදා ගත්තෙමි.
ඒ වනවිට නංගිලා නිදාගෙන සිටියහ.

***

පසුදින උදෑසන අම්මා හා තාත්තා වැඩට ගියහ.
අයියා නිවසේ සිටියේය.

අද ඔහුගේ යහළුවන් දෙදෙනෙක් පැමිණෙන බව කීවේය.
අපි මුහුණ සෝදාගෙන ඇඳුම් මාරු කරගෙන පහළට පැමිණියෙමු.

උදෑසන ආහාර ගෙන ප්‍රවීන්ලාගේ ගෙදරට යාමට සූදානම් වුණෙමු.

"අක්කි ඔයා ඉපදුනේ මොන අවුරුද්දෙද..?" අනුදී මාගෙන් ඇසුවාය.

"මම ඉපදුනේ 2004. සුනාමිය එන්න මාසෙකට කලින්." මම ඔවුන් සමඟ පාරට යමින් කීවෙමි.

"ආ එතකොට ඔයා අපේ අයියට වඩා අවුරුද්දයි නේද බාල, අපේ අයියා 2003 නේ." අනුදී කීවාය.

"ඔව්.ඔව්..ඔයාලා කොයි අවුරුද්දෙද…?"

"අපි තුන්දෙනාම 2009 දැන් 10 වසරේ." නිෂී කීවාය.

අපි බස් එකක් පැමිණෙන තෙක් පාරට වී බලා සිටියෙමු.

ඒත් සමගම මෝටර් බයිසිකලයකින් හිරාන් පැමිණ අප ඉදිරිපස එය නැවැත්තුවේය.

"ආ… මහ රැජිනිය සේවිකාවන් වට කොට මහරජ මුණගැසීමට යනවද..?"
බයිසිකලේ සිටි හිරාන් ඔච්චමට මෙන් ඇසුවේය.

"හිරාන් ඒ පාර මොකද මට තමුසේ එක්ක කතාවක් නෑ. වදයක් නොවී යනවද..?"

හිරාන් නංගිලාට සේවිකාවන් කියූ නිසා ඔවුහුද කෝප වුණෝය.

"මං යන්නම් ඊට කලින් කියපන් මගේ කෙල්ලට ඇයි උඹ සද්දේ දාන්නේ කියලා."

"මට ඔය එක එක නැට්ටිච්චියන්ට සද්ද දාන්න ඕනී නෑ." එරන්දි සමග තිබූ තරහ නිසා මම එසේ කීවෙමි.

"මොකක්ද උඹ කියන්නේ, උඹේ කට වැඩියි." එසේ කියමින් හිරාන් මාගේ කනට වැරෙන් පහරක් එල්ල කළේය.

මගේ අතේ තිබුණු ජංගම දුරකථනයද බිමට වැටුණි.
හිරාන් බයිසිකලයට නැග වේගයෙන් ගමන් කළේය.

දුරකථනය ඉදිරිපසට දමා තිබූ ප්‍රවීන් හා මා සිටින ඡායාරූපය මැදින් දුරකථනයේ වීදුරු කැඩී ගියේය.

මා හට ඉබේටම කඳුළු වැටුණි .

ඒත් සමගම පැමිණි බස් රථයෙන් අපි ප්‍රවීන්ලාගේ නිවසට ගියෙමු.

"ආ එන්න කට්ටියම අපි එනකම් බලන් හිටියේ." ක්‍රිශාන් අයියා කීවේය.

නිවසට ගොඩ වෙත්ම ප්‍රවීන් මා ඉදිරියට පැමිණියේය.

මාගේ මුහුණ රතු වී තිබුණි.
මම ප්‍රවීන් වැළඳගෙන ඇඬුවෙමි. සැබැවින්ම මට ඉබේම ඇඬුණි.

"ඇයි මොකද මැණික වුනේ, ඇයි අඬන්නේ..?" ප්‍රවීන් එසේ ඇසුවත් අපි හතර දෙනාම මේ ශබ්දව සිටියෙමු.

"ඇයි යකෝ මොකද වුණේ..?" ප්‍රවීන් වෙව්ලමින් යටගිරියෙන් කෑ ගැසුවේය.

බියට පත් වූ නිෂිණි නංගී සිදුවූ දේ ප්‍රවීන්ට කීවාය. දුරකථනයද පෙන්නුවාය.

"අඬන්න එපා බබා, මං ඌ ගැන බලා ගන්නම්. සොහාන් අයියා අද ගෙදරද…?"ප්‍රවීන් ඇසුවේය.

"ඔව් අද අයියගේ යාළුවෝ දෙන්නෙක් එන නිසා එයා ගෙදර." මම ඉකි බිඳුම් අතරින් කීවෙමි.

ක්‍රිශාන් අයියා ලෑස්ති වෙන්නකෝ. අද ඌ ගෙන් දෙකෙන් එකක් බෙර ගන්න ඕනේ." ප්‍රවීන් සොහාන් අයියාට දුරකථන ඇමතුමක් ගනිමින් කීවේය.

ඔහු අයියාට සිදුවූ දේ පැවසුවේය.

අප නිවසට පැමිණි දුලංජන අයියා සහ නිර්මාල් අයියා ද සමඟ ඔහු නගරයට එන බව පැවසුවේය.

ප්‍රවීන් ක්‍රිශාන් අයියා, ප්‍රබෝධ, චමත් සහ තීක්ෂණව රැගෙන නිවසින් පිටත් වීමට සූදානම් වුණි.

"අනේ ප්‍රවීන් යන්න එපා. හිරාන් ගැන දන්නවනේ." මම ප්‍රවීන්ට කීවෙමි.

"ස්නේහි, ඔයා තාම ප්‍රවීන් ගැන දන්නෙ නෑ. අනික ඔය හිරාන් කියන එකාට එච්චර උඩ පනින්න දෙන්න හොඳ නෑ." තීක්ෂණ කීවේය.

"හතර දෙනත් එක්ක ගෙට වෙලා ඉන්න. අම්මා පොළට ගියා. ආවම කියන්න අපි ටවුන් එකට ගියා කියලා." ප්‍රවීන් එසේ කියමින් පිටත් වුණේය.

කුමක් කරන්න දැයි මාහට සිතාගත නොහැකි වුණි.

පැයකට පමණ පසු තරංගි ඇන්ටි පැමිණියාය.

"දැන්ද දුවලා ආවේ..?" තරංගි ඇන්ටි ගෙට ගොඩ වෙමින් ඇසුවාය.

"පැයකට විතර කලින් ආවෙ පුංචි." අනුදි කීවාය.

"කෝ පුතාලා ඔයාලා එනකොටත් හිටියේ නැද්ද..?" තරංගි ඇන්ටී ඇසුවාය.

"අපි ආපු ගමන් වගේ එයාලා ටවුන් එකට ගියා ඇන්ටි." මම ඇයට පිළිතුරු දුන්නෙමි.

පසුව ඇය අපට ඔරෙන්ජ් ජූස් සකසා දුන්නාය. මම සිටියේ ප්‍රවීන්ගේ ලෝකයේය.
ඔවුන් මොනවා කරගෙන ඇත්දැයි බියෙනි.

පැය තුනක් ගත වුවද ඔවුන් නොපැමිණියේ ය.

මාගේ හිතේ වූ බිය තවත් වැඩි වුණි.

කරන්නට දෙයක් නොමැතිව මම ඇන්ටියට සිදුවූ දේ පැවසුවෙමි.

"දෙයියනේ මේ දරුවෝ මොනා කරගෙනද දන්නෑ." එය ඇසූ තරංගි ඇන්ටි කලබලයෙන් මෙන් කීවාය.

"අනේ මන්දා ඇන්ටී. මගේ හිතට බයක් දැනෙනවා."

"ඉන්න මම ඩිලාන්ට කතා කරලා කියන්නම්." ඇය එසේ කියමින් දුරකථනය අතට ගත්තාය.

"ඇන්ටි දැන් අංකල්ට කිව්වොත් අංකල් කලබල වෙයි. අපි තව ටිකක් බලමු." මම ඇයව වළක්වමින් කීවෙමි.

"ඔව් ඒකත් ඇත්ත. ඊට පස්සේ ඒ මනුස්සයාට එතන වැඩක් කරගන්න බැරිවෙයි." ඇන්ටි ඊට එකඟ වෙමින් කීවාය.

පැය භාගයකට පමණ පසු ඔවුහු නිවසට පැමිණියෝය.

අපි කලබලයෙන් මෙන් මිදුලට ගියෙමු.

ප්‍රවීන්ගේ අත තුවාල වී ලේ ගලමින් තිබුණේය. ක්‍රිශාන් අයියාගේ නළල සීරී ලේ මතුවී තිබුණේය. අනෙක් තිදෙනාට කිසිදු අනතුරක් සිදුවී තිබුණේ නැහැ.

" කොහෙද මෙච්චර වෙලා ගිහින් හිටියේ. මේ බලන්න අතත් තුවාල කරගෙන." තරංගී ඇන්ටි සැරෙන් කීවාය.

"අම්මගේ ලේලි කියන්න ඇතිනේ මොකද වුණේ කියලා." ප්‍රවීන් එසේ කියමින් නිවසට පැමිණියේය.

තරංගි ඇන්ටි තුවාල වලට බෙහෙත් රැගෙන ඒමට කාමරය වෙතට ගියාය.

"මොකක්ද වුණේ ප්‍රවීන්. අනේ කියන්නකෝ." මම ඔහුට ඇවටිලි කරත් ඔහු කිසිවක් කීවේ නැහැ.

"අනේ ඔයාවත් කියන්නකෝ මල්ලි මොකද වුණේ?" මම චමත් ගෙන් ඇසුවෙමි.

"අක්කි අපි යනකොට සොහාන් අයියත් ඇවිල්ලා හිටියා ටවුන් එකට එයාගේ යාළුවො දෙන්නත් එක්ක. ඊට පස්සේ අපි හිරාන්ගේ නම්බර් එක ට්‍රැක් කරලා එයා යන පාරෙම ගියා.. එයා එක්ක තවත් යාලුවෝ  දෙන්නෙකුත් හිටියා. අන්තිමට එයා  අතර වුණේ පාළු පාරක. අපි අටදෙනා එතනට ගිහින් උන්ට හොඳටම ගැහුවා. හිරාන් ළඟ තිබ්බ වීදුරු බෝතලයකින් අනූ අයියගේ අතට ගැහුවා. ඒකයි එයාගේ අත තුවාල වුණේ. ක්‍රිශාන් අයිය ලිස්සලා වැටුණු  වෙලවේ තමයි එයාගෙ නල්ල සීරුනේ." චමත් කීවේය.

"අනිවාර්යෙන්ම හිරානයාට සති ගානක් හොස්පිටල් එකේ ඉන්න වෙනවා. අපි ඌට ගහපු ගැහිල්ලට." තීක්ෂණ කීවේය.

" හැබැයි බං උන් තුන්දෙනාට ගහන්න අපි අට දෙනෙක් ඕනි නෑ. ප්‍රවීන් විතරක් හිටියත් ඇති" ප්‍රබෝධ සිනහසෙමින් කීවේය.

අනතුරුව තරංගි ඇන්ටී ප්‍රවීන්ගේ සහ ක්‍රිශාන්  අයියාගේ තුවාල උණු වතුරින් තවා බෙහෙත් දැමූවාය.

ප්‍රවීන්ට ඩිලාන් අංකල්ගෙන් හොඳටම බැනුම් ඇසීමට සිදුවුණි.

අම්මා පැවසූ පරිදි හිරාන්ව මහනුවර ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබුණි.

එදින රාත්‍රියේ ප්‍රවීන්, ප්‍රබෝධ හා තීක්‍ෂණ නැවතත් මොරටුව විශ්ව විද්‍යාලයේ බලා ගියහ.

චමත්, නිෂිණි හා සචිනිව රැගෙන යාමට ඔවුන්ගේ පියා වූ කපිල අංකල් පැමිණියේය.
අනුදී හා ක්‍රිශාන් අයියා ද ඔවුන්ගේ නිවසට ගියහ

***

පසුදින උදෑසන මා හට එරන්දිගෙන් දුරකථන ඇමතුමක් පැමිණියාය. කැම්පස් එකට යාමට පරක්කු වන නිසාත්, ඇය දුරකථන ඇමතුම ගන්නේ මට බනින්න බව දැන මා දුරකථන ඇමතුමට ප්‍රතිචාර දුන්නේ නැහැ.

බිනර මහේ හුළං රැල්ලත් සමඟ නිවසේ අමුතු කල එළියක් පැමිණියහ ….
නිවසේ සුදු තීන්ත ආලේප කර, ටයිල් පොලිෂ්කර, නිවසේ ලීබඩු අලුත් වැඩියා කර නිවසට අලුත් තිර රෙදි, ඇතිරිලි දමා නිවස අලුත් වී තිබුණි.

අයියාගේ විවාහ මංගල්‍යයට තව ඇත්තේ දින කීපයක් පමණි.

අම්මා කුසුමා නැන්දාත් සමග කැවිලි පෙවිලි සූදානම් කළහ.
අයියා අක්කී සමග ගොස් ඇඳුම් ආදී අවශ්‍ය දෑ සූදානම් කළහ.

මෙම විවාහය නිසා වඩාත් සතුටු වූයේ ක්‍රිශාන් අයියා සහ වරින්දි අක්කීය. ඒ ඔවුන් දෙදෙනා දෙවන මනමාලයා සහ දෙවැනි මනමාලිය ලෙස ගන්නා නිසා. දෙවන මනමාලයකු ලෙස ප්‍රවීන්ටද අයියා කතා කළද, මා වෙනුවට වෙනත් ගැහැණු ළමයෙකු සමග සිටීමට වන නිසා මම එයට අකමැති වුණෙමි.
දෙවැනි මනමාලියන් ගන්නේ ගැහැණු  ළමයාගේ පාර්ශවයෙන්  නිසා මා හට එයට යාමට නොහැකි වුණි.

"බබා අද මාත් එක්ක යමු. අපි තුන්දෙනාටම වෙඩින් එකට ඇඳුම් ගන්න." අම්මා උදෑසනම කීවාය.

"ෂා මරුනේ අම්මේ, යමු යමු…" මම එයට සතුටින් එකඟ වුණෙමි.

අනතුරුව උදෑසන 10.00ට  පමණ මහනුවර නගරයට ගොස් අම්මාත් මමත් ඇඳුම් ගත්තෙමු.

"පුතේ අපි තරංගි ඇන්ටිලාටයි, රූපිකා ඇන්ටිලාටයි invitation card  දීලා එමු. පවුලේ නෑදෑයින්ට කාඩ් දීලා ඉවරයි. ආයේ අපේ පැත්තෙන් දෙන්නේ ඒ දෙගොල්ලොන්ට විතරයි." අම්මා රෙදි මිලදී ගෙන අනතුරුව කීවාය.

අපි ප්‍රවීන්ලාගේ ගෙදරට යන විට තරංගී ඇන්ටී සහ ප්‍රසාදි අක්කී සිටියහ. වාසනාවකට අද සැප්තැම්බර් 3 වන සෙනසුරාදා වුණි.
සතියේ දිනයක් වුණි නම් ඔවුන් ගෙදර සිටින්නේ නැහැ.

ප්‍රසාදි අක්කීගේ උදරය තරමක් ඉදිරියට නෙරා තිබුණාය .ඇගේ කුසට දරුවකු පිළිසිඳ ගෙන මාස තුනහමාරක් පමණ වුණි. ප්‍රවීන්ලාට හා ප්‍රසාදි අක්කිලාට  ආරාධනා කර අනතුරුව එරන්දිලාගේ නිවසට ගියෙමු.

වාසනාවකට මෙන් එරන්දි ගෙදර සිටියේ නැහැ.

අම්මාත් මමත් අවශ්‍ය කරන අනෙකුත් දේවල්ද මිලදී ගත්තෙමු.

අයියාගේ විවාහ මංගල්‍යය උත්සවය බණ්ඩාරවෙල මලින්දි හෝටලයේ පැවැත්වීමට තීරණය කළ නිසා අවශ්‍ය දේවල් සූදානම් කරගෙන සැප්තැම්බර් 5 වනදා බණ්ඩාරවෙල හෝටලේක නතර වුණි.
අපත් සමඟ ක්‍රිශාන් අයියාද පැමිණියේය.
ප්‍රවීන්ද නිවාඩුවට ගෙදර ඇවිත් සිටියේය.

අයියාගේ යහළුවන් වන දූලංජන අයියා සහ නිර්මාල් අයියාද බණ්ඩාරවෙලට පැමිණියහ.
ඒ ඔවුන් දෙදෙනාද දෙවන මනමාලයන් ලෙස තෝරාගත් නිසා.

***

සීතල බණ්ඩාරවෙල නගරයේ සුන්දර දිනයක් උදාවිය.
අද සැප්තැම්බර් 6 වන අඟහරුවාදා.
අයියාගේ සහ අක්කීගේ පැතුම් මල් මෝදු වන දිනයකි.

අයියාව හා අනෙක් අයියලා තිදෙනාව සූදානම් කිරීමට මැදවියේ පිරිමි පුද්ගලයකු සහ තරුණ පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු පැමිණියහ.

පාන්දර ඔවුහු සූදානම් වී මෝටර් රථයෙන් බණ්ඩාරවල නිවාඩු නිකේතනයට ගොස් ඡායාරූප ගත්තේය. අපි සූදානම් වී චාරිත්‍රවලට අනුව හෝටලයට ඇතුල් වුණෙමු.

මම රෝස පැහැති මෙහෙන්ජා ඇඳුමක් ඇඳ කොණ්ඩේ කඩා ආභරණ හා මේකප් එකක් දමා සිටියෙමි.
අම්මා රෝස පැහැති සාරියක් ඇද සිටියාය. තාත්ති සුදු ෂර්ට් එකක් හා ලා නිල් පැහැති කලිසමක් ඇඳ, ලා නිල් පැහැති බ්ලේසර් එකක් දමා සිටියේය. හිරන්දි අක්කී වෙනදාටත් වඩා ලස්සනට සිටියාය .වරින්දි අක්කිලා ඇද සිටියේ කහ පැහැති ඔසරියකි. ඔවුහු ලස්සනට සැරසී සිටියහ.

ප්‍රවීන්ලාගේ ගෙදර අයත් පැමිණ සිටියාය.

ප්‍රවීන් ඇද සිටියේ කළු පැහැයට හුරු හින්දි ඇඳුමකි.

විවාහය චාරිත්‍රානුකූලව සිදුවුණි.

"අක්කේ හිතපු විදිහටම වැඩේ සිද්ධ වෙනව නේද..?" අනුරාධා ඇන්ටි අම්මාට කීවාය.

"ඔව් නංගි බලන්නකෝ හිරන්දි දුවගේ ලස්සන. මට නම් පුදුම සතුටක් දැනෙන්නේ." අම්මා කීවාය.

"බබා මං බය වුණා ඔයාට එන්න වෙන එකක් නෑ කියලා." මම ප්‍රවීන්ට කීවෙමි.

"මම කලින්ම ප්ලෑන් කළා වෙඩින් එකට නිවාඩු ගන්න." ප්‍රවීන් කීවේය.

අපි හැමෝම මේසේ වටා වාඩි වී කතාබස් කරමින් සිටියෙමු.

"දැන් ඔන්න චූටි අක්කිගේ ආසාව හරිනේ. ක්‍රිශාන් අයියා එක්ක එක ග්‍රෑප් එකේ ඉන්න හම්බුණානේ." හාතිය වරින්දි අක්කිට කීවේය.

"ක්‍රිශාන් අයියට නම් හොඳයි. අපේ අයියගේ වෙඩින් එකෙයි, සොහාන් අයියගේ වෙඩින් එකෙයි දෙකේම දෙවැනි මනමාලයාට ඉන්න හම්බවුණා" ප්‍රවීන් කීවේය.

අපි දිවා ආහාර ගත්තෙමු. අයියා සහ අක්කී ඇඳුම් මාරු කර ගත්තහ. ඔවුන් යුරෝපියන් ටයිප් ඇඳුම් ඇන්දෝය.

වරින්දි අක්කී සහ ක්‍රිශාන් අයියා නර්තනයක්ද ඉදිරිපත් කළහ.

අයියාගේ විවාහ මංගල්‍යයේ කටයුතු හොඳින් සිදුවුණි.

දින දෙකකට පමණ පසු අප නිවසේ විවාහ මංගල්‍යයේ දෙවැනි දින කටයුතු සිදු කෙරුණි.
සියලුම නෑදැයෝ අප නිවසට එකතු වුණෝය.

*****

පෙර පරිදිම විශ්ව විද්‍යාලයේ කටයුතු සිදුවුණි.
සති දෙකකට පමණ පසු නිවාඩු දිනයක එරන්දීගෙන් දුරකථන ඇමතුමක් පැමිණියාය.

"හලෝ ස්නේහි, ඔයා එක්ක කතා කරන්න පුළුවන්ද ..?" ඇය සන්සුන්ව ඇසුවාය.

"පුළුවන් එරන්දි කියන්න."

"මං මුලින්ම ඔයාගෙන් සමාව ඉල්ලනවා ඔයාව මහහැරපු එකටයි, බැන්න එකටයි. මට ආරංචි වුණා හිරාන් ඔයාගේ කනට ගැහුවා කියලා. ප්‍රවීන් හිරාන්ට ගැහුවා කියනකොට මට ඔයා ඒක කේන්ති ගියා, අනේ මට සමාවෙන්න ස්නේහී…" ඇය හැඬුම්බරව කීවාය.

"හරි එරන්දි සමාව ඉල්ලන්න ඕනෑ.මං දැන් ඒවා අමතක කරලා තියෙන්නේ. මට ඉස්සර වගේම තාමත් ඔයා හොඳම යාළුවා. ඔයා මොකක් හරි ප්‍රශ්නෙකද ඉන්නේ..?"

"ඔව් ස්නේහී. මං මේ ඔයාට කතා කළේ පොඩි දෙයක් කියන්න.
මම ප්‍රෙග්නන්ට් වෙලා. මගේ බඩේ හිරාන්ගේ දරුවෙක් ඉන්නවා. එයා දැන් තර්ජනය කරනවා කාට හරි කිව්වොත් මරනවා කියලා. මම දැන් මොකක්ද කරන්නේ ස්නේහි..?" ඇය අඬමින් කීවාය.

"මොනවා ඔය ඇත්තමද..? ඔයා හිරාන්ගේ හැටි දන්නෑ වගේ හැසිරුණේ ඇයි."

"නොදැන සිද්ධ වුණේ. මං හිතුවේ නෑ මෙහෙම වෙයි කියලා.
මට හිතාගන්න බෑ ඔයාට මොනාද කියන්නේ කියලා. මට හිතෙනවා ඔයා ඕක ප්‍රසාදි අක්කිට හරි රූපිකා ඇන්ටිට හරි කිව්වොත් හොඳයි කියලා."

"මට බයයි ස්නේහි, හිරාන් මොනවා හරි කළොත්." ඇය බියෙන් මෙන් කීවාය.

පසුව ඇය මා කියූ දෙයට එකඟ වී දුරකථනයේ තැබුවාය.

මා හට එරන්දී පිළිබඳ අනුකම්පාවකුත් හිරාන් පිළිබඳ දැඩි කෝපයකුත් හටගත්තෙමි.
මට එරන්දි කියූ දේ මම ප්‍රවීන්ට පැවසුවෙමි.

****

දින දෙකකට පමණ පසු අපට අසන්නට ලැබුණේ සිහිනකින්වත් නොසිතූ දෙයකි.

ඒ එරන්දි ඇයට පැමිණි ප්‍රශ්නය නිසා ගෙල වැල දමා සියදිවි නසාගත් බවයි.
අපි ඒ මොහොතේ සූදානම් වී ඇගේ නිවසට ගියෙමු.

"අනේ බලන්නකෝ නංගි, මට ඊයේ මේ කෙල්ල කිව්ව දරුවෙක් ලැබෙන්නේ ඉන්න බව. මං ආපු කේන්තියට හොඳටම ගැහුවා. නිහාල් කවදාවත් නැතුව  හොඳටම බැන්නා. ඒක දරාගන්න බැරුව ජීවිතේ නැති කරගෙන." රූපිකා ඇන්ටි වැලපින්නක් මෙන් අඬමින් කීවාය.

එදින සවස එරන්දිගේ මළ සිරුර නිවසට රැගෙන ආවෝය.

ඇගේ අප්‍රාණික සිරුර දෙක මාගේ හිත උණු වී ගියෙමි.

මම එරන්දිව බදාගෙන ඇඩුවෙමි.

පුංචි කාලයේ සිට එරන්දී මගේ හොඳම යෙහෙළිය.
නමුදු හිරාන් නමැති මාරයා නිසා අප දෙදෙනාගේ මිතුදම බිඳ වැටුණි.

අවසන් වතාවට එරන්දි මා සමග කළ කතාබහ විටින් විට මගේ හිතට ඇතුල් වුණි.

එරන්දිගේ අකල් මරණය සැමගේ සිතට දුකක් ගෙන දුන්නේය.

හිරාන් මරා දැමුවේ එරන්දි  පමණක් නොව ඇගේ කුස තුළ සිටි ඔහුගේද දරුවා ය.

දින දෙකකට පසු ඇගේ ආදාහන කටයුතු සිදු කෙරුණි.

ඇගේ දේහය අළු වී වාතලයට මුසු වී යන දුමාරය දෙස මම ඉකි බිඳමින් බලා සිටියෙමි.

ඇගේ එකම සහෝදරිය වූ ප්‍රසාදී අක්කිට මෙය වවා ගත නොහැකිව අසනීප වී රෝහල්ගත කළාය.

පසු ව දින කිහිපයකට පසු ඇයට සනීප වුණාය.

එරන්දිගේ හත් දවසේ දානමය පින්කම ද අපි සිදු කළෙමු.

රූපිකා ඇන්ටී සහ නිහාල් අංකල් ජීවත් වුවත් මළවුන් මෙන් සිටියහ.
ඔවුහු බෙහෙවින් පසුතැවිලි වුණහ.

එරන්දි නිමේෂිකා පෙරේරා අප අතරින් සදහටම සමු ගත්තාය.

…………………………………………******…………………………………………………………………………………

ජීවන පාද චාරිකාවෙ තවත් වසර 4ක් ගෙවී ගියහ. සයුරේ ගමන් කරන නෞකාවක් සේ විටින් විට සැඩ මාරුතය  සමග ගැටුණද ගමන එතරම් දුෂ්කර වූයේ නැහැ.

සමහර අවස්ථාවලදී සතුට හා ආදරය රළ පෙළක් මෙන් පැමිණ නෞකාව හා බැඳුනී.

වසර හතරක කාලයක තුළ අපි විශ්ව විද්‍යාල ගමනට සමු දුන්නෙමු.
මම දැන් වෘත්තියෙන් නීතිඥවරියකි.
ප්‍රවීන් සොෆ්ට්වෙයා ඉංජිනේරුවෙකි.

එරන්දිගේ සමු ගැනීමට පසු අප සිතට සතුටක් ගෙන දුන්නේ ඊට මාස පහකට පමණ පසු ප්‍රගීත් දිනුත්තරට සහ ප්‍රසාදි නිමේශිකාට දාව උපන් තුන් කුළුදුල් දරුවා නිසාය. ඔහු නමින් ප්‍රශින්ත නුරාන් සේනාධීර.

ප්‍රශීගේ සුරතල් සිනහවෙන් අපි සැමගේ සිත් ආදරයෙන් බැඳුණෙමු.

ඔහුට දැන් වයස අවුරුදු හතරකි. පෙර පාසල් යන ඔහු දැන් ගිරවෙකු මෙන් කටකාරය.
ඔහු සැම විටම පුංචි හා බාප්පා කියමින් ප්‍රවීන් සහ මා අසල රැඳේ.

ඔවුන් දෙදෙනාට දැන් තවත් දරුවෙකු සිටී. ඇයට වයස අවුරුදු දෙකකි. ඇය ප්‍රනීෂා නුවින්දි සේනාධීර.

එමෙන්ම අයියාට සහ හිරන්දි අක්කීටද වයස අවුරුදු දෙකක පුංචි කුමාරිකාවක් සිටි. ඇය නමින් සොනාශි අකීශා විජේනායක.
අක්කීට දරුවා ඉපදුණ දා බෙහෙවින්ම සතුටු වූයේ අම්මා සහ අනුරාධා ඇන්ටීය

නමුත් මුලදී විජේනායක පවුලේ නම ගෙනයාමට පළමුව මුණුපුරෙකු නොඉපදීම ගැන තාත්තිගේ හිතේ පොඩි කනස්සල්ලක් තිබුණි.

පසුව කාලයත් සමඟ එය පහව ගියේය.

ගෙවී ගිය කාලයත් සමඟ තවත් දෙයක් සිදුවුණි. ඒ බලාපොරොත්තු පොදු බැඳගෙන සිටි දෙපළක් වන වරින්දි අක්කිගේ සහ ක්‍රිශාන් අයියාගේ විවාහ මංගල්‍යයයි.

ඔවුහු එම විවාහ මංගල්‍යයේ දෙවැනි මනමාලයාට සහ මනමාලියට අපිව තෝරා ගත්තෝය.

භාතිය එස්.ටී.එෆ් එකට බැඳී එහි ඉහල තනතුරක් දරන්නේය.

අද ඉරිදා දිනයේ ප්‍රවීන් නිවාඩුවක් දමා අප නිවසට පැමිණෙන බව පැවසුවේය.

ස්වල්ප වේලාවකට පසු ප්‍රවීන් පෙර පාසලෙන් ප්‍රශීව රැගෙන පැමිණියේය.

"අනේ පුංචිගේ සුදු බෝලෙත් ආවද..?"මම ප්‍රශීව වඩා ගනිමින් ඇසුවෙමි.

"ඔව් පුංචි, මට බාප්පී මොකුත් අලන් දුන්නෑ." වචන ගොත ගසමින් හුරතල් ලෙස ඔහු කීවේය.

"නෝටි නේද පුතේ බාප්පි. ඉන්නකො මං ඔයාට පොඩි බඩුවක් දෙන්නම්."
එසේ කියා මම ඔහුව පුටුවක වාඩි කර කුස්සියට ගොස් චීස් පෙට්ටියක් සහ චොක්ලට් එකක් ඔහු අතට දුන්නෙමි.

"මේ පුංචි මට දුන්නේ බාප්පිට දෙන්න නෑ." එසේ කියමින් ප්‍රශී තනියම ඒවා කෑවේය.

"මේ ඒක නෙවෙයි බබා. අයියලා ජේන්නවත් නෑනේ..?"

"අයියයි, අක්කී, දුවයි බණ්ඩාරවෙල ගියා. මායි කුසුමා නැන්දා විතරයි අද ගෙදර ඉන්නේ."

" ආ එහෙමද…?මේ මං ඔයාට කියන්න හිටියේ අම්මයි අප්පච්චි කිව්වා ඊළඟ සතියේ සඳුදා ඔයාලගේ ගෙදරට නැකත් අරගෙන එනවා කියලා."

"අනේ කොච්චර හොඳද ඔයාලා එන්න. අද ප්‍රසාදි අක්කිලා ගෙදර නැද්ද..?"

"අක්කී අයියයි ගම්පොළ ගිහිල්ලා. අද රෑ වෙනකම් මෙයා මාත් එක්ක."

"ශෝක් නේ ඉතින්." මම ප්‍රවීන්ට හා ප්‍රශී බබාට ලෙමන් ජූස් දෙන අතරේ කීවෙමි.

"පුංචී ඔයාද ජූස් හැදුවෙ, ලසායී…" ප්‍රශින්ත කීවේය.

"නෑ පැටියෝ අපේ ගෙදර ඉන්නවා ආච්චි අම්මා කෙනෙක්. එයා තමයි හැදුවේ..?" මම ප්‍රශීගේ හිස සිඹ කීවෙමි.

"මැණික මේ මං හෙට අලුත් කාර් එකක් ගන්නවා."

"ඔය ඇත්තමද මරුනේ අනේ." මම සතුටින් කීවෙමි.

"ඔව් මැණික හෙට ගන්නවා.මං මුලින්ම ඔයාව දාගෙන වටයක් යන්න එන්නම්"

"මේ ඔයාට මොනවා හරි වැඩක් තියෙනවනම් කරගන්න. මං බබාව තියාගන්නම්."

"ඔයාට තියාගන්න පුළුවන්ද..? මට වැඩ වගයක් නම් තියනවා කමක් නැද්ද මැණික."

" මට තියාගන්න පුළුවන් අනේ. ඔයා ගිහින් එන්න."

අනතුරුව ප්‍රවීන් නිවසෙන් පිටව ගියේය.

මම ප්‍රශීව උණු වතුරෙන් නාවා ඇඳුමක් ඇන්දුවෙමි.

ඔහු කියූ නිසා මම ඔහුට කතන්දරයක් කියා දුන්නෙමි.

"පුංචී මට දොයි මතයි." ඔහු කෙඳිරිලි හඬින් කීවේය

මම ඔහුව මගේ කාමරයට එක්කගෙන ගොස් නිදි කෙරෙව්වෙමි.

පැය දෙකක් පමණ ඔහු හොඳින් නිදාගත්තේය.

සවස 4.00ට පමණ ප්‍රවීන් පැමිණ ඔහුව රැගෙන ගියේය.

"මාව දාලා යන්න බෑ කියා" ඔහු හොඳටම ඇඬුවේය.

රාත්‍රී 9.00ට පමණ  අම්මා හා තාත්ති පැමිණියහ.

"අම්මේ ඔයාලා ආවද..?"

"ඔව් පැටියෝ, හරි මහන්සියි."
 අම්මා පුටුවේ වාඩිවෙන අතරේ කීවාය.

කුසුම නැන්දා පැමිණ අම්මාට හා තාත්තාට තේ බන්දේසියක් දුන්නාය.

"අම්මේ, අද ප්‍රවීන් ආවා ප්‍රශී බබාවත් එක්කගෙන ආවේ."

"ආවද පුතේ..? පව් ඒ පොඩි කොල්ල නම් දුකේ බෑ අව්වා කියල මට කතා කරන්නේ."
අම්මා තේ බොන අතරේ කීවාය

"ප්‍රවීන්ලා සඳුදාට නැකත් අරගෙන අපේ ගෙදර එනවලු."

"ආ.. ඔව් නේද මට අද උදේ තරංගී කිව්වා."

"චූටි, මං ඔයාට හෙට සල්ලි දීලා යන්නම් ඕන දේවල් ගන්න." තාත්ති කීවේය.

අනතුරුව අපි රාත්‍රී ආහාර ගෙන නිදා ගත්තෙමු.

උදෑසන මා අවදි වන විට ප්‍රවීන් අප නිවසට පැමිණි සිටියේය.
මම දත් මැද මුහුණ සෝදා රාත්‍රී ඇඳුම ගලවා ගවුමක් ඇඳ පහළට ගියෙමි.

"ගුඩ් මෝර්නින් සනූ." ඔහු තේ බොන අතරේ මා හට කීවේය.

"ගුඩ් මෝර්නින් ප්‍රවීන්. මං හිතුවේ නෑ ඔයා මෙච්චර කලින් එයි කියල."

"චූටි, ප්‍රවීන් පුතා කාර් එක ගන්න දැන් යනවාලු. ඔයාව එක්කගෙන යන්න ඇවිත් තියෙන්නේ.
 ඉක්මනට ලෑස්ති වෙන්න." අම්මා කීවාය.

මම කාමරයට ගොස් ඔහු සමග යාමට කළු පැහැති ඩෙනීමක් ඇඳ රෝස පාට බ්ල්වුස් එකක් ඇන්දෙමි.

අප අම්මා හා තාත්තා වැඩට යන විට ඔවුන් සමගම මෝටර් රථයේ නගරයට ගියෙමු .
අනතුරුව ප්‍රවීන් තාත්තාගේ මෝටර් රථ ව්‍යාපාරයෙන් මෝටර් රථයක් මිලදී ගත්තේය.

ප්‍රවීන් අළු පැහැති මදක් දිලිසෙන නවීන පන්නයේ මෝටර් රථයක් මිලදී ගත්තේය.

අපිට දෙදෙනා මුලින්ම පේරාදෙණියේ  ගැටඹේ  පන්සලට ගොස් පසුව කෝවිලකට ගියෙමු.

" අනේ කාර් එක නම් මරු ප්‍රවීන්."

"හොඳයි නේද මටත් දැක්ක ගමන් ආස හිතුණා." ඔහු රිය පදවමින් කීවේය.

"බබා මාව ටවුන් එකෙන් දාගෙන යන්න මට බඩු වගයක් ගන්න තියෙනවා."

"හරි ඉතින් අපි දෙන්නම යමු. එසේ කියමින් ඔහු නගරයට පැමිණ මෝටර් රථයේ නැවැත්තුවේය.

අපි දෙදෙනාම ගොස් බඩු මිලදී ගත්තෙමු.

පසුව සඳුදාට ඇඳීමට මම කහ පාට සහ කළුපාට මිශ්‍ර බතික් සාරියක් මිලදී ගත්තෙමි.
ප්‍රවීන්ට කහ පැහැති අත් දිග ෂර්ට් එකක් මිලදී ගත්තෙමි.

අද නිවාඩු දිනයක් නිසා මම නිවසට යන විට අම්මා නිවසේ සිටියාය.
මා නිවසට ගොස් මිලදීගත් දෑ අම්මාට දුන්නාය. සාරිය දැක ඇය සතුටු වුණාය.

මම අම්මා සමග කතාබස් කරමින් ඔවුන්ට කෑවිලි සෑදීමට උදව් කළෙමි.

***

මාර්තු 20 වනදා උදෑසන මා අවදි වුණි.
මා අවදි වන විට අම්මාද අවදි වී සිටියාය.

අම්මාට වැඩ කටයුතු වලට උදව් කර මම සාරිය ඇඳ සූදානම් වුණෙමි.

උදෑසන 9.15ට පමණ ප්‍රවීන්ලා අප නිවසට පැමිණියහ.

ඔවුන් තෑගි භෝග බොහොමයක් ගෙනවිත් තිබුණි.

"එන්න තරංගී ඇතුළට." අම්මා කීවාය.

"කොහොමද තාරුකා හොඳින් ඉන්නවද…?" තරංගී ඇන්ටි ඇසුවාය.

"ඔව් තරංගී, හුඟ දවසකින් නේද දැක්කේ..?"

"කෝ සොහාන් පුතාලා නැද්ද..?" ඩිලාන් අංකල් අසුනක වාඩි වෙමින් ඇසුවේය.

"නෑ ඩිලාන්, බණ්ඩාරවෙල ගියා හිරන්දි දුවලාගේ ගෙදර. දැන් ගිහින් දවස් තුන හතරක් වෙනවා. තාම ආවේ නෑ." අම්මා කීවාය

"තාරු දුවව එක්කන් එන්න." තාත්ති කීවේය.

මම කහ පාට සහ කළුපාට මිශ්‍ර බතික්සාරිය ඇඳ කළු පාට ගල් ඇල්ලූ මාලය බෙල්ල මුලට දමා, කොණ්ඩේ උඩ ඉඳන් ගොතා, සුදු රෙදි කැබැල්ලකින් වැසූ බුලත් හෙප්පුව ප්‍රවීන්ට දී වැන්දෙමි.

"දැන් ඉස්සර හිටියටත් වඩා ලස්සන වෙලා දුව" තරංගී ඇන්ටි කීවාය.

මම අසල පුටුවක වාඩි වුණෙමි.

"තාරු අප්‍රේල් 3 වෙනිදාට හොඳ නැකතක් තියෙනවා. අපි එදාට එන්ගේජ්මන්ට් එක කරමුද ..?"
තරංගී ඇන්ටි ඇසුවාය.

"ඔව් එහෙම හොඳයි අපිට ප්‍රශ්නයක් නෑ." අම්මා කීවාය.

"වෙඩින් එකයි එන්ගේජ්මන්ට් එකයි දෙකම එක දවසේ ගන්න බැරිද..?" තාත්ති ඇසුවේය.

"අපේ පුතාට මාස තුනක ට්‍රේනින් එකක් තියෙනවා මඩකලපුවේ. ඒක පටන් ගන්නේ අප්‍රේල් 12 වෙනිදා. ඉවර වෙන්නේ ජූලි 12 වෙනිදා. අපි බැලුවේ ජූලි 20 වැනිදාට තියෙන නැකතට වෙඩින් එක ගමුද කියලා." ඇන්ටි කීවාය.

"ආ එහෙමද..? එහෙනම් අපිට ප්‍රශ්නයක් නෑ. තාත්ති කීවේය.

"පුතා මඩකලපුවේ හිටියට අපිට පුළුවන්නේ වෙඩින් එකේ කටයුතු ලෑස්ති කරන්න." ඇන්ටි කීවාය.

"එන්න තරංගී අපි තේ ටිකක් බීලා ඉමු." අම්මා එසේ කියමින් ඔවුන්ව කෑම කාමරේට එක්කගෙන ගියාය.

විවාහය සිදු කරන අන්දම වැඩිහිටියෝ කතාබහ කළහ.

පසුව දවල් 2.00ට පමණ දිවා ආහාර ගත්තෝය.

මම ප්‍රවීන් සමඟ මිදුලේ සිමෙන්ති බංකුවට පැමිණ වාඩිවී සිටියෙමි..

"මැණික මං හිතාගෙන ඉන්නේ අපි දෙන්නගෙ ප්‍රී ශූට් එක කරනකොට මං ලියපු අලුත් සින්දුව දාලා වීඩියෝ එකක් කරන්න."

"ෂා..මරු අදහස. මට නම් ඉවසිල්ලක් නෑ අපේ වෙඩින් එක දවස එනකම්. තව හරියටම මාස හතරයි තියෙන්නේ. අවුරුදු ගානක්ම අපි දෙන්න බලාගෙන හිටපු දිනේ ඉක්මනින්ම ඒයි."

සවස 4.00ට පමණ ඔවුහු නිවසට ගියහ.

*****

ප්‍රවීන් අප නිවසට පැමිණි දා සිට මා දින ගනිමින් බලා සිටියේ අද දිනය එනතුරුය.

අද අප්‍රේල් 3 වනදාය.

මාගේ ජීවිතයට හමුවූ ප්‍රේමණීය හිරු කුමරු සමඟින් විවාහ ගිවිස ගැනීම අදයි.
අපි උදෑසන 8.30ට තිබූ නැකතින් නිවසින් පිට වුණෙමි.

අපි අවශ්‍ය කරන ඇඳුම් රැගෙන මහනුවර 'විව් මවුන්ට්' නම් හෝටලේට ගියෙමු.

එහිදී මම සුදු පැහැති දිළිසෙන පාටි ගවුම ඇඳ ලෑස්ති වුණෙමි.
නිරූපණ ශිල්පිනියක් පැමිණ මාහට මේකප් කර කොන්ඩ මෝස්තරයක්ද දැමුවාය.

දෙපාර්ශ්වයමය නෑදෑයෝ සූදානම් වී හෝටලයට පැමිණියෝය.

ප්‍රවීන්ලා උදෑසන 9.00 වන විට හෝටලයට පැමිණියහ.

9.45ට තිබූ සුභ නැකතින් විවාහය රෙජිස්ටර් කළේය.
ප්‍රවීන් සුදු ශර්ට් එකක් ඇඳ කළු බ්ලේසර් එකක් දමා, කළු කලිසමක් ඇඳ සිටියේය.

අපි නෑදෑයින්ට හා යහළුවන්ට සංග්‍රහ කළෙමු.

ඡායාරූප ගැනීමට දිනුත්තර අයියාගේ යාළුවා වූ කසුන් අයියාද පැමිණියේය.

මුදු මාරු කර ගැනීමේදී ඔහු මාගේ නළල සිප ගත්තේය.

මම ඔහුව වැළඳ ගත්තෙමි.

"මැණික දැන් ඔයාවයි මාවයි වෙන් කරන්න කාටවත් බෑ." ඔහු කැම කන අතරේ ආදරයෙන් කීවේය.

"මට නම් මේක තාමත් හීනයක් වගේ."

විවාහ ගිවිස ගැනීමේ උත්සවයට ගම්පොළ සුදු පුංචිලාද, හිරන්දි අක්කිලාගේ පවුලේ අයද, මිහින්දිද පැමිණියහ.

ප්‍රවීන් අනුත්තර සේනාධීරගේ සහ ස්නේහී උත්තරා විජේනායකගේ විවාහ ගිවිස ගැනීම හිතුවාටත් වඩා හොඳින් සිදුවුණි.

****

අප්‍රේල් 10 වන දා සවස 7.00ට පමණ ප්‍රවීන් අප නිවසට පැමිණියේය.
ඒ පසුදින පාන්දර 4.00ට ඔහු පියා සමඟ මඩකලපුවේ පුහුණුවීමට යන බව පැවසීමටයි.
ඒ වන විට අම්මා හා තාත්තා නිවසේ සිටියේ නැහැ.
අයියා සහ අක්කීත් දුවට අසනීප වී බෙහෙත් ගැනීමට ගොස් සිටියහ.

"මැණික මං පාන්දර යනවා.ඔයාලගේ අම්මා නැද්ද..?" ඔහු ගෙට ගොඩ වෙත්ම ඇසුවේය.

"නෑ ප්‍රවීන්, අම්මලා තාම වැඩ ඇරලා ආවේ නෑ."

"මං හෙට ගියහම ආයේ එන්නේ ජූලි 12 වැනිදා"

"අනේ මට එච්චර කාලයක් ඔයා නැතුව ඉන්න බැහැ. ඔයා දන්නවනේ ඒක.
මට ඔයාව ඕනි ප්‍රවීන් අපි දෙන්නගෙ රෙජිස්ට්‍රේෂන් එක තිබ්බෙත් මේ ළඟදි, මං කොහොමද ඉවසගෙන ඉන්නේ ..?"

"මොනවා කරන්නද පණ..? මට යන්න වෙනවනේ. අනික මං ආයෙ එනකොට අපේ වෙඩින් එකත් ගන්නවනේ."

මම ඔහුව වැළඳගෙන ටික වෙලාවක් ඇඬුවෙමි.
අවසානයේ ඔහු මාගේ නළල සිප ගත්තේය.

"මං ඔයාට හැමදාම හවස කෝල් කරන්නම්. පරිස්සමෙන් ඉන්න මැණික. බුදු සරණයි."

"අනේ ඔයා යනවද හරි එහෙනම්. බුදු සරණයි පරිස්සමෙන් යන්න. මං ඔයාට ගොඩක් ආදරේ ප්‍රවීන්. මං කඳුළු අතරින් කීවෙමි.

ඔහු මෝටර් රථයට නැග නොපෙනී යනතුරු මම එළියට වී බලා සිටියෙමි.

"චූටි බබා… චූටි බබා… අම්මාගේ කටහඬ ඇසී මම නින්දෙන් අවදි වුණෙමි.

ප්‍රවීන් ගිය මොහොතේ සිට කාමරයට පැමිණ අඩමින් සිටියදී මා හට නින්ද ගොස් තිබිණි.

"බබා අසනීපයක් නැහැ නේද? ඇස් දෙකත් එක්ක ඉදිමිලා." අම්මා ඇඳ උඩ වාඩි වෙමින් බියෙන් මෙන් ඇසුවාය.

"නෑ අම්මේ, අසනීපයක් නෑ. හවස ප්‍රවීන් ආවා.
හෙට පාන්දර මඩකලපුවේ යනවලු. මට දුක හිතිලා ඇඬුවා.
ඒක නිසා වෙන්නැති ඇස් ඉදිමිලා ඇත්තේ." මම ඇඳේ වාඩි වෙමින් කීවෙමි.

"වැඩි කාලයකට නෙවෙයිනේ පුතේ. මාස තුනකට නේ."

"ඒ වුණාට මට දුකයි අම්මේ. කවදාවත් නැති විදිහට දුකක් දැනෙනවා."

"දැන් ඕක අමතක කරන්න. එන්න අපි කෑම කන්න යමු."

"මට බෑ අම්මේ, මම මෙහෙම්මම නිදාගන්නවා.
මට හෙට උදේට කතා කරන්න." මං එසේ කියද්දී අම්මා මට පොරවනය පොරවා කාමරේ විදුලි බල්බය විසන්ධි කර පිටව ගියාය.

මම දුරකථනය ගෙන ප්‍රවීන්ට දුරකථන ඇමතුමක් ගත්තෙමි.
ඔහු සමග පැය භාගයක් පමණ කතා කළෙමි.
ඔහු ගමනට අවශ්‍ය රෙදි සූදානම් කරමින් සිටින බව පැවසුවේය.

හිත අස්සේ අමුතුම දුකක් කැකෑරෙමින් තිබුණි.
අනතුරුව මම නින්දට ගියෙමි.

"ස්නේහී…ස්නේහී.. ප්‍රවීන්ව පරිස්සම් කරගන්න. හිරාන්…හිරාන් එයාට මොනවා කරයිද දන්නෑ…?"
සුදු අත් දිග ගවුමක් ඇඳ ගිනිදැල් අතරින් එරන්දි අඬමින් කීවාය.

එකවරම මා ගැස්සී ඇහැරුණෙමි.
ඒ බියකරු සිහිනයෙකි. මම දුරකථනයේ තිරය ඔන් කර වෙලා බැලුවෙමි.
වෙලාව පාන්දර 12.10යි.
මම එරන්දිව මතක් වී ඇඬුණි.

දුක බෙදා ගැනීමට සිටි ප්‍රවීන්ද අද සිට මාගෙන් දුරස් වෙයි.
මා හට සිතට බියක් දැනුණි.

උදෑසන මා හට දුරකථන ඇමතුමක් පැමිණියේය.
මා අවදි වූයේද ඒ දුරකථන ඇමතුමටයි.
වෙලාව උදෑසන 6.30යි.

"හලෝ ගුඩ් මෝර්නින් කෙල්ලේ, අඳුර ගන්න පුළුවන්ද ..?" ගැහැණු ළමයකුගේ කටහඬක් දුරකථනයේ අනිත් පසින් ඇසුණි.

මා හට රාත්‍රිය දුටු හීනයත්, දුරකථනයේ අනිත් පසින් කතා කළ ආකාරයත් නිසා එරන්දීව සිහි වුණි.

"අනේ සොරි මට අඳුරගන්න බැහැ.කවුද කියන්න පුළුවන්ද..?
මම කාරුණිකව ඇසුවෙමි.

"මම මිහින්දි ආකර්ෂා කියල කෙනෙක්. දන්නවද දන්නෑ."
ඇය විහිළුවට මෙන් කීවාය.

"අනේ සොරි මිහී. නම්බර් එක සේව් කරල නෑ ඒකයි."

"ආ අවුලක් නෑ ස්නේහී. මං කතා කළේ අපේ කැම්පස් එකේ යාළුවො ගෙට් ටු ගෙදර් එකක් තියෙනවලු.
ඔයා ඒකට එනවද අහන්න."
"කවදද මිහී තියෙන්නේ..?"

"මැයි 5නිදා ඔයා එනවද..?මහනුවර කැන්ඩි සයිඩ් හොටෙල් එකේ තියෙන්නේ."

"හා මං එන්නම් මිහී." මම එසේ කියමින් ඇයගෙන් අනෙකුත් විස්තර අසා දුරකථනය තැබුවෙමි.

***

අද මැයි 4 වනදා, දින ගණනක් යනතුරු ප්‍රවීන්ගෙන් දුරකථන ඇමතුමක් පැමිණියේ නැහැ.

අවසන් වරට මම යන ගමන් ඉන්නේ මැණික. කියා එවූ පණිවිඩය පමණයි.
මා හට වචා ගත නොහැකි දුකක් දැනුණි.
තරංගි ඇන්ටිට දුරකථන ඇමතුමක් ගෙන ඇසීමට මට සිතුණද, අද බ්‍රහස්පතින්දා දිනයක් නිසා මම ඇයට දුරකථන ඇමතුමක් ගත්තේ නැහැ.

මම වෙනදා මෙන් උසාවියට ගියෙමි.

"මොකද මිස් අවුලෙන් වගේ. මාගේ කාර්යාලයේ සහායට සිටි නදීරා අක්කා ඇසුවාය.

ඇය ප්‍රවීන් ගැන තොරතුරු දන්න නිසා මම ඇයට විස්තරේ කීවෙමි.

සමහර විට සර්ගේ ෆෝන් එක කැඩිලා ඇති. එහෙම නැත්නම් මොකක් හරි සිග්නල් අවුලක් ඇති, මඩකලපුවේනේ." නදීරා අක්කා කීවාය.

ඇය කියූ දේ ඇත්තක් කියා මට සිතුණි.
"ප්‍රවීන් කවදාවත් මාව හිතල මග හරින කෙනෙක් නෙවෙයි."
එරන්දි සිහිනෙන් ඇවිත් කියූ දෙයද මාගේ හිත තුළ සැරිසැරුවේය.

සුපුරුදු පරිදි උසාවියේ කටයුතු සිදුවුණි.
මම වැඩ කටයුතු අවසන් කර මහනුවර නගරයට ගොස් හෙට දින කැම්පස් එකේ පාටියට අවශ්‍ය කරන දෙය සූදානම් කර ගත්තෙමි.

මම කළු පැහැති බටර් සිල්ක් සාරියක් හා එයට ගැලපෙන කරාබු ද පාවහන්ද මිලදී ගත්තෙමි.
මා හට තරංගී ඇන්ටී නගරයට පැමිණ ලෙස දුරකථන ඇමතුවක් ගෙන කීවාය.
පසුව ඇය සමඟ ගොස් විවාහයට අවශ්‍ය දේ ද සූදානම් කර ගත්තෙමි.

*****

පසුදා උදෑසන 7.30ට පමණ මට ප්‍රවීන්ගෙන් දුරකථන ඇමතුමක් පැමිණියේය.

"හලෝ මැණික කොහොමද ඔයා හොඳින් ඉන්නවද…?"

"අනේ බබා ඔයා එක්ක මං තරහයි. දැන් ගිහින් කොච්චර දවස්ද ? ඇයි කතාවත් කලේ නැත්තේ?"

"මට සමාවෙන්න මැණික,මඩකලපුවේ අපි නැවතිලා ඉන්න තැනට පොඩ්ඩක්වත් සිග්නල් නෑ. මේ ටිකේ අම්මටවත් කතා කළේ නෑ.
අද ටවුන් එකට ආවා. ඒකයි ගන්න පුළුවන් වුණේ."

"එහෙමද මට හිතුණා. ඔයා හොඳින් ඉන්නවද ..?"

"ඔව් මැණික. ඔයාව ගොඩක් මතක් වෙනවා. ඔයා අද වැඩද..?"

"නෑ අද අපේ කැම්පස් එකේ යාළුවන්ගෙ ගෙට් ටු ගෙදර් එකක් තියෙනවා.
10.30ට පටන් ගන්නේ. මං අද නිවාඩු."

"ආ.. හොඳයි එහෙනම්. මේ මාසේ මට ආයේ කතා කරන්න වෙන්නේ නැහැ.
ඊළඟ මාසෙ 5 වෙනිදා තමයි කතා කරන්න වෙන්නේ. මං එදාට හවස් වෙලා ගන්නම්.

ආය ටවුන් එකට එන්නේ ඊළඟ මාසේ."

"ඔයාගේ ට්‍රේනින් එක හොඳයි ද..? කෑම එහෙම හොඳට හම්බවෙනවද..?"

"ඔව් මැණික. හැමදේම හොඳයි. සිග්නල් ප්‍රශ්නේ තමයි."
මම ප්‍රවීන් සමග බොහෝ වෙලාවක් කතා කළෙමි.

පසුව මම ගෙට් එකට යාම සඳහා සූදානම් වුණි.

කළු පැහැති සාරිය ඇඳ කර මුලට අළු පැහැති මාලේ දමා, ගල් ඇල්ලූ කරාබු දෙකක් හා මුද්දක් දමා කොන්ඩේ ක්‍රේල් කර මේකප් එකක් දැමූවෙමි.

10.30 වන විට මම තාත්තිත් සමග කැන්ඩි සයිඩ් හෝටලේට පැමිණියෙමි.
හෝටලයට පැමිණි විගසම ප්‍රවීන් සමඟ සිදුකළ ඔහුගේ මියුසික් වීඩියෝ එක මතකයට පැමිණියෙමි.

මා යන විට අඳුරන යහළුවන්ගෙන් හෝටලේ පිරී තිබුණි.

"හායි මිහී… කොහොමද..?" එකවරම මම මිහින්දීව දැක ඇයට අත වනමින් කීවෙමි.

"මම හොඳින් ඉන්නවා ස්නේහි, හිටියටත් වඩා ලස්සන වෙලා." මිහින්දි කීවාය.

අපි කැම්පස් එකේ සිටි යාළුවන් සමග අත්දැකීම් බෙදා ගත්තෙමු.
දිවා ආහාරය ගැනීමෙන් පසු අපි නටමින් ගයමින් විනෝද වුණෙමු.
ඡායාරූප ශිල්පියෙකු පැමිණ අපගේ ඡායාරූප ගත්තේය.

මා නිවසට යන විට සවස් වී තිබුණි.
මිහින්දි ඇගේ ස්කූටරයෙන් මාව නිවසටම ගෙනැවිත් බැස්සුවාය.

"තැන්ක් යූ මිහී. මං ඔයාට කෝල් මැසේජ් කරන්නම්. බායි බුදු සරණයි. පරිස්සමෙන් යන්න."

"ඔයත් පරිස්සමෙන් ස්නෙහි…"ඇය මට අත වනමින් ගියාය.

මා නිවසට යන විට හිරන්දි අක්කී සොනාශි දුව සමඟින් සිටියාය. මම පිරිසුදු වී රෑ වෙන තුරුම දුවව බලා ගත්තෙමි.
*****
සාමාන්‍ය පරිදි මාසයක් ගත වුණි. උසාවියට ගොස් කලින්ම නිවසට පැමිණියෙමි.

අද ජූනි 5 වනදා. උසාවිය තුළ සිට ගතම වෙහෙසකාරී වී තිබුණි.
මම නාන කාමරේට ගොස් හොඳින් දිය නා ගත්තෙමි.
අද නිවසේ සිටියේ කුසුමා නැන්දා පමණි.

මා ආහාර ගනිමින් සිටියදී මෝටර් බයිසිකලයක් පැමිණ අප නිවස ඉදිරිපිට නතර කළේය.

"පුතේ මේ රුවන්ත සර්ට ලියුමක් ඇවිල්ලා." ලියුම් බෙදන සමන් මාමා කීවේය.

"ආ දෙන්න මාමේ, මං දෙන්නම්." මම එසේ කියමින් ලියුම ගෙන ගෙට පැමිණියෙමි.

මම ආහාර ගෙන අනතුරුව තාත්තිලාගේ කාමරයට ගොස් තාත්තා ලියුම් තබන පොත් රැක් එක උඩ එය තැබුවෙමි.
මා කාමරේ ජනේලය විවර කිරීමට යාමේදී මේසේ මත තිබූ තාත්තිගේ පොත් මිටියක් බිමට ඇද වැටුණි.

මම පොත් ටික ඇසිරීමට යාමේදී තාත්තිගේ පැරණි දිනපොතක් හා ලිපි කිහිපයක් හමුවුණි. මා හට ඒවා කියවා බැලීමට ආශාවක් ඇතිවුණි.

මම අනෙක් පොත් අසුරා දිනපොත හා ලියුම් කිහිපය ගෙන කාමරයට ගියෙමි.

දිනපොතේ පිටු කීපයක් කියවාගෙන යාමේදී මා විමතියට පත්වන දෙයක් එහි සටහන් වී තිබුණි.

*2004 මැයි 10 වන සඳුදා.*
*අද උදෑසන වෙනදා මෙන් මා වැඩට ගියා, නමුත් සිදු වූයේ බලාපොරොත්තු නොවූ දෙයකි. ඒ අප ආයතනයේ අයිතිකරු වූ වරුණ ප්‍රනාන්දු සර්ට හදිසියේම හෘදයාබාධයක් ඇති වී රෝහල් ගත කිරීමයි. ඔහු අප මොටර් රථ ව්‍යාපාරයේ අයිතිකරු වුවද මා හට සැලකුවේ තමාගේම සහෝදරයෙකුට මෙන්ය. වරුණ ප්‍රනාන්දු සර්ගේ බිරිඳ තෙවන වරට මවක් වීමට බලාපොරොත්තුවෙන් සිටින්නේ මීට මාස 3කට පෙර සිටය. මාගේ බිරිඳ වන තාරිකා ද දෙවන වරට මව් පදවිය අපේක්ෂාවෙන් සිටී. සායන වලට රෝහලට යාමේදී රශිකා ප්‍රනාන්දු මැඩම් සහ තාරිකා එකටම යයි. එමෙන්ම ඔවුන්ගේ දරුවන් වූ රමේෂ් ඉසුරංග පුතුද, මිනේහී සෙනාරා දියණියද නිතරම අප කාර්යාලයට පැමිණ අපත් සමග කතා බස් කරයි.*

*2004 මැයි 12 වන බදාදා.*
*අද දින වරුණ සර්ගේ තත්ත්වය බරපතල විය. මා උදෑසනම ඔහු බැලීමට රෝහලට ගියා. ඔහු මට පැවසුවේම මෙපමණයි."රුවන්ත උබ මගේ සහෝදරයෙක් වගේ ළඟින් හිටියේ. මගේ දරුවෝ තුන්දෙනාව බලා ගන්න. විශේෂයේම රශිකාගේ බඩේ ඉන්න දරුවව, ලොකු දෙන්නා මගේ නංගි ගාව තියාගනියි. එයාට මං අද කිව්වා. මගේ පොඩි දරුවාට ස්නේහී උත්තරා කියන නම තියන්න." එසේ කියා අවසානාවට මෙන් වරුණ සර් හෘදයාබාධයකින් මියගියාය. මෙය මට සිතාගත නොහැකිය.*

*2004 මැයි 15 සෙනසුරාදා*

*වරුණ සර්ගේ අවමංගල්‍ය කටයුතු සියල්ල කඳුළු අතරින් සිදුකෙරිණි. එය වාවා ගත නොහැකිව රශිකා මැඩම්ට මානසික ආතතිය වැඩිවී විශාදයේ සැඳුණි. ඒ වන විට තාරිකා සේවය කළේ බදුල්ල මහා රෝහලේ. රශිකා මැඩම්ගේ තත්ත්වය අසාධ්‍ය වුණි. ඇයට තමා කවුරුන්දැයි යන්න පවා අමතක වුණි. ඇය සිටින්නේ මානසික රෝගීන්ගේ වාට්ටුවේය.*

*2004 නොවැම්බර් 2 වැනි ඉරිදා.*
*අද දින තාරිකාට අමාරුවී රෝහල්ගත කෙරුණි. රශිකා මැඩම්ගේ ද දරුවා බිහි කිරීමට කාලය එළැඹී තිබුණි. අවාසනාවකට මෙන් බදුල්ල රෝහලේ දී මාගේ හා තාරිකාගේ දෙවන දරුවා ඉපදීමේදීම මියගොස් සිටියා. ඒ බවක් තාරිකා දන්නේ නැහැ. එකම දිනයේදී (නොවැම්බර් 2 දින) රශිකා මැඩම්ට දියණියක් ඉපදුණා. ඇය සිටි රෝගී තත්ත්වය මත දරුවෙකු බලා ගත නොහැකි නිසා වෛද්‍යවරු කතාවී අපේ මියගිය දරුවා හා රශිකා ප්‍රනාන්දු මැඩම්ගේ පුළුන් බෝලයක් මෙන් ලස්සන ගැහැණු දරුවාම මාරු කර තාරිකා අසලින් තැබුවා. වරුණ ප්‍රනාන්දු සර්ටත් අවැසි වූයේ එයයි. තාරිකා කිරි පොවා ආදරයෙන් රැක ගත්තේ සඳ දෙව්දුවක් වන් පුංචි ස්නේහිවයි.*

මා හට මේ විශ්වාස කළ නොහැකි වුණි. මාගේ ඇස් දෙකෙන් කඳුළු රුටා වැටුණි. මීට වසර 4කට කලින් මා ගොස් ඇත්තේ මාගේ මවගේ මළ ගෙදරයි.
එතකොට ඒ ඇවිල්ලා හිටියේ මගේ අක්කයි, අයියයි. මම වරුණ සර්ගේ දුවද…?" මම එසේ සිතමින් දුක තුනී වන තෙක්ම ඇඬුවෙමි.

එවිට මා හට ප්‍රවීන්ගෙන් දුරකථන ඇමතුමක් පැමිණියේය.

"හෙලෝ මැණික ඔයා හොඳින් ඉන්නවද..?"

"අනේ නෑ ප්‍රවීන්, මං හොඳින් නෙවෙයි ඉන්නේ. මට මේ දුක දරාගන්න බෑ." මම අඬමින් කීවෙමි.

"ඇයි මොකක්ද ප්‍රශ්නේ කියන්න..?" ප්‍රවීන් කලබලයෙන් මෙන් ඇසුවේය.

"අනේ ප්‍රවීන්…" මම ඔහුට තාත්තිගේ දින පොතේ තිබූ සියලු දේ ඔහුට කීවෙමි.

"මොකක් මෙච්චර කාලයක් ඔයාව පණ වගේ බලාගෙන තියෙන්නෙ ඔයාගේ ඇත්ත දෙමාපියෝ නෙමෙයිද..? හැබැයි මොන දේ වුණත් ඔයා වාසනාවන්තයි මැණික. එයාලා ඔයාට කිසිම අඩුපාඩුවක් කළේ නෑනේ. දැන් දුක් වෙන්න එපා. මං ඊළඟ මාස 12 වෙනිදට එනවනේ." ප්‍රවීන් කණගාටුව හා සෙනෙහස පිරුණු හඬින් කීවේය.

මම ප්‍රවීන් සමග සවස් වන තුරුම කතා කළෙමි.
අම්මා සහ තාත්ති පැමිණෙන විට රාත්‍රී 8.30 පමණ වුණි.

ඔවුන් පැමිණෙන ශබ්දය ඇසී මම පහළට ගියෙමි.
පසුව ඔවුන් මහන්සිය නිවා පිරිසුදු වී පැමිණෙන තෙක් සිටියෙමි.
තාත්ති රූපවාහිනිය නැරඹීමට සාලයට පැමිණියේය.

"තාත්ති, මට ඔයා එක්ක දෙයක් කතා කරන්න තියනවා."

"එන්න වාඩිවෙන්න පැටියෝ, මොකක්ද ප්‍රශ්නේ?"

"තාත්ති මං අහන දේට ඇත්තම කියනවද.ඇත්තම කියන්න. මං කාගේ දරුවෙක්ද..?"

"මොනාද ඔයා මේ අහන්නේ, ඔයා අපේ දරුවෙක්." තාත්ති විමතියෙන් මෙන් කීවේය.

"බොරු කියන්න එපා තාත්ති, මං හැමදේම දන්නවා. මට ඔයාගේ කාමරේ තිබිලා මේ ඩයරි එක හම්බුණා. මට සමාවෙන්න ඔයාගෙන් අහන්නෙ නැතුව ඒක කියෙව්වට."

"ඔව් පුතේ ඕකේ තියෙන හැමදේම ඇත්ත. හැබැයි ඔයා මගෙන් අවසරයක් නැතුව ඒක කියවපු එක වැරදියි." තාත්තී එසේ කියද්දි අම්මාද පැමිණ තාත්ති අසලින් වාඩි වුණාය.

"මං විතරක් මේ දේ දැනගෙන දැන් වසර 24ක් ගෙවුණා. මං හිතාගෙන හිටියේ මේ දේ මාත් එක්කම වැළලෙයි කියලා. මට සමාවෙන්න තාරු. ස්නේහි අපි දෙන්නගෙ දුව නෙවෙයි." එසේ කියමින් තාත්ති සියලු කරුණු අම්මාට හා මට හෙළි කළේය.

අම්මා සත්‍ය දැනගෙන මා බදාගෙන ඇඬුවාය.

මම රාත්‍රියේදී මීට වසර 4කට පෙර මළගෙදරදී හමුවුණු මාගේ එකම සොයුරිය වූ මිනේහි සෙනාරා ප්‍රනාන්දුට දුරකථන ඇමතුමක් ලබා ගත්තෙමි.

මම ඇය සමග කතාකර ඇයව සහ අයියාව හෙට දිනයේ මුණගැසීමට අවශ්‍ය බව පවසා, හමුවෙන්නට නුවර නගරයේ අවන්හලක් කතා කර ගත්තෙමි.

***

පසු දා උදෑසන මම තාත්ති සමග සුදානම් මේ කොෆි ෂොප් එකට ගියෙමි.
තාත්ති මාව දමා වැඩට ගියේය. මා යන විට අක්කී සහ අයියා පැමිණ සිටියහ.

"අක්කි මම ස්නේහී. මං ඔයාට ඊයේ කතා කළේ." මම එසේ කියමින් අවන්හලේ අසුන් ගත්තෙමි.

"ඔව් නංගී. මං දන්නවා. මං දැනගත්ත ඔයා කවදම හරි ඔයා මට කතා කරනවා කියලා."

"ඔව් අක්කි මං ඊයේ හැමදේම දැනගත්තේ, මං එදා මළ ගෙදර ආවත් දැනං හිටියේ නෑ ඒ කවුද කියල. හැබැයි දැන් දන්නවා. ඒ මගේ අම්මා කියලා." මම අඬමින් කීවෙමි.

"අඩන්න එපා නංගි, අප්පච්චි නැති වෙනකොට මට වයස අවුරුදු හතයි. මං දෙක වසරේ හිටියේ. නංගි ප්‍රී ස්කූල් යනවා. අපි ලොකු වෙනකම් හිටියේ නැන්දා ගාව. එයා අපිට අම්මා වගේ සැලකුවේ" අයියා කීවේය.

"අයියා දැන් මොනවද කරන්නේ..?" මම කඳුළු පිස දමමින් ඇසුවෙමි.

"මං දැන් ඩොක්ටර් කෙනෙක් නංගී."

"එතකොට අක්කි මොකද කරන්නේ..?"

"මං අප්පච්චිගේ ඔෆිස් එකේ වැඩ කළේ. මං ඊළඟ මාසෙ කුරුණෑගල මෙහෙණි ආරාමයකට යනවා. මං ආසයි මහණ වෙන්න."

"අනේ කොච්චර හොඳද අක්කී..?"

"අම්මගෙ තරුණ කාලෙ ෆොටෝ එකක් තියෙනවා. ඔයා වගේමයි ඒකේ අම්මා." ඇය කෝපි බොන අතරේ කීවාය.

මම ඔවුන් සමග බොහෝ වෙලාවක් තොරතුරු කතා කරමින් සිටියෙමි.

ඔවුහු මෝටර් රථයෙන් මාව ගෙදරටම ගෙනත් බැස්සීය.

***

දින සති හෙමින් හෙමින් ගත වුණි.

ප්‍රවීන් ජූලි 5 වන දා නගරයට පැමිණ මාහට කතා කළේය.

"මැණික ඔයාට දැන් ප්‍රශ්නයක් නෑ නේද..?"

"නෑ ප්‍රවීන්, මං මගේ ඇත්තම අයියවයි අක්කාවයි මුණ ගැහුණා. එයාලා දෙන්නා දකිද්දි දුක හිතෙනවා."

"එහෙමද ඔයා දැන් හොඳින් ඉන්නවනම් එච්චරයි. අම්මා මට කතා කරලා කිව්වා අපේ වෙඩින් එකට ඕන දේවල් ලෑස්ති කරල තියෙන්නෙ කියලා."

"ඔව් ප්‍රවීන්, අම්මයි මමයි හැමදේම ගත්තා. ඔයා 12 වෙනදාට එනවනේ. ඊට පස්සේ 20 වෙනිදා අපේ වෙඩින් එක."

"ඔව් මැණික මං ඉක්මනට ඔයා ලඟට එනවා. මගේ මුළු ලෝකෙම ඔයා. මං ඒ ලස්සන දවස එනකම් මග බලාගෙන ඉන්නවා." ප්‍රවීන් එලෙස කීවේය.

මම ඔහු සමග බොහෝ වෙලාවක් කතා කළෙමි.

***

ජූලි 11 වනදා මා සතුටින් පසුවුණි. ඒ හෙට දින ප්‍රවීන් නැවත නුවර බලා එන නිසා.
අපි විවාහ මංගලයට අවශ්‍ය දේ සකස් කළෙමු.

මම වැඩට ගොස් උසාවියේ කටයුතු වෙනදා මෙන් සිදු කළෙමි.
මුලදී ආශාවෙන් රැකියාව කලද ප්‍රවීන්ගෙන් දුරස් වූ පසු එය මා හට එපා වුණි.

සවස 3.30ට පමණ මහා මොරසූරණ වැසක් පැමිණියේය. මම ජනේලය විවෘත කර පරිසරය දෙස බලා සිටීමි.

සැඩ සුළං ද නොනවත්වා අකුණු ගැසීමද සිදුවුණි.
එකවරම මා හට දුරකථන ඇමතුමක් පැමිණියේය.

"හලෝ සනූ පුතේ. මං තරංගී අම්මා කතා කරන්නේ."

"ආ කියන්න අම්මේ."

"මං මේ කෝල් කළේ දවල් 2.00ට විතර අපි මඩකලපුවට ආවා කියන්න. අපි 4.00ට මෙහෙන් පිටත් වෙනව. දැන් ටවුන් එකේ ඉන්නේ."

"ආනේ හොඳයි අම්මේ, එතකොට රෑ 9.30 විතර වෙන්කොට මෙහෙට එන්න පුළුවන්නේ.කෝ ප්‍රවීන් ඉන්නවද..?"

"ඔව් ඉන්නවා පුතේ ඉන්න මං දෙන්නම්."

"ප්‍රවීන් මට ඔයාව දකිනකං ඉවසිල්ලක් නෑ."

"මටත් එහෙමයි, මං මේ මාස තුනේ ඔයාගේ මූණ දකින්නේ නැතුව බොහොම අමාරුවෙන් හිටියේ."

"ඔයා ඉක්මනට ඉන්නකො එහෙනම්. පරිස්සමෙන් එන්න. මං ඔයා එනකම් මග බලාගෙන ඉන්නවා."

"හරි මැණික, ඔයත් පරිස්සමෙන්. බුදු සරණයි."

පසුව මම දුරකථනය තැබුවෙමි.

අද උදෑසන සිටම අයියාගේ දුව සොනාශිට උණ හැදි ඇත.
අමාරුව වැඩිකම නිසාම ඇය හොඳටම අඩයි.
මම ඇයව බලා ගැනීමට අක්කීට උදව් කළෙමි.

සවස 5.30ට පමණ ප්‍රවීන් දුරකථනයට පණිවිඩයක් එවා තිබුණි.

"මැණික දැන් අපි ඉන්නේ මහඔය. කන්න නතර කළා." යනුවෙනි.
මට දුවගේ වැඩ කරමින් සිටි නිසා එයට ප්‍රතිචාර දැක්වීමට නොහැකි වුණෙමි.

මා පණිවිඩය දකින විට රාත්‍රී 9.30 පමණ වුණි. මා නැවත ප්‍රවීන්ටත්, අම්මාට හා තාත්තාට කෝල් ගත්තත් කිසිවකු ප්‍රතිචාර දැක්වූයේ නැහැ.

පසුව මම රාත්‍රී ආහාර ගෙන නිදා ගත්තෙමි.

****

උදෑසන 6.30ට පමණ මම අවදි වුණෙමි . මුළු පරිසරයම අන්ධකාරයි. මහා වැස්සක් අකුණු ගසමින් ඇද හැලුණි.

එකවරම අම්මා කාමරයට පැමිණියාය.

"චූටි බලන්නකෝ වෙලා තියෙන දේ?" අම්මා අඬමින් කාමරේට පැමිණියාය.

"ඇයි අම්මේ මොකද වුණේ." අම්මා මුනිවත රකිමින් සිටි නිසාද ඇය අඬමින් කාමරයට පැමිණ නිසාද මම කලබලයෙන් මෙන් ඇසුවෙමි.

"පුතේ ඊයේ හවස ප්‍රවීන් පුතාලා මහා ඔය පහු කරලා එනකොට එයාලගේ කාර් එක ඇක්සිඩන්ට් වෙලා."

"මොනවා ඔය ඇත්තමද අම්මේ, ප්‍රවීන්ලා හොඳින් නේද..?" මම අත් දෙකෙන් මුහුණ වසාගෙන ඉකි බිඳුම් අතරින් කීවෙමි.

"මාදුරු ඔයට කාර් එක පෙරලිලා තියෙන්නේ. උදේ හාතිය පුතා කතා කළා. තරංගී ඇන්ටීටයි, අංකල්ටයි හොඳටම අමාරුයිලු. ප්‍රවීන් පුතාව හොයාගන්න නැලු." අම්මා ශෝකයෙන් මෙන් කීවාය.

මා හට දුක වාවා ගත නොහැකි වුණි.
මම බොහෝ වෙලාවක් ඇඩුවෙමි.

පසුව හාතියට දුරකථන ඇමතුමක් ගත්තෙමි.

"හෙලෝ හාතිය, මං ස්නේහි කතා කරන්නේ. ඇක්සිඩන්ට් එක ගැන විස්තර ටිකක් දැනගන්න ඕනි."

"ආ.. ස්නේහි, මං අද උදේ සොහාන් අයියටත් කතා කළා.
අපේ එස්.ටී.එෆ් කෑම්ප් එක කිට්ටුව තමයි ඇක්සිඩන්ට් එක වෙලා තියෙන්නේ."

"කොහොමද හාතිය අම්මටයි තාත්තටයි."

"සොරි ස්නේහි, එයාලා දෙන්නම අපිව දාලා හුඟක් දුර ගිහින්. කාර් එක ප්‍රපාතයකින් පහලට පෙරළිලා තියෙන්නේ. ප්‍රවීන් තාමත් අතුරුදහන්. අපේ කිමිදුම්කරුවෝ අද මාදුරු ඔයේ රිසර්ච් එකක් කරනවා." හාතිය කණගාටුවෙන් කීවේය

සිදුවූයේ කිසිවෙකුත් නොසිතූ දෙයකි. අවසානයේ සිදුවූයේ අපගේ විවාහ මංගල්‍යය නොව ප්‍රවීන්ගේ දෙමාපියන්ගේ අවමංගල්‍යයයි.

පසුදින ඔවුන්ගේ අප්‍රාණික සිරුරු නුවර නිවසට රැගෙන ආවෝය.

සියල්ලම ඔවුන් දැක හඬා වැලපුණි.
ප්‍රවීන්ම තාමත් සොයා ගත නොහැකි වුණි.

මෙය ස්වප්නයක්දැයි මට සිතාගත නොහැකිවුණි.

ප්‍රවීන්ලාගේ නිවස මිනිසුන්ගෙන් පිරී තිබුණි.

මා හට සෙනෙහස දැක්වූ මා හට මවක් පියෙක් මෙන් සැලකූ
සේනාධීර පවුලේ වියෝව මා හට විශාල දුකක් කැඳවන කාරණාවක් වුණි.

ගම්පොළ සුදු පුංචි මා අසලට පැමිණ කතා කළාය.

"පුතේ ඔය හැටියට අඬන්න එපා. අපි ලොකු පවක් කරලා තියෙනවා මෙච්චර ගුණ යහපත් මේ අයගේ මරණය දකින්න. හමුදාවෙන් කියනවා ප්‍රවීන් පුතා ගැන බලාපොරොත්තු අතෑරගන්න කියලා." ඇය අඬමින් මාව තුරුල් කරගෙන පැවසුවාය.

එකවරම මා සිහසුන් වී බිම ඇද වැටුණි. මා වටා සුදු ඇඳගත් අය වටවනවා පමණයි මා හට මතක ඇත්තේ.

*****

"ඩොක්ටර් දුවට සිහිය ආවා." හෙදියක් මා දෙස බලමින් කීවාය.
මම රෝහලේ වාට්ටුවක ඇඳේ සිටියෙමි.

මා හට සේලයින් ලබාදී තිබුණි.
මාහට සිදුවූ කිසි දෙයක් මතක නැහැ.

"චූටි මැණික, ඔයාට දැන් හොඳයිද .ඔයාට සතියක් සිහිය තිබුණෙ නෑ." අම්මා මා දෙසට එමින් කීවාය.

"මොකක්ද අම්මේ මට වුණේ."

ඔයාට මළ ගෙදර දවසේ ක්ලන්තෙ දැම්මා.ඔයාට ප්‍රශ්නෙ දරාගන්න බැරිව විශාදෙ හැදිලා සිහි නැතුව හිටියේ පුතේ."

"මට දැම්ම ගෙදර යන්න බැරි වෙයිද..?"

"දැම්ම බෑ පුතේ. ඔයාට තාම හොඳටම හොඳ නෑ. ඔයාගේ මොළේ ස්නායු කිහිපයක්ම මැරිල ඒවට ට්‍රීට්මන්ට් කරන්න ඕනේ."

"අම්මේ මගේ ප්‍රවීන් ගැන කිසිම ආරංචියක් නැද්ද..?"

"බොරු කියල වැඩක් නැනෙ පුතේ. කිසිම ආරංචියක් නෑ. හමුදාවේ අයත් කියනවා ප්‍රවීන් ගැන අදහස අතහැර ගන්නලු. එයාලා කිම්දුම්කරුවෝ දාලා හොඳට සර්ච් කරලා. ප්‍රවීන්ගේ ෆෝන් එක විතරයි හම්බවෙලා තියෙන්නේ. හැබැයි කාර් එක ඉස්සරහ සෙට් කරලා තිබුණු කැමරාවේ අනතුර සටහන් වෙලා තියෙන්නේ. ඒ ගැන මේ ටිකේ පොලිසිය විමර්ශන කරනවා."

මම රෝහලේ ඇඳකට වී කල්පනාවට වැටුණෙමි.

පෙර පාසල් අවධියේ සිටම ප්‍රවීන් මාගේ ජීවිතයට සොඳුරු මතකයක් එක් කළේය. ඔහු නොමැති හෙට දිනක් පිළිබඳ මට සිතීමටවත් නොහැකියි.

එකවරම අයියා සහ හිරන්දි අක්කී  මාව බැලීමට පැමිණියහ.

"නංගි දැන් ඔයාට කොහොමද..?" මාගේ ඇඳ අසලට පැමිණ අයියා ඇසුවේය.

"ලොකු අඩුවක් නෑ අයියේ. ටිකක් අමාරුයි. ඔළුව හොඳටම රිදෙනවා."

"නංගි මෙන්න අපි සුප් එකක් හදන් ආවා. මං ඔයාට පොවන්නද..?"
මම ඇයට හා කියන්නට මෙන් හිස දෙපසට සැලුවෙමි.

"කෝ අක්කි බබා." මම සුප් බොන අතරේ ඇසුවෙමි.

"බබා අපේ අම්මා ගාව තියලා ආවේ. අම්මා නුවර ආවා. ඒක නෙවෙයි නංගි, අපේ නංගිත් දැන් අම්මා කෙනෙක් වෙන්නයි යන්නේ." අක්කී කීවාය.

"අනේ කොච්චර හොඳද..?" මම සතුටින් කීවෙමි.

"නංගි අද ප්‍රසාදි අක්කිලත්  එනවලු ඔයාව බලන්න."
අයියා කීවේය.

ටික වේලාවක් රැඳී සිට අයියා සහ අක්කී  නිවසට ගියෝය.

පසුව වෛද්‍යවරයෙකු පැමිණ ලේ සාම්පලයක් ගත්තේය.

මම වටපිට බලන විට ප්‍රධාන දොරේ ගසා තිබූ 'මානසික රෝගී ඒකකය' යන පුවරුව දුටුවෙමි.

හිත පසාරු කරගෙන යනවාක් මෙන් මට දැනුණි. සවස දිනුත්තර අයියා සහ අක්කී  ප්‍රශින්ත පුතාවත් රැගෙන පැමිණියහ.

"කොහොමද නංගි..? තාරුකා ඇන්ටී කිව්ව ඔයාට සිහිය ආවා කියලා." ප්‍රසාදී අක්කී කීවාය.

"ඔව් අක්කී, ටිකක් අමාරුයි ඒ වුණාට."

"පුංචි ඔයාට මොකද වුණේ. ඔයාට ඌවා වුණාද..?" ප්‍රශී බබා කට උල් කරමින් ඇසුවේය.

"ඔහු පැටියෝ, පුංචි බබ්බා කන්නෙ නැතුව ඉඳලා පුංචිට ඌවා වුණා."මම ඔහුව ළඟට ගනිමින් කීවෙමි.

"ඔයාට අසනීප වුණ වෙලාවේ ඉඳලා පුතා ඔයාව බලන්න ඕන කියනවා." දිනුත්තර අයියා කීවේය.

"කෝ අක්කී දුව. ගෙදර තියලද ආවේ..?"

"ඔව් නංගී එයාව එක්කගෙන ආවාම හරි අමාරුයි. එයා අම්මා එක්ක ඉන්නවා." අක්කී කීවා ය.

"කෝ පුංචි බාප්පි..? පේන්නවත් නැනේ." ප්‍රශී මා දෙස බලා ඇසුවේය.

"පුතේ බාප්පි අපෙන් දුර ඈතකට ගිහින්." මම අඩමින්  කීවෙමි.

"මට තාම මේක හීනයක් වගේ. ඇක්සිඩන්ට් එක ගැන හිතන්න බෑ නංගි. මගේ පවුලේ මං තනිවෙලා. අප්පච්චි, අම්මා, ඒ වගේම මට කියලා හිටපු එකම සහෝදරයා දැන් මගෙන් ඈත්වෙලා. ආය නොයෙන්නෙම  යන්න ගිහින්." දිනුත්තර අයියා අඩමින් කීවේය.

"මටත් එහෙමයි. මේ දේ කරපු එකාව ඉක්මනට හොයාගන්න." මම ඉකි බිඳුම් අතරින් කීවෙමි.

"අපි අම්මලාගේ හත් දවසේ දානෙ දෙනකොට මල්ලීටත් පින් දුන්නා. ඉන්න තැනක හොඳින් ඉන්න කියලා." ප්‍රසාදි අක්කී කීවාය.

"නංගි අපි දැනටම මේ ඇසිඩන්ට් එක ගැන නඩුවක් ෆයිල් කරලා තියෙන්නේ. අපිට කැමරාවේ රෙකෝඩ් වුණ සාක්ෂිත් තියෙනවා."

දිනුත්තර අයියා කීවේය.

අක්කිලා යාමට සූදානම් වෙද්දි ප්‍රශී බබා යන්න බැහැ කියා ඇඬුවේය.

ඔවුහු කෙසේ හෝ ප්‍රශීව රැගෙන ගියහ.

එරන්දි, ප්‍රවීන්, තරංගී ඇන්ටී සහ ඩිලාන් අංකල් ජීවිතයට මුණගැසුණු ආදරණීයන්.

ඔවුන් වාවා ගත නොහැකි වෙන්වීමකින් නික්මුණු අය.

*****

රෝහලේ තවත් මාස තුනක් ගත වුණි . සඳුදා උදෑසන මා බැලීමට මිහින්දි පැමිණියාය.

"මට ආරංචි වුණා හැමදේම, මට ඔයා ව බලන්න එන්න හිතුණා. මං කලින්ම ආවේ නැත්තේ ඔයාට සුභ ආරංචියක් අරගෙනම එනවා කියලා."
මිහින්දි ඇඳේ වාඩි වෙමින් රැගෙන ආ පළතුරු කූඩය ඇඳ අසලින් තැබුවාය.

"අනේ කොච්චර හොඳද මිහී." මම සතුටින් කීවෙමි.

"මං කිව්වා වගේ ඔයාට කියන්න සුබ ආරංචියක් තියෙනවා."

"ප්‍රවීන් නැතුව මට මොන සුභ ආරංචිද..?"

"මං ප්‍රවීන්ගෙන් නඩුවට කතා කළා. වැරදිකාරයාව හම්බවුණා. මේක කරලා තියෙන්නේ 'හිරාන් අවන්ත' කියලා කෙනෙක්.
ලොකු බවුසරයකින් කාර් එක හප්පලා. ඊට පස්සේ තමයි කාර් එක පල්ලමකට වැටිලා තියෙන්නේ. කාර් එකේ තිබුණු කැමරාවේ හප්පපු බවුසරේ නම්බර් ප්ලේට් එක සටහන් වෙලා තිබුණා. ඔයාලගේ හිරන්දි අක්කගෙ තාත්තා, ලෝයර් කැලුම් රණසිංහ සර් අපිට ගොඩක් උදව් කළා." මිහින්දි කීවාය.

"මොනවා හිරාන් මුල ඉඳලම මගේ ප්‍රවීන්ගේ ජීවිත විනාශ කළේ ඌ. එරන්දිගේ මරණයටත් වග කියන්න ඕනි හිරාන්." මම කෝපයෙන් මෙන් කීවෙමි.

මම මිහින්දි සමග බොහෝ තොරතුරු කතා කළෙමි.
පසුව ඇය පිටව ගියාය.

වසර 4කට ඉහතදී ප්‍රවීන් පිරිස සමඟ ගොස් හිරාන්ට ගැසූ තරහ ඔහු මෙසේ පිට කර ඇත.
මිහින්දි පැවසූ පරිදි හිරාන්ව මිනීමරුම් චෝදනාවකට ජීවිතාන්තය දක්වා සිරගත කර ඇත.

ඔහු කළ පව් වලට, වැරැදි වලට එසේ දඬුවම් ඔහුට දඬුවම් හිමි විය යුතුයි.

මා දෙවියන්ගෙන් අයැද සිටින්නේ මාගේ ආදරණීයන්ගේ ආත්මයන්ට යහපතක් උදාවේවාය කියමිනි.
මා හට පෙර දිනක එරන්දීව දුටු සිහිනයත් මතකයට නැඟුණි.

සන්ධ්‍යාවේ මාගේ රෝගී තත්ත්වය පරීක්ෂා කිරීමට පැමිණියේ හුරු පුරුදු වෛද්‍යවරයෙකි.

"අනේ මේ රමේෂ් අයියා නේද…?" මම සතුටු සිතින් ඇසුවෙමි.

"ඔව් නංගී මං ගිය සතියේ ඉඳලා මේ හොස්පිටල් එකේ වැඩ කරන්නේ.
මට තාරුකා ඇන්ටි සිද්ධ වුණු දේ කිව්වා." ඔහු එන්නතක් විදිමින් කීවේය.

"දැන් කොහෙද අයියේ අක්කී ඉන්නේ..?"

"මිනේති නංගි දැන් ඉන්නේ කුරුණෑගල ධම්මිකා මෙහෙණි ආශ්‍රමයේ. දැන් ගිහින් මාස දෙකක් විතර වෙනවා."

"මං අක්කට කෝල් එකක් අරන් බලන්නද..?"

"වැඩක් වෙන්නේ නෑ, එයා ෆෝන් පාවිච්චි කරන්නේ නෑ.
ඔයාට පුළුවන්නම් හොඳ වුණහම ගිහින් බලලා එන්න."

"මට තව ගොඩක් කල් මේ හොස්පිටල්එකේ ඉන්න වෙයිද අයියේ..?"

"දැන් නම් ඔයාට ගොඩක් හොඳයි. අද සිකුරාදනේ, සඳුදාට ටිකට් කපයි.
හැබැයි දිගටම බෙහෙත් බොන්න වෙනවා."

රමේෂ් අයියා කියූ පරිදිම සඳුදා උදෑසන 10.00ට පමණ මාගේ ටිකට් කැපුවේය. මම අම්මා සමග නිවසට පැමිණියෙමි.

"පුතේ ඔයා ටිකක් කාමරේට වෙලා විවේක ගන්න."
අම්මා මාව කාමරයට රැගෙනවිත් කාමරයෙන් පිටව යද්දී කීවාය.

එකවරම මගේ නෙත යොමු වූයේ අපගේ විවාහයට ගත් මංගල සාරිය දෙසටයි.
කාමරය පුරා ප්‍රවීන් හා බැඳුණු මතක සටහන්ය.
බිත්තියේ ඇති අප දෙදෙනා කුඩා කළ එකට ගත් ඡායාරූපය දැමූ ඔරලෝසුවද, කණ්ණාඩි මේසේ උඩ ඇති ඡායාරූපයද, මාගේ අතීත මතක සටහන් කරා ඇදගෙන යයි. මම ඔහු කළ ගීතයට සවන් දුන්නෙමි .

නොදැනීම මාගේ ඇස්වලින් කඳුළු රූටා වැටුණි.
අම්මා කැඳ වීදුරුවක් රැගෙන පැමිණියාය.

"මේක බොන්න පුතේ, අනේ ඇයි ඔය ආයෙ අඬන්නෙ..?"

"අම්මේ මට ඔයාගෙන් අහන්න දෙයක් තියෙනවා." මම කඳුළු අතරින් කීවෙමි.

"මොකක්ද පුතේ කියන්න තියන්නේ…?" අම්මා විමතියෙන් මෙන් ඇසුවාය.

"අම්මේ මිනේහී අක්කි දැන් ඉන්නේ කුරුණෑගල මෙහෙණින් වහන්සේලාගේ ආරාමයක.
එයා තව ටික කාලෙකින් මහණ වෙනවාලු."

"ඔවු පුතේ, මං දන්නව මට රමේෂ් පුතා කිව්වා"

"අම්මේ මටත් ආසයි මහණ වෙන්න. මට ජීවිතේ කලකිරිලා නෑ. හැබැයි දැනටම තේරුම් ගිහින් තියෙන්නේ.
මං හොස්පිට් එකේ ඉන්නකොට මට හිතුණා ගිහි ජීවිතේ අපි මොන දුකක්ද විඳින්නේ කියලා."

"අපි දැනගෙන හිටියා කවදාහරි ඔයා ඔය කතාව කියනවා කියලා."
අම්මා දුකෙන් මෙන් කීවාය.

"අනේ ඒ කොහොමද අම්මේ..?"

"පොඩි කාලේ ඔයාගේ කේන්දරේ බලපු හැම තැනකින්ම වගේ කිව්වා ඔයාට මහණ යෝගයක් තියෙනවා කියලා.
හැබැයි මට ඔයාගෙන් දෙයක් දැනගන්න තියෙනවා. ඔයා කෝටිපති ව්‍යාපාරිකයෙක්ගේ දුවෙක්.
අපි ඔයාව හදාගන්න අරගෙන ඔයාට මොකක් හරි අඩුපාඩුවක් වුණාද පුතේ..?"

"නෑ අම්මේ එහෙම කියන්න එපා, ඔයාල මට කිසිම අඩුපාඩුවක් කළේ නෑ.
කවදාවත් ඔයාලා වචනෙකින්වත් මගේ හිත රිද්දලා නෑ." මම අම්මාව වැළඳ ගනිමින් කීවෙමි.

"මම තාත්තීගෙන් හවසට අහලා ඔයාට උත්තරයක් දෙන්නම්." අම්මා බිඳුණු හඬින් කීවාය.

රාත්‍රී ආහාර ගනිද්දී අම්මා තාත්තිට මා කියූ දේ පැවසුවාය.

තාත්ති ටික වෙලාවක් කල්පනා කළේය.

"දුවේ , මං දන්නවා ප්‍රවීන් පුතා නැතිවුණාට පස්සේ ඔයා දුකෙන් ඉන්නේ කියලා. අපි කවදාවත් ඔයාගේ හීන විනාශ කරන්නේ නැහැ. ඔයා සතුටින් නම් යන්නේ අපි ඔයාට අවසර දෙනවා. ඔයාව අපිට කවදාවත්ම හිරිහැරයක් කරදරයක් වුණේ නෑ.
ඔයා තමයි මගේ අම්මගේ ජීවිතේ එළිය කළේ. අපිට සතුට ගෙනත් දුන්නේ. ඔයා මහණ වෙන්න ආසයි නම් මහණ වෙන්න.
මගේ විරුද්ධත්වයක් නෑ. හැබැයි ඔයා කරදාවත් හිතන්න එපා අපි ඔයාට වෙනස්කමක් කරා කියලා."

තාත්ති ආහාර ගැනීම නවත්වා සන්සුන්ව කීවේය.

තාත්ති කුරුණෑගල ධම්මික ආශ්‍රමයට කතා කර තොරතුරු දැන ගත්තේය.

දින දෙකකට පසු අපි ආශ්‍රමයට පැමිණියෙමු.
මම පැමිණීමට පෙර මාගේ ඇඳුම්, පොත්පත්, පාවහන් ආදී සියල්ල නැති බැරි ළමයින්ට පරිත්‍යාග කළෙමි.
මම ඇතුල්වීමට පෙර අම්මාට හා තාත්තාට ගාථාව කියා දණ ගසා වැන්දෙමි.
ඔවුහු කඳුළින් නෑවී සිටියහ.
මම ඔවුන්ව වැළඳගෙන සිටියෙමි.

තාත්ති වාහනයේ සිටියදී අම්මා මාත් සමග පැමිණියාය.
මම සුදු දිග සායක් හා සුදු අත් දිග බ්ලවුස් එකක් ඇඳගෙන සිටියෙමි.

ආශ්‍රමය තුළ පුදුමාකාර සුවදායී බවක් දැනුණි.

අම්මා මිනේහී අක්කා සමග බොහෝ වෙලාවක් කතා කළාය.
මම මටයි කියා රැගෙන ආවේ සුදු රෙදි පෙට්ටියක් පමණි.
මම අම්මාට කෙසේ හෝ සමුදුන්නෙමි.

***

කාලයත් සමඟ ආශ්‍රමයට මම හුරු වුණි . අලුයම අවදි වී මුව සෝදා මල් නෙලා බුද්ධ වන්දනාවේ යෙදුණි.
මළුව ඇමදීම මාගේ ප්‍රියතම රාජකාරියක් බවට පත්වුණි.
මෙහෙණින් වහන්සේලා සමග සුහදව කටයුතු කළෙමි.
පොහොය දිනයන්දී අටසිල් සමාදන් වුණි.
ලොකු මෙහෙණින් වහන්සේ අභිධර්මය පාඩම් කියාදුන්නාය.

****

මාස හයකට පසු මා ඇතුළු 25දෙනෙකුගේ මහණකම් පින්කම සිදු කෙරුණි.

එයට පවුලේ සියලු දෙනාම සහභාගී වුණි. අපත් සමග මිනේහී අක්කීද මහණ වුණාය.
මා දැන් ස්නෙහි උත්තරා විජේනායක නොව මහනුවර යශෝධරා මෑණියන්ය.

මිණේෂි අක්කි දැන් මහනුවර උත්පලවණ්ණා මෑණියන්ය.
අප දැන් තිලෝගුරු ගෞතම බුදුපියාණන් වහන්සේගේ භික්ෂු ශාසනයේ උපන් තෙරණිවරුන්ය.

***

මහණ පින්කමෙන් තුන් වසරකට පසු අටමස්ථානයේ වැඳීම සඳහා ලොකු මෙහෙණින් වහන්සේ ඇතුළු මෑණිවරුන් පිටත් වුණෝය.
එයට අපද අයිති වුණි. පැය ගණනාවකට පසුව අපි අනුරාධපුර නගරයට පැමිණියෙමු .

රුවන්වැලි මහා සෑ පින්බිම වෙත පැමිණි සවස 5.30ට පමණි.

වසර ගණනාවකට පෙර පවුලේ අය සමග පැමිණි පසු ස්වර්ණමාලී සෑ රදුන් වැඳ පුදා ගැනීමට පැමිණියේ අදයි.

මා සුදු නෙළුම් මල් මිටක් රැගෙන මෙහෙර වහන්සේ පිදීමට යාමේදී මම එකවරම අකුණක් ගැසුවාක් මෙන් නතර වුණෙමි.

"මොනව ප්‍රවීන්…" මා හට රහසින් මෙන් කියවුණි.

මාගේ නෙතගෙන් කඳුළු ඇද වැටුණි.

ඔහු හිස මුඩුකර කසාවතක් ඇද වෙහෙර වහන්සේට නෙළුම් මල් පූජා කරමින් සිටියේය.

ඔහු සමග වයසක සීයා කෙනෙක් කතා කළේය.
ඒ සීයා මා දෙසට පැමිණෙද්දී මම ඔහුට කතා කළෙමි.

"උපාසක සීයේ, අර ස්වාමීන් වහන්සේව දන්නවද..?" මා සංවරව ඇසුවෙමි.

"එහෙමයි මෙහෙණින් වහන්ස, ඔය ඉන්නේ අපේ අම්බලන්ගොඩ ගල්දූව ආරාණ්‍ය සේනාසනයේ කුමාර කස්සප ස්වාමීන් වහන්සේ."

"දැන් හුඟක් කල් වෙනවද මහණ වෙලා..?"

"නැහැ මෙහෙණින් වහන්ස, දැන් මාස හයකට කලින් මහණ වුණේ. අපේ ආරණ්‍ය සේනාසනයේ ස්වාමීන් වහන්සේ නමක් වනයේ ඖෂධ පැළ සොයමින් සිටියදී මේ ස්වාමීන් වහන්සේ අසල ගහක වැටිලා ඉඳලා තියෙනවා. ඊට පස්සේ තුවාල වලට බෙහෙත් කළා. සැහෙන කාලයක් සිහිය නැතිව හිටියා. වෙදකම් දන්න ස්වාමීන් වහන්සේ නමක් බොහොම අමාරුවෙන් හොඳ කළා. ඒත් මේ ස්වාමීන් වහන්සේ කාගේ කවුද කියන්නේ අපි දන්නේ නැහැ. උන්වහන්සේගේ ඔලුව තදින් තුවාල වෙලා මතකයන් නැතිව ගිහිල්ලා. උන්වහන්සේ දැන් බණ භාවනා කරමින් අපේ ආරාමයේ වැඩ වසනවා…"
වයසක උපාසක සීයා පැවසුවේය.

"ඔබට පින් සිදුවෙනවා සීයේ. ස්තූතියි." මම ඔහුට පැවසුවෙමි.

ඔහු මා හට වැඳ එතනින් පිටව ගියේය.

එසේනම් ඔහුට දැන් මාවත් මතක නැහැ.
විශ්ව මාතාවට සිය දහස් වාරයක් ස්තුතිවන්ත වේවා!
ඒ ඔහුව ජීවතුන් අතර තැබුවාට.
මාගේ දෙනෙතින් කඳුළු රූටා වැටුණි.

අවසානයේ අප දෙදෙනාගේම පැතුම ස්වර්ණමාලී සෑ රදුන් ඉටු කළ සේක.
ඒ මීට වසර ගණනාවකට පෙර අප දෙදෙනා සුදු නෙළුම් මල් වට්ටියක් පූජා කර **'අප නැවත වරක් මේ පින්බිමේදී මුණ ගැසේවා'** යන්න කළ ප්‍රාර්ථනාවයි.

මම අත තිබූ සුදු නෙලුම් වට්ටිය පූජා කළෙමි.

පසුව මම කුමාර කස්සප ස්වාමීන් වහන්සේට දණගසා ගෞරවයෙන් යුතුව වැන්දෙමි.

මාගේ උණු කඳුළු බිඳුවක් උන්වහන්සේගේ පාදය මතට වැටුණි.

උන්වහන්සේ මිහිරි හඬින් 'සුවපත් වේවා' යැයි පැවසුවේය.

මම මාගේ සියලුම හැඟීම් අඳුරු පෙට්ටියක වල දැමුවෙමි.

පසුව මම අනෙකුත් මෙහෙණින් වහන්සේලා සමඟ වෙහෙර වහන්සේව ගාථා කියමින් වන්දනා කළෙමි.

***සමහර හමු වීම් තියෙනවා
හරි ආදරෙන් අපේ හිත් ඔප දමන
ඒත් සමහර බැඳීම් තාවකාලිකයි
හිමිවීමට හිත තබමින් නිහඬ වෙනවා….***

***ප්‍රාර්ථනා පොදි බැඳගෙන
ජීවන මංපෙතේ පියමැන්නාට
නිමාවයි මේ අපගේ ස්නේහ චාරිකාව
මතු බවයි හමුවෙන්න පැතුම් මල් පොදි බැඳගෙන
නතර වෙමි මා මෙහෙම
ගිලන් වූ හද තබා පසෙක***

***දෛවයේ සරදමකි මෙය***
***මේ භවයේ අයිති නැත අප සොඳුර.....***

නිමි!

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණ විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් වීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැටදහකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දරුවා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශික්ෂ භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කරකරගැනීම විශේෂත්වයකි. බෙහිදී මහමායා මාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරු බවතුන් දෙමාපියන් සහ ආදී විෂයාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුයි.

බුද්ධිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය  කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක දිම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණයේ සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයින් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබීම තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසී පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දෙවියට මගේ සුභාෂේෂණ

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනවිරත්න මහලේකම්